**JUNIOR ASSISTANT LIBRARIAN -** Mr. H.A.S.S. Perera

**CHIEF RESEARCH OFFICER -** Mr. G. Kumanayake

**SENIOR RESEARCH OFFICER -** Mr. M. Ajiwadeen, Mrs. G.R.A. Godagama, Mrs. P.L.T. Erandathi

**RESEARCH OFFICERS -** Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mr. V. Muralithas

**CHIEF PARLIAMENTARY INTERPRETER -** Mr. W.M.U. Bandara

**DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS -** Mr. I.L. Abdul Jabbar, Mr. J.A.S.P. Perera

**SENIOR PARLIAMENTARY INTERPRETERS -** Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan, Mr. C.J. Karunaratne, Mr. A.G. Mohamed Fiqrhi, Mr. S.R.M. Nisam, Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mrs. H.V.S. Heendeniya, Mr. P.L.P.L. Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. G. Jeyachandra

**PARLIAMENTARY INTERPRETERS -** Mr. D.D.V.N. Dhammage, Mr. M.H.M. Ramis, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mrs. A.L.A.D. Thiumini, Mr. M.Z.M. Azka, Mrs. A.R.Thirukumar, Mr. M.I.M. Fazi, Mr. N.J. Wickramage, Mr. P.M.A. Hussain, Mr. B.M. Razeel

## DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

**DIRECTOR (INFORMATION SYSTEMS AND MANAGEMENT)** - Mr. H.M.C. Perera

**SYSTEMS ENGINEER** - Mr. N.B.U. Nawagamuwa

**SYSTEMS ANALYST** - Mr. C.J. Willoraarachchi

**COMMUNICATION / SECURITY ENGINEER** - Mr. G.N. Lakmahal

**SYSTEMS DESIGNER** - Mr. M.N.C. Wickramasinghe

**SYSTEMS ADMINISTRATOR -** Mr. A.S.D.M. Wickramaratne

**WEB AND NETWORK ADMINISTRATOR -** Mr. N.G.L.S. Karunathilaka

**DATA BASE ADMINISTRATOR-** Mr. N.M.P.U. Premachandra

**SENIOR COMPUTER PROGRAMMERS-** Mr. D. Panditha, Miss P.M.M. Chandima

**COMPUTER PROGRAMMER -** Mrs. S.A.A.B. Athukorala

**SENIOR WEB EDITOR (SINHALA/ ENGLISH) -** Mr. U.L. Geeganage

**SENIOR WEB EDITOR (ENGLISH/ TAMIL) -** Mr. M.N.M. Shifaq

**SENIOR ASSISTANT COMPUTER PROGRAMMER -** Mrs. P.L.I.G. Cooray

**SENIOR HELP DESK CO-ORDINATOR** - Mrs. B.N.H. Thissera

**PARLIAMENTARY OFFICER –** Mr. W.V.R. Wickramaratne

**SENIOR COMPUTER OPERATORS** - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mr. W.H.U.D. Piyatunga, Mr. N.D.D.P. Premasiri, Mr. K.P.P.S. Romawardana, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashiq Ali, Mr. A.R.M. Rikaz Ali, Mr. A.M. Fowsul Ameen

**SENIOR COMPUTER TECHNICIANS -** Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

**SENIOR TECHNICAL ASSISTANTS -** Mr. V.R.S.J. Somaratne, Mr. W.S. Suranga

## DEPARTMENT OF COMMUNICATION

**PUBLIC OUTREACH OFFICER -** Mrs. Y.L.R. Nootan

**MEDIA OFFICER (STILL AND VIDEO PHOTOGRAPHY) -** Mr. U.G.N. Duminda

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (SINHALA) -**

**PUBLIC OUTREACH OFFICE COORDINATOR (TAMIL) -** Mr. S. Jeyaprakash

**MEDIA OFFICE COORDINATOR (SINHALA) -** Mr. S.A.S.K. Silva

# පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
නව වන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය

# பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்
ஒன்பதாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

# PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT
**THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**
**NINTH PARLIAMENT - FIRST SESSION**

**283** වන කාණ්ඩය | தொகுதி 283 | **VOLUME 283**

## පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2021 මැයි 04වන අඟහරුවාදා***
*2021 மே 04, செவ்வாய்க்கிழமை*
*Tuesday, 04th May, 2021*

**පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### இலங்கை காணி அபிவிருத்திக் கூட்டுத்தாபனம் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### SRI LANKA LAND DEVELOPMENT CORPORATION (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන)" නැමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ද පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බහුතරයක් විසින් සම්මත කළ හැකි බව ද ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**SC(SD)No.06/2021**
**SRI LANKA LAND DEVELOPMENT CORPORATION (AMENDMENT) BILL**

BEFORE : Justice Vijith K. Malalgoda PC - Judge of the Supreme Court
Justice E.A.G.R.Amarasekara - Judge of the Supreme Court
Justice Achala Wengappuli - Judge of the Supreme Court

SC(SD) No. 06/2021
Petitioner : A.D.P.A. Gooneratna
Counsel : Mayura Gunawansa PC with Sandarenu Peiris, Isuru Siriwardena, Yasanthi Dissanayake, Thanuja Karunarathne Instructed by Mahesh N. Pathirana

Respondent : Hon. Attorney General
Counsel : Indika Demuni de Silva, PC, Additional Solicitor General, with Yuresha de Silva, Senior State Counsel, Ms. Indumini Randenya, State Counsel, and Ms. Shewanthi Dunuwille, State Counsel.

The Court assembled for hearing at 10.00 a.m. on 19.04.2021.
A Bill in its short title referred to as "Sri Lanka Land Development Corporation (Amendment) Act No. of 2021 was published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka on 10th February 2021 and placed on the Order Paper of Parliament on 8th April 2021.

The Petition to this Court was filed by the Petitioner above named on 15th April 2021, within one week of the bill being placed on the Order Paper of Parliament as required by Article 121 (1) of the Constitution. Upon receipt of the petition the Court issued notice on the Attorney General as required under Article 134(1) of the Constitution.

The petition was referred to this bench by His Lordship the Chief Justice on 15th April 2021 with an order to Registrar to list it for hearing on 19th April 2021. The Petition was taken up for consideration on the same day, i.e., on 19th April 2021 with the consent of both parties.

In the petition filed before this court, the Petitioner had alleged that the entirety of the Bill violate and inconsistent with Articles 3, 4, 12 (1), 12 (2), 75 and 154G of the Constitution but restricted his submissions mainly to the alleged violation of Article 154G of the Constitution and submitted that the Parliament cannot proceed with this Bill without first referring it for the expression of the views of the Provincial Councils under Article 154G (3) as the proposed amendment deals with the subjects Land, Irrigation and Local Government listed under items 18, 19 and 04 in the list I to the 9th schedule or the Provincial Council List.

According to the Article 154 G (3) of the Constitution,

> "No bill in respect of any matter set out in the Provincial Council List shall become law unless such Bill has been referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council for the expression of its views thereon, within such period as may be specified in the reference, and –
>
> (a) where every such Council agrees to the passing of the Bill, such Bill is passed by a majority of the Members of Parliament present and voting; or
>
> (b) where one or more Councils do not agree to the passing of the Bill, such Bill is passed by the special majority required by Article 82:
>
> Provided that where on such reference, some but not all the Provincial Councils agree to the passing of a Bill, such Bill shall become law applicable only to the Provinces for which the Provincial Councils agreeing to the Bill have been established, upon such Bill being passed by a majority of the Members of Parliament present and voting."

The learned President's Counsel took up the position that the Court is required to go by the strict letter in this matter as the intention of the 13th Amendment was to devolve powers to the provinces to the proper extent set out therein.

As observed by us, Clause 2, 3 and 4 of the bill amends sections 2A, 2B and 4A of the Principal Enactment by prescribing a fine and term of imprisonment which was not found in the principal

enactment and also prescribing a specific procedure to follow when prosecuting violations already identified under section 2A, 2B, and 4A of the Principal enactment.

Clause 7 which amends Section 20A of the Principal Enactment also introduces a specific procedure to be followed when applying for restraining orders before the Magistrate's Court when prosecuting violations already identified under the Principal Enactment.

Clause 8 introduces two new Sections as Section 20D and 20E. Section 20D introduces a procedure that should be followed by a Police officer when a complaint is made for violations already identified under Section 2A, 2B and 4A of the Principal Enactment. The said section further declares those violations as cognizable offence in order to conduct effective investigations. Section 20E makes provisions to identify the liabilities of body of persons or partnerships.

Clause 9 had further clarified Section 22A of the Principal Enactment by identifying the procedure the Magistrate should follow, for offences, no penalty is identified under the Principal Enactment.

In addition to the above, Clause 5 of the Bill amends the Principal Enactment by replacing two ex-officio members of the Board of the Corporation and Clause 6 amend Section 9 of the Principal Enactment by introducing a new paragraph as 9 (1) (ea) which reads as follows;

(ea) "to enter into join ventures, partnerships or other commercial agreements with foreign or local companies or individuals directly, jointly or otherwise, within or outside Sri Lanka with the concurrence of the Minister and in accordance with other written law to achieve the objects of the corporation by utilizing the skilled labour, expert knowledge and the experience of the Corporation"

Clause 10 amends Section 28 of the Principal Enactment in order to provide for a new definition.

When considering the amendments referred to above, it appears that the main object of the Bill is to strengthen the legal framework already identified in the principal enactment.

In this regard this Court is mindful of the structure and the provisions in the Principal Enactment which clearly demonstrates that the Sri Lanka Land Development Corporation was brought into effect for the purpose of safeguarding low lying marshy, waste or swampy areas as they act as water retention areas for water to decede in cases of huge influx of water. It is for this purpose that the Principal Enactment prohibits person from filling or developing areas that are declared as development areas or low lying, marshy, swampy areas and canal reservations.

The learned Additional Solicitor General who represented the Hon. Attorney General relied on several Cabinet decisions which emphasized the need to strengthen the legal framework of the Principal Enactment in order to curb the violations under the Act.

On 1st July 2014 the then Minister of Defence and Urban Development had submitted a Cabinet Memorandum placing before the Cabinet of Minister the need to strengthen the legal framework of the Principal Enactment, in the following terms;

> "The corporation is responsible for the preservation of the retention areas, law lying, marshy, waste and swampy lands and canal reservations declared under the SLLR & DC Act. The corporation is facing legal issues when prosecuting the persons who carryout largescale un authorized filling of declared areas under the SLLR & DC Act and is hard pressed to stop these activities without having effective legal provisions."

The Cabinet paper thereafter proceeded to submit five areas that has to be strengthen and the said proposals are as follows;

1. Even though the Corporation has powers to take legal action against the unauthorized fillings and constructions within the declared areas under Section 2 (1) and 2 (b) of the Act No. 15 of 1968 as amended by the Act No. 35 of 2006, there is no provision in the existing Act for issuing of interim order by the competent court for the immediate stoppage of unauthorized fillings or development activities. Therefore, an amendment to the Section 2 (a) (5), 2 (b) (5) and 4 (a) (5) of the existing Act expected for issuance of interim order by the Magistrate Court for the immediate stoppage if unauthorized fillings or development activities on the facts of the first complaint to Courts.
2. Further the Chief Executive Officer of the Corporation should take every action to prevent unauthorized reclamations under Section 2 (a) (4) of the existing Act, and CEO may obtain the assistance of the Police where necessary. It is expected to incorporate provisions to the Section 2 (a), 2 (b) and 4 (b) to obtain greater assistance from the police in respect of persons carrying out an unauthorized activity and to give powers to the police in respect of persons carrying out the unauthorized filling and arrest them with their equipment and vehicles where unauthorized activity is taking and produce such persons and equipment before Magistrate's Court.

3. To consider offences stipulated under Section 2 (a) (3), 2 (b) (3), 4 (a) (3) and 20 (c) as cognizable offences and give power to the Magistrate Courts for hear and determination the case.
4. On conclusion of the case recover the damages as a fine by introducing a procedure with power to demolish construction and reinstate the land by unearthing to its original status and to charge the cost incurred and confiscate the relevant equipment and vehicles as deemed necessary.
5. In terms of Section 22 (a) of the existing Act, every person guilty of an offence under this Act for which no penalty is prescribed shall be liable to a fine not less than one hundred thousand rupees and not exceeding five hundred thousand rupees or to imprisonment for a period not exceeding one year and there is no provisions in the existing Act, that in which court such cause of action should hear and determine. Therefore, to overcome the procedural issues it is expected to incorporate provisions under Section 22 (a), to confer judicial powers to the Magistrate to take action regarding all offences.

The Cabinet of Ministers had approval the said memorandum at the Cabinet meeting held on 17th July 2014 and directed the legal draftsman to proceed with the drafting.

Once again, a Cabinet Memorandum was submitted before the Cabinet of Ministers by the then Ministers of Megapolis and Western Development emphasizing the need to strengthen the Principal Enactment having effective legal provisions. The said Cabinet Memorandum which was tabled before the Cabinet of Ministers at its meeting on 02.12.2015 contained identical proposals to the earlier Cabinet paper but had three new paragraphs recommending.

a) It is expected to incorporate provisions to enter into joint ventures/ partnerships and/or other commercial agreements with foreign or local companies or individuals directly, jointly or otherwise for conducting development projects within or out of Sri Lanka by utilizing the skilled labour/expert knowledge of the corporation endowed with experience and technical knowledge.
b) In terms of the prevailing Act, the board shall consist of three ex-officio members wiz; Directors of Irrigation, Director of Town and Country Planning and Commissioner for National Housing. It is proposed to incorporate provisions to appoint the line Ministry Secretory/ his representative in the place of the Commissioner for National Housing and Director General of

the National Physical Planning in the place of Director of Town and Country Planning as the said two posts are not functional.

c) Provisions have been laid down in the Act, regarding the powers vested in the Chief Executive Officer of the corporation in respect of the Seal of Corporation, prevention of unauthorized filling in the areas declared under the Act and prevention of the pollution of canals as well as taking action against the unauthorized activities/ constructions carried out in declared canal reservations.

As there is no interpretation to the word "Chief Executive Officer" in the Act, it is expected to define the post of General Manager of the Corporation as the "Chief Executive Officer"

The said Cabinet paper too was approved and the Cabinet decision was communicated to the relevant authorities for further steps by the secretory to the Cabinet including one copy to the "My/ National Policies and Economic Affairs"

Minister of Urban Development and Housing had submitted the draft Bill before the Cabinet, by Cabinet Memorandum dated 18th September 2020 along with the observations of the Minister of Justice and the Cabinet of Ministers at its meeting on 01st December 2020 approval was granted;

i) To publish the Sri Lanka Land Development Corporation (Amendment) Bill annexed to the Memorandum, in the Government Gazette; and

ii) To submit the said Bill referred to at (i) above, thereafter in Parliament for approval.

Sri Lanka Land Development Corporation as it is named at present, was originally established in 1968 as "Colombo District (Law-Lying Areas) Reclamation and Development Board under Act No. 15 of 1968. The said Act was amended on four occasions by Acts No. 27 of 1976, 52 of 1982, 35 of 2006 and 11 of 2019.

By amending Act 52 of 1982 the name of "Colombo District (Low Lying Areas) Reclamation and Development Board" was changed as "Sri Lanka Land Reclamation and Development Corporation" and the existing Board was converted to a Corporation.

By Section 2 of the amending Act 35 of 2006, the Long Title of the Principal Enactment was repealed and replaced to read as follows;

"AN ACT TO PROVIDE FOR THE ESTABLISHMENT OF A CORPOTATION, TO BE KNOWN AS THE SRILANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION FOR THE DEVELOPMENT

AND RECLAMATION IN ACCORDANCE WITH THE NATIONAL POLICY RELATING TO LAND RECLAMATION AND DEVELOPMENT OF SUCH AREAS AS MAY BE DECLARED BY ORDER OF THE MINISTER; FOR SUCH CORPORATION TO UNDERTAKE CONSTRUCTION WORK AND CONSULTANCY ASSIGNMENTS IN THE FIELD OF ENGINEERING; AND FOR MATTERS CONNECTED THEREWITH OR INCIDENTAL THERETO."

Even though the long title of the principal enactment was amended only to change the name of the corporation as, Sri Lanka Land Development Corporation by the amending Act 11 of 2019, the long title of the principal enactment remained unchanged.

Accordingly, it is clear that, since the amendment introduced to the principal enactment by amending Act 35 of 2006, it was the function of the Corporation to implement the National Policy of Land Reclamation and Development of the Areas identified by the Act.

In the said circumstances it is clear that the main objective of the Bill is to give effect to the National Policy on Land Reclamation and Development, where the Cabinet of Ministers in three successive Cabinets since 2014, had observed the need to strengthen the principal enactment in order to "empower the Sri Lanka Land Development Corporation to demolish unauthorized developments and to reinstate the land by unearthing the land to the original status, to empower the Magistrate's Courts to take action regarding all offences stipulated under the Sri Lanka Land Development Corporation Act" (Principal Enactment) and "to obtain greater assistance from the Police in respect of persons carrying out an unauthorized activity and give powers to arrest them with their equipment and vehicles where unauthorized activity is taking place."

When the principal Enactment was amended in 2006 to entrust the implementation of the National Policy on Land Reclamation and Development, to the Corporation, "undertake construction work and consultancy assignments in the field of Engineering" was also identified as part of the implementations of the National Policy.

However, no detailed provisions were made at the time the amendment was introduced but, when the Government Policy on Land Reclamation and Development was once again considered before the Cabinet in the year 2015, the said requirement was also included into the Cabinet Paper and obtained approval to include those requirements in to the Bill.

of the Bill does not fall within the subjects of Land, Land Development, Irrigation and/or Local Government as submitted by the Petitioner.

For the aforesaid reasons we are of the view that the provisions of the Bill are not inconsistent with any provisions of the Constitution.

Thus, we do hereby make determination in terms of Article 121 (3) of the Constitution, that the Sri Lanka Land Development Corporation (Amendment) Bill which is impugned by the Petitioner, is not inconsistent with any provisions of the Constitution and as such may be passed by parliament by a simple majority of members present and voting.

We place on record our deep appreciation of the assistance given by the learned Counsel for the Petitioner and learned Counsel who appeared on behalf of the Hon. Attorney General.

**Justice Vijith K. Malalgoda, PC,**
Judge of the Supreme Court

**Justice E.A.G.R. Amarasekara,**
Judge of the Supreme Court

**Justice Achala Wengappuli,**
Judge of the Supreme Court

## II

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව : සාමාජිකයකු නම් කිරීම

## அரசாங்க பொறுப்புமுயற்சிகள் பற்றிய குழு: உறுப்பினர் நியமனம்

## COMMITTEE ON PUBLIC ENTERPRISES: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රන්ජන් රාමනායක මහතාගේ මන්ත්‍රී ධුරය අහෝසි වීම හේතුවෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 127(3) හි විධිවිධාන ප්‍රකාරව, 2021 අප්‍රේල් 30 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

## පාර්ලිමේන්තුව තුළ කොවිඩ්-19 සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීම

## பாராளுமன்றத்தினுள் கொவிட் -19 சுகாதார வழிகாட்டுதல்களைப் பின்பற்றுதல்

## ADHERENCE TO COVID-19 HEALTH GUIDELINES IN PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2021.04.30 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී මේ වන විට දිවයිනේ උද්ගතව ඇති කොවිඩ්-19 වසංගත තත්ත්වය පිළිබඳව විශේෂ අවධානය යොමු වූ අතර, ඒ අනුව, පාර්ලිමේන්තුවට පැමිණීමේදී හා එහි රැඳී සිටීමේදී, මුඛ ආවරණ පැළඳීම, දෑත් පිරිසිදු කිරීම, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ඇතුළු සෞඛ්‍ය බලධාරීන් විසින් ප්‍රකාශයට පත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ තරයේ පිළිපදිමින් සහයෝගය ලබා දෙන ලෙසත්, පාර්ලිමේන්තුවෙන් පිටතදී කටයුතු කිරීමේදී ද, එම පිළිවෙත් අනුගමනය කරන ලෙසත් සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය, සෙසු හා අනුබද්ධිත කාර්ය මණ්ඩල, පාර්ලිමේන්තු මාධ්‍යවේදීන්, ආරක්ෂක අංශවලට අයත් කාර්ය මණ්ඩල ඇතුළු පාර්ලිමේන්තුවට පැමිණෙන සියලු දෙනා ද පාර්ලිමේන්තුවට පැමිණීමේදී හා එහි රැඳී සිටීමේදී මෙකී සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීමේ අත්‍යවශ්‍යතාව ද දැඩිව අවධාරණය කරමි.

## IV

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම

## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்

## MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2021 මැයි මස 04වන අඟහරුවාදා, එනම් අද දින පූර්ව භාග 11.30ට කාරක සභා කාමර අංක 02හිදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

- 2019 වර්ෂය සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;
- 2020 අංක 7 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය යටතේ 2021.03.01 සිට 2021.03.31 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය" මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන; සහ
- රේගු ආඥා පනතේ (235 අධිකාරය) 10(අ) වගන්තිය යටතේ ආනයන භාණ්ඩ සම්බන්ධ වරණීය හා සාමාන්‍ය තීරු බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 01 දිනැති අංක 2213/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.- [අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියම සහ නියෝග ඉදිරිපත් කරමි.

(i) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 21 දිනැති අංක 2202/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 14 දිනැති අංක 2206/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 16 දිනැති අංක 2206/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ]

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 18 දිනැති අංක 2211/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 11 දිනැති අංක 2214/58 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 6(2) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක 2214/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(x) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 05 දිනැති අංක 2217/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 23 දිනැති අංක 2220/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් 07 දිනැති අංක 2222/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියෝග සහ නියම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2017 වර්ෂයේ පැවති 106 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ නිර්දේශය;
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2019 වර්ෂයේ පැවති 108 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ නිර්දේශය; සහ
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 2019 වර්ෂයේ පැවති 108 වැනි සැසිවාරයේ දී පිළිගනු ලැබූ සම්මුතිය.- [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
( மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, 2018 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා ව්‍යවසායකත්ව, අලෙවිකරණ, මානව සම්පත් කළමනාකරණ, ව්‍යාපාර කළමනාකරණ, ගිණුම්කරණ සහ මූල්‍ය අධ්‍යයනාංශ පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/24 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශයක් පිහිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා (ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா - கடற்றொழில் அமைச்சர்)
(The Hon. Douglas Devananda - Minister of Fisheries)

கௌரவ சபாநாயகர் அவர்களே, 2019ஆம் ஆண்டுக்கான இலங்கை தேசிய நீரியல் வாழ் செய்கை அபிவிருத்தி அதிகாரசபையின் வருடாந்த அறிக்கையை நான் சமர்ப்பிக்கின்றேன்.

இவ்வறிக்கை, கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுவிற்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமென பிரேரிக்கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මහින්ද අමරවීර මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) ජනාධිපතිවරයාගේ අරමුදල පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව - 2018;

(iii) 2004 අංක 11 දරන මුදල් පනත යටතේ රෙගුලාසි;

(iv) 2018 අංක 35 දරන මුදල් පනත යටතේ නියෝගය; සහ

(v) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, රත්න, තිස්ස පාර, කහදාව, අංක 129 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. පේමචන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - காணி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Lands)
ගරු කථානායකතුමනි, මැදවච්චිය, රෝහල ඉදිරිපිට පාර, අංක 131/බී දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්.කේ. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රසන්න රණවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, මහනුවර, මුල්ගම්පොල, හීරැස්සගල, දෙවන පටුමඟ, අංක 71/35/1 දරන ස්ථානයේ පදිංචි එන්.කේ. සූරියබණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පන්නිපිටිය, ඇරැව්වල, රත්න මාවත, අංක 545/1 බී දරන ස්ථානයේ පදිංචි සී. අබේවික්‍රම මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතර, නාවිමන උතුර, සෝමාරාම පාර, අදිරප්පලයි වත්ත යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. චන්ද්‍රාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ගරු කථානායකතුමනි, රිදීගම, කටුපිලගොල්ල, "සිරි නිවස" යන ලිපිනයෙහි පදිංචි පී.ජී. සිරිල් ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොළඹගේආර, හල්මිල්ල ආර, 17 පාර, අංක 896/ඒ දරන ස්ථානයෙහි පදිංචි කේ.ඩබ්ලිව්. ගාමිණී කරුණානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කැලණිය, පිලපිටිය, ජයතිලක මාවත, අංක 112/2ඒ දරන ස්ථානයෙහි පදිංචි ආර්.ජේ.එච්. ජයසුන්දර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**
(மாண்புமிகு (மேஜர்) பிரதீப் உந்துகொட)
(The Hon. (Major) Pradeep Undugoda)
ගරු කථානායකතුමනි, ගම්පහ, අකරවිට, අංක 201 දරන ස්ථානයේ පදිංචි කේ. විජයගුණවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)
ගරු කථානායකතුමනි, බණ්ඩාරගම, ගුංගමුව, ගුණානන්ද මාවත, අංක 123ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. කපිල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පේරාදෙණිය, උඩපේරාදෙණිය, "තුෂාරගිරි", අංක 8 දරන ස්ථානයෙහි පදිංචි එම්. සිසිර විල්ෆ්‍රඩ් කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කිරිබත්කුඹුර, බුළුමුල්ල, අංක 185/බී දරන ස්ථානයෙහි පදිංචි ආර්.එච්.ඒ.එම්.ජේ.පී. කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)

ගරු කථානායකතුමනි, ගම්පහ, විජය පාර, අංක 96/1 දරන ස්ථානයෙහි පදිංචි පද්මා මාලනී මහගමාරච්චි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2021 අප්‍රේල් 30වන දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

අමාත්‍යාංශ නිවේදනය, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

## පරිසර ආරක්ෂණය සහ තිරසර කෘෂිකාර්මික සංවර්ධන ඉලක්ක පිළිබඳ කැබිනට් පත්‍රිකාව: පරිසර අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## சுற்றாடல் பாதுகாப்பு மற்றும் நிலைபேறான கமத்தொழில் அபிவிருத்தி இலக்கு தொடர்பான அமைச்சரவைப் பத்திரம்: சுற்றாடல் அமைச்சரினது கூற்று

## CABINET MEMORANDUM ON ENVIRONMENT PROTECTION AND SUSTAINABLE AGRICULTURAL DEVELOPMENT GOALS: STATEMENT BY MINISTER OF ENVIRONMENT

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, "අපේ රටේ පාරිසරික සුරක්ෂිතතාව හා තිරසර කෘෂිකාර්මික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් හරිත ආර්ථිකයක් කරා" යන තේමාව යටතේ අතිගරු ජනාධිපතිතුමා විශේෂ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එය මේ රටේ හැරවුම් ලක්ෂ්‍යයක් විධියට සැලකිය හැකියි. පරිසර අමාත්‍යවරයා වශයෙන් මා දැනටමත් අමාත්‍යාංශයේ සියලු නිලධාරින්ට උපදෙස් ලබා දී තිබෙන්නේ එහි අන්තර්ගත සියලු කරුණු පිළිබඳ අධ්‍යයනය කර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ කටයුතු සිදු කරන ලෙසයි.

මෙම ඉතාම වැදගත් කැබිනට් පත්‍රිකාව පිළිබඳ මේ පාර්ලිමේන්තුවේදී යම් අදහසක් ඉදිරිපත් කිරීමට මාහට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. ප්‍රශ්න දරා ගන්න පුළුවන් නම් හිනා වෙන්න වැඩි කාලයක් ගත වෙන්නේ නැහැ. මේක තමයි අපි දන්නා සත්‍යය.

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ අටවන කොටස වන 'තිරසාර පරිසර ප්‍රතිපත්තියක්' යටතේ සඳහන් වනවා, 'ජෛව ගෝලය කෘත්‍රිම වෙනස් කිරීමකට හෝ බලපෑමකට ලක් කිරීමෙන් පරිසරයේ සමබරතාව බිඳ වැටීම සැලකෙන්නේ පරිසර දූෂණයක් ලෙස ය." කියා. අනාගත පරපුරට සුරක්ෂිත පරිසර පද්ධතියක් තුළ ජීවත් වීමට ඇති අයිතිය ආරක්ෂා කොට සංරක්ෂණය කිරීම පමණක් නොව සමබර වූ සමාජ ආර්ථික පුරුදු ක්‍රියාවට නැංවීම ද අප අමාත්‍යාංශයේ වගකීමයි.

මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කරමින් අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉතා වැදගත් ප්‍රකාශයක් කරනු ලැබුවා. "මම මේ රටේ ජනාධිපති තනතුරට පත් කරන විට ජනතාව මගෙන් ඉල්ලා සිටියා, 'අපේ රටේ පරිසරය රැක දෙන්න' කියා. ඒ සඳහා ජනතාව විසින් මට වගකීම පැවරුවා. 'සෞභාග්‍යයේ දැක්ම' අනුව අපේ රටේ පරිසරය මෙන්ම කාබනික වගාව ප්‍රචලිත කරමින්, වස විසෙන් තොර ආහාර පාන අපේ රටේ ජනතාවට පරිභෝජනය සඳහා ලබා දීම අපේ වගකීමක්. එය ජනතාවට උරුම කර දීමට මම බැඳී සිටිනවා." යැයි ප්‍රකාශ කරමින් තමයි අතිගරු ජනාධිපතිතුමා මෙම ඉතාම වැදගත් කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ.

මෙම කැබිනට් පත්‍රිකාවේ යෝජනා 20ක් සඳහන් වෙලා තිබෙනවා. එයින් 13ක්ම පරිසරයට අදාළ වන යෝජනා බව මේ පාර්ලිමේන්තුවේ දැන ගැනීම සඳහා මා කියන්න කැමැතියි.

පසුගිය කාලය පුරාවට පරිසරයට සිදු වූ හානි සම්බන්ධයෙන් තමයි මාධ්‍යවලත්, මේ පාර්ලිමේන්තුවේත් ප්‍රකාශ ඉදිරිපත් වුණේ. පරිසරය ආරක්ෂා කිරීම සඳහා වන තිරසර වැඩ පිළිවෙළක් පිළිබඳව පරිසර අමාත්‍යවරයා විධියට මම වරින් වර යෝජනා ඉදිරිපත් කරමින්, අදාළ අය කැඳවමින් අදහස් ගණනාවක් අතිගරු ජනාධිපතිතුමන් වෙතත්, කැබිනට් මණ්ඩලය වෙතත් ඉදිරිපත් කළා. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා මේ සියලු කාරණා සැලකිල්ලට අරගෙන මේ රටේ පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා මෙතෙක් රාජ්‍ය නායකයෙක් ගත් ඉහළම තීන්දු ටික මේ කැබිනට් පත්‍රිකාව මගින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

මම මෙහි සඳහන් පළමුවැනි යෝජනාව ගැන සඳහන් කරන්න කැමැතියි. වන සනත්වය වැඩි කිරීම සඳහා රක්ෂිතවල පදිංචිකරුවන් වෙනත් ස්ථානවල පදිංචි කරවීම සඳහා එතුමා අවධානය යොමු කර තිබෙනවා. රජයේ ඉඩම්වල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල, වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පදිංචි ජනතාව, එම රක්ෂිත භූමිවලින් ඉවත් කර ඒ අයට සුදුසු වෙනත් ස්ථානවල නිවාස ලබා දීම පිළිබඳව වර්තමාන ජනාධිපතිතුමා කල්පනා කර තිබෙනවා. ඒ වාගේම, අංක දෙක විධියට තවත් යෝජනාවක් සඳහන් කර තිබෙනවා. ජාතික යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්වලදී පරිසර සංරක්ෂණය මුලින් සිදුකර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව එතුමා යෝජනා කළා. අපි සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීමේදී, පරිසරයට ඇති වන හානි පිළිබඳව කථා කරමින් ඉන්නවාට වඩා, එවැනි පරිසර හානියක් සිදු වන්නේද කියා සොයා බලා සංවර්ධන වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්න කියන උපදෙස් තමයි මෙයින් ලබා දෙන්නේ.

ඊළඟට, නාගරික නිවාස ගොඩනැගිලි ඉදිකිරීමේදී පරිසර හිතකාමී විධියට නිර්මාණය කිරීම අනිවාර්යය කර තිබෙනවා. ඒ වාගේම දැනටමත් තහනම් කර තිබෙන ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය අවම කිරීම තවදුරටත් කඩිනම් කරන්න කියලා උපදෙස් ලබා දීලා තිබෙනවා. මම පරිසර අමාත්‍යවරයා විධියට කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කළා, ප්ලාස්ටික් සහ පොලිතින් වර්ග කිහිපයක් තහනම් කිරීම පිළිබඳව. ඒ අනුව මාර්තු 31 වන දා වනවිට අපි වර්ග පහක් තහනම් කළා.

ඒ වාගේම තවත් එක් යෝජනාවක් ඉදිරිපත් කර, අනුමත කර ගත්තා. ඒ තමයි, ප්ලාස්ටික්වලින් ඇසුරුම් නිෂ්පාදනය කිරීමේදී ප්‍රතිචක්‍රීකරණ පහසුව සඳහා අදාළ සංකේත අංක සඳහන් කළ යුතුය කියලා. අපි දැනට ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන 05ක් මාර්තු 31වැනි දින සිට නැවැත්වූවත්, සමහර බහු ජාතික සමාගම් අපේ කනින් රිංගා ගිහින් වෙනත් කාර්යයන් කරන්න උත්සාහ දරන බව අපි දන්නවා, ගරු කථානායකතුමනි. හැබැයි, මේ බහු ජාතික සමාගම්වලට යට වෙන්න අපේ සූදානමක් නැති බවත් ඒ අයට අපි කියන්න කැමැතියි. අදාළ නියමවලට අනුකූලව කටයුතු නොකරන සියලුදෙනා, ඒ අය මොන තත්ත්වයක සිටියත්, මොන තරම් බලවත් වුණත්, ඒ අයගේ ආයතනවල නිෂ්පාදන තහනම් කිරීමට කටයුතු කරනවා. අවශ්‍ය වුණොත් බලපත්‍ර අවලංගු කිරීම දක්වාම කටයුතු කරන බව මේ අවස්ථාවේ මා සඳහන් කරන්න කැමැතියි. ඒ එක්කම, අපි දේශීය නිෂ්පාදකයන්ට ආරාධනා කරනවා, අපට අවශ්‍ය සබන්, අපට අවශ්‍ය ෂැම්පූ සහ අපට අවශ්‍ය දත් බෙහෙත් ටික මේ රටේ නිෂ්පාදනය කර ගන්න වැඩ පිළිවෙළක් හදන්න කියලා. අනාගතයේදී මේවා නිෂ්පාදනයට බහු ජාතික සමාගම්වලට ඉඩ දෙන්න අපි සූදානමක් නැති බවත් මා සඳහන් කරන්න කැමැතියි.

ඊළඟට අතිගරු ජනාධිපතිතුමා සඳහන් කරනවා, වනජීවී සහ වන සංරක්ෂණයට අදාළ විශේෂ කරුණක් පිළිබඳව. ඒ තමයි විල්පත්තුව, හබරණ හා යාල ආදී ප්‍රදේශවලින් පැමිණෙන අලින් නිසා අනෙක් ප්‍රදේශවල මහ ජනතාවට සිදු වන හිරිහැර වැළැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිළිබඳව. ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. විපක්ෂ නායකතුමා කියා තිබෙනවා මම දැක්කා, එතුමාගේ රජයක් බලයට පත් වුණාට පස්සේ අලි ප්‍රශ්නයට විසඳුම් ලබා දෙනවා කියලා. ගරු කථානායකතුමනි, එතුමන්ලාගේ ආණ්ඩුවක් බලයට එනතෙක් ඉන්න ඕනෑ නැහැ. එතුමා කොයි කාලයේ ආණ්ඩු බලය ගනීද කියා දන්නේත් නැහැ. අපි තවත් රජයකට අලි මිනිස් ගැටුම පිළිබඳව කථා කරන්න ඉඩ නොතබා මේ ආණ්ඩු කාලය තුළදීම එයට ස්ථිර විසඳුමක් ලබා දීම සඳහා වෙනම අමාත්‍යාංශයක් පත් කරමින්, මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරමින්, නිශ්චිත විසඳුම් ලබා දෙන්න කටයුතු කරනවාය කියා මේ පාර්ලිමේන්තුවේදී මා සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අලි වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන අතිරේකව ලබා දෙන්නත් එතුමා යෝජනා කරලා තිබෙනවා. මීට අමතරව, පාසල් අධ්‍යාපන විෂය ක්ෂේත්‍ර හා බාහිර ක්‍රියාකාරකම්වලදී පරිසරය හා ජෛව විවිධත්වය මුල් කර ගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට එතුමා යෝජනා කරලා තිබෙනවා.

ඒ වාගේම, දුම් සහතිකය නිකුත් කිරීමේදී අය කරන මුදල්වලට අධිභාරයක් යොදමින් එය විධිමත් කිරීමට කටයුතු කරන යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම, ජාතික නිෂ්පාදන හා සේවා ගිණුම්ගත කිරීමේදී පරිසර සංවර්ධනය ගණනය කිරීම සඳහා සංඛ්‍යාලේඛන තොරතුරු පද්ධතිය පුළුල් කිරීමට යෝජනා කරලා තිබෙනවා. ඊළඟ යෝජනාව හැටියට, කැළි කසළ ඉවත් කිරීමේදී කැළි කසළ අමුද්‍රව්‍ය වශයෙන් යොදාගෙන කෙරෙන නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඒ වාගේම පරිසර හිතකාමී වැඩසටහන් ජනතාව තුළ පුළුල් කිරීම සඳහා ජනමාධ්‍ය දිරි ගැන්වීම, පරිසර පද්ධතිය බල ගැන්වෙන පරිදි ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම ආදී යෝජනා රාශියක් අපේ පරිසර පද්ධතිය සුවපත් කිරීම සඳහා, පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරලා තිබෙනවා.

මීට අතිරේකව, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කාබනික වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය යෝජනා රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම කෘමිනාශක භාවිතය අවම කරමින් අපට අවශ්‍ය ආහාර සෞඛ්‍ය සම්පන්න විධියට ලබා ගන්නට අවශ්‍ය යෝජනා එතුමා මෙම වැඩසටහන තුළ ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වන විටත් පරිසර අමාත්‍යාංශය වැඩසටහන් රාශියක් ආරම්භ කර තිබෙන බව මම කියන්නට කැමැතියි, ගරු කථානායකතුමනි. එතුමා මීට පෙර වරින් වර ලබා දුන් උපදෙස් අනුව අපි ඒ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අපි ආරම්භ කරපු එක වැඩසටහනක් තමයි පාසල් මට්ටමින් ක්‍රියාත්මක "සොබා අමා" කියන වැඩසටහන යටතේ පැළ රෝපණය කිරීම. අපි ආරම්භ කර තිබෙන ප්‍රධාන වැඩසටහනක් තමයි "හුස්ම දෙන තුරු" වැඩසටහන. එය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි ආරම්භ කළා. එහිදී අපි දැනට පැළ 127,000ක් ගස් බවට පරිවර්තනය කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. රජයේ මුදල් ශත පහක්වත් යොදා ගන්නේ නැතිව මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තමයි වැදගත් වෙන්නේ. ඒ සඳහා පරිසරයට ආදරය කරන පෞද්ගලික අංශයේ ආයතන රාශියක් අපට උදවු උපකාර කරලා තිබෙනවා. ඒ සියලුදෙනාට ස්තුති කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, ආගමික ස්ථාන මුල් කර ගනිමින් ඔසු වන නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා, මේ වන විට එහි 99වන වැඩසටහනත් අපි අවසන් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, එහි 100වන වැඩසටහන ඔබතුමාගේ දිස්ත්‍රික්කය වන මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට තමයි අපි දැනට සැලසුම් කරලා තිබෙන්නේ.

අපි සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන්, "නැකතට පැළයක්" වැඩසටහන ආරම්භ කළා. ඒ සඳහා අපි රාජ්‍ය මුදල් භාවිත කළේ නැහැ. එම වැඩසටහන තුළින් අපි බලාපොරොත්තු වුණු ඉලක්කයටම මේ රට තුළ පැළ මිලියන 2කට ආසන්න ප්‍රමාණයක් රෝපණය කරගන්න පුළුවන් වුණා. ඒ සඳහා අපට උදවු උපකාර කළ පෞද්ගලික අංශයටත්, විශේෂයෙන්ම ඒ ගැන පුළුල් ප්‍රචාරයක් ලබාදුන් ජනමාධ්‍යයටත් මේ අවස්ථාවේදී ගෞරවය හිමි කරන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යාංශය ක්‍රියාත්මක කරන ප්‍රධාන වැඩසටහනක් තමයි "සුරකිමු ගංගා" වැඩසටහන. මේ රටේ ගංගා 103ක් තිබෙනවා. එම ගංගා 103ම පිරිසිදු කිරීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට අතීතය මතක ඇති. ඔබතුමා කුඩා කාලයේ මේ ඕනෑම ගඟකින් වතුර අරගෙන බොන්න පුළුවන් තත්ත්වයක් තිබුණා; ඕනෑම ඇළකින් වතුර අරගෙන බොන්න පුළුවන් තත්ත්වයක් තිබුණා. අපි කුඩා කාලයේ මිනිස්සු කුඹුරට යනකොට වතුර බෝතලයක් අරගෙන ගියේ නැහැ, කෑම විතරයි අරගෙන ගියේ. වක්කඩේ වතුර ටික අරගෙන බීලා තමයි මිනිසුන් පිපාසය සංසිඳවා ගත්තේ. ඒ තරම් පිරිසිදු ජලය තමයි තිබුණේ. නමුත්, අද වන විට ඒ ජලය දූෂණය වෙලා. අද වෙනකොට ඒවායේ ජලය බොන්න තියා වෙනත් දෙයකටවත් පාවිච්චි කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අපේ බලාපොරොත්තුව තමයි, ඉදිරි අවුරුදු 3 ඇතුළත සියලු ගංගා පිරිසිදු කරලා ඕනෑම ගංගාවකින් පිරිසිදු ජලය ලබා ගන්න පුළුවන් මට්ටමක් නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපේ රටේ වසරකට ප්ලාස්ටික් හා පොලිතින් මෙට්‍රික්ටොන් 136,000ක් පාවිච්චි කරනවා. ඒවායින් මෙට්‍රික්ටොන් 12,000ක්, 12,100ක් වාගේ ප්‍රමාණයක් තමයි ප්‍රතිචක්‍රීකරණය කරන්නේ. අනෙක් සියල්ලම පරිසරයට එකතු වෙනවා. අපි භාවිත කරන ප්ලාස්ටික් සහ පොලිතින්වලින් සියයට 7.1ක් හැරුණාම ඉතිරි සියලු ප්ලාස්ටික් සහ පොලිතින් අපේ පරිසරයට එකතු වෙනවා. ඒ තුළින් දැවැන්ත පරිසර විනාශයක් වෙනවා. අවුරුදු 100ක් ගියත් ඒවා දිරන්නේ නැති බව ඔබතුමා හොඳටම දන්නවා.

[ගරු මහින්ද අමරවීර මහතා]

ඒ නිසාම අපි දැන් ප්ලාස්ටික් හා පොලිතින් පාවිච්චිය අධෛර්යය කිරීම සඳහා -පාවිච්චිය අවම කිරීම සඳහා- ගැසට් පත්‍රයක් නිකුත් කිරීමට අවශ්‍ය කැබිනට් පත්‍රිකාවක් සකස් කරලා තිබෙනවා. පෞද්ගලික අංශයේ සහයෝගය ලබා ගනිමින් කාබන් පැන් සහ දත් බුරුසු එකතු කිරීම සඳහා වෙනම බහලුම් ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි දැනටමත් ක්‍රියාත්මක කරලා තිබෙනවා. මේ වනවිට එවැනි බහලුම් 800ක් ලබා දීලා තිබෙනවා. ලබන අවුරුද්ද වනවිට එම බහලුම් ප්‍රමාණය 7,000 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් රාජ්‍ය මුදල් භාවිත කරන්න අපේ බලාපොරොත්තුවක් නැහැ කියන කාරණයත් අපි මේ අවස්ථාවේදී කියනවා. පාසල්වලින් විතරක් දවසකට කාබන් පැන් කිලෝග්‍රෑම් 80කට වැඩි ප්‍රමාණයක් පරිසරයට එකතු වන බව මම ඔබතුමාට සඳහන් කරන්න කැමතියි, ගරු කථානායකතුමනි. ඒ සම්බන්ධයෙන් මම මීට වඩා දීර්ඝව කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පරිසරය ආරක්ෂා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ මෙම කැබිනට් පත්‍රිකාවේ සඳහන් කරුණු සාර්ථක කර ගැනීම සඳහා දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව සියලුදෙනා එකතුවෙලා, පරිසරය සුරක්ෂිත කරලා, අනාගත දරු පරපුරට හොඳ පරිසර පද්ධතියක් ලබාදීමට කැප වෙන්න කියලා මේ අවස්ථාවේ ඔබතුමාගෙන් සහ මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින්, මට කථා කරන්න කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு அலுவல்கள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. පූ.භා. 11.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත: නියෝගය
## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சட்டம்: கட்டளை
## SRI LANKA EXPORT DEVELOPMENT ACT: ORDER

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 12 දිනැති අංක 2210/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## සුරාබදු ආඥාපනත: නිවේදනය
## மதுவரிக் கட்டளைச் சட்டம்: அறிவித்தல்
## EXCISE ORDINANCE: NOTIFICATION

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22(1) වගන්තිය යටතේ බෝතල් කරන ලද රා සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා අපේ පැත්තත් පොඩ්ඩක් බලන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා යෝජනාව ඉදිරිපත් කරද්දී තමයි ඔබතුමා නැඟී සිටියේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. අපි ඒ යෝජනාවලට විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මතු කරන කාරණය මොකක්ද කියන්න, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, විවාදයක් නැතිව මේ නියෝග සහ නිවේදන සම්මත කරන්න පක්ෂ නායක රැස්වීමේදී අපි එකඟ වුණා. ඒකෙන් අදහස් කරන්නේ නැහැ, අපි මේවාට පක්ෂයි කියලා. ඒ ගැන විවාදයක් නැහැ. නමුත් මම ඔබතුමාට කිව්වා, අපේ මතය ප්‍රකාශ කිරීම සඳහා ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට විනාඩි දහයක කාලයක් ලබා දෙන්න කියලා. ඔබතුමා මට ඒක කියන්න දෙන්නේ නැහැ. පක්ෂ නායක රැස්වීමේදී එකඟ වුණේ, මේ නියෝග සහ නිවේදන විවාදයක් නැතිව සම්මත කරන්නයි. අපි මේවාට පක්ෂයි කිව්වේ නැහැ. අපි මේවාට විරුද්ධයි. නමුත්, අපේ මතය ප්‍රකාශ කරන්න ඉඩ ලබා දෙන්න ඕනෑ. ඔබතුමා මට mike එක දෙන්නේත් නැහැනේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා ඉදිරිපත් කළාට පස්සේ ඒ කටයුතු කරමු.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
දෙවැනි කාරණය මෙයයි. ගරු මහින්ද අමරවීර මැතිතුමා ඉදිරිපත් කළ ප්‍රකාශය සම්බන්ධයෙන් අපට විවාදයක් ඕනෑ.

තුන්වැනි කාරණය මේකයි. ඔබතුමා කිව්වා, ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා අද පාර්ලිමේන්තුවට ගෙන්වනවා කියලා.

නමුත්, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ බිරිඳ කථා කරලා ඇහුවාම කිව්වා ලු, ඔබතුමා ඒ සඳහා අවසර දීලා නැහැ කියලා. චෛත්‍යධාරිතුමාගේ ලියුමට විතරක් එතුමා පාර්ලිමේන්තුවට ගෙන්වන්න බැහැ කිව්වා ලු. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අත්සන තිබෙන්න ඕනෑය කියලා තිබෙනවා. ඔබතුමා මේ ගැන සොයා බලා දුරකථනයෙන් හෝ කථා කර එතුමා පාර්ලිමේන්තුවට ගෙන්වන්න. ඔබතුමා පක්ෂ නායක රැස්වීමේදී ඒක පොරොන්දු වුණා නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන හොයලා බලන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ඒක පොරොන්දු වුණා. අපි ඔබතුමාට දොස් කියන්නේ නැහැ. නමුත්, එතුමා ගෙන්වන්න ඔබතුමාගේ අත්සන ඕනෑ ලු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීට කලින් නම් එහෙම අවශ්‍යතාවක් තිබුණේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, හෙට දිනයේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත ගැන විවාද කරන්නේ නැත්නම්, අද පැවැත්වෙන විවාදය හෙටත් - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන කථා කරන්න අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවා තිබෙනවා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක දැන් කිව්වේ නැත්නම් ඔබතුමා කියනවා නේ, දැනුම් දුන්නේ නැහැ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පක්ෂ නායක රැස්වීමේදී කථා කරලා ඒ ගැන තීන්දුවක් ගනිමු. දැන් මට ඒ ගැන තීන්දු කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඉල්ලීමක් කරනවා හෙටත් මේ විවාදය ගන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක පක්ෂ නායක රැස්වීමේදී කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අද උදේ පාන්දරම කරපු කථාවට ප්‍රචාරයක් ලැබුණා නේ. මම අද දින න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1 සහ 2 යෝජනා ඉදිරිපත් කළා. ගරු සභාව ඒවා අනුමත කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා දැන් ඉතිරි යෝජනා ටික ඉදිරිපත් කරන්න.

## II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.
(අංක 04/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ගැන අපේ විරුද්ධත්වය සටහන් කර ගන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සටහන් කර ගත්තා.

## III

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 4 සහ 12 වගන්ති යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 07 දිනැති අංක 2209/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 05/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ විරුද්ධත්වය සටහන් කර ගන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සටහන් කර ගත්තා.

## IV

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය, මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 11 දිනැති අංක 2210/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 06/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ විරුද්ධත්වය සටහන් කර ගන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සටහන් කර ගත්තා.

## එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
## VALUE ADDED TAX (AMENDMENT) BILL

*දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 7වන වගන්තිය සංශෝධනය කිරීම)
## வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 4.- (*Amendment of section 7 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "2 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අපනයනය කිරීම සිදුව ඇති බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ";

(2) "2 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සැපයුම සිදු කරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාල සීමාවක් ඇතුළත' ";

(3) "2 වන පිටුවේ, 19 වෙනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ආ) (iiඅ) වන අනුඡේදයේ, 'ප්‍රති අපනයන කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩ;' යන වචන වෙනුවට 'ප්‍රති අපනයන කාර්යය සඳහා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද යම් භාණ්ඩ සඳහා වන ගෙවීම එම සේවා සැපයුම සිදු කරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැබී ඇති එම භාණ්ඩ;' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;' "

(4) "2 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සේවා සැපයුම සිදු කරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ";

(5) "2 වන පිටුවේ, 26 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ඇ) (v) වන අනුඡේදයේ 'බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන' යන වචනය වෙනුවට 'එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) (vi) වන අනු ඡේදයේ 'බැංකුවක මාර්ගයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබෙන' යන වචන වෙනුවට 'අන්තර්ජාලය සේවා සැපයුම සිදු කරන ලද බදු අය කළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඊ) (vii) වන අනුඡේදයේ 'විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් මාර්ගයෙන් ගෙවීම් ලැබෙන්නා වූ' යන වචන වෙනුවට 'එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් තත් කාර්ය සඳහා ගෙවීම් ලැබෙන්නා වූ' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) (ඇ) වන අනුඡේදයේ 'විදේශීය ව්‍යවහාර මුදලින්, ශ්‍රී ලංකාවේ බැංකුවක් මාර්ගයෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්,' යන වචන වෙනුවට 'එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාවට පිටතින් ලැබී ඇත්නම්,' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:

'(3) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් වන ගාස්තුව අවස්ථාවෝචිත පරිදි, එම අපනයනය සිදු කරන ලද හෝ එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලකින් නොලැබීම නොතකා, එම භාණ්ඩ අපනයනය කරනු ලබන බවට හෝ එම සේවාවන් ඉටු කරනු ලබන බවට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය එම භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 4, as amended, ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
## வாசகம் 6. - (முதன்மைச் சட்டவாக்கத்தின் 12ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 6.- (*Replacement of section 12 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) මේ වගන්තිය යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු-

(අ) ඔහුගේ බදු අයකළ හැකි සැපයුම් 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් බදු අයකළ හැකි සැපයුම්වල මුළු වටිනාකම ඉක්මවන්නේ නම් මිස; හෝ

(ආ) ඔහුගේ මුළු සැපයුම් අපනයනය කර තිබෙන බවට කොමසාරිස්-ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි ඔප්පු කරනු ලබන අපනයනකරුවකු වන්නේ නම් මිස; හෝ

(ඇ) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ කාර්යය සඳහා කොමසාරිස්-ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි ලියාපදිංචි හඳුනාගත් සැපයුම්කරුවකු ලෙස එම යෝජනා ක්‍රමය සඳහා ලියාපදිංචි වීමට කැමති තැනැත්තකු වන්නේ නම් මිස,

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]

කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය කරනු ලබන සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමයේ ලියාපදිංචිවීමට සුදුසුකම් නොලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 22ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 7.- (*Amendment of section 22 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"6 වන පිටුවේ, 11වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) (6) වන උපවගන්තියේ (v) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්;

'(vi) 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති භාණ්ඩ හෝ සේවා සැපයුම සම්බන්ධයෙන් වන ගාස්තුව, අවස්ථාවෝචිත පරිදි, එම අපනයනය සිදු කරන ලද හෝ එම සේවා සැපයුම සිදු කරන ලද බදු අයකළ හැකි කාලසීමාව අවසානයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලකින් ලැබී නොමැති නම්.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7, as amended, ordered to stand part of the Bill.*

## 8 වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම)

### வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான முதலாம் அட்டவணையைத் திருத்துதல்.)

CLAUSE 8.- (*Amendment of the First Schedule to the principal enactment.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"8 වන පිටුවේ, 8 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ක) මේ (සංශෝධන) පනත ආරම්භ වන දින සිට ක්‍රියාත්මක වන' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8, as amended, ordered to stand part of the Bill.*

***9 සහ 10 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*9ஆம், 10ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 9 and 10 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත

### உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்

INLAND REVENUE (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය.:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]*
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [ மாண்புமிகு தினேஷ் குணவர்தன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. Dinesh Gunawardena.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 සිට 5 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 5ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 11ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 6.- (*Amendment of section 11 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "2 වන පිටුවේ, 28 වන පේළිය සහ 29 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'ලද ණය වෙනුවෙන් මූල්‍ය ආයතනය විසින් දරන ලද අරමුදල්වල පිරිවැය, ඒ මූල්‍ය ආයතනය විසින් ආදායම' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 7 to 17 ordered to stand part of the Bill.*

## 18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்தின் 62ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 18 .- (*Amendment of section 62 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "10 වන පිටුවේ, 1 වන පේළිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'එසේ වුව ද, නිර්වාසික තැනැත්තකු විසින් 2021 අප්‍රේල් මස' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 18, as amended, ordered to stand part of the Bill.*

***19 සිට 21 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகத்திலிருந்து 21ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 19 to 21 ordered to stand part of the Bill.*

## 22 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 22.- (முதன்மைச் சட்டவாக்கத்தின் 75ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 22.- (*Amendment of section 75 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "13 වන පිටුවේ, 3 වන පේළිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> '(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ, 'ද්විත්ව බදුකරණ' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***22 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*22ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 22, as amended, ordered to stand part of the Bill.*

***23 සිට 39 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*23ஆம் வாசகத்திலிருந்து 39ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 23 to 39 ordered to stand part of the Bill.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

## 40 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම)

## வாசகம் 40.- (முதன்மைச் சட்டவாக்கத்தின் 126ஆம் பிரிவினைத் திருத்துதல்)

CLAUSE 40.- (*Amendment of section 126 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"24 වන පිටුවේ, 20 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:

'(5) අනුමත ගණකාධිකාරිවරයකු ඇතුළුව යම් තැනැත්තකු විසින් ගෙවීමක් සඳහා බදු වාර්තාවක් හෝ බදු වාර්තාවක කොටසක් සකස් කරනු ලැබූ අවස්ථාවක දී එම තැනැත්තා විසින් එම බදු වාර්තාව සකස් කිරීමේ දී ඔහු සම්බන්ධ වූ ප්‍රමාණය නිශ්චිතව දක්වමින් වෙන් වෙන් වශයෙන් සහතික කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් පරීක්ෂා කරන ලද ලේඛන සහ ඔහු විසින් පාදක කරගත් තොරතුරු නිශ්චිතව දැක්විය යුතු ය. එම සහතික කිරීම බදු වාර්තාව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එකී සහතික කිරීම එකී බදු වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***40 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*40ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 40, as amended, ordered to stand part of the Bill.*

***41 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*41ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 41 ordered to stand part of the Bill.*

## 42 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම)

## வாசகம் 42.- (முதன்மைச் சட்டவாக்கத்தின் 139ஆம் பிரிவினைத் திருத்துதல்)

CLAUSE 42.- (*Amendment of section 139 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"25 වන පිටුවේ, 24 වන පේළිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය සහ ඒ තීරණය සඳහා හේතු බදු ගෙවන්නා වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***42 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*42ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 42, as amended, ordered to stand part of the Bill.*

***43 සිට 46 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*43ஆம் வாசகத்திலிருந்து 46ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 43 to 46 ordered to stand part of the Bill.*

## 47 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 190අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම)

## வாசகம் 47.- (முதன்மைச் சட்டவாக்கத்தின் 190அ என்னும் புதிய பிரிவினை உட்புகுத்துதல்)

CLAUSE 47.- (*Insertion of new section 190A of the principal enactment.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "28 වන පිටුවේ 8 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙකම ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වංචනික ලෙස සකස් කරන ලද හෝ සහතික කරන ලද ලේඛන සඳහා වන දණ්ඩන විධිවිධාන

'190අ. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා වන-

(අ) යම් ලේඛනයක් හෝ තොරතුරක් වංචනිකව සකස් කරනු ලබන; හෝ
(ආ) ලේඛනයක් වංචනිකව සහතික කරනු ලබන,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේ දී, රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.' " ;

(2) "29 වන පිටුවේ 1 වන පේළියේ සිට 5 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කරන්න; "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***47 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*47ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 47, as amended, ordered to stand part of the Bill.*

## 48 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම)
## வாசகம் 48.- (முதன்மைச் சட்டவாக்கத்தின் 195ஆம் பிரிவினைத் திருத்துதல்)
CLAUSE 48.- (*Amendment of section 195 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"31 වන පිටුවේ, 6 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙකම ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(6) ඒ වගන්තියේ 'සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය' යන යෙදුමේ අර්ථ නිරූපනයේ-

(අ) ඒ අර්ථ නිරූපනයේ (ආ) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:

'(ආ) (ඇ) වන ඡේදයට යටත්ව, ඒ තැනැත්තාට අස්ථිත්වයක් වන ආශ්‍රිතයකු නොමැති වීම;'

(ආ) ඒ අර්ථ නිරූපනයේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:

(ඇ) ආශ්‍රිතයා අස්ථිත්වයක් හෝ අස්ථිත්ව වන්නේ නම්, එම තැනැත්තාගේ හෝ ඔහුගේ ආශ්‍රිතයාගේ සමස්ත දළ වාර්ෂික පිරිවැටුම රුපියල් 500,000,000කට අඩු වීම;' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***48 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*48ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 48, as amended, ordered to stand part of the Bill.*

***49 සහ 50 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*49ஆம், 50ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 49 and 50 ordered to stand part of the Bill.*

## 51 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම)
## வாசகம் 51.- (முதன்மைச் சட்டவாக்கத்தின் முதலாம் அட்டவணையைத் திருத்துதல்)
CLAUSE 51.- (*Amendment of the First Schedule to the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "36 වන පිටුවේ, 6 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ද, යම් පුද්ගලයකුගේ පහත දැක්වෙන ලැබීම් සහ ලාභ මත 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 14% ක උපරිම අනුප්‍රමාණය අනුව බදු අය කරනු ලැබිය යුතු ය:

(අ) මැණික් සහ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව;

(ආ) යම් පුද්ගලයකු විසින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කරමින් නිපදවන ලද විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සැපයීම මත ලැබුණු මුදල් ප්‍රමාණ' ";

(2) "39 වන පිටුවේ, 27 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(ඕ) 2021 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, සමාගමක් විසින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කරමින් නිපදවන ලද විදුලිය ජාතික විදුලිබල පද්ධතියට සැපයීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 14%' ";

(3) "42 වන පිටුවේ, 5 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ම ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ '28% ක් විය යුතු ය.' යන වචන සහ ඉලක්කම් වෙනුවට '2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක් විය යුතු ය.' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***51 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*51ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 51, as amended, ordered to stand part of the Bill.*

***52 සිට 54 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*52ஆம் வாசகத்திலிருந்து 54ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 52 to 54 ordered to stand part of the Bill.*

## 55 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම)
## வாசகம் 55.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான ஐந்தாம் அட்டவணையைத் திருத்துதல்)
CLAUSE 55.- (*Amendment of the Fifth Schedule to the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "58 වන පිටුවේ, 10 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'එසේ වුවද, මේ උපඡේදය යටතේ වූ අඩු කිරීම තක්සේරු වර්ෂයේ' " ;

(2) "59 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යුතු අතර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***55* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

*55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 55, as amended, ordered to stand part of the Bill.*

***56* සිට *61* තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

*56ஆம் வாசகத்திலிருந்து 61ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 56 to 61 ordered to stand part of the Bill.*

## 'අ' වගුව
### பட்டியல் 'அ'
*Table 'A'*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"66 වන පිටුවේ, 'අ' වගුවේ 25 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | |
|---|---|
| '51(4)(ඇ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) උපඡේදයේ (ඔ), (ඕ) සහ (ඕඕ) යන අයිතම' " |

**සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***'අ' වගුව, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*பட்டியல் 'அ' திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Table 'A', as amended, ordered to stand part of the Bill.*

## 'ආ' වගුව
### பட்டியல் 'ஆ'
*Table 'B'*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "68 වන පිටුවේ, 'ආ' වගුවේ 18 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | | |
|---|---|---|
| '26 | 83 | 01.01.2020' " |

(2) "70 වන පිටුවේ, 'ආ' වගුවේ 3 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | | |
|---|---|---|
| '51(4)(ඇ) | පළමුවන උපලේඛනයේ 4 වන ඡේදයේ (2අ) වන උපඡේදය ((ඔ), (ඕ) සහ (ඕඕ) යන අයිතම හැර) | 01.01.2020' " |

(3) "71 වන පිටුවේ, 'ආ' වගුවේ 13 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | | |
|---|---|---|
| '56(4) | හයවන උපලේඛනයේ 4 වන ඡේදය | 01.03.2020' " |

**සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***'ආ' වගුව, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*பட்டியல் 'ஆ' திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Table 'B', as amended, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ, නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Sir, I rise to point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්, ගරු මන්ත්‍රීතුමා?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, විවාදයකට ඉඩ දෙන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

No, I just want to say this.

ගරු කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 29 යටතේයි මේ ප්‍රශ්නය අහන්නේ. ගරු කථානායකතුමනි, 2021.04.05වන දා ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ගැසට් එකක් තිබෙනවා. 2222/13 තමයි, ඒ ගැසට් එකේ අංකය. මා ළඟ තිබෙන්නේ එහි ඉංග්‍රීසි පිටපත. එහි තිබෙන්නේ කටු පොල් ආනයන නැවැත්වීම පිළිබඳව. ඒ වාගේම ගරු කථානායකතුමනි, තව ගැසට් එකක් තිබෙනවා, ඒක නිකුත් කර තිබෙන්නේත් අප්‍රේල් මාසයේ 05වන සඳුදායි. ඒකත් එදිනමයි නිකුත් කර තිබෙන්නේ. එහි අංකයත් 2222/13. ඒකත් කලින් කී අංකයමයි.

හැබැයි, ඒ ගැසට් එක කලින් ගැසට් එකට වඩා වෙනස්. දෙවැනි ගැසට් එකේ තිබෙනවා, කටුපොල් ආනයනය තහනම් කිරීමට අමතරව වගා කර තිබෙන කටුපොල් ගස් ගලවන්නට ඕනෑ කියලා. ගරු කථානායකතුමනි, මේක palm oil පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මේ ගරු පාර්ලිමේන්තුවෙන් තමයි නීති සම්පාදනය කරන්නේ.

ගරු කථානායකතුමනි, 2021 අප්‍රේල් මාසයේ 05වන දින, 2222/13 දරන අංකය යටතේ නිකුත් කරන ලද ගැසට් නිවේදන දෙකක් තිබෙනවා. මේ අවස්ථාවේ දී මා එම ගැසට් නිවේදන දෙක **සභාගත*** කරනවා.

එකම අංකය යටතේ, එක දවසේ නිකුත් කළ ගැසට් නිවේදන දෙකක් ඇතුළේ තිබෙන කාරණා වෙනස් වෙන්නේ කොහොමද? කවුද මේක කළේ? මේක ජනාධිපතිවරයා වෙනුවෙන් ජනාධිපති ලේකම්වරයා නිකුත් කළ ගැසට් එකක්. ජනාධිපතිවරයා මේක වෙනස් කළේ නැත්නම් කවුද මේක වෙනස් කළේ? මේ විධියට ගැසට් වෙනස් කරන්න අයිතියක් තිබෙන්නේ කාටද? ගරු කථානායකතුමනි, මේ විධියට කවුරුන් හෝ ගැසට් එකේ අඩංගු කාරණා වෙනස් කළා නම් ඒක ලොකු වැරැද්දක් කියලා තමයි මම දකින්නේ. ඒ විධියට ගැසට් එකක කාරණා වෙනස් කිරීම මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වාගේම, රටේ පුරවැසියකු හැටියට මට මේක ලොකු ප්‍රශ්නයක්. මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, වහාම මේ සම්බන්ධයෙන් සොයා බලා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කොහොමද, කවුද මේ ක්‍රියාවට සම්බන්ධ වුණේ කියලා. ඉන් පසුව මේ දෙකෙන් නිවැරදි නියෝගය ඇතුළත් කරලා අලුත් ගැසට් එකක් ගහන්න වෙයි. මොකද එකම අංකය යටතේ ගැසට් දෙකක් තිබෙන්න බැහැ නේ.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා, ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා කිව්වා නේ. දැන් කියන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද මේ පිළිබඳව විවාදයක් නැති වුණත්, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු රා කර්මාන්තයට අදාළ 2209/42, 2209/43 සහ 2209/44 කියන ගැසට් නිවේදන සම්බන්ධව අපේ විරෝධතාව ප්‍රකාශ කළා. සාම්ප්‍රදායික රා නිෂ්පාදනය කරන අය පිළිබඳව නොවෙයි අපේ

ප්‍රශ්නය තිබෙන්නේ. සුරාබදු ආඥා පනත අනුව සාම්ප්‍රදායික ප්‍රමිතියක් සහිත රා පිළිබඳව ඉතා පැහැදිලිව අර්ථ දක්වා තිබෙනවා. පොල්, තල් එහෙම නැත්නම් කිතුල්, එහෙමත් නැත්නම් වෙනයම් තාල වර්ගයේ ගසකින් ගත්ත පැසවන ලද හෝ නොපැසවන ලද ක්ෂාරය තමයි රා යනුවෙන් හඳුන්වන්නේ. නමුත්, ඒ පිළිබඳව නොවෙයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

අද මේ ඉදිරිපත් කරලා තිබෙන එක ගැසට් නිවේදනයකින් බද්ද රුපියල් 50 සිට 25 දක්වා අඩු කරන්නත්, අනෙක් නිවේදනයෙන් අළෙවි කිරීමේදී ලීටර් 1.5කට තිබුණු සීමාව ලීටර් 3 දක්වා වැඩි කිරීමත්, ඒ වාගේම ඒ ගැසට් නිවේදනය අනුව ප්‍රවාහනයේදී පුද්ගලයකු සන්තකයේ තබා ගත හැකි රා ප්‍රමාණය ලීටර් 1.5 සිට ලීටර් 3 දක්වා වැඩි කිරීමත් කරලා තිබෙනවා. ඒ වාගේම රා තැබෑරුම් විවෘත කරලා තිබෙන වේලාව සාමාන්‍යයෙන් තිබුණේ දවල් 11.00 සිට හවස 2.00 දක්වාත්, හවස 5.00 සිට රාත්‍රී 8.00 දක්වාත්. මේ නව ගැසට් නිවේදනය අනුව දවල් 11.00 සිට හවස 2.00 දක්වා තිබුණු වේලාව පැයක් ඉස්සරහට අරගෙන උදේ 10.00 සිට විවෘත කරන්නත්, රාත්‍රී 8.00 දක්වා තිබුණු වේලාව රාත්‍රී 9.00 දක්වා වැඩි කරන්නත් අවසර දීලා තිබෙනවා.

මහාචාර්ය දියනාත් සමරසිංහ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානය පවා කියලා තිබෙනවා, තැබෑරුම් විවෘතව තබන කාලය වැඩි කිරීම කියන්නේ ඒ සඳහා ළැදියාව දක්වන පිරිසට වැඩි කාලයක් ලබාදීම කියලා. ඒ පැත්තෙන් බැලුවත් මේක සෞඛ්‍යමය වශයෙන් හොඳ දෙයක් නොවෙයි. "මතට තිත" පිළිබඳව කථා කළ හිටපු ජනාධිපතිවරයා, වර්තමාන අගමැතිවරයා සහ මුදල් විෂය භාර ඇමතිවරයා විධියට එතුමාගේ අත්සන යටතේයි මේ ගැසට් නිවේදන නිකුත් කරලා තිබෙන්නේ. එතුමා තමයි මේ රටේ බුද්ධ ශාසන ඇමතිවරයා, මේ රටේ ආගමික හා සංස්කෘතික ඇමතිවරයා. ඒ, එක පැත්තක්.

අනෙක් කාරණය, මා සතුව තිබෙනවා, පුත්තලම් දිස්ත්‍රික් මහා රා කර්මන්තකරුවන්ගේ සමිතිය විසින් නිකුත් කළ ලිපියක්. ගරු කථානායකතුමනි, "පුත්තලම් දිස්ත්‍රික් මහා රා කර්මාන්තකරුවන්ගේ සමිතිය" යන ලිපි ශීර්ෂය යටතේ 2021.03.09 දින ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා වෙත යොමු කරන ලද එකී ලිපිය මම **සභාගත*** කරනවා.

මේ ලිපිය යොමු කරලා තිබෙන්නේ ගරු අරුන්දික ප්‍රනාන්දු ඇමතිතුමාට. මේ ලිපියෙන් ඔවුන් පැහැදිලිව කියනවා, රටට දෛනිකව රා ලීටර් 160,000ක අවශ්‍යතාව තිබෙනවා, හැබැයි ලංකාවේ නිෂ්පාදනය කිරීමට හැකියාව ඇත්තේ ලීටර් 45,000යි කියලා. ලීටර් 160,000ත් 45,000ත් අතර හිඟය සම්පූර්ණ කරන්නේ යීස්ට්, සීනි සහ ලුණු එකතු කර සකස් කිරීමෙන් කියලා පැහැදිලිව මේ ලිපියේ සඳහන් වෙනවා. ඒවා තමයි කෘත්‍රිම රා කියන්නේ. ගමේ භාෂාවෙන් සීනි කරිඤ්ඤං කියන්නේ මේවාට.

ගරු කථානායකතුමනි, මේ ගැසට් නිවේදන මඟින් ලබාදෙන සහනවලින් සැබෑ සහනය ලැබෙන්නේ ස්වාභාවික රා නිෂ්පාදනය කරන ගමේ නිෂ්පාදකයාට නොවෙයි. ඒ වාගේම රසායන විද්‍යාව පිළිබඳව සාමාන්‍ය දැනීමක් තිබෙන අයත් දන්නවා, යීස්ට් එකතු කළ පමණින්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මේ යෝජනාවට විරුද්ධත්වය ප්‍රකාශ කළා නේ. විවාදයක් නැතිව මේ යෝජනා සම්මත කර ගන්න අපි එකඟ වුණා. ඒ නිසා දැන් ඔය කථාව අවසන් කරන්න.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
විනාඩි දහයක් මට වෙන් කරලා තිබෙනවා නේ. මගේ විනාඩි දහය අවසන් නැහැ, ගරු කථානායකතුමනි. මට විනාඩි දහයක් තිබෙනවා කියලා නේ, ඔබතුමා කිව්වේ.

යීස්ට් එකතු කළ පමණින්, සීනි එකතු කළ පමණින්, ලුණු එකතු කළ පමණින් පරිමාව ලීටර් 45,000 ඉඳලා 160,000 දක්වා වැඩි වෙන්නේ නැහැ. එහෙනම් ඒකට ජලය එකතු වෙන්න ඕනෑ. ජලය එකතු වීම සුරාබදු ආඥාපනත අනුව රා පිළිබඳ අර්ථ දැක්වීමට සම්පූර්ණයෙන් විරුද්ධයි. එය 1980 අංක 26 දරන ආහාර පනත වාගේම, 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනත යටතේ බැලුවත් සංයුතිය වෙනස් කිරීම - adulteration - ඉතා වැරැදි දෙයක්. ඒ, එක පැත්තක්. මීට අදාළ ඉතා වැදගත් ලිපි ලේඛන කීපයක් මා ළඟ තිබෙනවා.

(පූජ්‍ය) තිනියාවල පාලිත හිමියන් විසින් අජිත් නිවාඩ් කබ්රාල් මහතාට සහ පී.බී. ජයසුන්දර මහතාට එරෙහිව USAවල CIA හා සම්බන්ධ පුද්ගලයෙකු විධියට හඳුන්වපු ඉමාඩ් ෂා සුබේරිට ඩොලර් මිලියන 6.5ක මුදල් ගෙවීම සම්බන්ධව 2021.04.20 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද නඩුවට අදාළ ලිපි ගොනුව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වාගේම කොන්ඩාවිල්, පලාලි පාර, අංක 174 A යන ලිපිනයේ පදිංචි චන්ද්‍රකාන්තන් කාන්තරුබන් ලියපු ලියුමක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඔහු ඉතා පැහැදිලිව මේ ලියුමෙන් කියනවා, "මට නීති විරෝධී රා නිෂ්පාදනය -මත්පැන් නිෂ්පාදනය- සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙලා තිබෙනවා" කියලා. හැබැයි, ඔහු මේ ලියුම ලියන්නේ කාටද? Mr. H.G. Sumanasinghe, Commissioner General of Excise වෙත. මේ ලියුම ලියන්නේ 2019.09.06වැනි දා. "මම මේ කටයුත්ත කළේ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේම නිලධාරින් කීප දෙනෙකු එක්ක" කියලා ඔහු ඒ ලියුමෙන් කියා තිබෙනවා. ඒ නිලධාරින් කවුද කියලා ඔහු ඒ ලියුමේ කියනවා. Mr. S. Srimanna, OIC; Mr. N. Sothinathan, Assistant Commissioner; Mr. K. Kumarasinghe, Deputy Commissioner - Head Office; Mr. B. Wansooriya, Commissioner of Excise - Head Office and Mr. W. Dissanayake, Commissioner of Excise - Head Office යන අයගේ සහයෝගය මතයි මම මේ කටයුත්ත කළේ කියලා ඔහු නිකුත් කරපු ලිපියේ කියනවා. "මම වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් දඩ ගෙවන්න ලෑස්තියි. හැබැයි, මම මේක කළේ තනියම නොවෙයි" කියලා ඔහු කියනවා. ඒ ලියවිල්ල බැලුවාම ඒ කාරණය හරි පැහැදිලියි. 2021.04.27වැනි දා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශකවරයා නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනින් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ඔබතුමා මට විනාඩි දහයක් දුන්නා නේ. විනාඩි දහය අවසන් වනකොට මට කියන්න. එතකොට මම කථාව අවසන් කරන්නම්.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් සභාව කල් තැබීමේ විවාදය ආරම්භ කරන්න ඕනෑ. ඔබතුමා විනාඩි 11ක් කථා කරලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මේ කාරණයත් කියලා මම අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

ඉතා පැහැදිලිව මම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. 2021.04.27වැනි දා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා අපි කවුරුත් කෑම කන කැන්ටිමේ හදන කෑමවලට යොදනවා, විනාකිරි. විනාකිරිවලට කෘත්‍රිම රා යොදා ගන්නේ නැහැ කියලා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශක කපිල කුමාරසිංහ මහතා කියනවා. හැබැයි, ඔහුම 2020.12.09වැනි දා රූපවාහිනී නාළිකාවකට ඇවිල්ලා කියනවා, "කෘත්‍රිම රා විනාකිරි නිෂ්පාදනයට යොදා ගන්නවා" කියලා. ඇත්තටම අද ගෙනෙන ගැසට් පත්‍ර තුනෙන්ම සිදු වෙන්නේ මේ රටේ කෘත්‍රිම රා හදන්න විශාල වශයෙන් අවස්ථාවක් හදා ගන්න එකයි. කෘත්‍රිම රා තමයි හකුරු හදන්න පාවිච්චි කරන්නේ; කෘත්‍රිම රා තමයි විනාකිරි හදන්න පාවිච්චි කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනා ඇතුළු ගෙවල්වල සිටින ඔක්කොම අය කන්නේ කෘත්‍රිම රා කලවම් කරපු ආහාර. මේකයි තිබෙන ප්‍රශ්නය. සාමාන්‍ය ගණනය කිරීම අනුව මේ කෘත්‍රිම රා නිසා අවුරුද්දකට අපට අහිමි වන බදු මුදල රුපියල් බිලියන 80ක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න. දැන් විනාඩි 11ක් ගතවෙලා තිබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
සාමාන්‍යයෙන් කථාවක් කරගෙන යන කොට හැම මන්ත්‍රීවරයෙකුටම තව විනාඩියයි කියලා ඔබතුමා කියනවා. ඔබතුමා මට එහෙම කිව්වේත් නැහැ. එක වතාවටම වෙලාව අවසානයි කියලා මයික් එක දෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කියපු කාරණා ඔක්කොම අහගෙන හිටියා නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අද නියෝගයක් සහ නිවේදන කිහිපයක් විවාදයෙන් තොරව සම්මත කරන්න කටයුතු කළාට අපි ඒවාට විරුද්ධයි. එහෙනම් ඔබතුමා පක්ෂ නායකයන් එක්ක කථා කරලා, එක් දිනක කල් තැබීමේ යෝජනාවක් අපට ලබා දෙන්න. අද පක්ෂ නායක රැස්වීම තිබෙනවා නේ. අද මේ සම්මත කර ගත් නියෝගය, නිවේදන සහ පනත් කෙටුම්පත් දෙක සම්බන්ධයෙන් අපට එක් දිනක කල් තැබීමේ යෝජනාවක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. සභාවේ මූලික කටයුතු පෙරවරු 11.00ට නිම කරන්න නියමිතව තිබුණත්, ඒ අදහස් ඉදිරිපත් කිරීම නිසා අපට තවත් මිනිත්තු කිහිපයක් ලබාගන්න සිදු වුණා.

දැන් සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න, ගරු සභානායකතුමනි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

## කොවිඩ් පාලනය සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක් හා ඒකාබද්ධ වැඩසටහනක්
## விஞ்ஞான அணுகுமுறை மற்றும் ஒருங்கிணைந்த திட்டத்தினூடாக கொவிட்டைக் கட்டுப்படுத்தல்
## SCIENTIFIC APPROACH AND AN INTEGRATED PROGRAMME FOR CONTROL OF COVID

[පූ.භා. 11.12]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වයිරස් රෝගී තත්ත්වයේ තෙවන රැල්ලක් පැතිර යෑමට ලක්වීම නිසා රටේ මහ ජනතාවගේ ජන ජීවිතය, සෞඛ්‍ය ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් තීරණාත්මක මංසන්ධියකට පැමිණ ඇත. මිනිසුන් අතර වන ත්‍රස්තවාදී යුද්ධයක් හා ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවියකු සමඟ වන වයිරස යුද්ධයක් අතර වෙනස පවා වටහා ගැනීමට නොහැකිවීම මෙම කනගාටුදායක තත්ත්වයට අපේ රට ඇද දමා ඇත. විශේෂයෙන් මතක තබාගත යුතු තත්ත්වය නම්, කොවිඩ්-19 යනු, වයිරසයක් සමඟ කරන යුද්ධයක් බවත්, අප සාමාන්‍ය ත්‍රස්තවාදීන් සමඟ සටන් කිරීමේදී නිශ්චිත ත්‍රස්තවාදීන් සංඛ්‍යාවක් සමඟ සටන් කිරීම සිදුවන අතර, මිනිස් ත්‍රස්තවාදීන් අපට පියවි ඇසින් දැක බලාගත හැකි වීමයි. කොවිඩ්-19 වයිරසය ඇසට නොපෙනෙන අතර, වයිරස සංඛ්‍යාව දිනපතාම ලක්ෂ ගණනින් වැඩි වෙයි. මේ නිසා ඇසට පෙනෙන ත්‍රස්තවාදීන් සමඟ සටන් කරනවාට වඩා ඇසට නොපෙනෙන කොවිඩ්-19 වයිරස් ත්‍රස්තවාදය සමඟ සටන් කිරීමේදී ඉතා ප්‍රවේශමෙන් හා විචක්ෂණශීලි ලෙසත්, විද්‍යාත්මක ලෙසත් කටයුතු කළ යුතු වෙයි. නමුත්, අවාසනාවන්ත ලෙස සිදු වූයේ මිථ්‍යා විශ්වාස සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීමෙන් ජනතාව තවදුරටත් අසරණ වීමයි.

කොවිඩ්-19 සම්බන්ධව පර්යේෂණ කළ මෙරට වෛද්‍ය විද්‍යාඥයන් අප්‍රේල් මාසයේ 08වන දින රජයට ඉතා පැහැදිලිව අනතුරු ඇඟවීමක් කරමින් කොවිඩ්-19 භයානක වයිරස ප්‍රභේද රටට ඇතුළු වී ඇති බවත්, වහාම සියලු අංශ සක්‍රියකොට ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවත් පෙන්වා දෙන ලද නමුත්, දිගින් දිගටම වෛද්‍ය විද්‍යාත්මක කරුණු නොසලකා හරිමින් දේශපාලන යන්ත්‍රණය විසින් කොවිඩ්-19 රෝගය පාලනය කිරීමේ බලය අත් පත් කර ගැනීම නිසා අද වන විට ජනතාව මිනිස් ජීවිතවලින් වන්දි ගෙවමින් සිටිති. එසේම විද්‍යාව ජනගත කිරීම වෙනුවට මිථ්‍යාව ජනගත කිරීම සඳහා කටයුතු කළ අන්දමද ඉතා කනගාටුදායකය.

කොවිඩ්-19 හි සැබෑ අනතුරුදායක ස්වරූපය ජනතාවට සම්ප්‍රේෂණය කිරීම වෙනුවට දිගින් දිගටම ජනතාවට වැරැදි චිත්‍රයක් මවා පෑම නිසා ජනතාව මේ වන විට කොවිඩ්-19 ගැන නොසැලකිලිමත් බව අලුත් අවුරුදු සමයේදී අපි දුටුවෙමු. රජය මඟින් කළ යුතු යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු නොකර දිගින් දිගටම ජනතාවට චෝදනා කිරීම කිසිසේත්ම සාධාරණ කටයුත්තක් නොවෙයි. ජනතාවගේ භාරකාරයා ලෙස රාජ්‍යයක වගකීම දරන දේශපාලන යන්ත්‍රණය අද සිදුවන මෙම ඛේදවාචකයෙහි වගකීම භාරගත යුතුය.

සැක සහිත රෝග ලක්ෂණ සහිත රෝගීන් කල්තියා හඳුනා ගැනීම හා පරීක්ෂණවලට භාජන කිරීම - tests, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම - isolate and treat, ඔවුන්ගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීම - contact tracing, ඔවුන් නිරෝධායන යන්ත්‍රණය සඳහා යොමු කිරීම - quarantine- සහ වයිරසය පැතිර යෑම පාලනය කිරීම සඳහා අනුගමනය කළ යුතු compassion treatment, සමාජය තුළ දුරස්ථභාවය පවත්වා ගැනීම සහ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කිරීම යන යන්ත්‍රණයන් අඛණ්ඩව පවත්වාගෙන යෑම සිදු කළ යුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානය දිගින් දිගටම පෙන්වා දෙයි. අප රට තුළ ශක්තිමත් ප්‍රාථමික සෞඛ්‍ය සේවයක් පවතින නිසා කල් ඇතිව කොවිඩ්-19 හඳුනා ගැනීම සඳහා වන රෝග ආවේක්ෂණ යන්ත්‍රණයක් -Disease Surveillance System, එවැනි අවස්ථාවලදී ක්ෂණිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් - Rapid Response Team - සක්‍රිය කිරීමත්, COVID -19 තත්ත්වය මධ්‍යයේ වෙනත් අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා නොවෙනස්ව පවත්වා ගෙන යෑම - rehabilitation care - කෙරෙහිත් අවධානය යොමු කළ යුතුය.

මේ වන විට සීඝ්‍රයෙන් සිදුවන කොවිඩ්-19 ව්‍යාප්තිය සෞඛ්‍ය ධාරිතාව ඉක්මවා ඇති බැවින්, විද්‍යානුකූල පදනමක් මත ඉතා ඉක්මනින් රෝග පාලනය කිරීම සඳහා රෝගී ප්‍රතිකාර මධ්‍යස්ථානවල ධාරිතාව ඉහළ නැංවීම, දැඩි සත්කාර ඒකකවල ධාරිතාව සහ පහසුකම් ඉහළ නැංවීම, ප්‍රමාණවත් ඔක්සිජන් සංචිත පවත්වා ගැනීම, සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය ආරක්ෂක උපකරණ ලබා දීම, එන්නත් ලබා දීමේ යන්ත්‍රණය අඛණ්ඩව පවත්වාගෙන යෑම, ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ශක්තිමත් කරමින් ප්‍රමාණවත් තරම් PCR පරීක්ෂණ පවත්වාගෙන යෑමත්, ගුවන් තොටුපොළ හා වරාය දැඩි අධීක්ෂණය කිරීමත් අඛණ්ඩවම කළ යුතුය. එසේම කේන්ද්‍රගත වැඩ පිළිවෙළක් යටතේ ප්‍රාදේශීය වශයෙන් රෝගී තත්ත්වය සම්බන්ධයෙන් නිරීක්ෂණ මධ්‍යස්ථාන - observation rooms - පිහිටුවමින්, ඒ ඒ ප්‍රදේශවල පළාත් අධ්‍යක්ෂ හා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගේ නායකත්වය යටතේ රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා වසංගත රෝග විද්‍යා අංශයේ නියාමනයට යටත්ව නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් වීම ඉතාම අත්‍යවශ්‍යය.

විශේෂයෙන් මෙවර රෝගයට ගොදුරුවන රෝගීන් අතරින් වැඩි ප්‍රමාණයකට අසාධ්‍ය රෝග ලක්ෂණ ඇති වීම නිසා දැඩි සත්කාර ඒකක පහසුකම් හා ඔක්සිජන් අවශ්‍යතාව ඉහළ යන බැවින් ප්‍රමාණවත් තරම් සංචිත පවත්වාගෙන යෑම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. මේ අතර සමස්ත ජනගහනයෙන් සියයට 70ක පමණ ප්‍රමාණයක්වත් එන්නත්කරණයට ලක්විය යුතු වුවත්, එසේ නොවීම කනගාටුවට කරුණකි.

වැදගත්ම කරුණ වන්නේ, පෞද්ගලික දේශපාලන බලපෑම්වලින් තොරව කටයුතු කිරීමට සෞඛ්‍ය අංශවලට අවශ්‍ය නිදහස ලබා දීමයි. දේශපාලන බලපෑම් මත දක්ෂ වෛද්‍ය පරිපාලකයන්, විශේෂඥ වෛද්‍යවරුන්, වෛරස් විශේෂඥයන් ආදීන් නිසි පිහිටුවීමකින් තොරව ඉවත් කර ඇති බවක් පෙනෙන්නට තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශය වෛද්‍ය පරිපාලකයින්ගේ උපදෙස්වලට අනුව කටයුතු කිරීම වෙනුවට, වෛද්‍ය සංගමයේ බලපෑම්වලට යටත්වීමක් සිදු වූ අතර, මේ වන විට වෛද්‍ය පරිපාලනයට පත් වන්නේ කවුදැයි තීරණය කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ රජයේ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිතිය වීම මෙයට නිදසුනකි.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ජන ජීවිතයට සිදු වන හානිය අවම කිරීම සඳහා සෞඛ්‍ය අංශවල උපදෙස්වලට අනුව රටේ අන්තර් දිස්ත්‍රික්ක හෝ අන්තර් පළාත් වශයෙන් දැඩි සංචරණ සීමා පැනවීම් කළ යුතුය. මක්නිසාදයත්, රෝග පාලනය කිරීම කළ හැකි එකම ක්‍රමය වන්නේ පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට සම්ප්‍රේෂණය වීම බිඳ දැමීමෙන් - breaking the chain - පමණි. එසේම, සමාජ දූරස්ථභාවය පවත්වාගෙන යෑමෙන් රෝගය පැතිරයෑම සියයට 95ක් පමණ පාලනය කළ හැකි බව විද්‍යාත්මකව සනාථ වී ඇත. නිරෝධායන නීති සෑමට එක ලෙස ක්‍රියාත්මක විය යුතු අතර, පොදු ප්‍රවාහන සේවා විශේෂ අධීක්ෂණයට ලක්විය යුතුව ඇත. මේ අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ තත්ත්වය ඉන්දියාවේ තත්ත්වය අභිභවා ගමන් කිරීමේ අවදානමක් පවතින බවට ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය ඇතුළු සියලු විශේෂඥ වෛද්‍යවරු අනතුරු හඟවා තිබියදී මෙවැනි තත්ත්වයන් තවදුරටත් නොසඟවා කටයුතු කරමින් මහ ජනතාවගේ ජීවිත හානිවීමට ඉඩ දීම වෙනුවට ඉතා ඉක්මනින් විද්‍යානුකූල ප්‍රවේශයක් යටතේ රෝගය පාලනය කිරීමටත්, සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශ කොවිඩ්-19 රෝගය පාලනය කිරීම සඳහා ඉතා හදිසි තත්ත්වයක් සේ සලකා ප්‍රමුඛතාව ලබා දී ඒකාබද්ධ වැඩ සටහනක් - inter-collaboration and an integrated programme - හරහා පියවර ගතයුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] took the Chair.*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට කොවිඩ්-19 සම්බන්ධයෙන් රට තුළ ඉතා බැරෑරුම් තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඊයේ හඳුනාගත් කොවිඩ් රෝගීන් සංඛ්‍යාව 2000 ඉක්මවා තිබෙනවා. ඒ වාගේම ඊයේ 13 දෙනෙකු මිය ගොස් තිබෙනවා. මෙතෙක් වාර්තා වූ වැඩිම කොවිඩ් රෝගීන් සහ මරණ සංඛ්‍යාව මෙයයි. මේ පිළිබඳ (මහාචාර්ය) සුනෙත් අගම්පොඩි මහත්මයා කරුණු සඳහන් කළ ලේඛනයක් මම **සභාගත*** කරනවා.

මේ graph එක අනුව එතුමා පෙන්වා දී තිබෙනවා, අපේ රටේ කොවිඩ් රෝගීන් වාර්තාවීම ඉන්දියාවටත් වඩා උත්සන්න තත්ත්වයකට ගමන් කරලා තිබෙනවා කියලා. එතුමා එම ලේඛනයේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "The effective reproduction rate of COVID-19 in Sri Lanka is larger than India. The difference is in the population size and health infrastructure which is already on the verge of collapse. It will be only a matter of time if we continue to ignore."

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

එහෙමයි එතුමා කියන්නේ. මේක ඉතාම භයානක තත්ත්වයක්. අද වන විට අපි කොවිඩ්-19 රෝගයේ 3වැනි රැල්ලට මුහුණ දෙමින් ඉන්නවා. මෙතෙක් කල් තිබුණු පළමු කොවිඩ් රැල්ල සහ දෙවන කොවිඩ් රැල්ල දෙස බලනකොට වයසක කාණ්ඩවලට තමයි එම රෝගය වැළඳුණේ. නමුත්, මේ තුන්වැනි රැල්ල එක්ක අපි දැක්කා, තරුණ සහ ළමා රෝගීන් එන්න එන්නම වැඩි වෙන බව. Sri Lanka Medical Association එක 22වැනි දා ජනාධිපතිතුමාට ලිපියක් ලියනවා. ඔවුන් එම ලිපියෙන් පැහැදිලිවම ප්‍රකාශ කරනවා, "Suspicion of a new presentation with atypical manifestations and possible rapid transmission also has been noted" කියලා. වෙනත් කිසිම රෝග ලක්ෂණයක් නැතිව මෙම නව කොවිඩ් වයිසරය එක විධියටම උත්සන්න වීමක් තමයි දක්නට ලැබෙන්නේ. It further states, I quote:

> "Presentation of younger patients with more serious symptoms also has been noted. The clinicians working at the Lady Ridgeway Hospital, have also observed the rapidly increasing number of positive cases of COVOD-19 among children. Presence of a new variant with possible rapid transmission also was suspected.....
>
> The possible new variant is suspected to be a new mutation of already prevalent Sri Lankan index organism or a virus introduced newly from another foreign country."

අපි මේ රෝගයට මුහුණ දෙනකොට හොඳ සූදානමකින්, දැනට තිබෙන විද්‍යානුකූල දත්ත පාවිච්චි කරලා එයට මුහුණ දෙන්න වෙනවා. මේ ලිපියේ ඔවුන් තවදුරටත් සඳහන් කර තිබෙනවා, "Sri Lanka Medical Association along with the Intercollegiate Committee of All Medical Professional Organizations" කියලා. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය තමයි, අපේ වෛද්‍යවරුන්ගේ පැරණිම වෘත්තියවේදී සංවිධානය, umbrella organization එක. මේ යටතේ තවත් colleges විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ colleges ඔක්කෝම එකතු වෙලා COVID Committee එකක් හදලා තිබෙනවා. එම COVID Committee එකේ සිටින සියලු විශේෂඥවරු එකතු වෙලා සාකච්ඡා කරලා තමයි වර්තමානයේ පවතින තත්ත්වය ගැන ප්‍රකාශ කරන්නේ. මේ ලිපියේ ඔවුන් තවදුරටත් මෙසේ සඳහන් කර තිබෙනවා:

> "At the COVID Committee meeting held on 21st April 2021, the clinicians reported to the SLMA their observations of the rapidly increasing number of COVID-19 positive cases, numbers requiring hospital admissions, oxygen and increasing needs of Intensive Care Unit (ICU), management in their clinical settings and the increasing number of positive reports at the lab settings. Further, it was also highlighted that the already allocated ICU beds for COVID-19 patients are all occupied at present."

මේවා සම්පූර්ණයෙන්ම occupy කරලා තිබෙන්නේ. ඒ ගොල්ලන් සියලු Collegesවල විශේෂඥවරු එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරන්න ජනාධිපතිතුමාගෙන් වෙලාවක් ඉල්ලනවා. නමුත්, අද වනතුරු ඔවුන්ට ඒ අවස්ථාව ලැබිලා නැහැ.

මේ රෝගයේ ප්‍රධාන ලක්ෂණය තමයි, asymptomatic වීම. වෙනදා වාගේ උණ, හෙම්බිරිස්සාව, කැස්ස ආදී ලක්ෂණ මොකුත් නැහැ. මේ රෝගය අපි කාට හෝ හැදුණත් එක පාරටම හුස්ම ගැනීමේ අපහසුතාවක් ඇතිවනවා, difficulty in breathing. එතැන ඉඳලා තමයි එක පාරටම රෝගය පටන් ගන්නේ. ඒකත් එක්ක නියුමෝනියා තත්ත්වය තමයි එන්නේ. මේකට තිබෙන මූලිකම හා හදිසිම ප්‍රතිකාරය තමයි, ඔක්සිජන් ලබා දීම. ඒ සඳහා අපට ICU ඇඳන් තිබෙන්න ඕනෑ. ඒ වාගේම oxygen supplies තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් HDUs ලෑස්ති කරලා තිබෙන්න ඕනෑ. අපි මේ රෝගීන් සඳහා වෙන්කර තිබෙන්නේ ICU ඇඳන් කීයක් ද?

අපේ රාජ්‍ය අමාත්‍ය වන්න ජයසුමන මැතිතුමාම මේ සම්බන්ධයෙන් කළ ප්‍රකාශයක උපුටා ගැනීමක මෙසේ සඳහන් වනවා:

"කොවිඩ් රෝගීන්ට වෙන්කර තිබුණේ ICU ඇඳන් 38යි. චන්න ජයසුමන පිළිගනී. ඇඳන් 200ක් දක්වා වැඩි කරන්න තීන්දු කර තිබෙන්නේ ඊයේ. දැඩි සත්කාර ඒකකයට ඇතුළත් වීමේ ප්‍රතිශතය දෙගුණ වන බැවින් රජය ඊයේ මෙම තීරණය ගත් බව හෙතෙම කියා සිටී. කෙසේ වෙතත් රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කළේ පළමු හා දෙවන රැල්ලේදී දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර අවශ්‍ය වන පද්ධති සංවර්ධනය කර තිබී ඇත්තේ රෝගීන්ගෙන් සියයට දශම දෙකකට පමණක් වන නමුත් වයිසරයේ නව ප්‍රභේදය...."

එතුමා කියනවා, මේ තත්ත්වය සම්බන්ධයෙන් ලෑස්ති වෙලා තිබුණේ සියයට දශම දෙකයි කියලා.

තමුන්නාන්සේලා මතක තබා ගන්න, මම සෞඛ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉවත් වෙලා එනකොට ඇඳන් 777ක් තිබුණා. මම වැඩ භාර ගන්න කොට ventilators 598ක් තිබුණා. ඒ ප්‍රමාණය 777 දක්වා මම වැඩි කළා. අපට monitors තිබුණේ 400යි. මම ඒ ප්‍රමාණය 850 වන තෙක් වැඩි කළා. ඒ අනුව බලන කොට monitors 850ක් සහ ventilators 777ක් අපට තිබෙනවා කියන්නේ අඩු ගණනේ අපට ICU ඇඳන් 700ක්වත් තිබෙනවා කියන එක. නමුත්, කොරෝනා රෝගීන් වෙනුවෙන් වෙන්කර තිබෙන්නේ 38යි. අනෙක් රෝගීන් සිටින ICU ඇඳන් එක්ක මේ රෝගීන් දමන්න බැහැ. මොකද, මේක ව්‍යාප්ත වන රෝගයක්. ඒ නිසා මේ රෝගීන්ට වෙනමම ICU ඇඳන් තිබෙන්න ඕනෑ. මම සෞඛ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉවත් වෙලා එනකොට වෛද්‍යවරු සහ හෙදියන් සහිත staff එකක් යොදවා නව ICU ඇඳන් 150ක් පමණ තිබෙන ඒකක විවෘත කිරීමට ලැහැස්ති කර තිබුණා. මේවා ඉක්මනට විවෘත කරන්න ඕනෑ. කළුතර දිස්ත්‍රික්කය ගත්තොත්, පිඹුර රෝහල තමයි කොවිඩ් රෝගීන් සඳහා ලැහැස්ති කර තිබෙන්නේ. පිඹුර රෝහලේ කායික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු - physician - ඉන්නවා, ඇඳන් 30ක් තිබෙනවා, නමුත්, කිසිම උපකරණයක් නැහැ. මාස තුනක ඉඳලා ඒ ගොල්ලන් උපකරණ ඉල්ලනවා. අද වනකොටත් ඒවා ලැබිලා නැහැ. ඒ නිසා ඒ unit එක operate වෙන්නේ නැහැ. ඒ අනුව, කළුතර දිස්ත්‍රික්කයට HDU එකක් නැහැ.

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ මැල්සිරිපුර තත්ත්වයත් එහෙමයි. ඔවුනුත් පහසුකම් ඉල්ලා තිබෙනවා, තවම හම්බ වෙලා නැහැ. ඒ විතරක් නොවෙයි, කුරුණෑගල, ගම්පහ, ගාල්ල, මාතර දිස්ත්‍රික්කවලටත් කිසිම HDU - High Dependency Unit - එකක් නැහැ. අපට හැම තැනම ICUs හදන්න බැහැ. එම නිසා HDUs හැදුවා නම් හරි. ඩෙංගු රෝගය ව්‍යාප්ත වනකොට හැම දිස්ත්‍රික්කයකින්ම වාගේ කුඩා රෝහලක් අරගෙන එදා සෞඛ්‍ය අමාත්‍යාංශය මොකක්ද කළේ? ඒකේ HDU එකක් දැම්මා. ඒ HDU එක දැම්මේ emergency careවලට. එහෙම තමයි අපි රෝගීන් control කළේ. අද මේවා කෙරෙන්නේ නැහැ. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ විශාලම දිස්ත්‍රික්කය වන ගම්පහටවත් එහෙම එකක් අද වනතුරු නැහැ.

මම කියන අනික් කරුණ මෙයයි. මේ වන විට ඇඳන් අඩු වෙලා තිබෙනවා. මම පසුගිය 21වන දා පැවැත්වූ ප්‍රවෘත්ති සාකච්ඡාවේදී ඉල්ලා සිටියා, KDU රෝහලේ ඇඳන් 1,000ක් තිබෙනවා, ICU ඇඳන් 32ක් තිබෙනවා, මේවා වහාම ගන්න කියලා. මම සෞඛ්‍ය ඇමතිතුමියට ස්තුතිවන්ත වනවා. එතුමියගේ මාධ්‍ය ලේකම් 30වන දා නිකුත් කළ ප්‍රවෘත්ති නිවේදනයේ තිබෙනවා, "කොවිඩ් ආසාදිත රෝගීන්ට KDU රෝහලේ දැඩි සත්කාර සේවා පහසුකම් ලබා ගන්න පුළුවන්" බව. එතුමිය KDU රෝහලේ ICU ඇඳන් 24කුත්, HDU ඇඳන් 12කුත් මේ රෝගීන්ට ලැහැස්ති කර ගෙන තිබෙනවා. එම නිසා පහුවෙලා හෝ ඒ කටයුත්ත කළාට මම එතුමියට ස්තුතිවන්ත වනවා. ඒක බොහොම හොඳයි.

අනික් කාරණය තමයි, නෙවිල් ප්‍රනාන්දු රෝහල. ඒ රෝහලේ කොවිඩ් රෝගීන්ට ඇඳන් 500ක් වෙන්කර තිබෙනවා. එහි ICU ඇඳන් 12ක් තිබෙනවා. ඒ රෝහලට ගන්නේ රෝග ලක්ෂණ නැති - asymptomatic - අය විතරයි. මම ඉල්ලා සිටිනවා, ICU ඇඳන් නොමැති රෝගීන්ට ඒ රෝහලේ තිබෙන ICU ඇඳන් ලබා දෙන්න ක්‍රියා කරන්න කියලා. නෙවිල් ප්‍රනාන්දු රෝහල පවරා ගත්තා කියල තමයි මා ජනාධිපති කොමිසමට ගෙන ගියේ. මට විරුද්ධව ජනාධිපති කොමිසමේ තිබෙන්නේ එක චෝදනාවයි. ඒ, නෙවිල් ප්‍රනාන්දු රෝහල පවරා ගත්තා කියන එක. මම ඒ රෝහල පවරා ගත්ත එක වැරැදියි නම්, ඔබතුමිය ඇතුළු මේ ආණ්ඩුවේ ඔක්කොම කට්ටියත් වැරැදිකරුවන් වෙන්න ඕනෑ, අපේ උපාලි අබේරත්න මහත්මයාගේ තීන්දු අනුව. පසුගිය කාලයේ මච්චරුන්ට තිබුණු එකම ස්ථානය තමයි ඒ එදා පවරාගත් නෙවිල් ප්‍රනාන්දු රෝහල.

තවත් දෙයක් මා රජයෙන් ඉල්ලා සිටිනවා. නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල තිබෙනවා. ඒක නිකම් තිබෙන්නේ. එහි ඉඩකඩ අරගෙන ඒකට ඇඳන් දාලා ඒකේ HDUs හෝ ලැහැස්ති කරගන්න. ඇඳන් දාගන්න තෘතීයික සේවා රෝහල්වලට යන්න එපා. එහෙම වුණොත් රෝග ව්‍යාප්තිය වැඩි වෙනවා.

ඊළඟට, කොළඹ දකුණ රෝහලේ Millennium Ward Complex එක. මගේ කාලයේ එහි ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ තමයි තිබුණේ. මට ආරංචියි එහි වැඩ කටයුතු අවසන් වෙලා තිබෙනවා කියලා. එම නිසා ඇඳන් දාන්න Millennium Ward Complex එක පාවිච්චි කරන්න. අනෙක් එක, ගාල්ලේ Helmut Kohl Maternity Hospital එක තිබෙනවා. අන්තිම මොහොතේ අපි ඒක හදලා ඉවර කළා. මේ වන විට එහි වැඩ කටයුතු අවසන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ building එක පාවිච්චි කරන්න. ඒ වාගේමයි, පොළොන්නරුවේ ජාතික වකුගඩු රෝහල. එහි ඇඳන් 250ක් තිබෙනවා. ඒ වකුගඩු රෝහල විවෘත කරන්න ඉස්සෙල්ලා, දැනට උතුරු මැද පළාතේ රෝහල් පාවිච්චි කරන්න.

මේ අලුත් වයිරසය ගැනත් කියනවා. පසුගිය අවුරුද්දේ මාර්තු මාසයේ 11වැනි දා පළමුවරට වයිරසය ආවා වාගේ, වයිරසය එනවා. එම නිසා රටට රෝගීන්ට එන්න දෙන්න එපා කිව්වා. ඒ වාගේ මේ වතාවේත් විශේෂඥ වෛද්‍යවරුන් ආණ්ඩුවට අවවාද - warn - කළා. නමුත්, ඒවා ගණන් ගත්තේ නැහැ. මේ පිළිබඳව ක්‍රියා කරන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විශේෂඥ වෛද්‍ය අංශයේ වෛද්‍ය ආචාර්ය චන්දිම ජීවන්දර මහතා අලුත් වයිරසය ගැන අප්‍රේල් 8වැනි දාම සෞඛ්‍ය අමාත්‍යාංශයට දැනුම් දුන්නා. එතුමා කිව්වා, අලුත් අවුරුද්දට ඉස්සෙල්ලා ඒ ගැන දැනුම් දුන්නා කියලා. නමුත්, ඒ වෙනුවෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. ඒ වාගේම, Prof. Suneth Agampodi කියනවා, "A country can implement proactive and extreme pandemic control measures well in advance, knowing what the costs are. Or they can hide in broad daylight until they are being dragged into implementing those measures, but with heavy losses" කියලා. ඒ වාගේම එතුමා කියනවා, "Based on our pandemic prediction model, each day of delay in implementing control measures costs 150 to 200 more cases and two to three deaths with an exponential increase. The graph shows the predicted effect of lockdown on case numbers in Sri Lanka" කියලා.

[ගරු රාජිත සේනාරත්න මහතා]

මේකෙන් කියන්නේ, පුළුවන් තරම් ඉක්මනට lockdown එකකට යන්න, එහෙම නැත්නම් මේ graph එකේ තිබෙන විධියට, පසුවන හැම දවසකම මෙවැනි රෝගීන් ප්‍රමාණයක් ඇති වෙනවා කියලා. පරීක්ෂා කර බැලීම සඳහා එම ලේඛනය මම **සභාගත*** කරනවා.

එතුමා තවදුරටත් කියනවා, "By the time we accept community transmission stage 3 of COVID-19, the stage 4 is knocking at our door." හතර වන අදියරත් මේ වන විට පැමිණෙමින් තිබෙනවා. "Time for strategic early lockdown to challenge the pandemic was ignored and still we have a window of opportunity. If not surrendered, lockdown is inevitable."

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මෙවැනි තත්ත්වයක් තිබෙන නිසා මේ අදියර ක්‍රියාත්මක කළේ නැති වුණොත් ඉදිරියේදී lockdown එකකට යන්න සිදු වෙනවා. ඒ වාගේම, අපේ විශේෂඥ වෛද්‍ය සංගමයත් - AMS, Association of Medical Specialistsත් - ඒක කියනවා. ඒ ගොල්ලන්ගේ ලිපිය මට කියවන්න වෙලාව නැහැ. ඔබතුමා කිව්වා, කාලය සීමිතයි කියලා. මෙහි පැහැදිලිවම කියන්නේ, වෛද්‍ය විද්‍යාත්මක මත අනුව තීන්දු ගන්න; දේශපාලනය අනුව තීන්දු ගන්න එපා කියලායි. ඉහළින් එන දේශපාලන තීන්දුවලට සෞඛ්‍ය අමාත්‍යාංශය යට කරන්නට එපා. අපේ කාලයේ අපි සෞඛ්‍ය අමාත්‍යාංශයට නිදහස දීලා තිබුණා, වෛද්‍යමය හේතු මත අමාත්‍යාංශය පවත්වාගෙන යන්න. පසුගිය කාලයේ අපේ මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා පවා කිව්වා, එතුමාට "වයිරස් රෝග ගැන PhD එකක් තිබිලාත් කිසිදු සාකච්ඡාවකට කැඳවා නැහැ" කියලා. ඒ වාගේ පුද්ගලයන්වත් කැඳවන්නේ නැහැ! අනෙක් එක, සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝග දීලා තිබෙනවා, PHI's Union එක කියන විධියට PCR පරීක්ෂණ කට්ටල හිඟයි, ඒ නිසා PCR පරීක්ෂණ නවත්වන්න කියලා. මේ ගැන ඉතා කනගාටුයි කියලා එතුමා කිව්වා. එතුමන්ලා - PHIsලා - මේ ඇත්ත කථාව කිව්වාම, - ඒ ගොල්ලන් තමයි ඇත්තටම මේ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යන්නේ - ඒ ගොල්ලන් එක්කත් ආණ්ඩුවේ සමහර අය ගහගන්න පටන් අරගෙන තිබෙනවා. ඒ අය මාත් එක්ක ඉන්න පින්තූර ඒ අයගේ මාධ්‍ය තුළින් පෙන්වනවා.

මාත් එක්ක හැම වෘත්තිය සමිති නායකයෙක්ම වාගේ පින්තූර අරගෙන තිබෙනවා; එකට තේ බීලා තිබෙනවා; කෑම කාලා තිබෙනවා. ඒ විධියට බැලුවොත්, ඒ හැමෝම මගේ මිනිස්සු වෙනවා නේ. ඒ විධියට බලා ක්‍රියා කරන්නේ නැතුව, ඒ අයත් එක්ක කථා කරලා ඉතාම ඉක්මනින් අවශ්‍ය පියවර ගන්න කියලා මම තමුන්නාන්සේලාට කියනවා.

ඊයේ වන විට ජාතික රෝහලේ තත්ත්වය මොකක්ද? ඊයේ 55දෙනෙකුගේ PCR positive වෙලා තිබුණා. ඒ අය හොයා ගත්තා. නමුත්, ඔවුන් යවන්න වෙනත් රෝහලක් නැහැ; ඇඳන් නැහැ.

ඒ විතරක් නොවෙයි, ආසාදිතයන් දසදෙනෙකුට ඔක්සිජන් ඕනෑ වුණා. නමුත්, ඇඳන් නැහැ; ICUs නැහැ. ඒ නිසා ඊයේ medical wards දෙකක් ඒ කටයුතුවලට ගත්තා. HDUsවලට තෘතියික රෝහල් පාවිච්චි කරන්න එපා කියලා මම කියනවා. පුළුවන් තරම් ප්‍රාථමික සහ අනෙකුත් රෝහල්වල HDUs පාවිච්චි කරන්න. එතකොට පැතිරීම අඩු කරගත හැකියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එන්නත ගැනත් පොඩ්ඩක් කථා කරලා මගේ කථාව අවසන් කරන්නම්.

ජනාධිපතිතුමාත් කියා තිබෙනවා, "කොවිඩ් - 19 උවදුරට විසඳුම එන්නතයි. රජය ඊට සූදානම්." කියලා. බොහොම හොඳයි. නමුත්, ලංකාවේ ලක්ෂ 210ක ජනතාවක් ඉන්න බව මතක තියා ගන්න ඕනෑ. මීට කලින් හිතාගෙන හිටියා, ලක්ෂ 130කට ඒ එන්නත දුන්නොත් ඇති, වයසක අයට විතරයි, වැඩි වශයෙන් ඒ වයිරසය ආසාදනය වෙන්නේ කියලා. නමුත්, අද ළමයින්, තරුණ අය ඇතුළු ඔක්කෝටම එය ආසාදනය වන බව වාර්තා වෙනවා. ඒක නිසා ලක්ෂ 210ටම එන්නත දෙන්න වෙනවා. ඇමෙරිකාවේ ජනගහනය මිලියන 322යි. ඒ මිලියන 322ටම එන්නතේ පළමුවැනි dose එක මේ වෙන කොට දීලා ඉවරයි.

අපේ රටේ ජනගහනය ලක්ෂ 210 නම් එන්නතේ doses ලක්ෂ 420ක් තිබෙන්න ඕනෑ. එයින් අපි දැනට ගෙනැල්ලා තිබෙන්නේ කීයද? 1,264,000ක් විතරයි. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කරපු ප්‍රවෘත්ති නිවේදනයක අන්තිමට කියනවා, "මේ වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම එන්නත් ගබඩාව මඟින් මුළු දිවයිනම ආවරණ වන පරිදි AstraZeneca එන්නතේ දෙවන මාත්‍රාව බෙදා හැරීමට සියලු කටයුතු යොදාගෙන ඇත" කියලා. දෙවැනි මාත්‍රාව බෙදා දෙන්නේ කොහොමද, පළමු මාත්‍රාවත් දීලා ඉවර නැතිව තියෙද්දී? ලක්ෂ 210න් ලක්ෂ නවයකට විතරයි එන්නතේ පළමු මාත්‍රාවත් දීලා තිබෙන්නේ. අද වන විට ඇමෙරිකාවේ සියලුදෙනාටම පළමුවැනි dose එක දීලා, සියයට 30කට දෙවැනි dose එකත් දීලා තිබෙනවා. නමුත්, ලංකාව තවම පළමු මාත්‍රාව දීලා තිබෙන්නේත් ලක්ෂ 9කට විතරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඖෂධ හිඟය සම්බන්ධයෙනුත් මේ දිනවල ඉතාම නරක තත්ත්වයක් තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබුණු ඖෂධ වර්ග 40ක් සම්බන්ධ වාර්තාවක් මා ළඟ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා වැඩිපුර විනාඩි දෙකක් ගත්තා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය ඉතාම වැදගත්. ගරු ඇමතිතුමියත්, රාජ්‍ය ඇමතිවරුත් ගරු සභාවේ ඉන්න අවස්ථාවේ ඒ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්.

---
***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බෙහෙත් තමුන්නාන්සේටත් ඕනෑ වෙයි. අත්‍යවශ්‍ය, life-saving drugs 40ක් අද නැහැ. මට දැන් තොරතුරක් ආවා, හෙට - අනිද්දා වෙන කොට තව බෙහෙත් වර්ග 22ක stocks නැති වෙනවා කියලා. දැන් බලන්න මිනිසුන් කියන දේවල්. රවී සිරිවර්ධන කියන්නේ මට විරුද්ධව කථා කරපු පුද්ගලයෙක්; පසු ගිය කාලයේ මට පහර ගහපු කෙනෙක්. ඒ පුද්ගලයා කියලා තිබෙනවා, "රාජිත සේනාරත්න එක්ක මොන තරම් දේශපාලන ප්‍රතිවිරෝධතා තිබුණත්, මිනිහා සෞඛ්‍ය ඇමති කාලයේ අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය ඇති වෙන්න තිබුණා වාගේම යම් සාධාරණ මිලකුත් තිබුණා. තයිරොක්සින් පාවිච්චි කරන පවුලේ සාමාජිකයන්ට අදාළ බෙහෙත් ගන්න මම අද මහරගම ෆාමසි 10කට ගියා. එක තැනකවත් තයිරොක්සින්වලට අදාළ කිසිම බෙහෙතක් තිබුණේ නැහැ. අද සෞඛ්‍ය ඇමතිවරු තුන්දෙනෙක්ද කොහෙදෝ ඉන්නවා. වගකීමක් ගන්න කෙනෙක් නැහැ. තයිරොක්සින් තිබෙන තැනක් හරියට දන්න කෙනෙක් ඉන්නවා නම් කියන්න, මම ඇවිත් ගන්නම්." කියලා. ඔහුට උත්තරයක් ලැබිලා තිබෙනවා, "රාගම Leesons Hospital pharmacy එකේ last week එකේ තිබුණා. check කරලා බලන්න." කියලා. එතුමා එතැන check කරලා කියනවා, එතැනත් ඉවරයි කියලා. මෙන්න මේකයි තත්ත්වය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

යෝජනාව ස්ථිර කිරීම, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.35]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව මා ස්ථිර කරනවා. මේ අවස්ථාවේ මම විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. කොරෝනා රෝගය ලෝකය පුරාම පැතිරුණු වෙලාවේ, විපක්ෂ නායකතුමා 2020 ජනවාරි මාසයේ සෞඛ්‍ය ඇමතිතුමියගෙන් මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා, "මේ තත්ත්වයට මුහුණ දෙන්න සූදානම්ද? අවශ්‍ය face masks ගෙන්වන්න සූදානම්ද?" කියලා. එතකොට එතුමිය මේ සභාවේදීම උත්තරයක් දුන්නා, "එහෙම අවශ්‍යතාවක් දැනට මතු වෙලා නැහැ. අවශ්‍ය වුණොත් ගෙන්වන්නම්" කියලා. අපි දැක්කා, ඒ විධියට වගකීම් විරහිතව හැසිරිලා, නාම යෝජනා ලබා දීමේ කාරණය උදෙසා airports විවෘත කර තිබූ ආකාරය. දූපත් රටක් වුණු අපේ රට මාර්තු මාසයේ 19වන දා වනතුරු විවෘත කර තිබුණු නිසා කොවිඩ් - 19 පළමු රැල්ල රට ඇතුළට ආවා. මේ ජාතික ව්‍යසනයේදී විපක්ෂය විධියට විවිධ යෝජනා මේ පාර්ලිමේන්තුව තුළදීත්, එළියේදීත් රජයට ඉදිරිපත් කළාම, ඒ අයට උසුළු විසුළු කරන්න ගත්තා. සුමාන තුනක්, හතරක්, පහක් ගිහිල්ලාත් ඒ ගොල්ලන් ඒ විධියටම කටයුතු කළා. ඇත්ත වශයෙන් 2020 මාර්තු මාසයේ 23වැනි දා අපි යෝජනා කළා, කොවිඩ් - 19 නිසා රට වහන්න වෙන කොට දෛනික ආදායම් ලබන ජනතාවට සහ අඩු ආදායම්ලාභීන්ට ආදායම් මාර්ග අහිමි වීම නිසා ඔවුන්ට සල්ලි දෙන්න කියලා. ඒ වෙලාවේ ඇහුවා, "එහෙම නිකම් දෙන්න සල්ලි කොහෙන්ද?" කියලා. ඊට පස්සේ රුපියල් පන්දහසක් ලබා දෙන්න කියලා අපි කරපු යෝජනාව ඒ අයට ක්‍රියාත්මක කරන්න සිදුවුණා. ඒ වාගේම, 2020 අප්‍රේල් 20වැනි දා අපි කිව්වා, මැතිවරණයට ප්‍රමුඛතාව දෙන්න එපා, කොරෝනා රෝගීන්ට ප්‍රතිකාර කරන මධ්‍යස්ථාන වැඩි කරලා, නිරෝධායන මධ්‍යස්ථාන වැඩි කරලා, මේ රට සුරක්ෂිත තැනක් බවට පත් කරන්න. කියලා. නමුත්, ඒ කාල වකවානුවේත් ආණ්ඩුවේ අවධානය තිබුණේ, මේ රටේ ජනතාව බිල්ලට දීලා හරි කමක් නැහැ, මැතිවරණය ඉක්මනට තියලා තුනෙන් දෙකක බලයක් ගන්නේ කොහොමද කියන එක ගැනයි. "තුනෙන් දෙක, තුනෙන් දෙක" කියමින්, එය මන්තරය වාගේ ජප කරමින් හිටියේ. අපි මාධ්‍යවලින් දැකපු විධියට ඒ කාලය -අප්‍රේල් මාසයේ 24, 25- වනකොට කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට රුපියල් මිලියන දාහකට වඩා එකතු වෙලා තිබුණා. ඒ අරමුදලට වෙච්ච දේවල්, ඒකෙන් කරපු දේවල් මොනවාද? ඒකෙන් බෙහෙත් ගත්තාද, ඇඳන් ගත්තාද, රෝහල්වලට දුන්නාද කියන එක තවමත් අපි දැනුවත්ව සමාජයට හෝ මේ පාර්ලිමේන්තුවට නිසියාකාරව දැනුම් දීලා නැහැ. ඒ වෙලාවේ වග කිවයුතු විපක්ෂයක් විධියට අපි ආණ්ඩුවට යෝජනා කළා, "ලෝක වෙළෙඳ පොළේ ලංකාවට ගෙන්වන තෙල් වර්ගයේ - Brent crude oilවල - මිල ඇමෙරිකානු ඩොලර් 65 ඉඳලා 19 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ නිසා මුළු අවුරුද්දටම order එක place කරන්න. හැබැයි, ඒ අවස්ථාවේ අපට ගෙන්වන්න බැරි නිසා භූමිකම්පා සිදුවන ජපානය, එහෙම නැත්නම් දූපත් රටක් වන සිංගප්පූරුව වාගේ රටවල් අනුගමනය කරන ක්‍රමය අනුගමනය කරන්න" කියලා. ඒ මොකක්ද? Order කරලා, ඒ රටවලම ගබඩාවල තබන එකයි. එ ගබඩා සඳහා යම් වියදමක් දරන්න ඕනෑ. දළ වශයෙන් අපට අවුරුද්දකට ඩොලර් බිලියන පහක් විතර වැය වෙනවා, තෙල් ගෙන්වන්න. එහෙම order කළා නම් අපට ඩොලර් මිලියන දෙදහස් හත්සියයක - බිලියන 2.7ක - විතර ඉතුරුවක් කරගන්න තිබුණා. මොකද, සංචාරක කර්මාන්තයෙන් ගිය අවුරුද්දේ අපේක්ෂිත සම්පූර්ණ ආදායම ඩොලර් බිලියන පහක් වුණත්, මිලියන පන්සියයක්වත් නොලැබෙන තත්ත්වයක් තුළ ඒ පාඩුව වෙනත් පැත්තකින් පියවා ගන්න පුළුවන් කියන එක අපි කිව්වා. ඒකට ඇහුම්කන් දුන්නේ නැහැ. නමුත්, පසුගිය "කෝප්" කමිටු රැස්වීමකදී අපි ඒ ගැන අහනකොට තෙල් සංස්ථාවේ බලධාරීන් කිව්වා, ඒක ඒ අයට කරන්න හැකියාවක් ලැබුණේ නැහැ කියලා. නමුත්, oilවලින් ලාභයක් ලබා ගන්න, ඉතුරුවක් කර ගන්න පුළුවන්කම තිබියදී ඒ සඳහා කටයුතු නොකර, 2020 මැයි මාසයේ 10වැනි දා ජනාධිපති ලේකම් පුංචිබණ්ඩා ජයසුන්දර මැතිතුමා රජයේ සේවකයන්ගෙන් ඉල්ලීමක් කළා, මාස භාගයක පඩිය පරිත්‍යාග කරන්න කියලා. අපි දන්නවා, මේ ආණ්ඩුව පත් කරන්න කැප වුණු, ඡන්දය දුන්නු සියයට හැත්තෑවක් විතර පිරිස රජයේ සේවකයන් බව. රජයේ සේවකයන්ට රුපියල් දහදාහක වැටුප් වැඩිවීමක් අපේ රජයෙන් ලබා දුන්නාට පස්සේ ඒ අය අනෙක් පැත්තට ඡන්දය දුන්නා. කොවිඩ්-19 වසංගතය ආවාම ඉස්සර වෙලාම "ෂොට්" එක වැදුණේ ඒ ගොල්ලන්ටයි. මාස භාගයක පඩිය දෙන්න කිව්වා.

ඒ විතරක් නොවෙයි, අඩු ආදායම්ලාභි ජනතාවගේ ආදායම් අහිමි වුණු නිසාත්, ආණ්ඩුව දෙන රුපියල් පන්දහස කන්න තියා ලෙවකන්නත් මදි නිසාත් පසුගිය ජූනි මාසයේ 25වැනි දා අපි ඉල්ලීමක් කළා, කරන්ට් බිලට, වතුර බිලට මාස හයක සහනයක් දෙන්න කියලා. ත්‍රිරෝද රථ පදවන මහත්වරුන්ගේ, ඩිමෝ බට්ටා වාහන පදවන මහත්වරුන්ගේ ව්‍යාපාර කඩාගෙන වැටුණා. ලීසිං කොම්පැනිවලින් රීරි යක්ෂයන් වාගේ ඒ ගොල්ලන්ගෙන් ලීසිං වාරික ඉල්ලාගෙන ආවා. අපි කිව්වා, ඒකට සහනයක් දෙන්න කියලා. ඒකටත් සියයට හතරක සහනයක් හඳුන්වා දුන්නා. නමුත්, ඒ සහනය ජනතාවට නිසියාකාරව ලැබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මට වැඩිපුර විනාඩි හයක කාලයක් ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු එස්.එම්.මරික්කාර් මහතා]

ඒ වාගේම ජූලි මාසයේ 17වැනි දා අපි සෞඛ්‍ය ඇමතිතුමියගෙන් ඉල්ලීමක් කළා, සෞඛ්‍ය මාර්ගෝපදේශ ටික ලබා දෙන්න කියලා. එතුමියට මාස එකහමාරක් දීලා තිබිලාත් මැතිවරණය නිසා ඒක ඉදිරිපත් කරන එක කල් දමමින් හිටියා. අපි දැක්කා, කොළඹ දිස්ත්‍රික්කයේ සමහර ඇමතිවරු කිව්වා, "කොවිඩ් -19 පරාජය කළ අංක 19ට ඡන්දය දෙන්න." කියලා. අපේ ගාමිණී ලොකුගේ ඇමතිතුමා එහෙම ඒ ගැන හොඳට දන්නවා. එහෙම තමයි "කොවිඩ්-19" වික්කේ. හැබැයි, ඒ සෞඛ්‍ය මාර්ගෝපදේශ දෙන්නේ නැතුව, PCR tests කරන එක පහළොස්දහසේ ඉඳලා පන්දහසට අඩු කරලා මේ රට තුළ දෙවැනි රැල්ල නිර්මාණය වෙන්න ඉඩ දීලා බලාගෙන හිටියා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොවිඩ්-19 දෙවැනි රැල්ල ආවාට පසුවත් මොකක්ද වුණේ? ඒකට නිසි පිළියම් යොදනවා වෙනුවට "විස්ස, විස්ස" කියමින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඒකාධිපති විධියට සම්මත කර ගැනීමේ තදියමක් තමයි ඒ අයට තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඒ වෙලාවේ අපි රජයට බලකිරීමක් කළා, "කළ ගෙඩි අතහරින්න එපා, මිථ්‍යාව පස්සේ යන්න එපා, එක එක පැණි පස්සේ දුවන්න එපා. වෛද්‍ය විද්‍යාත්මක යථාර්ථය අනුව අවසාන විසඳුම වන්නේ එන්නතයි. ඒ නිසා එන්නත ආනයනය කරන්න" කියලා. අඩුම තරමින් ඒ දේ කරන්නවත් කටයුතු කළේ නැහැ. Oxford-AstraZeneca එන්නතේ මාත්‍රා ලක්ෂ දහයක් ඉන්දියාවෙන් ලැබුණා. ඒකෙන් ලක්ෂ පහක් ලැබුණේ donation එකක් විධියට. ලක්ෂ පහක් සල්ලි දීලා අරගෙන තිබෙනවා. ලක්ෂ දෙකක් WHO එකෙන් COVAX පහසුකම යටතේ ලබා දුන්නා. මෙයින් 950,000 දෙනකුට විතර එන්නත ලබා දීලා තිබෙනවා. දැන් දෙවැනි මාත්‍රාව දෙන්න බඩු නැහැ. දෙවන මාත්‍රාව ජනතාවට ලබා දෙන බව ලලිත් වීරතුංග මැතිතුමා TV එකේ කියනවා මම දැක්කා. මැයි මාසයේ අග හෝ ජූනි මාසයේ අග හෝ කල් ඉකුත්වීමට නියමිත මාත්‍රා ටික ජනතාවට ලබා දුන්නත් ලක්ෂ දෙකහමාරකට පමණයි ලබා දෙන්න පුළුවන්. ඉතිරි ලක්ෂ හයට දෙන්න මේ vaccine එක නැති වුණොත් මොකද වෙන්නේ? ඒ ගොල්ලන්ට අබ සරණයි ද? රාජ්‍ය තාන්ත්‍රිකව ගනුදෙනු කරන්න දන්නේ නැති නිසා, මේ vaccine එක ගෙන්වා ගන්න බැරි නිසා අසත්‍යයක් කියලා වෙනත් vaccine එකක් දීලා ඒ ජීවිත බිල්ලට දීමේ සූදානමක්ද ආණ්ඩුවට තිබෙන්නේ කියලා අපි අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම උදාහරණයක් කියන්න කැමැතියි. අපේ වාගේම ජනගහනයක් ඉන්න රටක් තමයි ඊශ්‍රායලය. ඊශ්‍රායලයේ අගමැතිතුමා මැඩෝනා සමාගමේ සහ ෆයිසර් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරින් සමඟ ඉතාම කිට්ටුවෙන් කථා කරලා, ඩොලර් 15ක් වූ vaccine එකකට ඩොලර් 30 ගණනේ ගෙවලා අරගෙන මුළු රටේම ජනතාවට ඒ එන්නත් ලබා දුන්නා. අද ඒ රටේ face masks පැළඳීමේ අවශ්‍යතාවක් නැහැ. "එන්නත සඳහා ඩොලර් පහළොවක් වැඩිපුර ගෙව්වේ - දෙගුණයක් ගෙව්වේ- ඇයි" කියලා මාධ්‍ය එතුමාගෙන් අහන කොට එතුමා කිව්වා, දවස් තුනක් රට වහලා තිබෙන විට සිදු වන ආර්ථික හානියට වඩා, වැඩිපුර මුදලක් දීලා හෝ මුළු රටේම ජනතාවට එන්නත් ලබා දීම ලාභයි කියලා.

Oxford-AstraZeneca එන්නතක් ඩොලර් 5යි. අද වන විට අපේ රටේ ජනතාවගෙන් භාගයකට, එනම් මිලියන 11කට පමණ ඒ එන්නත ලබා දුන්නා නම් ඒ සඳහා රුපියල් බිලියන 10යි වැය වන්නේ. අපේ ණය බර ඇමෙරිකානු ඩොලර් බිලියන 10කට වඩා තිබෙනවා. රුපියල් බිලියන 10ක් වියදම් කරලා ඉන්දියාවෙන් බැරි නම්, එංගලන්තයෙන් බැරි නම් කොයි රටකින් හෝ vaccine එක ගේන්න බැරි වෙලා තිබෙනවා. 'සර් ෆේල්' බව එයින් නැවත වතාවක් ඔප්පු කළා කියන එක මා කියන්න කැමැතියි.

මම මේ අවස්ථාවේදී තවත් කරුණක් කියන්න කැමැතියි. අපට ලැබුණු එන්නත් ජනතාවට ලබා දෙද්දී රුපියල් 5,000 දීමනාව බෙදන්න යන, ජනතාවගේ එදිනෙදා රාජකාරිවලට සෘජුව සම්බන්ධ වන, front line එකේ සිටින ග්‍රාම නිලධාරින්ට, සමෘද්ධි නිලධාරින්ට, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්ට, ආර්ථික සංවර්ධන නිලධාරින්ට ප්‍රමුඛතාව දිය යුතුව තිබුණා. මුළු ලංකාවම ගත්තත්, ඒ නිලධාරින්ගේ උපරිම සංඛ්‍යාව 60,000යි. නමුත් ඒ අය ගැන කිසිම තැකීමක් කළේ නැහැ. අපි විපක්ෂය විධියට වගකීමෙන් කිව්වා, ඒ අයටත් එන්නත ලබා දෙන්න කියලා. රුපියල් 5,000 දෙන්න යන්නේ ඒ අය; මිනිසුන්ගෙන් බැණුම් අහන්න, ගුටි කන්න යන්නේ ඒ අය. ඒ අයටවත් ප්‍රමුඛතාව දුන්නේ නැහැ.

PCR tests අඩු කිරීම නිසා තමයි අද තුන්වැනි රැල්ලක් මේ රට තුළ නිර්මාණය වුණේ. මම ස්තුතිවන්ත වෙනවා, සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියට. එතුමිය ප්‍රජා වෛද්‍ය විශේෂඥවරියක විධියට ඉතාම වගකීමෙන් තීරණ ගන්න උත්සාහ කරද්දී, තකතීරුවන් කිහිපදෙනෙක් එකතු වෙලා එතුමියගේ කකුලෙන් ඇදලා රට lock down කරන්න දෙන්නේ නැතිව මේ වැඩ පිළිවෙළ නිසියාකාරව ක්‍රියාත්මක වීමට ඉඩ නොදීම පිළිබඳව අපි කනගාටුව ප්‍රකාශ කරනවා. හෙට අනිද්දා වන කොට දිනකට කොවිඩ් රෝගීන් 8,000ත් 10,000ත් අතර සංඛ්‍යාවක් දක්වා වැඩි වෙන්න පුළුවන් කියලා එතුමිය කියා තිබෙන බව මම අන්තර් ජාලයෙන් දැක්කා. අපට වඩා විශේෂඥයෙකු එහෙම කියනවා නම්, අපි ඒ කථාවට ඇහුම් කන් දිය යුතුයි. මේ වෙලාවේ කවුරු හෝ ඇවිත් රටේ ජනතාව බේරා ගැනීමට, මේ කාරණය කළමනාකරණය කිරීමට කටයුතු කරන්නේ නම්, ඒ සඳහා අවශ්‍ය ඉඩ ලබා දෙන්න ඕනෑය කියන එක මම ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට මේ රට අරාජික කරලා තිබෙන්නේ කොවිඩ් පැත්තෙන් විතරක් නොවෙයි. අද සංවෘත ආර්ථිකයක් කරා මේ රට ගෙන යමින් රටේ ජනතාව බිල්ලට දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවා. මේ ආණ්ඩුවේ අය දැන් යෝජනා කරනවා රටට ගෙන්වන තෙල්වලින් සියයට 10ක් අඩු කිරීමට. ඒකෙන් ඩොලර් මිලියන 400ක්, 500ක් ඉතිරි වෙනවා ලු. ඒ වාගේම, රටට ගෙන්වන ඖෂධවලින් සියයට 10ක් අඩු කළාම ඩොලර් මිලියන 50ක්, 60ක් ඉතිරි වනවා ලු. ඒ වාගේම පිටරටින් ආහාර ගෙන්වන එක අඩු වුණාම ඩොලර් මිලියන 500ක් ඉතිරි වෙනවා ලු. "මෙන්න මේ විධියට තමයි අපි මේ ආර්ථික අර්බුදය පාලනය කරන්න හදන්නේ" කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත කථාව මේකයි. අද මේ රජයට සංචිත නැහැ. මේ රජය සංචිත වශයෙන් තිබුණු සියලු මුදල් ණය ගෙවීම සඳහා පාවිච්චි කිරීම නිසා තමයි අද සංචිත හිඟ වෙලා ඩොලරයේ රුපියල් අගය වැඩි වෙලා තිබෙන්නේ. අලුත් ආදායම් මාර්ග උපයන්නේ නැතිව, තිබෙන සංචිතවලින් ආර්ථිකය කළමනාකරණය කිරීමේ හැකියාවක් නැහැ. "Made in Sri Lanka" කියන සංකල්පය හොඳයි. නමුත් ඒ යටතේ කොපමණ අලුත් ආදායමක් ඉපයුවාද කියලා අපට කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තමයි පොහොර අර්බුදය. අපේ රට තේ අපනයනයෙන් ඩොලර් මිලියන 1,346ක්, රබර්වලින් ඩොලර් මිලියන 24ක්, පොල්වලින් ඩොලර් මිලියන

330ක්, අනෙකුත් කෘෂි භෝගවලින් ඩොලර් මිලියන 499ක් ආදි වශයෙන් අවුරුද්දකට ඩොලර් මිලියන 2,199ක් උපයන රටක්. අපට කාබනික පොහොර කථාව පෙන්වලා ඔබතුමන්ලා ඇත්තටම කළේ මොකක්ද? අද පොහොර ගෙන්වීමට ඩොලර් මිලියන 400ක් ගෙවන්න මුදල් නැහැ. ලංකාවේ කෘෂිකාර්මික ශ්‍රම බලකාය අඩු වීම නිසා තමයි ජනතාව අවුරුදු 50ක්, 60ක් තිස්සේ රසායනික පොහොරවල අහිතකර බලපෑමට ගොදුරු වුණේ. කාබනික පොහොර භාවිතය හොඳයි. හැබැයි, මේක හමුදා අනුබණ්ඩයකට නියෝග දෙනවා වාගේ එක පාරට කරන්න පුළුවන් දෙයක් නොවෙයි. විශේෂඥයන්ගේ දැනුම අරගෙන, තිබෙන සම්පත් අනුව ඒ ක්‍රමය ක්‍රමානුකූලව දියුණු කරගන්නා වැඩ පිළිවෙළක් හදලා ඒ වැඩ පිළිවෙළට අනුව කටයුතු කරගෙන ගියා නම් තමයි හොඳ. හැබැයි, දැන් මේ කරන වැඩෙන් මොකක්ද වෙන්නේ? කෘෂි කර්මාන්තයෙන් සියයට 10ක් කප්පාදු වුණොත් මේ රටේ මිලියන දෙකකට වැඩි ජනතාවට අනාගතයේදී කන්න හාල් නැති වෙනවා. එතකොට පිට රටින් එම ආහාර ද්‍රව්‍ය ගෙන්වන්න විශාල මුදලක් වැය කරන්න සිදු වන විට මොකක්ද වෙන්නේ? එසේ මුදල් යොදවන එකෙන් ඩොලරයේ අගය තවත් කීයකින් වැඩි වෙයිද කියන එක පිළිබඳව ඔබතුමන්ලාට කිසිම අවබෝධයක් නැහැ.

තෙල් සංස්ථාව ගෙන්වපු තෙල්වලට සල්ලි ගෙවන්න විධියක් අද නැහැ. ඒ වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,000ක් මහජන බැංකුවට සහ ලංකා බැංකුවට ණයයි. ඒ ටික ගෙව්වාම මොකක්ද වෙන්නේ? සංචිතය බින්දුවට ම බහිනවා. හැබැයි, මිනිස්සු තෙල් ගැහුවා; මිනිස්සු සල්ලි දීලා තෙල් ගැහුවා. ඇයි එහෙම නම් තෙල් සංස්ථාවට බැරි බැංකුවලට සල්ලි ගෙවන්න? ඒ නිසා තෙල් ටික ගෙන්වන්න අද වන විට විශේෂයෙන්ම මැද පෙරදිග රටවල දෙපතුල ළඟ වැටෙන්න අපේ රටට සිදු වෙලා තිබෙනවා. අපට ඒ පිළිබඳ කිසිම සන්තෝෂයක් නැහැ.

මේ රටේ බලශක්ති අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා; ආහාර අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා; ඖෂධ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊයේ වසංගත රෝග විශේෂඥතුමා කියනවා මම දැක්කා, දැන් කොවිඩ්-19 හැදිලා මැරෙන අයට වෙනත් ලෙඩ තිබුණා නම්, ඒ මැරෙන අය ගණන් ගන්නේ කොවිඩ්වලින් මැරුණු අය හැටියට නොවෙයි කියලා. අද ෆාමසිවල blood pressureවලට ගන්නා පෙති නැහැ. ඒ වාගේම පිළිකාවලට නොමිලයේ දෙන බෙහෙත් අඩුයි; ඇස් කාච අඩුයි. ඒ නිසා දැන් ඩබල් ගේමක් ගහන්නයි හදන්නේ, කොවිඩ්-19 නිසා මැරෙන ප්‍රමාණය අඩුයි, වෙනත් ලෙඩ රෝගවලින් තමයි මැරෙන්නේ කියලා. නමුත්, මේ දවස්වල ජනතාවගේ අවධානය යොමු වෙලා තිබෙන්නේ කොවිඩ්-19 නිසා මැරෙන ගණන කීයද කියන කාරණයට. SMS alert එක එන්නේ ඒ ගැන.

මා ඉතාම පැහැදිලිව මේ කාරණයත් කියන්න කැමැතියි. මේ කටයුතු කළමනාකරණය කරගන්න නම් මොකක්ද කරන්න ඕනෑ? මේ තිබෙන ණය ටික ප්‍රතිව්‍යුහගත කරගෙන, විපක්ෂයේ හඬටත් ඇහුම් කන් දීලා ජාතික ප්‍රතිපත්තියක් යටතේ ජාතික වැඩ පිළිවෙළකට නොගියොත්, ඊළඟ මැතිවරණයේදී තමුන්නාන්සේලාට අබ සරණයි! එසේ කියමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.49]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Rohitha Abegunawardhana - Minister of Ports and Shipping)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය, මුළු ලෝකයම කොවිඩ්-19 වසංගතයට මුහුණ දෙමින් ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා තිබෙන අවස්ථාවක්. අපි දන්නවා, කොවිඩ්-19 මුළු ලෝකයටත්, අපටත් අලුත් අත්දැකීමක් බව. එම අත්දැකීමට මුහුණ දෙන ගමන් ලෝකයේ රටවල් කිහිපයක්ම කොවිඩ්-19 පාලනය කරන්න අවශ්‍ය එන්නත් මේ වන විට සොයා ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ්-19 මර්දනයට එන්නත හොයාගන්න පුළුවන්කම තිබුණත්, ඒ වාගේම ලෝකයේ තිබෙන තවත් භයානක රෝගවලට නොයෙක් විධියේ ප්‍රතිකාර හොයාගන්න පුළුවන්කම තිබුණත්, අපේ රටේ විපක්ෂයට හැදිලා තිබෙන රෝගයට නම් ලෙහෙසියෙන් කිසිම බෙහෙතක්, එන්නතක් හොයා ගන්න හම්බ වෙන්නේ නැහැ. ඒ අයට තිබෙන්නේ වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, දේශපාලනීකරණය කියන රෝග. මොනයම් හෝ මාතෘකාවක් තිබෙනවා නම්, එම මාතෘකාව දේශපාලනීකරණය කරගෙන බොර දියේ මාළු බාන විපක්ෂයක් බවට අද ඒ අය පරිවර්තනය වෙලා තිබෙනවා. අපි ඒ ගැන ඉතාම කනගාටුවෙන් කථා කරන්නේ.

මේක ලෝක ව්‍යසනයක්. අපේ රටේ විපක්ෂය හිතා ගෙන ඉන්නවා, කොවිඩ්-19 වසංගතය මේ රටට ගෙනාවේ බලයේ සිටින අපේ ආණ්ඩුවයි කියලා. බලයේ සිටින මේ ආණ්ඩුව නොවෙයි, කොවිඩ්-19 වසංගතය මේ රටට හෝ ලෝකයට හෝ දුන්නේ. මේක ස්වභාව ධර්මයෙන් ලැබුණු දෙයක්. ස්වභාව ධර්මයෙන් ලැබුණු දෙයක් දෙස දේශපාලන කාරණා තුළින් දකින රෝගය වැලඳී තිබෙන එතුමන්ලාට විසඳුමක් ලබා දෙන්න -මා අර කියපු විධියට- කිසිම එන්නතක් හොයාගන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වන කොට මුළු ලෝකයේම කොවිඩ්-19 වැලඳුණු රෝගීන් සංඛ්‍යාව පහළොස්කෝටි විසිපන්ලක්ෂ තිස්හතරදහස් පන්සිය විසිඅටක් වෙනවා. මුළු ලෝකයේම සිටින ජනතාවගෙන් එපමණ ප්‍රමාණයක් කොවිඩ් රෝගීන් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. එතරම් ප්‍රමාණයක් කොවිඩ් රෝගීන් බවට පරිවර්තනය වන කොට මුළු ලෝකයේම කොවිඩ් මරණ සංඛ්‍යාව තිස්එක්ලක්ෂ අනූඅටදහස් පන්සිය විසිඅටක් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තමයි ලෝකයේ තත්ත්වය.

අපි හැම වෙලාවේම සාපේක්ෂව බලන්න පුරුදු වෙන්න ඕනෑ. සාපේක්ෂව බලන්නේ නැතිව අපි කොහොමද මේකට මුහුණ දෙන්නේ? ලෝකයේම තත්ත්වය එසේ තිබියදී අද වන විට අපේ

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

රටේ තත්ත්වය මොකක්ද? අද වන විට ලංකාවේ ජනතාවගෙන් එක්ලක්ෂ දහතුන්දහස් හයසිය හැත්තෑහයක් කොවිඩ් රෝගීන් බවට පත් වී තිබෙනවා. ඒ අය අතරින් සුවය ලැබූ සංඛ්‍යාව අනූඅටදහස් දෙසීයනවයක් වනවා. මේ එක්ලක්ෂ දහතුන්දහස් හයසිය හැත්තෑහය දෙනා අතරින් මිය ගිය සංඛ්‍යාව හත්සිය නවයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ සංඛ්‍යාවත් අවම කරගන්න තමයි අපි උත්සාහ කළ යුතු වන්නේ. නමුත් ලෝකයත් එක්ක සංසන්දනාත්මකව බලන කොට, අපි අද මොන වාගේ ස්ථානයකද ඉන්නේ කියන කාරණය මුළු රටටත්, බුද්ධිමත්ව කල්පනා කරන අයටත් පෙනෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ් ආසාදිතයන් 113,676න්, මේ වනවිට 98,000ක් සුවය ලබා තිබෙනවා; 14,758ක පිරිසක් රෝහල්වල ප්‍රතිකාර ලබනවා; මිය ගිය සංඛ්‍යාව 709ක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත්, මාත් ඇතුළුව මේ රටේ සිටින හැම කෙනාම රාත්‍රී රූපවාහිනී පුවත් බලනවා. චීනයෙන් පළමු කොවිඩ් රෝගියා වාර්තා වීමෙන් පසුව ඇමෙරිකාව, මහා බ්‍රිතාන්‍යය ඇතුළු ලෝකයේ බලවත් යුරෝපා රටවල ඇති වූ තත්ත්වය අපි දැක්කා. මේ කොවිඩ් රෝගය ඒ ලෝක බලවතුන්වත් දණ ගැස්සුවා. ඒ ලෝක බලවතුන්ට හිස ඔසවන්න දුන්නාද? ඒවා ආර්ථික වශයෙන් ඉතා ශක්තිමත් රටවල්. එහෙම නම් ඔවුන්ට තිබුණා නේ, මේ වසංගතයෙන් බේරෙන්න. මම දැක්කා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සංඛ්‍යාලේඛන ගෙනැවිත්, ඒ අනුව කථා කළා. කොවිඩ් වසංගතය ලෝක බලවතුන් දණ ගැස්සුවා නම්, අපි වාගේ දියුණු වෙමින් පවතින ආසියානු රටක් ගැන කුමන කථාද? හැබැයි, අද අප සිටින තත්ත්වය දිහා බලන්න වෙන්නේ සහ සාපේක්ෂව සංසන්දනය කරන්න වෙන්නේ කුමන රටක් සමඟද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ තමයි, අසල්වැසි ඉන්දියාව. අසල්වැසි ඉන්දියාවේ රෝගීන් සංඛ්‍යාව ඊයේ වනකොට ලක්ෂ 4කට ආසන්නයි. දිනකට 3,000ක් පමණ මිය යනවා. මිනී කඳු එකතු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සුසාන භූමි භාරකරුවාට දිනකට නිදා ගන්න ලැබෙන්නේ පැය දෙකයි. ඔහු මිනී පුච්චලා ඒ සුසාන භූමිය තුළම බිත්තියකට හේත්තු වෙලා පැය දෙකක් නිදා ගන්නවා. මේ තමයි, ඉන්දියාවේ තත්ත්වය. ඉන්දියාවේ එවැනි තත්ත්වයක් තිබෙන කොට, ශ්‍රී ලංකා රජය හැටියට අපේ යුතුකම සහ වගකීම අප ඉටු කර තිබෙනවා. මේක අපට අලුත් අත්දැකීමක්. නමුත්, අපි මෙයට මුහුණ දිය යුතුයි.

අද විපක්ෂය පැත්තෙන් කථා කළ බොහෝ දෙනෙක් ඔක්සිජන් ගැන කථා කළා. විපක්ෂය නියෝජනය කරන අය මාධ්‍යයට අදහස් දක්වනකොට හුඟක් වෙලාවට ඔක්සිජන් ගැන, ඔක්සිජන් අඩුවක් ගැන කථා කරනවා. ඒ වාගේම ඉස්පිරිතාලවල තිබෙන ඇඳන් සංඛ්‍යාව ගැන කථා කරනවා. සිදු කරන PCR ප්‍රමාණ ගැන කථා කරනවා. ඒ වාගේම රටේ තිබෙන අනෙකුත් ප්‍රශ්න ගැනත් කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට යහ පාලන ආණ්ඩුව තිබුණා නම් අද ඔක්සිජන් ගැන කථා කරන, PCR ගැන කථා කරන, ඇඳන් සංඛ්‍යාව ගැන කථා කරන, ICU beds ගැන කථා කරන හැම කෙනාටම කථා කරන්න වෙන්නේ ආදාහනාගාර ගැන. එහෙම නම් ඔක්සිජන් ගැන කථා කරන්න ඉතුරු වෙන්නේ නැහැ. PCR tests කරන්න අය ඉතුරු වෙන්නේත් නැහැ. රටෙන් භාගයක් මැරිලා. එහෙම නම් මේ රට විශාලා මහනුවරක් බවට පරිවර්තනය වෙලා. ඒකට හේතුව මොකක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ යහ පාලන ආණ්ඩුව කරපු උන්නැහේලා නේ! ආර්ථික ඔස්තාර්ලා නේ! විශේෂඥ වෛද්‍යවරු නේ! හැබැයි, අවුරුදු පහක් ඒ ආණ්ඩුව කටයුතු කළේ කොහොමද? ජනාධිපතිවරයා දකුණට හරවන්න signal දානකොට, අගමැතිවරයා වමට හරවනවා. මී හරකයි, එළහරකයි වාගේ නොගැළපීමක් එතැන තිබුණේ. දෙන්නා දෙපැත්තට අදිනවා. අද මේ රටේ එවැනි තත්ත්වයක් තිබුණා නම්, - ඒ කියන්නේ මේ කොවිඩ් වසංගතය වෙලාවේ යහ පාලන ආණ්ඩුව තිබුණා නම්- අපට සිදු වන්නේ මිනී කඳු මැද ජීවත් වන්නයි. එහෙම නම් මේ උන්නැහේලාට අද කථා කරන්න වෙලාවක් හම්බ වෙන්නේ නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය. හැබැයි, දැන් කථා කරන්නේ හරියට සුද්ධෝදන රජතුමාගේ බාල මල්ලිලා වාගේ. එදා ඇඳන් මෙච්චර හැදුවා ලු; ඉස්පිරිතාල මෙච්චර හැදුවා ලු; විශේෂඥ වෛද්‍යවරු මෙච්චර සිටියා ලු. දෙයි හාමුදුරුවනේ! ඒවා කළා නම් ආණ්ඩු බලය අපට එනවාද? අපි එහෙම නම් තවම විපක්ෂයේ, එතුමන්ලා ආණ්ඩුවේ. මගේ අම්මේ! දැන් කථා කරන්නේ නවගුණවැල අතේ තබාගෙන වාගෙයි. ඉතිහාසයේ කරපු දේවල් මතක නැහැ. හැබැයි අපි බොහොම වගකීමෙන් කියනවා, වත්මන් රජය හැටියට අපේ යුතුකම හා වගකීම අප ඉටු කරන බව.

අපි vaccine එක සම්බන්ධයෙන් දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ වනවිට 925,000කට vaccine එක ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවට මෙවැනි තත්ත්වයක් අත්වෙයි කියලා අපි බලාපොරොත්තු වුණාද? අනාගතය ගැන කියන්න අපට පුළුවන්ද? හෙට රෝගීන් වැඩි වෙයිද, අඩු වෙයිද කියලා ඔබතුමාටවත්, මටවත්, රජයටවත්, කාටවත් කියන්න පුළුවන්ද? මේ ස්වභාව ධර්මය. ඒක අවිනිශ්චිතයි. හැබැයි ආණ්ඩුවක් විධියට අප දැන ගන්නට ඕනෑ, මේ තත්ත්වය පාලනය කරන්න ගත යුතු ක්‍රියා මාර්ග. ඒ ක්‍රියා මාර්ග අනිවාර්යයෙන්ම ගන්න ඕනෑ. අපි මේ වනවිට 925,000කට එන්නතේ පළමු මාත්‍රාව දීලා තිබෙනවා. දැන් දෙවන මාත්‍රාව ලබාදෙන්නට කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන්ම මේ දෙවන මාත්‍රාව ලබා දෙන්නේ ඉදිරි පෙළ අයට. ඒ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අය වෙන්න පුළුවන්; හමුදා අංශවල අය වෙන්න පුළුවන්. රෝගීන්ට ඉතා ආසන්නව ක්‍රියා කරන අයට දෙවන මාත්‍රාව අපි ලබා දෙනවා. ඒ වාගේම, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් එම 925,000ට අවශ්‍ය දෙවන මාත්‍රාව ලබාදීමට කටයුතු කරනවා.

කොරෝනා සඳහා තිබෙන වෙනත් vaccines සම්බන්ධයෙනුත් මේ වන විට සාකච්ඡා පවත්වාගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රජයක් හැටියට තීන්දු අරගෙන තිබෙනවා එන්නත් ලබාගෙන මාස හතරක් ඇතුළත මිලියන 13ක් එන්නත් කරන්න. අද ලෝකය දිහා බලන්න. ලෝකයේ රටවල් ගත්තාම, එකම එන්නතක්වත් ලබා නොදීපු, එකම මාත්‍රාවක්වත් ලබා නොදීපු රටවල් 50කට වැඩි ගණනක් තිබෙනවා. නමුත් අපි එන්නත්කරණය සම්බන්ධයෙන් අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

සමහර අවස්ථාවලදී විපක්ෂය කියනවා, ඉතා ඉක්මනින් රට lock down කරන්න; මුළු රටම වහන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළු රටම වහලා නැවත වතාවක් රට විවෘත කළාට පසුව රෝගීන් හමු නොවුණු රටක් තිබෙනවා නම් අපට පෙන්වන්න. ලෝකයේ කොතැනක හෝ එහෙම රටක් තිබෙනවාද කියලා අපට පෙන්වන්න. එහෙම රටක් නැහැ. අපේ රටටත් පළමුවැනි වතාවට 2020 මාර්තු මාසයේ කොවිඩ් අත්දැකීම එනකොට, මාර්තු මාසයේ සිට අපිත් අපේ රට lock down කළා. මොකද, එය අපට අලුත් අත්දැකීමක් වුණා. යුරෝපා රටවල මිනිසුන් පාරේ යනකොට මැරිලා වැටෙන හැටි දකිනකොට, ඒ මරණ බයත් එක්ක, ඒ අලුත් අත්දැකීම තුළ අපි එදා රට lock down කළා. අපි රට lock down කරලා, ඒ තත්ත්වයට මුහුණ දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවේ විපක්ෂය හොඳටම දැනගෙන සිටියා, මැතිවරණය

පරදිනවා කියලා. අපි හොඳටම දැනගෙන සිටියා, අපි දිනනවා කියලා. 2020 අප්‍රේල් 25වන දා වශයෙන් පාර්ලිමේන්තු මැතිවරණයට දින නියම කරලා තිබුණා. අපට තිබුණා, මේ තරම් රෝගීන් හමු වුණේ නැහැ, මේ තරම් පිරිසක් මිය ගියේ නැහැ කියලා එදා පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන්න. ඉන්දියාව දෙස බලන්න. ඉන්දියාවේ රෝගීන් ලක්ෂ හතරක් හමු වෙනකොට, ඉන්දියාවේ මැතිවරණ පවත්වනවා; පෙළපාළි යනවා. නමුත් ලංකාව එදා මොකක්ද කළේ? අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා තීන්දුවක් ගත්තා. මොකක්ද? දින නියමයක් නොමැතිව පාර්ලිමේන්තු මැතිවරණය කල් තබන්න. මේකයි ඇත්ත තත්ත්වය.ඒ නිසා අපි රජයක් හැටියට අපේ වගකීම ඉටු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ රෝහල්වල තිබෙන ඇඳන් ප්‍රමාණය කොපමණද? අපේ ගරු ඇමතිතුමියත් සභාවේ ඉන්නවා. එතුමිය ඉතාම හොඳින් තම වගකීම ඉටු කරන ඇමතිතුමියක්. අපේ ඉස්පිරිතාලවල තිබෙන මුළු ඇඳන් ප්‍රමාණය 86,153ක් පමණ වනවා. කොවිඩ් රෝගීන් සඳහා ඇඳන් 5,728ක් අපි වෙන් කරලා තිබෙනවා. මේ වන විට රෝගීන් 14,000ක් සිටින නිසා ඇඳන්වල අඩුවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඇත්ත කියන්න ඕනෑ. මේ වෙනකොට අපට හමුදාව මඟින් තවත් ඇඳන් 3,500ක් අතරමැදි ස්ථානවලට ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරින් එකතු වෙලා තවත් ඇඳන් ප්‍රමාණයක් සොයා ගෙන තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කය ගත්තත්, කළුතර දිස්ත්‍රික්කය ගත්තත්, ගම්පහ දිස්ත්‍රික්කය ගත්තත්, ඒ ඒ දිස්ත්‍රික්කවල දේශපාලන අධිකාරිය සහ දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්වරු, සෞඛ්‍ය අංශය ඇතුළු රාජ්‍ය සේවයේ නිලධාරින් එකතු කරගෙන අපි අලුතින් ඇඳන් සොයා ගන්නවා. බොහෝ වේලාවට ඒ දිස්ත්‍රික්කවල තිබෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල නේවාසිකාගාරවල - hostelsවල - තිබෙන ඇඳන් ගන්නවා. කළුතර දිස්ත්‍රික්කයේ අපි එකතු වෙලා එසේ කටයුතු කළා. අපේ ප්‍රදේශයේ පියල් නිශාන්ත රාජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. අපි අලුතින් ඇඳන් 1,000ක් කළුතර දිස්ත්‍රික්කයට සොයා ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක කළ යුතු දෙයක්. මොකද, අපට දවස් දෙක තුනක් රෝගීන් ගෙවල්වල තියන්න පුළුවන්කමක් නැහැ. අපට මේවා ගැන කථා කරන්න පුළුවන්. නමුත් මේ තත්ත්වය ප්‍රායෝගිකව දකින්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ප්‍රායෝගිකව දකිනකොට, ක්‍රියාත්මක කරනකොට තමයි යම් යම් අඩුපාඩුකම් තිබෙන බව පෙනෙන්නේ. රෝගීන් අහඹු ලෙස එක එක තැන්වලින් මතු වෙනවා. ඒ කටයුතු වෙනදා කළේ අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු. දැන් අපි හමුදාවත් එක්ක එකතුවෙලා තමයි ඒ රෝගීන් ඉස්පිරිතාලවලට ගෙන යන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ.

රටේ මහ ජනතාවටත් මේ ගැන වගකීමක් තිබෙනවා. අපි හැමෝටම වගකීමක් තිබෙනවා. අපි, මුඛ ආවරණ පලඳින්නේ නැතුව, සෞඛ්‍ය උපදෙස් පිළිපදින්නේ නැතුව නිදහසේ වැඩ කටයුතු කළොත් අපට සිද්ධ වෙන්නේ මොකක්ද ? අපිම අපේ මාරයාට අත වනා ගැනීමක් තමයි එතකොට සිද්ධ වෙන්නේ.

කවුරුන් හෝ වැරදි දෙයක් කරනකොට විපක්ෂයක් හැටියට කියනවා නම් ඒක හරියි කියලා, ඒකද මේ වෙලාවේ කළ යුතු කියලා මම අහනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. විපක්ෂ නායකතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමා හිටියා නම් හොඳයි. මෙම කොවිඩ්-19 රෝගය සම්බන්ධයෙන් මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දේශපාලන මතය අනුව වෙනත් ඕනෑම දෙයක් සම්බන්ධයෙන් අපි දෙපැත්තට බෙදෙමු. හැබැයි, මේක මුළු ලෝකයම වෙළාගත්, අපේ ජීවිත බිලි ගන්නා වසංගතයක් බවට පත්වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදීවත් දේශපාලන වශයෙන් බෙදී වෙන්වෙලා, වෛරයෙන්, ක්‍රෝධයෙන් කටයුතු නොකර, ආණ්ඩුවත් සමඟ අත්වැල් බැඳගෙන ජනතාවගේ ජීවිත බේරා ගනිමු කියන ඉල්ලීම මම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, lock down කිරීම ගැන දැන් කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොවිඩ් වසංගතය හමුවේ ලෝකයේ රටවල් අනුගමනය කරන ක්‍රමවේද දෙකක් තිබෙනවා. එක ක්‍රමයක් තමයි රට lock down කරලා මේ වසංගතයට මුහුණ දීම. දෙවැනි ක්‍රමය තමයි රට තුළ රෝගීන් වැඩි වන ස්ථාන තෝරාගෙන ඒ ප්‍රදේශ සම්බන්ධයෙන් යම් යම් ක්‍රමවේද පාවිච්චි කරලා, සංචරණ සීමා පනවලා මෙම රෝගයත් එක්ක ඉදිරියට යෑම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කට උල් කරලා, නහය පැත්තකට අඹරලා රට lock down කරන්න කියන්නේ කොවිඩ්වලින් රට ආරක්ෂා කරගන්න නොවෙයි. ඒ බව කථා කරන කෙනාගේ ඇස් දෙකෙන්ම පේනවා. කට උල් කරනකොට, ලප එළියට එන විධියට කථා කරනකොට පේනවා, මේ කථා කරන්නේ අනිවාර්යයෙන්ම වෙනත් චේතනාවක් හිතේ තියාගෙන කියලා. මොකක්ද ඒ චේතනාව? රට lock down කළාම තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්න මතු වෙන්නේ. කම්කරුවාට, එදිනෙදා හම්බකරගෙන ජීවත්වෙන මිනිහාට ජීවත් වෙන්න විධියක් නැති වෙනවා. තේ දළු කඩන මනුස්සයාට තේ දල්ල කඩා ගන්න බැහැ, රබර් කිරි කපන කෙනාට රබර් කිරි ටික කපා ගන්න බැහැ. ඒ වාගේ අභියෝගවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒවාට මුහුණ දෙනකොට මොකක්ද වෙන්නේ? ඉන් පසුව කන්න නැති ප්‍රශ්නය ඇති වෙනවා, ආර්ථික ප්‍රශ්න ඇති වෙනවා. අන්න එතකොට තමයි රට ඇතුළේ ප්‍රශ්න මතුවෙලා, "අපට කන්න දෙන්න" කියලා මිනිස්සු පාරට බහින්න පටන් ගන්නේ. ඒ වෙලාවට තමයි විපක්ෂයට හොඳ වේදිකාවක් ලැබෙන්නේ. ඒ වෙලාවට තමයි විපක්ෂයට හොඳ තෝතැන්නක් ලැබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉන්න විපක්ෂය කවදාවත් ස්ථාවර ආණ්ඩුවකට කැමැති නැහැ. ඒ ගොල්ලෝ කැමැති අස්ථාවර ආණ්ඩුවකට. මොකද, ස්ථාවර ආණ්ඩුවක් තිබුණොත් එතුමන්ලාට වේදිකාවක් නැහැ, අස්ථාවර ආණ්ඩුවක් තිබුණොත් වේදිකාවක් තිබෙනවා. කොවිඩ් වසංගතය මැද්දේත් අපට ස්ථාවර ආණ්ඩුවක් තිබෙන නිසා දැන් එතුමන්ලා නන්නත්තාර වෙලා. එතුමන්ලා කවදාවත් කැමැති නැහැ, රට ඉදිරියට යනවාට. ඒක තමයි එතුමන්ලාගේ ඇත්ත තත්ත්වය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කොවිඩ්-19 තත්ත්වයත් එක්ක අපි ජනතාවට සහන ලබාදීලා තිබෙනවා. විශේෂයෙන්ම මේ කොවිඩ් වසංගතය ඇති වුණු කාල වකවානුවේ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයන් ඇතුළු නොයෙකුත් ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාරික කටයුතු කඩා වැටිලා තිබෙනවා. ඒ අයට බැංකුවලින් සහන ලබා දෙනවා. මේ රටේ ව්‍යාපාරිකයන් රැක ගැනීම සඳහා එක් අවස්ථාවකදී අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා Central Bank එකේ නිලධාරින්ට තදින් කථා කරනවා අපි දැක්කා. එවැනි තත්ත්වයක් ඇති වුණේ මොකද? අපේ ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගන්නටයි. මේ රටේ පුංචි මිනිසුන් ඉන්නවා. අපි දන්නවා, මේ වසංගත තත්ත්වය හමුවේ ඒ පුංචි මිනිසුන්, ඒ කියන්නේ සමෘද්ධිලාභින්, අඩු ආදායම්ලාභින්, එදිනෙදා රැකියා කළ මිනිසුන් අන්ත අසරණ තත්ත්වයට පත් වුණා. එසේ අසරණභාවයට පත් වුණු මිනිසුන්ට අපි රුපියල් 5,000ක දීමනාවක් ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, මේ මොහොත වන විට කොවිඩ් රෝගියෙකුගේ ආශ්‍රිතයකුගේ නිවසක් නිරෝධායනය වන නිවසක් බවට පත් කළාම, පීඑච්අයි මහත්මයා

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඇවිල්ලා, "මෙම නිවස නිරෝධායනය වන නිවසකි" කියලා දැන්වීමක් ඇලෙව්වාම අපේ රජයෙන් ඒ ගෙදරට රුපියල් 10,000ක් වටිනා සහන මල්ලක් දෙවරකට ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එවැනි සහන මල්ලක් ලබා දෙනවා. නමුත් දැන් මේවා ගැන කථා කරන්නේ නැහැ. කරන දේවල් ගැන කථා කරන්නේ නැහැ. නොකරන දේවල් ගැන තමයි කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් හැටියට අපට වග කීමක් තිබෙනවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමියට අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා, දිවා රෑ නොබලා ඉතාම වුවමනාවෙන් සහ කැපවීමෙන් තමන්ගේ ඒ වගකීම ඉටු කිරීම ගැන. ගරු ඇමතිතුමියනි, එම වගකීම ඉතාම සාර්ථකව ඉටු කරන ගමන්, ඔබතුමියට සහාය දෙන කාර්ය සාධක බලකායට, අපේ හමුදාපතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවට, සෞඛ්‍ය සේවයේ පහළම සිටින කම්කරුවාගේ ඉඳලා විශේෂඥ වෛද්‍යවරුන් දක්වා අපි මේ අවස්ථාවේදී අපේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. හැබැයි, ඒ අතරතුර අවාසනාවකට වාගේ සමහර අවස්ථාවලදී සමහර වෛද්‍යවරු කරන ප්‍රකාශ දිහා බැලුවාම අපට කනගාටුවක් ඇති වනවා. ඔබතුමියට පුළුවන්කමක් තිබෙනවා නම්, වැඩිපුර කථා කරන වෛද්‍යවරුන්ට වැඩිපුර වැඩ කොටසක් භාර දෙන්න කියලා මම යෝජනා කරනවා. කියවනවා වෙනුවට ඔවුන්ට වැඩ කරන්න වැඩ කොටසක් භාර දෙන්න. හුඟක් වෙලාවට සමහර වෛද්‍යවරු කියවනවා අපි දැකලා තිබෙනවා. එහෙම කියවන අයට කොවිඩ් රෝහලක් භාර දෙන්න. ඒ විධියට කියවන අයට කොවිඩ් රෝහලක් බැගින් භාර දෙන්න. එතකොට මේ කටයුතු කරන්නේ කොහොමද කියලා ඒ අයට බලාගන්න පුළුවන්. නැත්නම් ඔවුන් හැමදාම අරක කියනවා, මේක කියනවා. ප්‍රශ්නයක් ගැන කියනකොට පිළිතුරකුත් තිබෙන්නට ඕනෑ. එම නිසා ඒ තත්ත්වය ඇති කරගන්න කියලා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමියනි. කෙසේ වෙතත්, රජයක් හැටියටත්, ප්‍රජාව හැටියටත් අපි බොහොම පැහැදිලිව මේ වගකීම භාර ගන්නවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකය දිහා බලලා මේ වසංගත තත්ත්වය අඩු කර ගන්නයි අපි බලන්නේ. මේ වසංගත තත්ත්වය අඩු කරගන්න නම් අපි හැම කෙනෙකුම පරිස්සම් වෙන්න ඕනෑ. බලන්න, අද පාර්ලිමේන්තුවටත් අලුත් අත්දැකීමක් නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පාර්ලිමේන්තු සභා ගර්භයේ තිබෙන දොරවල් විවෘත කරගෙන කථා කළේ කවදාද? එළියේ තිබෙන දොරවල් විවෘත කරගෙන කථා කළේ කවදාද? මේක අලුත් අත්දැකීමක්. මේ අලුත් අත්දැකීම් ගැන අපට කථා කරන්න සිදු වෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. හිටපු සෞඛ්‍ය ඇමතිතුමා කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරමින් කථා කළා. එතුමා ඇඳන් සම්බන්ධයෙන් කථා කළා; රෝහල් සම්බන්ධයෙන් කථා කළා; වෛද්‍යවරු සම්බන්ධයෙන් කථා කළා. හැබැයි, එතුමාගේ කථාව තුළ ගැබ්වෙලා තිබුණු කාරණා සියල්ලම ඉෂ්ට වෙලා තිබුණා නම් මේ වනවිට අපට ඇඳන් හොයන්න අවශ්‍ය වෙන්නේ නැහැ. කියන විධියට එතුමන්ලා සියල්ල ඉටු කරලා තිබෙන්නේ. එතුමා තමයි ශක්‍ර දේවේන්ද්‍රයාගේ මල්ලී. මොකක්ද ඒකට හේතුව? ඇලඩින්ගේ පුදුම පහන අතේ තියාගෙන තමයි එතුමන්ලා අවුරුදු පහක් හිටියේ. ඒ විධියට ඇලඩින්ගේ පුදුම පහන අවුරුදු පහක් අතේ තියාගෙන ඉඳලා ගහපු පදයකුත් නැහැ, බෙරේ පලුවකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කයට ගිහිල්ලා බලන්න, මුල්ගල් පැළවෙනවා. ඊට උඩින් තණකොළ ගස් වැවිලා. කෙනෙකුට ඇඟිල්ලක් දිගු කරන විට ඇඟිලි හතරක්ම තමන් දෙසට යොමු වන බව කරුණාකරලා මතක තබා ගන්න කියලා අපි එතුමන්ලාට කියනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ ගෝලයන්ට කියන්න, කැඩපත ළඟට ගිහිල්ලා බලන්න කියලා. එතකොට තමන්ගේ මුහුණ මොන වාගේද කියලා තේරෙයි. ඔබතුමාත් කැඩපතක් ළඟට ගිහිල්ලා බලන්න, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ, මහින්ද රාජපක්ෂ අගමැතිතුමාගේ රජය යටතේ ගරු සෞඛ්‍ය ඇමතිතුමියත් එක්ක අපි මේ අභියෝගය භාර ගන්නවා. හැකියාව තිබෙනවා නම් කරන්න බැරි දෙයක් නැහැ. අපි ඒ යුතුකම අනිවාර්යයෙන්ම ඉටු කරනවාය කියන කාරණය මතක් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.09]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுக்குத் தரப்படுவது 10 நிமிடங்கள், அதிலும் 2 நிமிடங்களை வெட்டாதீர்கள்! எங்களுக்கு ஒதுக்கப்பட்ட நேரத்தை எங்களுக்குத் தருமாறு தயவாகக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று மிக முக்கியமாக 'கொவிட்' பற்றிய ஒத்திவைப்புவேளை விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. நேற்று முன்தினம் இந்தியாவின் தமிழ்நாடு மற்றும் பல மாநிலங்களுடைய தேர்தல் முடிவுகள் வெளிவந்திருக்கின்றன. தமிழ் நாட்டிலே தேர்தலில் வெற்றிபெற்றிருக்கின்ற முத்துவேல் கருணாநிதி ஸ்டாலின் அவர்களுக்கு நாங்கள் இந்தச் சபையினூடாக எங்களுடைய வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றோம். அத்தோடு, அவரோடு இணைந்து கூட்டாகப் போட்டியிட்ட வை. கோபால்சாமி, தொல். திருமாவளவன் உட்பட அவரோடு

இணைந்த இடதுசாரிக் கட்சிகளின் உறுப்பினர்களுக்கும் இந்த இடத்திலே வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றோம். வருகின்ற 7ஆம் திகதி தமிழ் நாட்டினுடைய முதல்வராகப் பதவியேற்கும் ஸ்டாலின் அவர்கள் மற்றும் எதிர்க்கட்சித் தலைவர்கள் இந்த மண்ணில் இருக்கின்ற தமிழ் மக்களையும் கருத்திலெடுத்து அவர்களுடைய பாரிய பங்களிப்பைச் செய்வது எமது மக்களுடைய எதிர்கால இருப்புக்கான வழிகளில் பெரிய ஒரு விடயமாக அமையும். அதனைவிட, எதிர்க்கட்சியாக அ.தி.மு.க. இருந்தாலும்கூட அவர்களும், அந்தத் தேர்தலிலே வெற்றியினுடைய விளிம்புவரை சென்றிருக்கின்ற சீமான், கமலஹாசன் போன்றவர்களும் எங்களுடைய விடயத்திலே அதிக கரிசனையைக் கொண்டிருப்பார்கள் என்ற நம்பிக்கையையும் நான் இந்தச் சபையினூடாக அவர்களுக்குத் தெரிவிக்க விரும்புகின்றேன்.

இன்றைய தினம் 'கொவிட்' சம்பந்தமான ஒத்திவைப்புப் பிரேரணை எதிர்க்கட்சி உறுப்பினரும் முன்னாள் அமைச்சருமான ராஜித சேனாரத்ன அவர்களால் இங்கு முன்மொழியப்பட்டது. அதனை முன்மொழிந்து பேசிய அவர், "நாங்கள் இந்த நாட்டைப் பெரிய பயங்கரவாதத்திலிருந்து மீட்டோம்; இப்பொழுது 'கொவிட்' என்கின்ற பயங்கரவாதத்தை நாங்கள் எதிர்கொள்கின்றோம்" என்று பேசினார். 'கொவிட்' என்பதற்கு இந்த உலகத்தில் எந்தவொரு நாடும் 'பயங்கரவாதம்' என்ற சொல்லைப் பாவிக்கவில்லை. அது ஒரு கொள்ளை நோய் - கொடிய நோய். அதனை எதிர்கொள்வதற்கான வழிமுறைகள் என்ன? என்பதை அறிந்து, அவற்றைச் செயற்படுத்துவதுதான் முக்கியமானதே தவிர, மீண்டும் மீண்டும் ஓர் இனத்தின் போராட்ட வரலாறுகளைப் பயங்கரவாதமாகவே காண்பிக்க முனைவது - ஆளுங்கட்சியாக இருந்தாலென்ன, எதிர்க்கட்சியாக இருந்தாலென்ன - ஓர் ஐக்கியத்திற்கான வழியாக இருக்குமென்று நாங்கள் கருதவில்லை.

குறிப்பாக இன்று இலங்கையிலே இந்த 'கொவிட்' தொற்றினால் பாதிக்கப்பட்ட மக்கள் பல்வேறுபட்ட இடங்களிலே இறந்துபோவதை நாங்கள் பார்க்கின்றோம். ஒவ்வொரு நாளும் தொலைக்காட்சியில் இரவிலே 9.00 மணிக்குப் பின்னர்தான் "இன்று 9 பேர் இறந்திருக்கிறார்கள், இன்று 5 பேர் இறந்திருக்கிறார்கள், இன்று 7 பேர் இறந்திருக்கிறார்கள்" என்ற விபரங்கள் சின்னச் சின்னச் செய்திகளாக - செய்தித் துணுக்குகளாக வெளிவருகின்றதைக் காண முடிகின்றது. அதில், சொல்லப்படுகின்ற தொகைகள் உண்மையானதா? என்ற கேள்வி பலரிடமும் இருக்கின்றது.

இலங்கையிலே இந்தக் 'கொவிட்' தொற்றை எதிர்கொள்கின்ற விதம், கட்டுப்படுத்துகின்ற விதம் ஓரளவுக்குப் பாராட்டுக்குரியதாக இருக்கின்றது. இலங்கையில் முதன்முதல் குறிப்பாக வடக்கு, கிழக்கு மாகாணங்களில்தான் அதிகமான இடங்களில் தனிமைப்படுத்தும் நிலையங்கள் உருவாக்கப்பட்டன. உதாரணமாக நான் வாழுகின்ற கிளிநொச்சி மாவட்டத்தில் மட்டும் 6 இடங்களில் இதற்கான தனிமைப்படுத்தும் நிலையங்கள் உண்டு. அதிலே மலையாளபுரத்தில் அமைந்திருக்கின்ற தனிமைப்படுத்தும் நிலையத்தை மட்டும்தான் வடக்கு மாகாண சுகாதாரத் திணைக்களம் நடத்துகின்றது. ஏனையவை எல்லாமே இராணுவத்தின் வசம்தான் இருக்கின்றன. நாட்டினுடைய அனைத்து நடவடிக்கைகளும் இராணுவத்திடம் வழங்கப்பட்டுள்ளன.

யாழ்ப்பாணம், கோப்பாய் தேசிய கல்வியியற் கல்லூரி - National College of Education இல் இருக்கின்ற தனிமைப்படுத்தல் நிலையத்தில் தனிமைப்படுத்தலுக்காக அனுப்பப்படுகின்றவர்களுடைய நிலைமைகள் மிக மோசமானதாக இருக்கின்றது. அவர்களுக்குச் சரியான உணவு வழங்கப்படுவதில்லை. ஆவிபிடித்தல், குடிக்க ஏதாவது ரசம் போன்றவற்றைக் கொடுத்தல் என்பதைவிட, மூன்றுவேளையும் சோறும் ஒரு கருவாட்டுத் துண்டும்தான் வழங்கப்படுகின்றது. அவர்களில் அநேகமானவர்கள் மூன்றுவேளையும் சோறு சாப்பிட முடியாதவர்கள், விரதம் அனுஷ்டிப்பவர்கள், diabetes நோயினால் பாதிக்கப்பட்டவர்கள் இருக்கிறார்கள். இவர்களுக்குக்கூட இவ்வாறுதான் வழங்கப்படுகின்றது. இவர்களுக்கு வெளியிலிருந்து உணவு வழங்குவதற்குக்கூட இராணுவத்தால் அனுமதி வழங்கப்படுவதில்லை. ஆகவே இந்த விடயம் தொடர்பிலே கூடிய கவனம் செலுத்தவேண்டுமென்பதை நான் கௌரவ சுகாதார அமைச்சருக்குத் தெரியப்படுத்த விரும்புகின்றேன். இன்று பல்வேறுபட்ட இடங்களிலே "பஸ்ஸிலிருந்து இறங்கியவர் விழுந்து சாவு! வீட்டிலேயிருந்தவர் திடீரென இறப்பு!" என்றவாறான செய்திகளை நாங்கள் அறிகிறோம். ஆனால், அவர்களுடைய பிரேத பரிசோதனையிலே 'கொவிட்' காரணமாக இறந்ததாகச் சொல்லப்படுகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நீங்கள் 10 ஆண்டுகளுக்கு முன்பு திரும்பிப் பாருங்கள்! எங்களுடைய மக்கள் முள்ளிவாய்க்காலிலே கொத்துக்கொத்தாகச் செத்தார்கள். முள்ளிவாய்க்காலிலிருந்து கொண்டுவரப்பட்டு வவுனியாவிலே செட்டிகுளம், மெனிக்பாம், இராமநாதன் முகாம், கதிர்காமர் முகாம் போன்றவற்றில் இருத்தப்பட்ட மக்கள் பலர் கொத்துக்கொத்தாக விழுந்துவிழுந்து செத்தார்கள். அந்த நேரத்திலே இறந்தவர்களுடைய உடல்கள் அடையாளம் காணப்பட முடியாமல் எரிக்கப்பட்டன; பலருடைய உடல்கள் தாழ்க்கப்பட்டன. நான் அப்பொழுது இலங்கைச் செஞ்சிலுவைச் சங்கத்தின் கிளிநொச்சிக் கிளையின் செயலாளராக இருந்தேன். கிளிநொச்சியைச் சேர்ந்த பலருடைய உடல்களை அடக்கம் செய்வதற்காக செட்டிக்குளம் வைத்தியசாலைக்குச் சென்றால், அங்கே இருக்கின்ற பிரேத அறையினுள் நுழைய முடியாத அளவுக்கு இலையான்களின் தொல்லை இருந்தது. அவ்வளவுதூரம் அங்கு துர்நாற்றம் வீசிக்கொண்டிருந்தது. எவ்வளவு மோசமான ஒரு சூழல் அந்த நேரத்தில் இருந்தது என்பதை நான் இப்பொழுது தெருக்களிலே மக்கள் விழுந்து சாகிறார்கள் என்கின்றபொழுது ஞாபகப்படுத்திப் பார்க்கின்றேன். அந்த நேரத்திலே கொண்டுவந்து இறக்கப்பட்ட மக்கள் உணவுக்காக கையேந்துகிறபொழுது முகாம்களிலே நெரிபட்டுச் செத்தார்கள்; சிறுவர்கள் செத்தார்கள். இவையெல்லாம் இந்த மண்ணிலே நடந்த அவலங்கள்! இந்த அவலங்கள் தொடர்பான ஞாபகங்கள் மீண்டும் இந்த மண்ணிலே உங்களுக்கு ஏற்படுகின்றதா? சிங்களத் தலைவர்கள் அதைப் புரிந்துகொள்கிறீர்களா? இந்தக் கொள்ளை நோயிலிருந்து எல்லோரும் பாதுகாக்கப்பட வேண்டுமென்றால், இந்த உலகத்தையே வெருட்டுகின்ற இந்த நோயிலிருந்து எல்லோரும் காப்பாற்றப்பட வேண்டுமென்றால், எல்லோருக்குள்ளும் ஒரு புரிதல் வேண்டும். அது இனம், மதம் கடந்து எல்லோரையும் ஒற்றுமையான ஒரு பாதைக்குள் கொண்டுசெல்ல வேண்டும். ஆனால், இங்கே இருக்கின்ற அடிப்படைகளைப் பார்த்தால், இனங்களுக்கிடையிலான வன்ம உணர்வுகள்தான் அதிகரித்திருக்கின்றன.

அண்மையிலே கைதுசெய்யப்பட்ட முன்னாள் அமைச்சரும் தற்போதைய பாராளுமன்ற உறுப்பினருமான றிஸாட் பதியுதீன் அவர்கள்கூட, ஓர் ஆழ்ந்த வன்ம உணர்வோடுதான் கைதுசெய்யப்பட்டிருக்கிறார். அவர் கைதானதையிட்டு

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

எத்தனை பேர் மகிழ்ச்சியடைகிறார்கள்! இந்த நாட்டிலுள்ள மதத் தலைவர்கள் உட்பட எத்தனை பேருக்கு அது மகிழ்ச்சியாக இருக்கின்றது என்று எனக்குத் தெரியவில்லை. ஆனால், றிஸாட் பதியுதீன் என்பவர் தமிழ் மொழி பேசுகின்ற ஓர் இனத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற, வளர்ந்து வருகின்ற ஓர் அரசியல் தலைவர்! அதிலும் குறிப்பாக, முஸ்லிம் மக்கள் மத்தியிலே கூடுதலான செல்வாக்குள்ள ஒரு மனிதராக அவர் வளர்ந்துவருகிறார். அவரை இரவு மூன்று மணியளவில் அடாத்தாகக் கைதுசெய்துகொண்டு சென்றமையானது, இந்த நாட்டினுடைய சனநாயகத்தையும் புத்த பகவானுடைய சிந்தனைகளையும் கேள்விக்குட்படுத்தியிருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இவ்வாறான அநியாயமான செயற்பாடுகள் இந்த நாட்டிலே இருக்கும்வரை, நீதி, நியாயங்களுக்கு ஒரு சரியான பாதை இந்த நாட்டிலே திறக்கப்படாதவரை, இந்த நாட்டிலே வாழுகின்ற ஏனைய இனங்கள் "இந்த நாட்டில் நாங்கள் வாழ முடியும்" என்று நிம்மதி கொள்ளாதவரை இந்த நாடு ஓர் அதலபாதாளத்தை நோக்கியே சென்று கொண்டிருக்கும்; மக்கள் நிம்மதியாக வாழ முடியாத ஒரு நாடாகவே இருந்துகொண்டிருக்கும். 1940களிலே இந்த நாட்டைவிடக் குறைந்த வருமானத்தோடு இருந்த சிங்கப்பூரும் யப்பானும் இன்னும் சில நாடுகளும் இன்று உலகத்திலே வளர்ச்சியடைந்த நாடுகளாக மாறியிருக்கின்றன. ஆனால், இங்கே இருக்கின்ற இனவாதச் சிந்தனைகளும் பேரினவாத எண்ணங்களும் இலங்கையை வளரமுடியாமல் தடுத்திருக்கின்றன; இது இப்பொழுதும் தொடர்கின்றது.

தேர்தல் காலங்களில் மறைக்கப்பட்டிருந்த கொரோனாவினுடைய தாக்கம் - 'கொவிட்-19'இனுடைய தாக்கம் - இப்பொழுது பூதாகாரமாக வெளிவந்திருக்கின்றது. ஒருநாளில் கிட்டத்தட்ட 2,000 பேரை தொற்றாளர்களாக அடையாளப்படுத்தக்கூடிய அளவுக்கு இந்த நாட்டிலே 'கொவிட் -19' பரவுகிறது என்றால், இது இன்னும் எத்தனை கட்டங்களைத் தாண்டிச் செல்லப்போகிறது? 'கொவிட்-19'க்கு எதிரான தடுப்பூசி ஏற்றல் நடடிவக்கைகூட கேள்விக்குட்படுத்தப்பட்டிருக்கிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
யாழ்ப்பாணத்திலே கடந்த இரண்டு மாதங்களாக சுகாதாரத் தொண்டர்கள் தங்களுடைய நிரந்தர நியமனத்துக்காகப் போராடுகிறார்கள். வடக்கு மாகாண ஆளுநரின் அலுவலகத்துக்கு முன்னால், இந்தச் சுகாதாரத் தொண்டர்கள் இரண்டு மாதங்களாகப் போராட்டம் ஒன்றை நடத்தி வருகிறார்கள். அரசியலுக்காக - சில அரசியல்வாதிகளுக்கு வேண்டிய நபர்களுக்கு வேலை வழங்குவதற்காக இவர்களுக்கு நிரந்தர நியமனங்கள் வழங்கப்படாமல் இருக்கின்றன. அப்படியென்றால், எவ்வாறு இந்தத் தொற்றைக் கட்டுப்படுத்தும் பணியில் சுகாதாரத்துறையினர் ஈடுபட முடியும்? சுகாதாரம் எவ்வாறு பேணப்பட முடியும்? எனவே, இதற்கு நீங்கள் முதலில் முடிவு காணுங்கள் என்று இந்தச் சபையினூடாக வலியுறுத்தி, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.18]

**ගරු දයාසිරි ජයසේකර මහතා (බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - பத்திக், கைத்தறி துணிகள் மற்றும் உள்நாட்டு ஆடை உற்பத்தி இராஜாங்க அமைச்சர்)
The Hon. Dayasiri Jayasekara - State Minister of Batik, Handloom and Local Apparel Products)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට එකතු වීමට ලැබීම ගැන මම සන්තෝෂ වනවා. අපේ රටේ ඇතිවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව අද පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා ගණනාවක් පවත්වන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. වසංගත තත්ත්වය හමුවේ රටේ සියලුදෙනා ම දැඩි අවධානයකින් කටයුතු කළ යුතු වනවා. පාර්ලිමේන්තුවේ මැති-ඇමතිවරු සියලුදෙනා වාගේම ආණ්ඩුවත් මේ වැඩ කටයුතුවලට විශාල අවධානයකින් යුතුව තමයි සම්බන්ධ වෙන්නේ. මෙය හදිසියේ ඇති වුණු තත්ත්වයක්. කල්පනා කරලා, plan කරලා, යමක් කරන්න පුළුවන් දෙයක් නොවෙයි පසුගිය කාල වකවානුව තුළ එක දිගටම සිදු වුණේ. වසංගත තත්ත්වය වැඩි වීමත් එක්ක රටක් විධියට වාගේම ආණ්ඩුවක් විධියට අපි විශාල වැඩ කොටසක් මේ වනකොට ඉෂ්ට කරලා තිබෙනවා. නමුත් එහි යම් යම් අඩුපාඩු හා දුර්වලතා තිබෙන බව අපි දකිනවා. හැම ක්‍රියාවලියක්ම සියයට සියයක් සාධාරණව ඉෂ්ට වුණාය කියලා අපට කියන්න බැහැ. හැබැයි, ආණ්ඩුවක් විධියට විශාල වැඩ කොටසක් අපි මේ වනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා.

අපේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමා එන්නත් පිළිබඳව කථා කළ නිසා මම විශේෂයෙන්ම ඒ පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා. තවම එකම එන්නතක්වත් - එකම dose එකක්වත්- විද ගන්න බැරි රටවල් පණහක් ලෝකයේ තිබෙන බව අපි දන්නවා. නමුත් අද වනකොට ලංකාවේ නවලක්ෂ විසිපන්දහසකට එන්නත් ලබා දීලා තිබෙනවා. ඊළඟ ක්‍රියාවලිය තමයි අපට කරන්න තිබෙන්නේ. Serum Institute of India නිෂ්පාදනය කරන ඇස්ට්‍රාසෙනෙකා කොවිෂීල්ඩ් එන්නතේ ලක්ෂ පහක ප්‍රමාණයක් COVAX වැඩ පිළිවෙළ යටතේ ඉන්දියානු අගමැතිතුමාගේ දායකත්වයෙන් පසුගිය ජනවාරි මාසයේ ඉඳලා ලංකාවට ලැබුණා. මාර්තු මාසයේ තවත් එන්නත් ලක්ෂ පහක් අපි මිලදී ගත්තා. විශේෂයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් වෙනම නොමිලයේ එන්නත් 264,000ක් ලැබුණා. දැනටමත් අපේ රට තුළ චීනයෙන් ගෙන්වන ලද "සයිනොෆාම්" කියන එන්නතේ ලක්ෂ හයක ප්‍රමාණයක් තිබෙනවා. එයින් 3,000ක් චීන ජාතිකයන්ට පාවිච්චි කළත්, තවත් එන්නත් 597,000ක් අපට තිබෙනවා. NMRA ආයතනය අනුමත කළොත්, ඉතාම ඉක්මනින් එම එන්නත ලබා දීම ආරම්භ කරන්න පුළුවන්. චීනයෙන් තොරතුරු ටික ලබා දුන්නාට පසු ඉතාම ඉක්මනින් එය අනුමත කර, අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, අද උදේ Sputnik V එන්නත් මාත්‍රා 15,000ක් ලංකාවට ලැබුණා. එය සෙල්සියස් අංශක සෘණ 20ක උෂ්ණත්වයක ගබඩා කළ යුතු එන්නතක්. එය, අපි මුදල් දී ලබා ගත් එන්නත් ප්‍රමාණයක්. ලබන සතියේ තවත් Sputnik V එන්නත් 185,000ක් ලැබීමට නියමිතයි. ඒ වාගේම මැයි මස අග වීමට පෙර තවත් 200,000ක් ලංකාවට ගෙන්වන්න දැන් වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ජූනි මාසයේ තවත් 400,000ක් ගෙන්වන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඔක්තෝබර්,

නොවැම්බර් වෙනකොට -මේ අවුරුද්ද අවසාන වෙනකොට- රුසියානු Sputnik V එන්නතේ මිලියන 13ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා State Pharmaceuticals Corporation එක අවශ්‍ය පරිදි ගිවිසුම්ගත වෙලා තිබෙනවා. ඒ අනුව අපට ඒවා පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. ඒ වාගේම, අපේ බලාපොරොත්තුව තිබෙන්නේ ඉතාම ඉක්මනින් මිලියන හතත්, හතහමාරත් අතර ප්‍රමාණයකට ඒ එන්නත් ලබා දීමේ වැඩ පිළිවෙළ සකස් කරන්නයි. WHO එකේ COVAX වැඩ පිළිවෙළ යටතේ අපට එන්නත් 264,000ක් ලැබුණා. ඒවායිනුත් තව ලක්ෂ 40ක් රටට ගෙනැවිත් ජනතාවට ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

කොවිඩ් වසංගතයේ හදිසි වැඩිවීමත් එක්ක අද ඉන්දියාවේ ඇති වෙලා තිබෙන තත්ත්වය අනුව Serum Institute එකට ඒ එන්නත් නිෂ්පාදනය කිරීමේ විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. එහෙම නොවුණා නම් ලංකාවට මේ විධියේ අර්බුදයකට මුහුණ පාන්න වෙන්නේ නැහැ, අපේ කටයුතු ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරගන්න තිබුණා. අද වන විට බංග්ලාදේශයත්, ආර්ජන්ටිනාවත්, බ්‍රසීලයත් ඉන්දියාවේ ඒ එන්නත ලබා ගැනීම සඳහා බලාගෙන ඉන්නවා. අපි බලාපොරොත්තු වුණා, ඉන්දියාවෙන් එන්නත් මිලියන 7ත්, 8ත් අතර ප්‍රමාණයක් ලබා ගන්න. නමුත්, දැන් එය ලබා ගැනීමට යම් ප්‍රමාදයක් තිබෙනවා. ඒ නිසා තමයි අපි ඉදිරි කාලවකවානුවේ Sputnik V එන්නත ලබා ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙනයන්නේ. ලංකාවේ ජනගහනය මිලියන 22ක පමණ ප්‍රමාණයක් සිටියත්, අපි අවුරුදු 18ට අඩු දරුවන්ට ඒ එන්නත පාවිච්චි කරන්නේ නැහැ. ඒ නිසා ලංකාවේ එන්නත්කරණ වැඩ පිළිවෙළ සඳහා අවශ්‍ය වෙලා තිබෙන්නේ මිලියන 13ත්, 14ත් අතර ප්‍රමාණයක්. අපේ ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කිව්වා, "බඩු නැහැ" කියලා. එහෙම ප්‍රශ්නයක් නැහැ. සෞඛ්‍ය අංශ කලින් කල්පනා කළේ, පළමු මාත්‍රාව ලබා දී සති 4ක් ඇතුළත දෙවන මාත්‍රාව දෙන්න ඕනෑ කියලායි. නමුත්, අද තිබෙන වාතාවරණය තුළ, විශේෂඥයන් කියන විධියට සති 16ක් ඇතුළත දෙවන මාත්‍රාව පාවිච්චි කරන්න පුළුවන්. කලින් තිබුණු තත්ත්වය තමයි, සති 4ක පමණ කාලයක් තුළ දෙවන මාත්‍රාව දෙන්න ඕනෑය කියන එක. නමුත්, සති 12ත්, 16ත් අතර කාලයක් තුළ දෙවන මාත්‍රාව පාවිච්චි කරන්න පුළුවන් කියන නිසා, කිසි ගැටලුවක් නැතිව ඊට අවශ්‍ය කටයුතු ටික සකස් කර ගන්න පුළුවන්.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඉන්දියාවේ AstraZeneca එන්නත හදන කොම්පැනියේ අයිතිකාරයා එහෙන් පැනලා ගිහිල්ලා එංගලන්තයේ ඉන්නවා කියන්නේ ඇත්තද කියන එකයි මට දැනගන්න ඕනෑ වුණේ. ඒක ඇත්තද, බොරුද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගැන මම දන්නේ නැහැ. ඒක ඔබතුමා හොයා ගන්න ඕනෑ කාරණයක්. කවුරු කොහෙන් පැනලා ගියත් අපට අවශ්‍ය එන්නත් ප්‍රමාණය ලබා ගැනීමේ වැඩ පිළිවෙළ ආණ්ඩුව දැන් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි,-[බාධා කිරීමක්] ඔබතුමාට එන්නත ලබාගන්න පුළුවන් නේ, ඔබතුමා ගත්තේ නැති වුණාට. මමත් එන්නත ලබා ගත්තේ නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමා දෙවැනි මාත්‍රාව ගත්තාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ. පළමු මාත්‍රාව ගත්තේත් නැහැ. දෙවැනි මාත්‍රාව ගත්තේත් නැහැ. [බාධා කිරීමක්] භය වෙන්න එපා, එන්නත දෙනවා.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ඔබතුමාට කොරෝනා හැදුණා නේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට හැදුණා. ඒත් එන්නත ලබා ගන්න පුළුවන්. දැන් අනෙක් අය එන්නත අරගෙනයි තිබෙන්නේ. මම මේ වනතුරුත් එන්නත ලබා ගෙන නැහැ. ඔබතුමාට දෙවැනි එන්නත නේ, ගන්න තිබෙන්නේ? [බාධා කිරීමක්] එන්නත දෙන්නම්. කිසි ගැටලුවක් නැහැ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
දැන් රෝගය වේගයෙන් පැතිරෙනවා. කොහොමද ඒක නවත්වා ගන්නේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉන්නකෝ, මම ඒ ගැන කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් -19 වසංගතය වේගයෙන් වැඩි වෙමින යනවා. එය වැළැක්වීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්නේ කොහොමද කියන කාරණය තමයි අපි ඔක්කෝටම තිබෙන ප්‍රශ්නය. සමහර අය කියන්නේ රට වහලා දාන්න - lock down කරන්න - කියලායි. Lock down කළාම සිදු වෙන දේ ගැනත් අපි හිතන්න ඕනෑ. අද වන විට ත්‍රීවීලර් එළවන අපේ සහෝදරවරු විතරක් ලක්ෂ 14ක් ඉන්නවා. ඒ වාගේම ලොතරැයි ටිකට් විකුණන අහිංසක මිනිස්සු ලක්ෂ 6ත්, 8ත් අතර ප්‍රමාණයක් ඉන්නවා. ඒ විතරක් නොවෙයි. දවසේ කුලියට, රුපියල් 1000ක, රුපියල් 1500ක මුදලකට වැඩ කරලා සවසට ගෙදර එන අය මිලියන 3ත්, 4ත් අතර ප්‍රමාණයක් ඉන්නවා. මම තමුන්නාන්සේලාගෙන් අහන්න කැමතියි, lock down කළොත් ඒ අයට සිදු වෙන දේ මොකක්ද කියලා. අපි ඔක්කෝටම කියන්න පුළුවන් lock down කරන්න කියලා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ, ඒ මිනිසුන් බලා ගන්නේ කවුද කියන එකයි. මේක තමයි තිබෙන ප්‍රධාන අර්බුදය. Lock down කළ ගමන් මුළු ලංකාවටම එය බලපානවා. කලින් රුපියල් 5000ක දීමනාවක් ගෙව්වා වාගේ ඒ අයට යම් සහනයක් සලසන්න වෙනවා. විපක්ෂ නායකතුමා කිව්වා, රුපියල් 20,000ක දීමනාවක් ගෙවන්න කියලා. රුපියල් 20,000 කෙසේ වෙතත් අඩුම තරමින් රුපියල් 5000ක දීමනාවක් ගෙව්වත් යන වියදම කොයි තරම් ප්‍රමාණයක්ද කියලා අපි ඔක්කෝම කල්පනා කර බලන්න ඕනෑ. මම නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තුමාට මම ඊයේ කථා කරලා ඇහුවාම කිව්වා, ගිය සතියේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වහලා තිබුණු ප්‍රදේශවලට පමණක් රුපියල් 5000 දීමනාව ගෙවන්න Treasury එකෙන් රුපියල් මිලියන 212ක මුදලක් දාලා තිබුණා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ කථා කරන්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා ප්‍රදේශ කිහිපයක් ගැන පමණයි. ඒ අනුව බැලුවාම රටම lock down කිරීම තුළ ඇති වන ප්‍රශ්නය මොකක්ද කියලා අපි සියලුදෙනා කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි කියන්නේ සංචරණය සීමා කරලා අත්‍යවශ්‍ය කාරණයකට පමණක් එළියට යන්න වැඩ පිළිවෙළක් සකස් කර ගන්න පුළුවන් නම් අපට මේ තත්ත්වය පාලනය කර ගන්න පුළුවන් වනවා කියලා. ඒ ඒ ප්‍රදේශ පමණක් වසා දැමීමකට ලක් කර කටයුතු කරගෙන යන එකට micro-lockdown කියලායි අපි කියන්නේ.

අපේ ගරු සෞඛ්‍ය අමාත්‍යතුමියත්, රාජ්‍ය අමාත්‍ය ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියත්, රාජ්‍ය අමාත්‍ය ගරු චන්න ජයසුමන මැතිතුමාත් දැන් මේ වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. එක පැත්තකින් සෞඛ්‍ය ඇමතිතුමිය උදේ ඉඳන් රෑ වනතුරු වෙහෙසෙමින් මේ වෙනුවෙන් වූ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න කටයුතු කරනවා. අපි ඒ වෙනුවෙන් එතුමියට ස්තුතිවන්ත විය යුතුයි. ඒ වාගේම සෞඛ්‍ය අංශයේ අපේ ආදරණීය වෛද්‍යවරු ඇතුළු කාර්ය මණ්ඩලය පමණක් නොවෙයි, අපේ හමුදාව, පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරින්, සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමන්ලාගේ ඉඳලා ගම් මට්ටමේ ඉන්න සියලු නිලධාරින් මේ ක්‍රියාදාමයට ශක්තිය දෙන්න අද එළියට බැහැලා තිබෙනවා. ඒ අය අද විශාල අනතුරක ඉන්නේ. ඒ අනතුරත් අරගෙනයි මේ ක්‍රියාදාමයට ශක්තිය දෙන්නේ. ඒ නිසා අපි මේ ගැන කල්පනා කළ යුතුයි. ආණ්ඩුව විපක්ෂයට තඩි බාලා හෝ විපක්ෂය ආණ්ඩුවට තඩි බාලා මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. කරුණාකර, මේක ජාතික ප්‍රශ්නයක් සේ සලකා අපි සියලුදෙනාම එකට එකතු වෙලා වැඩ කරමු කියන කාරණයයි මට කියන්න තිබෙන්නේ. මෙතැන ඉඳන් තමුන්නාන්සේලාට බණින එක අපටත් කරන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට ආණ්ඩුවට බණින්නත් පුළුවන්. හැබැයි, ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ නිසා අපි සියලු දෙනාම එකතු වෙලා අවශ්‍ය කටයුතු කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව කාරණයක් කියන්න තිබෙනවා. මට සුළු වෙලාවක් දෙන්න. රෝහල්වලට අවශ්‍ය ඇඳන් - beds - සංඛ්‍යාව වැඩි කර ගැනීම සඳහාත් අපි දැන් කටයුතු කරන්න ඕනෑ. අපි ඒ වැඩ පිළිවෙළ හැම දිස්ත්‍රික්කයකම සකස් කරනවා. අපි මේ වන විට ඇඳන් 1000ක් දැමීමට හැකි අලුත් රෝහල් පද්ධතියක් ඉදිකිරීම සඳහා වන වැඩ පිළිවෙළ හැම දිස්ත්‍රික්කයකම ආරම්භ කරන්න කටයුතු කරමින් පවතිනවා. අපේ බලාපොරොත්තුවක් තිබෙනවා, ඉදිරි මාසය ඇතුළත ඉතා ඉක්මනින් මේ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මක කරන්න. සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා අපි ඒ කටයුත්ත ක්‍රියාත්මක කරගෙන යනවා. ඔක්සිජන් පිළිබඳ කථා කිරීමට අවශ්‍යව තිබුණත්, වේලාව නොමැති නිසා මගේ කථාව නවත්වන්න වෙනවා. රජයක් විධියට අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් එකතු වෙලා විශාල වැඩ කොටසක් මේ සම්බන්ධව ක්‍රියාත්මක කරන බව මා මේ අවස්ථාවේ කියන්න ඕනෑ.

මේ රටේ සිටින අපේ ආදරණීය ජනතාවගෙන් මම ඉල්ලා සිටිනවා, පවතින තත්ත්වය අවබෝධ කරගෙන සංචරණය පුළුවන් තරම් සීමා කරමින්, මුව ආවරණ පළඳිමින්, නිදහසේ සැරිසරමින් ජීවත් වීමේ ක්‍රමවේදය පොඩ්ඩක් පාලනය කරගෙන තමන්ගේ ජීවිත ගත කරන්න කියලා. ඉතාම ඉක්මනින් මේ තත්ත්වයෙන් මිදෙන්න අවශ්‍ය කටයුතු කරන්න අපි සූදානම් කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.31]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa -Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සාකච්ඡාවට භාජන වන්නේ රට තුළ ඇති වී තිබෙන ආර්ථික, සමාජයීය, සෞඛ්‍යමය අර්බුදය පිළිබඳවයි. ඇත්ත වශයෙන්ම අද ඒක හඳුන්වන්න සිද්ධ වෙලා තිබෙනවා, "කොරෝනා ඛේදවාචකය" - Coronavirus tragedy - හැටියට. කොරෝනා ඛේදවාචකය, අපේ රටත්, ලෝකයත්, ලෝක ප්‍රජාවත් මුහුණ දෙන මහා ඛේදවාචකයක්. මේ දැවැන්ත අභියෝගය අපි හැමෝම එකට එකතු වෙලා ජයග්‍රහණය කරන්න ඕනෑ. ඒක තමයි යුගයේ අවශ්‍යතාව; ඒක තමයි ජාතික අවශ්‍යතාව. ඒ උදෙසා මුළු රටම එකතු වන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි, අපට මේ තත්ත්වය මඟ හරවා ගන්න අවස්ථාව තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුද්දේ ජනවාරි 24වැනි දාත්, පෙබරවාරි 05වැනි දාත් -අවස්ථා දෙකකදී- මේ උත්තරීතර සභාවේදී කොරෝනා ප්‍රශ්නය පිළිබඳ රජයේත්, පාර්ලිමේන්තුවේත්, රටේ ජනතාවගේත් අවධානය මුලින්ම යොමු කරපු පුද්ගලයා වන්නේ මම යි. එතකොට අපේ රටට කොරෝනා ඇවිල්ලාත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්න ඉදිරිපත් කරන කොට වග කිව යුතු රජයක් යැයි කියන මේ රජයෙන් ලැබුණු ප්‍රතිචාරය මොකක්ද? අපි කිව්වා, පිට රටවලින් අපේ රටට එන පුද්ගලයන්ගෙන් අප පරිස්සම් වන්නට ඕනෑ කියලා; ජනතාවට මුව ආවරණ ලබා දෙන්නට ඕනෑ කියලා. ඒකට දුන් උත්තරය මොකක්ද? මම එය හැන්සාඩ් වාර්තාවකින්ම උපුටා දක්වන්නට කැමැතියි. ඒකට ආණ්ඩුව දුන් උත්තරය 2020 පෙබරවාරි 05වන දිනැති හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 57හි මෙසේ සඳහන් වනවා:

> "...සාමාන්‍ය ජනතාව මුඛ ආවරණ පැළඳීම මෙම රෝගය පැතිරීම වැළැක්වීම සඳහා අත්‍යවශ්‍යයයි කියා හෝ එසේ කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියා හෝ මා විශ්වාස කරන්නේ නැහැ."

කොහොමද කථාව? එහෙම කියලා අපට මඩ ගහන්නත් පටන් ගන්නවා. ඇයි, computers 1,000ක් 2,000ක් දමාගෙන, කුලී හේවායන් දමාගෙන, වහලුන් දමාගෙන සමාජ මාධ්‍යවල comments නිර්මාණය කරන්න ආණ්ඩුවට තිබෙනවා නේ වෙනමම troll farms.

මා කොවිඩ් පිළිබඳ කාරණාව ගැන කිව්වේ කවදාද? ඒ, 2020 පෙබරවාරි 05වැනි දා සහ ජනවාරි 24වැනි දා.

2020 පෙබරවාරි 05වන දිනැති හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 58හි මෙසේ සඳහන් වනවා:

> "...අපි රටේ ජනතාවට මුඛවාඩම් දමන්න කියලා ජනතාව අනිසි බියකට යොමු කළ යුතු නැහැ. ..."

ආණ්ඩුවයි මෙහෙම කියන්නේ. මේ ඔක්කෝම ඒ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉහත ප්‍රකාශ ද සහිත සම්පූර්ණ පිළිතුර ඇතුළත්, 2020 පෙබරවාරි 05වන දිනැති හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 55 සිට 60 දක්වා වන කොටස මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවේ ආණ්ඩුව නිසි පියවර ගත්තා නම්, මේ කොරෝනා බෙදවාවකය අපේ රට බිලි ගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප කරපු යෝජනාවලට රජයේ ප්‍රතිචාරය මොකක්ද? ඒවා ගණන් ගත්තේ නැහැ; ප්‍රතික්ෂේප කළා; විහිළුවට ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු කාලීනව ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න අහන එකත් සීමා කළා. එදා හිටපු විපක්ෂ නායකවරයාට එහෙම සීමාවක් තිබුණේ නැහැ. නමුත් අද එය සීමා කර තිබෙනවා, ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන් කියලා.

මොකද, අපි ප්‍රශ්න අහන එක හිසරදයක් හැටියටයි ආණ්ඩුව සැලකුවේ. නමුත් දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? කොරෝනා රැලි ගණනාවකට පස්සේ කොරෝනාව හිසරදයක් වෙලා. අපට කිව්වා, අපි කාලය කනවා කියලා. අපට නින්දා කළා; අපහාස කළා. සමහර අවස්ථාවලදී පරුෂ වචනයෙනුත් බැණ වැදුණා. නමුත් අපි මොකක්ද කළේ? අපි කළේ, රට වෙනුවෙන් යුතුකම ඉටු කිරීම. කොරෝනාව කියන්නේ මොකක්ද කියලා අපි පළමුවැනි වතාවට ආණ්ඩුවට පෙන්වා දුන්නා. නමුත් ඒවා තඹ සතයකට ගණන් ගත්තේ නැහැ. එදා මොකක්ද කිව්වේ? "අපට පුළුවන්. අපි කරලා පෙන්වන්නම්. අපි දිනුම්. කොරෝනා පරාදයි." කියලායි කිව්වේ. කෘත්‍රිම සැනසීමක් රට තුළ ඇති කරන්නට PCR පරීක්ෂණ සීමා කළා. ඒක තමයි ඇත්ත කථාව. Artificial self-confidence එකක් නිර්මාණය කළා; කෘත්‍රිම සමාජ ජනතා තෘප්තියක් නිර්මාණය කළා. එහෙම කරලා, මුළු රටම රවටලා මහ මැතිවරණයකට ගියා. එදා කිව්වා, "අපි දිනුම්. කොරෝනා පරාදයි" කියලා. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කුසලානත් දුන්නා. ජයග්‍රාහී කුසලානය, අතිගරු ජනාධිපතිතුමාට. අනුකුසලානය, ගරු අගමැතිතුමාට. අද මොකක්ද වෙලා තිබෙන්නේ? රටත් ඉවරයි. ජනතාවත් ඉවරයි. තුන්වැනි රැල්ලෙන් මුළු රටම අනාරක්ෂිත වෙලා තිබෙනවා. හැබැයි, බලයට ආවේ ආරක්ෂාව තහවුරු කරනවා කියලා. දැන් අනාරක්ෂිත රටක් නිර්මාණය වෙලා. අපේ රටේ ජාතික ආරක්ෂාවට අද මේ කොරෝනාව නිසා මරු පහරක් එල්ල වෙලා තිබෙනවා.

මෙහිදී ජාතික ආරක්ෂාව තහවුරු කර ගන්නේ ටී-56න්, යුද ටැංකියෙන්, කෆීර් යානාවලින්, මල්ටි බැරල් රොකට් ලෝන්චර්ස්වලින්, මිග් යානාවලින් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොරෝනා කියන මේ බරපතළ ව්‍යසනය මැඩ පවත්වන්නට මොකක්ද අවශ්‍ය? එන්නත අවශ්‍යයි; ICU ඇඳන් අවශ්‍යයි; ventilators අවශ්‍යයි; ECMO machines අවශ්‍යයි. ECMO machines රටටම තිබෙන්නේ දෙකයි ලු. Oxygen cylinders අවශ්‍යයි. මහා පරිමාණයේ testings කරන්න පුළුවන් PCR යන්ත්‍ර අවශ්‍යයි. අපි මේ ආණ්ඩුවෙන් අහනවා, මේ කොරෝනා අවදානම පිළිබඳව රට දැනුවත් කරපු 2020 ජනවාරියේ ඉඳලා, ආණ්ඩුව දැනුවත් කරපු දවසේ ඉඳලා ආණ්ඩුව මොකක්ද කළේ කියලා. ආණ්ඩුව කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලින් මොනවාද කළේ? මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඉහළ නැංවූවාද? ICU beds සංඛ්‍යාව වැඩි කළාද? Ventilators සංඛ්‍යාව වැඩි කළාද? නැහැ. ආණ්ඩුව කළේ, කොරෝනා දේශපාලනය; Corona politics. දැන් බොහෝ දෙනා කියනවා, Corona politics නොවෙයි, Corona politricks කියලා. මුසාව, මුළාව, වංචාව මඟින් පව උල්පත් නිර්මාණය කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එන්නත දෙනවා වෙනුවට පළමුවෙන්ම මොකක්ද කළේ? ඉස්සෙල්ලාම කළේ මුට්ටි බෙහෙත. තමන්ගේ bodyguardsලාට video කරන්න කියලා මුට්ටි ටික ගඟට දැම්මා. ඔන්න, එන්නත! මුට්ටිය ගඟට දාන කොට පොකුරු ව්‍යාප්තියයි, සමාජ ව්‍යාප්තියයි නතර වෙනවා, මුට්ටිය තමයි ඔක්කෝටම විසඳුම කියලා හිතුවා. හැබැයි, මුට්ටිය fail වුණාට පස්සේ මොකක්ද වුණේ? මුට්ටිය fail වුණාම, බොරු පැණියක් ගෙනාවා. ඒක, ජනතාව රවට්ටන පැණිය. ඒ පැණිය අළෙවි කිරීමේ කොන්ත්‍රාත්තුව කළේ, රජයට සම්බන්ධ වහල්ලු කොට්ඨාසයක්; දේශපාලන එහෙයියන්, අතකොළු බවට පත් වූවන් කොට්ඨාසයක්. පරීක්ෂණයකට ලක් නොකරපු, පැහැදිලි වෛද්‍ය නිගමනයක් නොලබපු පැණිය, මේ සභා ගර්භයේ ගරු සාමාජිකයන් කිහිප දෙනෙකුත් ලජ්ජා නැතිව පානය කරලා රටට පෙන්වන්න හැදුවා, මුට්ටියෙන් පස්සේ පැණිය හරියනවා, එන්නත් අවශ්‍ය නැහැ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න ලජ්ජයි. දොස්තරවරු යැයි කියා ගන්නා වූ සමහර සාමාජිකයන් පැණියේ අළෙවිය ව්‍යාප්ත කරන වෙළෙන්දන් බවට පත් වුණා. දැන් ඊයේ පෙරේදා වාර්තා වෙලා තිබෙනවා, පැණියත් ෆේල් කියලා. මුලින්ම මුට්ටිය ෆේල්. ඊට පස්සේ පැණිය ෆේල්. අපේ රටේ මේ රජය මුට්ටි සෙල්ලමයි, පැණි සෙල්ලමයි කර කර ඉන්න අතරතුර ලෝකයේ අනෙක් රටවල් මොකක්ද කළේ? ලහි ලහියේ ගිහිල්ලා විවිධ එන්නත් වර්ග ඇණවුම් කළා. Oxford-AstraZeneca එන්නත, Moderna COVID-19 එන්නත, Pfizer-BioNTech එන්නත, Johnson & Johnson එන්නත වැනි ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්දේශ කරපු එන්නත් වර්ග ඇණවුම් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කැනඩාව කොයි තරම් ඒ රටේ ජනතාවට ආදරෙයිද කිව්වොත් එක පුරවැසියාට මාත්‍රා දහය ගණනේ ඇණවුම් කරලා, දැන් ඒ රටේ එන්නත් අතිරික්තයක් තිබෙනවා. හැබැයි, වර්තමාන රජයට වුවමනාවක් නැහැ, හැකියාවක් නැහැ, සම්බන්ධකම් නැහැ. අපේ රටට අවශ්‍ය එන්නත් යම් ප්‍රමාණයක් හෝ කැනඩාවෙන් ඉල්ලා ගන්න පුළුවන්. නමුත්, එහෙම සබඳතා වර්තමාන රජයට නැහැ. එතකොට ලෝකයේ සියලු රටවල් පාහේ එන්නත් හිඟයක් ඇතිවෙයි කියන බිය තුළ පුළුවන් තරම් තමන්ගේ රටේ ජනතාව වෙනුවෙන් එන්නත් ටික ලබා ගත්තා. අපේ රටේ තිබුණේ මුට්ටි සෙල්ලමයි, පැණි සෙල්ලමයි. ඒ මුට්ටි සෙල්ලමයි, පැණි සෙල්ලමයි කරපු නිසා අපි ප්‍රමාද වුණා, එන්නත් ටික ඇණවුම් කරන්න. දැන් ලෝකයේ එන්නත් හිඟයක් තිබෙනවා. මේ එන්නත් හිඟයට මුහුණ දෙන්න අපට සිදු වුණේ, මේ රජයේ අකාර්යක්ෂමතාව සහ නොහැකියාව නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දළ වශයෙන් ගත්තොත් ඊශ්‍රායලය Pfizer-BioNTech එන්නත උපයෝගී කරගෙන බොහොම සාර්ථක විධියට ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වාගේම, එන්නත් වැඩ පිළිවෙළ සාර්ථකව කෙරීගෙන යනවා. සියයට 60කට එන්නත් ලැබිලා රෝගය බෝවීම දැන් අඩුවෙලා තිබෙනවා. විශේෂඥවරුන් කියන්නේ, අපේ රටේ ලක්ෂ 220ක් වන ජනගහනයෙන් දළ වශයෙන් සියයට 60ක්, 70ක් එන්නත් කළාම herd immunity එක නිර්මාණය වෙනවා කියලායි. අපේ රටේ ජනගහනය ලක්ෂ 220ක් නම්, එන්නත් දෙන්න තිබෙන්නේ ලක්ෂ 154කට. සරලව, දළ වශයෙන් කථා කරනවා නම්, එක මාත්‍රාවකට ඩොලර් පහ ගණනේ බැලුවොත් එක වටයකට යන්නේ රුපියල් මිලියන 15,400යි; රුපියල් කෝටි 1540යි. තවත් විධියකට කියනවා නම්,

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අර සීනි හොරකමට සමාන මුදල. සීනි හොරකම නොකර එන්නත ගෙන්වූවා නම්, අපේ රටේ ඇති වී තිබෙන අනාරක්ෂිතභාවය මෙතරම් දුර දිග යන්නේ නැහැ. ජාතික ආරක්ෂාවට මෙතරම් මරු පහරක්, තර්ජනයක් එල්ල වන්නේ නැහැ. නමුත්, ශ්‍රී ලංකා ආණ්ඩුව කළේ මොකක්ද? ශ්‍රී ලංකා ආණ්ඩුව කියනවා, "භය වෙන්න එපා COVAX ක්‍රමවේදය හරහා සහ GAVI ක්‍රමවේදය හරහා අවශ්‍ය එන්නත් ටික අපට ලැබෙනවා" කියලා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමිය, 2020 නොවැම්බර් 25වන බදාදා පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශයක් හැන්සාඩ් වාර්තාවේ 396 තීරුවේ සඳහන් වෙනවා. "... ශ්‍රී ලංකාවට ලබා ගත හැකි වනු ඇති අතර, පළමු වටයේදීම අපගේ ජනගහනයෙන් සියයට 20කට, එනම් මිලියන 4.2ක ජනතාවකට..." වශයෙන් සඳහන් කරමින් COVAX සහ GAVI යන ක්‍රමවේද තුළින් එන්නත් ලැබීමට නියමිත බව ප්‍රකාශ කර තිබෙනවා. 2020 නොවැම්බර් 25වැනි දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 396හි සඳහන් එතුමියගේ එම ප්‍රකාශය මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

එතකොට ලක්ෂ 42න් කීදෙනාටද අද එන්නත හම්බවෙලා තිබෙන්නේ? ඉතාම සොච්චම් ප්‍රමාණයක් WHO එකෙන් හම්බවුණා. තවත් යම් ප්‍රමාණයක් ඉන්දියාවෙන් තෑග්ගක් හැටියට හම්බ වුණා. ඒ හැරුණුකොට ලෝක සෞඛ්‍ය සංවිධානය - WHO - අනුමත කළ එන්නත් ලබා ගැනීම අද වර්තමාන රජයට බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. එහෙම නම්, රජය කළ යුතුව තිබුණේ මොකක්ද? මාත්‍රා 1,281,417ක් ලැබුණාම, ඒ මාත්‍රා ප්‍රමාණය දෙකෙන් බෙදලා හයලක්ෂ ගණනකට තමයි ඉස්සර වෙලා දෙන්න තිබුණේ. නමුත් මොකක්ද කළේ? කිසිම COVID-19 protocol එකක්, කිසිම ක්‍රමවේදයක් අනුගමනය කරනේන් නැතුව පළමු වටයේදී 924,687දෙනෙකුට දුන්නා. දැන් දෙවැනි මාත්‍රාව 356,730දෙනෙකුට දෙන්න යනවා. එතකොට 568,000කට දෙවැනි මාත්‍රාව නැහැ. දැන් අපට ආරංචියි, වෙනත් එන්නතක් ගෙන්වලා, දෙවැනි මාත්‍රාව හැටියට එම එන්නත දෙන්න හදනවා කියලා. මොකද, Oxford-AstraZeneca එන්නත ගන්න නැති නිසා. ඉතින් ඒක හරිද? ඒ එන්නත දෙන්න ඉස්සර වෙලා මේ ගැන හිතුවේ නැද්ද?

දැන් භයානකම කාරණාව මේකයි. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ - NMRA එකේ - ප්‍රධානියා ඇතුළු සාමාජිකයන් ගණනාවක් පන්නා දමලා තිබෙනවා. කියන්නේ නම් ඉතින් ඒ අය ඉල්ලා අස්වුණා කියලා. ඉල්ලා අස්වුණේ නැහැ, එළවා දැම්මා. ඇයි? රජයෙන් කිව්වා, Sinopharm එන්නතට අනුමැතිය දෙන්න කියලා. එතකොට ඒ වෛද්‍යවරු කිව්වා, "ප්‍රමාණවත් clinical trials කරලා නැහැ, ඒ නිසා Sinopharm එන්නතට අනුමැතිය දෙන්න ප්‍රමාණවත් තොරතුරු නැහැ" කියලා. දැන් එතකොට අද එන්නත් හොඳද නරකද කියන්නේ, දේශපාලනඥයෝ; මැති ඇමතිවරු; රජය. එහෙම කරන්න පුළුවන්ද? ඒවා තීන්දු කරන්න ඕනෑ, විශේෂඥවරු; විෂයානුබද්ධව සිටින කෘතහස්ත කණ්ඩායම. භයානකම කාරණය මේකයි. මට පෙර කථා කළ ගරු රාජ්‍ය ඇමතිතුමා සඳහන් කළා, එන්නත් වර්ග දෙකක් ගැන. දැන් Sputnik V ගෙන්වනවා ලු. Sinopharm එන්නතත් තිබෙනවා ලු. නමුත් බරපතළ ප්‍රශ්නය මොකක්ද? ලෝක සෞඛ්‍ය සංවිධානය ඒවා නිර්දේශ කරලා නැහැ; අනුමත කරලා නැහැ. දැන් මේ හදන්නේ, ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත නොකළ බෙහෙත් -එන්නත්- අපේ රටේ ජනතාවට ලබා දෙන්නයි. කොහොමද එහෙම කරන්නේ? මේවාට අපට උත්තර අවශ්‍යයි. මා විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමියගෙන් ඉල්ලීමක් කරනවා, මේ රටේ ජනතාවට මේ අපරාධය කරන්න එපා කියලා. WHO එක අනුමත නොකළ එන්නත් අපේ රටට ගෙන්වලා ජනතාවට ලබා දෙනවා නම්, ඒක සාපරාධී ක්‍රියාවක් හැටියට මා පෞද්ගලිකව දකිනවා. අනුමැතියක් තිබෙන එන්නත් ටික ලබා ගන්න කටයුතු කරන්න. එන්නත් මාත්‍රාවල අතිරික්තයක් තිබෙනවා; යුරෝපා රටවලත් තිබෙනවා. හැබැයි ඉතින් යුරෝපා රටවලට, කැනඩාවට කථා නොකර ඒවා ගන්න බැහැ. මට මතකයි, ආණ්ඩුවට කථා කරන්න බැරි නම් විපක්ෂයක් හැටියට සමඟි ජන බලවේගය මැදිහත් වෙලා ඒ ගැන කථා කරන්නම් කියලා එදා මා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මේ ඔක්කොම බලාගෙන ඉඳලා අපි තානාපතිතුමන්ලා, තානාපතිතුමියලා ගණනාවක් හමු වුණා. හමු වෙලා මොකක්ද කිව්වේ? අපේ රටට mobile field hospitals ලබා දෙන්න කටයුතු කරන්න කිව්වා; මහා පරිමාණයේ පරීක්ෂණ කරන්න පුළුවන් PCR යන්ත්‍ර ලබා දෙන්න කිව්වා; ventilators ලබා දෙන්න කිව්වා; ICU ඇඳන් ලබා දෙන්න කිව්වා. ඊයේත් රුසියානු තානාපතිතුමා හමු වෙලා අපි කිව්වේ ඒකයි. අද ජපානයේ තානාපතිතුමා හමුවෙනවා. එතුමාටත් කියන්නේ ඒකමයි. විපක්ෂයේ අපි කරන දේ මේ ආණ්ඩුවට කරන්න බැරි ඇයි? පිට රටවල් එක්ක තරහා වෙලා, කථා කරන්නේ නැතිව, ගනු දෙනු කරන්නේ නැතිව, සාකච්ඡා කරන්නේ නැතිව මේ මහා ගෝලීය ව්‍යසනයට මුහුණ දෙන්න අපට පුළුවන්ද? රාජ්‍ය තාන්ත්‍රිකභාවයක් තිබෙන්නට ඕනෑ, විදේශීය සබඳතා ශක්තිමත් කර ගන්නට ඕනෑ. ඉංග්‍රීසියෙන් කියනවා, "It is a do or die battle" කියලා. මේක, අපි ඔක්කෝම ඉන්නවාද නැති වෙනවාද කියන එක පිළිබඳ මහා ප්‍රශ්නයක්. අපි මෙහි රටවැසියන් හැටියට ජාති, ආගම්, කුලමල, පන්ති, පක්ෂ භේදයෙන් තොරව එකා මෙන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නට ඕනෑ. නමුත්, මේ රජය "කොරෝනා දේශපාලනය" කිරීම නිසා අද මුළු රටම අන්ත අසරණභාවයට පත්වෙලා තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ කනගාටුවෙන් හෝ කියන්නට ඕනෑ. විශේෂයෙන් මේ රැවටිලිකාර දේශපාලනයට අපි නැවතීමේ ලකුණ තබන්නට ඕනෑ. කොරෝනා මර්දනය කිරීම සඳහා යා යුතු වැඩිපුර පියවර ඉදිරියට යන්න අපි සූදානම්.

මම මේ වේලාවේ අදාළ නම් ගම් කියන්නට යන්නේ නැහැ. නමුත්, මම මේ කරුණ ගරු ඇමතිතුමියට කියන්න කැමැතියි. ICU ඇඳන්වල බරපතළ හිඟයක් තිබෙනවා කියලා අදත්, ඊයේත් විශේෂඥ වෛද්‍යවරු මට පණිවුඩ එව්වා. ඒකට ආණ්ඩුවේ විසඳුම මොකක්ද? ICU ඇඳන් හිඟයට විසඳුම මොකක්ද? ප්‍රමාණවත් ventilators නොගෙන්වා මෙච්චර කාලයක් බලාගෙන හිටියේ ඇයි? යම් කිසි කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අවුරුද්දකුත් මාස හතරක්, පහක් පමණ තිබුණානේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ පිළිබඳව දන්නවාද කියන්න මම දන්නේ නැහැ. අපේ රටේ ආරක්ෂක අංශයට හෙලිකොප්ටර් හතරක් ඇණවුම් කරලා තිබෙනවා; armoured personnel carriers 60ක් ඇණවුම් කරලා තිබෙනවා. රට වටේම කායවර්ධන මධ්‍යස්ථාන සෑදීමට රුපියල් මිලියන 625ක් වියදම් කිරීමට ඊයේ පෙරේදා කැබිනට් අනුමැතියක් ලැබුණා කියලා කියනවා මට ඇහුණා. ඒවායේ ප්‍රශ්නයක් නැහැ. රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරන්නට ඕනෑ. හෙලිකොප්ටර් යානා අවශ්‍යයි; යුද ආම්පන්න අවශ්‍යයි; කාය වර්ධන කට්ටල අවශ්‍යයි. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. නමුත්, රටේ ප්‍රමුඛතාව ජනතාව ජීවත් කරවීමයි; ජනතාව මේ මහ ව්‍යසනයෙන් බේරා ගැනීමයි. ඒ නිසා කරුණාකර සෞඛ්‍ය අංශවලට සවන් දෙන්න, වෛද්‍යවරුන්ට සවන් දෙන්න, විශේෂඥවරුන්ට සවන් දෙන්න, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සවන් දෙන්න, හෙද සංගම්වලට සවන් දෙන්න, පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට සවන්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දෙන්න, ග්‍රාම නිලධාරිතුමන්ලා ඇතුළු රාජ්‍ය සේවයට සවන් දෙන්න. අද සෞඛ්‍ය ක්ෂේත්‍රය පුපුරන තත්ත්වයකට ඇවිත් තිබෙන්නේ. MOH ක්ෂේත්‍රය තුළ පුදුම අසහනයක්, පුදුම පීඩනයක් තිබෙනවා. හැබැයි, අපේ විරෝදාර සුවවිරුවන්, ඒ වාගේම ඒකට සම්බන්ධ වූ රාජ්‍ය අංශයේ සියලුදෙනා අසීමිත කැප කිරීමක් කරනවා. ඒ අය තමන්ගේ පෞද්ගලිකත්වය පැත්තක දමලා අපේ රටේ ගිලන් වුණු -රෝගාතුර වුණු- ජනතාවට සහනයක් සලසන්න අවදානම් සහිතව මුහුණ දෙනවා.

අද කොරෝනා වසංගතය අස්සේ ඩෙංගු ව්‍යාප්තියත් වර්ධනය වෙලා. කවුරුවත් ඒ ගැන කථා කරන්නේ නැහැ. රෝහල්වල ඇඳන් රෝගීන්ගෙන් පිරිලා. දැන් සාමාන්‍ය රෝගීන්ටත් ඇඳන් නැහැ. Heart diseases වෙන්න පුළුවන්, kidney diseases වෙන්න පුළුවන්, liver diseases වෙන්න පුළුවන්. එවැනි බෝ නොවන රෝග - non-communicable diseases - තිබෙන රෝගීන්ටත් ඇඳන් නැහැ. අවුරුද්දකුත් මාස හතරක්, පහක් මොකක්ද කළේ කියලා මම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි. අද රටේ තිබෙන ප්‍රමුඛතාව හෙලිකොප්ටර් ගෙන්වන එකද? රටේ ජාතික ආරක්ෂාව පිළිබඳ තක්සේරුවක් කරලා armoured personnel carriers ලබා ගැනීම, gym equipment ලබා ගැනීම පසුව කරන්න පුළුවන්. නමුත්, අද රටේ තිබෙන ප්‍රමුඛතාව අනුව වෙන වෙන දේවල්වලට කැප කරන මුදල් ටික ඔක්කෝම එකතු කරලා අපි කොවිඩ් එන්නත ගෙන්වා ගනිමු.

සමගි ජනබල වේගයේ අපි ලැහැස්තියි, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා නියෝජනය කරමින්, මන්ත්‍රීතුමන්ලාගේ පරිත්‍යාගවලින් "පාර්ලිමේන්තු මන්ත්‍රී අරමුදලක්" පටන් ගන්න. හැබැයි, ඒ වෙන වෙන ශෝභන වැඩවලට නොවෙයි, එන්නත ගෙන්වා ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමියට කාරණා කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. ගරු ඇමතිතුමියනි, remdesivir කියලා බෙහෙතක් තිබෙනවා. මට chest specialist කෙනෙක් කිව්වා, ඒවායේ ලොකු හිඟයක් තිබෙනවා කියලා. ඒ වාගේම tocilizumab කියන බෙහෙත් වර්ගයේත් හිඟයක් තිබෙනවා. මට chest specialist කිව්වා, ඒ ගැන කථා කරන්න කියලා. මොකද, එතුමන්ලා ඒ ගැන කථා කරලා, කථා කරලා දැන් හක්ක ගෙවිලා ලු, තිබෙන්නේ. බෙහෙත් නැහැ ලු. ඒ වාගේම බොහොම ප්‍රසිද්ධ ළමා රෝග සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරයෙක් මට කථා කරලා කිව්වා, ICU ඇඳන් ප්‍රශ්නයට වහාම පිළියමක් යොදන්න කියලා. ගරු අමාත්‍යතුමියනි, මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, මෙතෙක් කල් මේ රජයට නොතිබුණු වැඩසටහනක් දැන්වත් ආරම්භ කරන්න කියලා. ඒකට කියන්නේ ඉදිරි සැලසුම් - forward planning - කියලා. ඉදිරි ක්‍රමෝපායික සැලසුම් - forward strategic planning - ක්‍රියාත්මක කරන්න.

මම දන්නවා, තමුන්නාන්සේලා බොහොම සුබවාදී අදහස්වල - optimistic scenariosවල - තමයි සිටියේ. එහෙම නොවෙයි, හැම දෙයක්ම වාසිදායක නොවන ලෙස - pessimistic ලෙස - හිතලා තමුන්නාන්සේලාගේ සැලසුම් නිර්මාණය කරන්න. Oxygen cylindersවල බරපතළ හිඟයක් තිබෙනවා. ගරු ඇමතිතුමියනි, ඒකට විසඳුම මොකක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසරේ නොවැම්බර් 03වැනි දා මම මේ ප්‍රශ්නය ගැන කථා කරනකොට, රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන හැම පැත්තකින්ම කෑ කෝ ගසා, මඩ ගසා, පරුෂ වචන කියා නින්දා කළා; අපහාස කළා. එංගලන්තයේ හිටපු අග්‍රාමාත්‍යවරයෙක් වූ බෙන්ජමින් ඩිස්රේලි මැතිතුමා මේ වාගේම අවස්ථාවකදී යම් කිසි ප්‍රකාශයක් කරන්න ගිය මොහොතක එතුමාට විවිධ ප්‍රහාර එල්ල වෙනකොට එතුමා කියපු කථාවක් මම එදා කිව්වා. එතුමා මෙන්න මෙහෙම කිව්වා. "මම දැන් වාඩිවෙන්නම්. හැබැයි, කවදා හෝ මා කී දේ සැබැවින්ම ඇසේවි. මට කියන්න තිබෙන්නේ එදා මා කී දේ ඇත්ත බව ඔබට අහන්නට ලැබීම ගැන මට ඇති වන්නේ සතුටක් නොව දුකක් බවයි. එදා මා කී දේ ඔබට අසන්නට ලැබී තිබෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, මිනිසුන්ගේ අඥානාව නිසායි." ගරු අමාත්‍යතුමියනි, අද ජනතා අඥානාවක් තිබෙනවා. මේ ජනතා අඥානාව ඉදිරියේ මම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර අහක බලන්න එපා කියලා; කරුණාකර මේ ප්‍රශ්නය මඟ හරින්න එපා කියලා.

ගරු ඇමතිතුමියනි, අපේ රටේ දැන් community spread එකක් තිබෙනවාද, නැද්ද කියලා දැන්වත් ඔබතුමියට කියන්න පුළුවන්ද? දිගටම කියාගෙන ආවානේ, සමාජ ව්‍යාප්තියක් - community spread එකක් - නැහැ, පොඩි පොඩි පොකුරු ව්‍යාප්තියක් - cluster spread එකක් - තමයි තිබෙන්නේ කියලා. අද මොකක්ද කියන්නේ? අද තිබෙන්නේ පොකුරු ව්‍යාප්තියද, එහෙම නැත්නම් සමාජ ව්‍යාප්තියද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු කාරණා ඉදිරිපත් කිරීම සඳහා මට තව සුළු වේලාවක් ලබා දෙන්න. මේ ආණ්ඩුව යථාර්ථවාදී වෙන්නට ඕනෑ; සත්‍යවාදී වෙන්නට ඕනෑ. තිබෙන සංඛ්‍යාලේඛන අමිහිරි වෙන්නට පුළුවන්. නමුත් ඒ අමිහිරි සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න. එතකොට සත්‍ය මත, දත්ත මත, ඇත්ත මත පදනම් වුණු ජාතික සෞඛ්‍ය ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්. රටේ ජනතාව තුළ යම් කිසි කෘත්‍රිම සැනසීමක් - artificial feel-good factor එකක් - ඇති කරන්නට PCR පරීක්ෂණ අඩු කරලා හරියන්නේ නැහැනේ. PCR පරීක්ෂණ අඩු කරනවා කියන්නේ corona detection එක අඩු වෙනවා කියන එකයි. ඔව් ඉතින්, PCR පරීක්ෂණ අඩු කළාම සංඛ්‍යාලේඛන අනුව එළියට එන කොරෝනා වැළඳුණු ප්‍රමාණය අඩු වෙනවා. ඒ අනුව, හරි. නමුත් එහෙම කරන්න එපා. WHO Guidelinesවලට අනුව, දිනකට කරන්නට පුළුවන් උපරිම පරීක්ෂණ ප්‍රමාණය කරලා, රටට සත්‍ය තත්ත්වය හෙළිදරව් කරන්න. පවතින තත්ත්වය පිළිබඳව ඇත්ත කථා කරන්නට ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අපේ පැත්තෙන් තව විනාඩි කීපයක් ගන්න පුළුවන්. ඒ ගැන ගැටලුවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, සත්‍යය මත පදනම්ව කටයුතු කරන්න කියලා. කරුණාකර WHO එක අනුමත නොකරපු vaccinesවලට රටේ බදු ගෙවන්නන්ගේ සල්ලි වියදම් කරන්න එපා. ගරු ඇමතිතුමිය, ඔබතුමිය මේ ගරු සභාවට කියන්න ඕනෑ Sinopharm එන්නත WHO එක අනුමත කර තිබෙනවාද, නැද්ද, Sputnik V එන්නත WHO එක අනුමත කර තිබෙනවාද, නැද්ද කියලා. ඒ වාගේම, WHO එක අනුමත නොකරපු එන්නත්වලට මහජන මුදල් කැප කරන්න මේ රජය කටයුතු කරනවාද කියන්න. මේ ප්‍රශ්නවලට අපට පැහැදිලි උත්තර අවශ්‍යයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා ]

ගරු දයාසිරි ජයසේකර රාජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී එතුමා කිව්වා, ඇඳන් 1,000ක් සහිත රෝහල් මේ වන විට දිස්ත්‍රික් මට්ටමින් හදන්න යන බව. බොහොම හොඳයි. ඇයි ඒ වැඩ පිළිවෙළ 2020 ජනවාරි සිට පටන් ගත්තේ නැත්තේ? මැණික් කුලුන හදන්න ඉස්සෙල්ලා, ඇඳන් 1,000කින් යුත් ඒ රෝහල් ටික හැම දිස්ත්‍රික්කයේම හදන්න තිබුණා නේ. ඇයි, එහෙම සිතුවිලි නිර්මාණය වුණේ නැද්ද?

ඊළඟට, රජය ලබා දුන් රුපියල් 5,000 ගැන එතුමා කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් රාජ්‍ය මුදල් ඇමතිවරයකු හැටියට කටයුතු කළා. අපේ රට තමයි කොරෝනා ප්‍රශ්නයේදී මූල්‍ය උත්තේජක පැකේජයක් - fiscal stimulus package - ලබා නොදුන් රට. කිසිම මූල්‍ය උත්තේජක පැකේජයක් ලබා දුන්නේ නැහැ. නිකම් බොරුවට රුපියල් 5,000 බැගින් දෙවරක් දීලා සැනසීමක් ඇති කර ගන්නවා, "ඔන්න දුන්නා" කියලා. රුපියල් 5,000 බැගින් දෙවරක් දුන්නා කියන්නේ මූල්‍ය උත්තේජකයක්ද? ණය අත්හිටවූ වනවා කිව්වා. පොලියත් අත්හිටවූ වනවා කිව්වා. ලීසිං වාරික නතර කරනවා කිව්වා. මතකද? මේ වන විට මොකද කරන්නේ? ඒ නතර කරපු කාලය තුළ නොගෙවපු වාරිකවලට පොලිය මත පොලියක් අය කරනවා. මුලින් ගෙවාගෙන ආපු පොලිය නොවෙයි. නොගෙවපු වාරිකවලටත් පොලිය අය කරනවා. ඒක මොන විහිළුවක්ද? මේකද මූල්‍ය උත්තේජක පැකේජයක් - fiscal stimulus package එකක් - කියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවේ සිටින අරුන්දති රෝයි කියන විද්වතිය ගැන ඔබතුමාත් හොඳින් දන්නවා. ඉන්දියාවේ තත්ත්වය දිහා බලලා එතුමිය මෙන්න මෙහෙම කියනවා, “We are witnessing a crime against humanity”. ඒ කියන්නේ, "අපි මේ බලා සිටින්නේ, මානව සංහතියට එල්ල වන සාපරාධී ක්‍රියාවක් දෙසය." ගරු ඇමතිතුමියනි, ඒ වදන අපේ රටේ පාවිච්චි කරන්නට ඉඩ තබන්න එපා කියා, මගේ කථාව අවසන් කරන්නට පෙර ඔබතුමියට කියනවා. We do not want to see a crime against humanity taking place in our country. This Government has been totally incompetent, inefficient in dealing with this crisis. They have politicized this; ඒක දේශපාලනීකරණය කළා. භූමදානය සහ ආදාහන ප්‍රශ්නය ගෙනැල්ලා ලජ්ජා නැතුව ආගම්වාදයක් ඇති කළා නේ. අවසානයේ මොකක්ද වුණේ? අවසානයේ ලෝක ප්‍රජාවගේ බලපෑම මත මේ ආණ්ඩුවට කියපු දේවල් වමාර, වමාර අනුභව කරන්න සිද්ධ වුණා. Regurgitate කර කර, vomit කර කර, ඒ වමාරපු දේවල් කන්න සිද්ධ වුණා. ආදාහනයයි, භූමදානයයි කියන ප්‍රශ්නය තුළ මාස ගණනාවක් ජාතිවාදය ක්‍රියාත්මක කළා. නමුත්, සමඟි ජන බලවේගය සැබෑ සිංහල බෞද්ධ බලවේගයක් හැටියට කොන්ද කෙළින් තබාගෙන ඇත්ත කථා කළා. අවසානයේ බොරු සිංහල බෞද්ධකමක් නිර්මාණය කරගෙන ආපු අයට සත්‍යය පිළිගන්න සිද්ධ වුණා.

කරුණාකර කොරෝනා ප්‍රශ්නය දේශපාලනීකරණය කරන්නේ නැතුව, අපි හැමෝම එකට එකතු වෙලා සත්‍යය මත පදනම් වෙලා, ඇත්ත මත පදනම් වෙලා -ඇත්ත තිත්ත වුණත්, රටේ ජනතාවට ප්‍රකාශ කරලා- කොරෝනා මර්දනය කරන්න අත්වැල් බැඳ ගනිමු. අදත්, හෙටත් අපි තානාපතිවරුන්ට කථා කරනවා, මේ රටට උදවු කරන්න කියලා; රටට අවශ්‍ය සෞඛ්‍ය උපකරණ ලබා දෙන්න කියලා. කවදාවත් විපක්ෂයකින් එහෙම වෙලා නැහැ. සාම්ප්‍රදායික විපක්ෂයක් කොහොම හෝ ආණ්ඩුව අමාරුවේ දමන්න කකුල් මාට්ටු දමනවා. නමුත් කකුල් මාට්ටු දමන්න අවශ්‍ය නැහැ, රටේ ජනතාව ඉතාම අන්ත අසීරුතාවයට, අසහනයකට, පීඩනයකට ලක් වී තිබෙන මොහොතක. ඒ නිසා ගරු ඇමතිතුමියගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ සභාවටත්, රටටත් ඇත්ත හෙළිදරව් කරලා කොරෝනා ප්‍රශ්නයට වහා විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. වසරකුත් මාස 5ක් මුළුල්ලේ මේ ප්‍රශ්නය මහ හැරලා රටේ ජනතාවට වෙනත් චිත්‍රයක් පෙන්වූ ආකාරයට ඒ දේශපාලන රඟපෑම් කරන්නේ නැතුව, ඔබතුමිය නායකත්වය අරගෙන මේ ප්‍රශ්නයට තිරසර විසඳුමක් ලබා දෙන්න. විපක්ෂයේ ප්‍රගතිශීලී අපි -සමඟි ජන බලවේගයේ අපි- රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් ඕනෑම පරිත්‍යාගයක් කරමින්, ඕනෑම කැපකිරීමක් කරමින්, අපේ රටත් සමඟත්, රටේ ජනතාව සමඟත් නිරන්තරයෙන් සිටින බව කියමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.07]

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වගකිව යුතු විපක්ෂ නායකයකු විධියට නොවෙයි, එතුමා අදහස් දැක්වූයේ. හැමදාම එතුමා කියන්නේ දේශපාලනය කොරෝනා එක්ක සම්බන්ධ කරන්නේ නැහැ කියලායි. නමුත් එතුමා කරන්නේම ඒක. දේශපාලනයත් එක්ක සම්බන්ධ කරගෙන තමයි කොරෝනා වසංගතය සම්බන්ධයෙන් එතුමා වචන පිට කරන්නේ. එතුමාගේ දෙබිඩි චරිතය ගැන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව වන අපි හොඳින් දන්නවා. එතුමාගේ චරිතය පිළිබඳ හොඳ අධ්‍යයනයක් අපට තිබෙනවා. ඒකයි එතුමාට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලන්න බැරුව කොළඹට ආවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සෞඛ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - சுகாதார அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA took the Chair.*

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියමින් හිටියේ අපේ විපක්ෂ නායකතුමාගේ දෙබිඩි චරිතය පිළිබඳවයි. එතුමා හැම දාම කොරෝනාව දේශපාලනය කරලා පාර්ලිමේන්තුවේදීත්, එළියේදීත්, ජනතාව නොමඟ යවමින්, සෞඛ්‍ය අංශ නොමඟ යවමින් ගැටලුවක්, ඛේදවාචකයක් ඇති කරන්න බොහෝ උත්සාහ කළා. මම හිතන්නේ එය පුදුම විය යුතු කාරණයකුත් නොවෙයි. මොකද, එතුමා ජයග්‍රහණය කරවන්න එතුමා පසු පස හිටියේ, ජනතාවට බාල බෙහෙත් පොවපු, අර සුවපතිලා වාගේ අය; රටේ ආර්ථිකය කඩා බිඳ දමපු, මහ බැංකුව කොල්ල කන්න උදවු කරපු, ඒවාට අත උස්සපු අය. ඒ වාගේම රටේ ජාතික සම්පත් විකුණන්න, ජාතික සම්පත් ටික කුණු කොල්ලයට විදේශිකයන්ට පවරා දෙන්න කටයුතු කරපු අය තමයි එතුමා පිටුපස්සේ ඉන්නේ. ඒ වාගේම ආගම්වාදය හරහා රටේ ආගම්වාදී ත්‍රස්තවාදය ඇති කරන්න, ඒ සඳහා උදවු දීපු, අනුබල දීපු අය තමයි එතුමා පිටුපස ඉන්නේ. ඒ නිසා රටේ අවංක ජනතාව තීරණය කළා, හැට නවලක්ෂයක් ජනතාව අවංකව ඡන්දය දීලා තීරණය කළා, ජනතාවට වගකියන නායකයෙක් රටේ ජනාධිපති පුටුවේ වාඩි කරවන්න. ඒ වාගේම එතුමාට තුනෙන් දෙකේ බලයකුත් එක්ක ශක්තිමත් ආණ්ඩුවක් ලබා දෙන්න ජනතාව පැහැදුණා. හැබැයි, අපි මතක තියා ගන්න ඕනෑ, අපේ ජනාධිපතිතුමා දෙබිඩි චරිතයක් නොවෙයි කියන කාරණය. එතුමා ළඟ දෙබිඩි ගති නැහැ. එතුමාගේ පාරේ යන අපිත් දෙබිඩි චරිත නොවෙයි. ලෝකයේ දියුණු රටවල් පවා වැටුණු ගෝලීය වසංගතයක් වූ මේ කොරෝනා වසංගතයෙන් අපේ රට වැටෙන්නට නොදී සෞඛ්‍ය පද්ධතිය නිවැරදිව ක්‍රියාත්මක කිරීමේ අවංක වුවමනාව, වගකීම අපට තිබෙනවා. ආණ්ඩුවේ පසු පෙළ මන්ත්‍රීවරු විධියට අපි ඒ සඳහා කැප වෙනවා.

විපක්ෂ නායකතුමා vaccines ගැන කථා කළා. අදටත් ලෝකයේ රටවල් 50කට වැඩි ප්‍රමාණයක් vaccine එක මාත්‍රාවක්වත් පාවිච්චි කරලා නැහැ. රට විවෘත කරලා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පටන් අරගෙනත් මේ වෙනකොට මාස 8ක් වෙනවා. ඒ මුල් කාලයේ විපක්ෂ නායකතුමා කිව්වේ, "vaccines ගේන්නේ නැහැ. මොකක්ද මේ කරන්නේ, මේක පිස්සුවක්" කියලායි. හිටපු සෞඛ්‍ය ඇමතිතුමා, -සුවපතිතුමා- කිව්වේ මේ රට වහන්න එපා, මේක වහලා කරන්න පුළුවන් දෙයක් නොවෙයි කියලායි. එතුමාගේ හිටපු හෙංචයියන් වාගේම දහදෙනා, පහළොස්දෙනා එකතු කරගෙන වෘත්තීය සමිති හදාගෙන ඉන්න වෛද්‍යවරු කිව්වේ මොකක්ද? "මේක උණක්, හෙම්බිරිස්සාවක් වාගේ රෝගයක්, මේකට භය වෙන්න එපා, රට වහන්න එපා, කොරහේ කිඹුල්ලු දකින්න එපා" කියලායි. එහෙම කියපු අය අද කියනවා රට වහන්න කියලා. අපි දන්නවා ඒ වෘත්තීය සමිති කොහොමද හැසිරෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සෞඛ්‍ය අංශයේ සේවකයකු විධියට මාත් අවුරුදු 13ක් හිටියා. අද වෙනකොට වෛද්‍යවරු, හෙද - හෙදියන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, කනිෂ්ඨ කාර්ය මණ්ඩල - මේ සියලුදෙනාම- එකාවන්ව එකමුතු වී මේ රට මේ කොරෝනා වසංගතයෙන්, ව්‍යසනයෙන් බේරා ගන්නට කැපවීමෙන් කටයුතු කරනවා. ඒ වෙනුවෙන් ඒ අයට අපේ ගෞරවය, උත්තමාචාරය පුද කරන්නට ඕනෑ. ඒ වාගේම ඒ හරහා දේශපාලනය කරන වෘත්තීය සමිති නායකයෝ ඉන්නවා. [බාධා කිරීමක්] ඒ කියන හෙද නිලධාරියා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එතුමා අද කරන්නේ දේශපාලනය. [බාධා කිරීමක්] ඒ වාගේම රවි කුමුදේශ් කියන පුද්ගලයා,- [බාධා කිරීමක්] අපි දැන ගන්නට ඕනෑ, - [බාධා කිරීමක්] ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමා මට කථා කරන්න ඉඩ දෙන්න. අපි මෙතැනදී දැනගන්නට ඕනෑ, දේශපාලනය කරන අය සහ විපක්ෂ නායකතුමාගේ-

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වෛද්‍යවරයෙක් නිසා මට පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා. තවම අර පැණිය තිබෙනවාද, නැත්නම් පැණිය ඉවරද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

ඔබතුමන්ලා රටේ ජනතාව නොමඟ යවනවා. අපි ඇත්ත දන්නවා. ඒ නිසා රටේ ජනතාව නොමඟ යනවා වාගේ අපි නොමඟ යන්නේ නැහැ. ඒක මතක තියා ගන්න. එහෙම නොමඟ යන අය ඇති. නමුත්, අපි එහෙම නොමඟ යන්නේ නැහැ.

මේ කොරෝනා වසංගතය මැඩ පැවැත්වීම අපට තනියම කරන්නට බැරි වැඩක්. රජය, සෞඛ්‍ය අංශ, මහ ජනතාවගේ සහයෝගය සහ එකමුතුකම හරහා තමයි මේ කොරෝනා වසංගතය මැඩ පවත්වන්න හැකි වෙන්නේ. මුළු ලෝකයම ඒක ඔප්පු කර තිබෙනවා; ඔප්පු වෙලා තිබෙනවා.

Vaccines ගැන කථා කළ නිසා මම මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. අද වෙනකොට ඉන්දියාවේ ජනගහනයෙන් සියයට 3කට විතරයි vaccines ලබාදීලා තිබෙන්නේ. Vaccines හදන රටේ තත්ත්වයත් ඒකයි කියන එක මතක තියා ගන්න. නමුත්, අද වෙනකොට අපි ලක්ෂ 9කට අධික ප්‍රමාණයකට vaccine එක ලබා දීලා තිබෙනවා. අපි vaccines ගෙනෙන කොටත් ඔබතුමන්ලා කැමැති වුණේ නැහැ. අපි වෙනත් රටක් සමඟ රාජ්‍යතාන්ත්‍රිකව කථා කළත් කැමැති නැහැ. ඒවාට WHO එකේ approval ඕනෑ කියනවා. සමහර වෙලාවට කියනවා “Approval ඕනෑ නැහැ, තිබෙන එන්නතක් ලබා දෙන්න” කියලා. අපි, අපට ඕනෑ දේවල් කරන්නේ නැහැ. විශේෂඥ වෛද්‍යවරු ඇතුළු අපේ සෞඛ්‍ය අංශ නිර්දේශ කරන දේවල් තමයි අපි කරන්නේ. ඒ සම්බන්ධ විශේෂඥයන් කියන ඒවායි කරන්නේ. ආණ්ඩුවක් විධියට අපි අපට ඕනෑ ඕනෑ දේවල් කරන්නේ නැහැ. අපේ රජයේ ජනාධිපතිතුමා, අගමැතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමිය ඒ ආකාරයට කටයුතු කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි රජයක් විධියට අපේ capacity එකට වැඩිය PCR පරීක්ෂණ ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. අද වෙනකොට දවසකට කරන පරීක්ෂණ ප්‍රමාණය 25,000 දක්වා වැඩි කරලා තිබෙනවා. අපට මතකයි 2020 දෙසැම්බර් මාසයේ අපි දවසකට PCR පරීක්ෂණ කළේ 13,000ක් විතර. අද වෙනකොට ඒ ප්‍රමාණය 25,000 දක්වා වැඩි කරලා තිබෙනවා. එතුමන්ලා ICU bed capacity එක ගැන ඇහුවා. අද වන විට කොරෝනා රෝගීන් සඳහා පමණක් ICU beds 146ක් තිබෙනවා. අපි මේ ප්‍රමාණය තවදුරටත් වැඩි කරමින් යනවා. තවදුරටත් ඔක්සිජන් ධාරිතාව වැඩි කරමින් ඉන්නවා. දැන් තිබෙනවාට වඩා සියයට දෙසියයකින් ඔක්සිජන් ධාරිතාව වැඩි කර ගන්න පුළුවන් කියලා ඔක්සිජන් සපයන අය කියා තිබෙනවා. අපි ආණ්ඩුවක් විධියට මේ ප්‍රශ්නය දේශපාලනීකරණය කරන්න යන්නේ නැහැ. අවශ්‍ය කටයුතු අපි හරියාකාරව ක්‍රියාත්මක කරනවා. රට වහන්න කියන ඔස්තාර්ලා මතක තියා ගන්න, නිවැරැදිම ක්‍රමය අපි කියපු ක්‍රමයයි කියන එක. ඒ කාරණය රජයේ

[ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා]

වෛද්‍ය නිලධාරින්ගේ සංගමය එදාත් කිව්වා; අදත් කියනවා. ඒ විශේෂඥයන්ගේ අදහස් අනුවයි අපි ක්‍රියාත්මක වෙන්නේ. රට වහන්න කිව්වා; ජනාධිපතිතුමා ඒ කාරණය අහලා රට වැහුවා. රට විවෘත කරන්න කිව්වා. Stepwise රට විවෘත කළා. අද වනකොට අපේ රජය තීරණය කරලා තිබෙනවා, මේ zonal lockdown එක තමයි හොඳම,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Madam Chair, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා කිව්වා, අපි රට වහන්න කියනවා කියලා. ඇත්ත වශයෙන්ම රට වහන්න කියලා ප්‍රසිද්ධියේ පුවත් පත්වලට කිව්වේ අපේ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනියයි. එතුමිය වෛද්‍යවරියක් හැටියට වෘත්තීය මතය ප්‍රකාශ කළා. අපි එතුමියට ගරු කරනවා.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
ඔබතුමන්ලා පටලවාගෙන. අපි රට වහන්නේ නැතිව, මනා ආර්ථික කළමනාකරණයක් එක්ක කටයුතු කරගෙන යනවා. අපි micro-lockdownsවලටයි යන්නේ. ඒ වෙනුවෙන් තමයි PCR පරීක්ෂණ ධාරිතාව වැඩි කරලා තිබෙන්නේ. වසංගත රෝග විද්‍යා අංශයෙන් දත්ත ලැබීමේදී පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කාරණයත් යම්තාක් දුරකට අපි නිවැරැදි මට්ටමට ගෙනෙනවා. මොකද, "සුවපතිතුමා" පත් කරපු අයයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇතැම් මුල් පුටුවල ඉන්නේ. ඒ නිසා යම් යම් කාරණාවලදී අපට ගැටලු ඇති වෙනවා. නමුත්, ඒ ගැටලුත් මඟ හැරගෙන අපි ආණ්ඩුවක් විධියට ඉදිරියට යනවා.

ඒ වාගේම අපි ආණ්ඩුවක් විධියට එන්නත්කරණ වැඩ පිළිවෙළ රටට හඳුන්වා දුන්නා. ලක්ෂ නවයකට වැඩි ප්‍රමාණයකට පළමු මාත්‍රාව ලබා දුන්නා. දැන් ලක්ෂයකට කිට්ටු ප්‍රමාණයකට දෙවැනි මාත්‍රාවත් දෙනවා. අපට Sputnik V එන්නත් 15,000ක් ඇවිල්ලා තිබෙනවා. එහි දෙවැනි කොටසත් ඒවි. නිරෝධායනය වන පවුලකට අපි රුපියල් 10,000ක් ලබා දෙනවා. රුපියල් 5,000 ඒවා දෙකක් කියලා ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒක ටිකක් හැල්ලුවට ලක් කළා. නිරෝධායනය වන සෑම පවුලකටම රුපියල් 10,000ක බඩු මල්ලක් ලබා දෙන බව ඔබතුමන්ලා මතක තබා ගන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
තවම දීලා නැහැ.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
තවම බඩු මල්ල දීලා නැත්නම් ඒ පිළිබඳව කරුණාකර දැනුම් දෙන්න. දැනුම් දුන්නාම ඒ බඩු මල්ල ලබා දෙනවා. භය වෙන්න එපා. අපි ඒ සියල්ල ආණ්ඩුවක් විධියට දැන් කරනවා. සෞඛ්‍ය අංශය අපට විශේෂ ශක්තියක් ලබා දෙන බව අපි විශේෂයෙන් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, ආරක්ෂක අංශ විශේෂ ශක්තියක් ලබා දෙනවා. මහ ජනතාවගේ දායකත්වයත් ලබා ගෙන අපට මේ කොරෝනා වසංගතය මඟ හරවා ගන්න පුළුවන්. මහ ජනතාවගෙනුත් අපි මේ අවස්ථාවේ ඉල්ලීමක් කරන්න ඕනෑ, මුව ආවරණ පැළැඳ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රියා මාර්ග පැකිළීමකින් තොරව අනුගමනය කරමින් රජය ගෙන යන වැඩ පිළිවෙළට ශක්තිමත් දායකත්වයක් ලබා දෙන්න කියලා. මම විපක්ෂයෙන් අද ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා කරන්නේ නැහැ කියන දේශපාලනය මේ කොරෝනා වසංගතයත් එක්ක කරන්න එපා කියලා. කරුණාකර, අපිත් එක්ක එකතු වෙන්න; අපිත් එක්ක එක වැඩ පිළිවෙළකට එන්න.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා field hospitals ඉල්ලනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)
මට තව තත්පර කීපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

එතුමා Field hospitals ඉල්ලනවා. එතුමා ඒ ඉල්ලීම කරන්නේ සද්භාවයෙන් නම් හොඳයි. Field hospitals හදන්න කලින් තිබෙන hospitals වල ඇඳන් ටික වැඩි කර ගත්තොත් හොඳයි. ඒක තමයි අපි දැන් කරන්නේ. දිස්ත්‍රික්කයකට ඇඳන් 2,000 ගණනේ වැඩි කර ගන්න අපි දැන් කටයුතු කරනවා. Field hospitals හදන්න පෙර තිබෙන සම්පත් අපි කළමනාකරණය කර ගන්න ඕනෑ. අපි මේ සියල්ල ගැනම හිතන්න ඕනෑ. එතුමා ICU bed එකක් ගැන කථා කරනකොට ICU bed එකකට සේවකයන් කොච්චර ඕනෑද කියලාත් දැනගන්න ඕනෑ. Bed එක දීලා විතරක් බලාගෙන ඉන්න බැහැ. මේ සියලු කාරණා සැලකිල්ලට ගනිමින් අපි රජයක් විධියට නියමාකාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. ඒ වෙනුවෙන් අපට උදවු කරන්න, ශක්තියක් ලබා දෙන්න කියලා ගරු විපක්ෂයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව නිමා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.20]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොරෝනා වසංගතයේ දෙවැනි රැල්ලෙන් පසුව දැන් තුන්වැනි රැල්ලත් මතු වෙලා තිබෙනවා. පළමුව කොරෝනා වසංගතය මේ රටට ආපු අවස්ථාවේ එය මර්දනය කළ ආකාරය පිළිබඳව උදන් අනා, ඒක දේශපාලන වාසියක් කර ගත්තේ ආණ්ඩුවේ අයම තමයි. ඇත්තටම ගත්තොත්, ආණ්ඩුවක් විධියට කොරෝනා සම්බන්ධයෙන් තැබිය යුතු බර තැබීම, පවතින අවදානම ආණ්ඩුව හැල්ලුවට ලක් කළා. ඒ අවදානම සැහැල්ලුවට ලක් කිරීම නිසා තමයි, දෙවන රැල්ල මතු වුණේත්, තුන්වන රැල්ල මතු වුණේත්. යුද්ධ හමුදාපතිවරයා ම පසුගිය දවස්වල ඒක පිළිගත්තා. "අපි අධිතක්සේරුවකට ගියා. ඒකෙන් තමයි මේ දෙවන රැල්ල මතු වුණේ" කියලා එදා කිව්වා.

පළමුවැනි රැල්ල අවසන් වෙලා ටික කාලයක් යන කොටම යුක්රේන ජාතිකයන් ලංකාවට ගෙන්වාගන්න පටන් ගත්තා. ගරු ඇමතිතුමිය ම මේ ගරු සභාවේ ඉතා පැහැදිලිව කිව්වා, "යුක්රේන ජාතිකයන් කිහිපදෙනෙකු කටුනායක සීදුවේ හෝටලයක නතර වෙලා ඉඳලා තිබෙනවා. එතැනින් දෙවන රැල්ල මතු වෙන්න මූලාරම්භය ඇති වුණා" කියලා. ඉදිරිපත් කරපු වෛද්‍ය වාර්තාවේත් ඒක ඉතා පැහැදිලිව තිබෙනවා. එහෙම තිබියදී තමයි, ආණ්ඩුව අත්තනෝමතික විධියට දිගින් දිගටම විශේෂඥ වෛද්‍යවරුන්ගේ, වෛද්‍යවරුන්ගේ මතය නොසලකමින් ඒ යුක්රේන ජාතිකයන් ලංකාවට ගෙන්වාගන්න සියලු දේවල් කළේ. අදත් අපි දකිනවා, කිසිදු වග විභාගයක් නැතිව ඉන්දියාවෙන් විශාල වශයෙන් ලංකාවට පිරිස් එන බවක්. නමුත් ඒක පාලනය කරන්නේ නැහැ. එතැනදී බලන්නේ සල්ලි ගැන විතරයි. හෝටල් කිහිපයකින්ම දැන් වාර්තා වෙලා තිබෙනවා ඉන්දියාවේ ඉඳලා ඇවිත් මිනිස්සු ඉන්නවා කියලා. ඔවුන් සංචාරක වීසා අරගෙන ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒ අයට එහෙම එන්න ඉඩ හැරලා තිබෙනවා. අපි ඉන්දියාවේ තත්ත්වය ගැන බොහෝ ගැඹුරින් කථා කරනවා; පෙන්වනවා. නමුත්, ඒ අය එන එක පාලනය කරන්න ආණ්ඩුව තවමත් අපොහොසත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ අපොහොසත්කම ගැන කථා කරද්දී, මට මතක් වෙනවා ජනාධිපතිතුමා කොවිඩ් ආරම්භක අවස්ථාවේදී කථා කළේ කොහොමද කියලා. එතුමා කිව්වේ, "මේ විසිඅටදෙනෙකු නිසා මොකටද රට වහන්නේ? මම මේවා හොඳට පාලනය කරපු කෙනෙක්." කියලායි. එදා හරි උජාරුවෙන් ඒවා කිව්වේ. "මොළෙන් කල්පනා කරලා වැඩ කරන්න ඕනෑ" කිව්වා. "Panic වෙන්න එපා" කිව්වා. "Panic වුණොත් ජනතාවත් panic වෙනවා" කිව්වා. "මගෙන් අහනවා, සිංගප්පූරුවේ කොහොමද කළේ, ඉතාලියේ කොහොමද කළේ කියලා. නමුත් කවුරුත් අහන්නේ නැහැ, ලංකාවේ මම කොහොමද කළේ කියලා. අපි නේ හොඳටම කළේ." කියලා නේ කිව්වේ. කරලා තියෙන්නේ මේ! මේවා දේශපාලන කයිවාරු ගහන වැඩ නොවෙයි.

මෙහිදී ඉතා පැහැදිලිව විශේෂඥ වෛද්‍යවරුන්ගේ, වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව තීන්දු තීරණ ගත යුතුව තිබෙනවා. හරි පැහැදිලියි, පෙරේදා පිළියන්දල වෙච්ච සිද්ධිය. පිළියන්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමිය ඉතා පැහැදිලිව කියනවා, "ඒ ප්‍රදේශයේ සියලු ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන විධියට තමයි lock down කිරීම කළේ. හැබැයි, මම දන්නේත් නැතිව, මගෙන් අහන්නේත් නැතිව නගර සීමාවේ විතරක් ඒ තත්ත්වය ඉවත් කර තිබෙනවා" කියලා. හමුදාපතිවරයා ඊයේ රාත්‍රියේ රූපවාහිනී වැඩසටහනකදී කිව්වා, "හතර වටෙන් ඇමතිවරුන්ගෙන් calls ආවා. ඒ calls හින්දා ඒ ප්‍රදේශය විවෘත කරන්න සිද්ධ වුණා" කියලා. එතකොට, කවුද ඒ තීන්දු ගන්නේ? වෛද්‍යවරුද, විශේෂඥ වෛද්‍යවරුද, දේශපාලනඥයෝද, ඊට උඩින් සිටින කවුරුන් හෝ කෙනෙක්ද?

ගරු සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය විෂය භාර රාජ්‍ය අමාත්‍යවරිය විධියට ඉතා පැහැදිලිව කිව්වා, "අපි සෞඛ්‍ය අංශයෙන් නිර්දේශ ඉදිරිපත් කළා. සංචරණ සීමා ඇති කරන්න නිර්දේශ ඉදිරිපත් කළා. ඒ යෝජනා පරාද වුණා. ඒවාට ඇහුම් කන් දුන්නේ නැහැ. ඒකේ ප්‍රතිඵලය විධියට තමයි මේ තුන්වන රැල්ල ඇති වෙලා තිබෙන්නේ" කියලා. කවුද ඒක පරාද කළේ? කොවිඩ් රෝග පාලන කටයුතු භාර රාජ්‍ය ඇමති ඔබතුමියයි. හැබැයි, ඔබතුමියම කියනවා, "ඒ යෝජනාව සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කළා. හැබැයි, ඒක පරාද වුණා" කියලා. කවුද පරාද කළේ? ඒක මේ රටේ ජනතාව දැනගන්න කැමැතියි. අවුරුදු උත්සව කාලය හින්දා ඇති වෙච්ච එකක් නොවෙයි මේක. දැන් මේ අය කියන්න හදනවා, අවුරුද්දට ජනතාව ගමන් බිමන් ගියා, විනෝද චාරිකා ගියා, ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි රෝගය ව්‍යාප්ත වුණේ කියලා. නැහැ. ඒක මහා අසත්‍යයක්. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායම අප්‍රේල් මාසයේ 08වැනි දා වන කොට ඉතා පැහැදිලිව සනාථ කරලා කිව්වා, බ්‍රිතාන්‍යයේ තිබෙනවා හා සමාන වයිරස් ප්‍රභේදයක් දැන් ලංකාව තුළ ව්‍යාප්ත වෙනවා, ඒක භයානකයි; වාතය හරහා ඒ වයිරසය ව්‍යාප්ත වෙන්න පුළුවන් කියලා. ඒ කිව්වේ අලුත් අවුරුද්දට කලින්. අප්‍රේල් මාසයේ 08වැනි දා ඒක ප්‍රකාශ කළේ. ඒ අනුව ආණ්ඩුව ගත් තීන්දු මොනවාද? ආණ්ඩුව එම විශේෂඥ උපදේශකයන්ගේ නිර්දේශවලට අනුව ගත් ක්‍රියා මාර්ග මොනවාද? ක්‍රියා මාර්ග කිසිවක් ගත්තේ නැහැ. ඒ නිසා මේ තත්ත්වය හරියාකාරව පාලනය කර ගන්න බැරි වීම පිළිබඳ වගකීම භාරගන්න ඕනෑ ආණ්ඩුවයි. අදත් තිබෙන තත්ත්වය ඒක තමයි. අදත් කයිවාරු ගහනවා. කයිවාරු ගැහුවාට විය යුතු වැඩේ වෙන්නේ නැහැ. අද මහ පොළොවට බැහැලා බලන්න. PCR පරීක්ෂණ ප්‍රමාණවත්ව කරන්නේ නැහැ. මේ ඊයේ පෙරේදා යන්තම් ඒ ප්‍රමාණය වැඩි කළා. නමුත්, පසුගිය කාලයේ ඔබතුමන්ලා ඒක අත්හැරලා තිබුණේ. PHI මහත්වරුන්ට කියලා තිබුණේ, ඒ පරීක්ෂණ කරන්න එපා කියලා. වෙන මොකවත් ඕනෑ නැහැ, ජනාධිපතිතුමා මීමුරේ ගිහිල්ලා පවත්වපු "ගම සමඟ පිළිසඳර" වැඩසටහනේදී එහි ගම්වැසියෙක් කියනවා, "ජනාධිපතිතුමනි, අපට PCR යන්ත්‍රයක් ලබා දෙන්න, මේ රෝගය තිබෙනවාද කියා හඳුනාගන්න" කියලා. ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? හාස්‍යයෙන්, උපහාසයෙන් හිනා වෙලා කිව්වා, "PCR වැඩක් නැහැ. ඒවා කරන්න ඕනෑ නැහැ. එන්නත ඔක්කෝටම දෙනවා. එන්නත තමයි උත්තරය" කියලා. එහෙම නේ කිව්වේ, රටේ ජනාධිපති. එන්නත උත්තරය නම්, එන්නත දෙන්න එපායැ. එන්නත් ලක්ෂ 12ක් පමණ තමයි මේ වන විට ගෙනැවිත් තිබෙන්නේ. ඒ එන්නත්වලින් ලක්ෂ 9ක් වාගේ තමයි ජනතාවට ලබා දුන්නේ. ලෝක සෞඛ්‍ය සංවිධානය ඉතා පැහැදිලිව නිර්දේශ ඉදිරිපත් කළා, ජනතාවගෙන් ලක්ෂ 140කට වත් එන්නත ලබා දුන්නොත් පමණයි මේ රෝගය පාලනය කරන්න පුළුවන් කියලා. නමුත් අදටත් දෙවැනි මාත්‍රාව ලබා දෙන්න ක්‍රමවේදයක් හැදුවේ නැහැ. ඒ පළමුවෙනි එන්නත් මාත්‍රාව කිසිම පාලනයක් නැතිව අයාලේ යන විධියට තමයි ලබා දුන්නේ. විෂයය භාර රාජ්‍ය අමාත්‍යතුමිය විධියට ඔබතුමිය ඒකට විරුද්ධ වුණා. අපි ඒක දැක්කා. නමුත් ඒක තමයි ආණ්ඩුවේ තීරණය වුණේ. ඒ නිසා කාරණය හරි පැහැදිලියි. මේ සම්බන්ධයෙන් වන විශේෂඥ වෛද්‍යවරුන්ගේ මතයට ඇහුම් කන් දෙන්නේ නැතිව ඒවා ඩෝසර් කරලා තමයි -අනෙක් හැමදේම ඩෝසර් කරන විධියටම ඒවාත් ඩෝසර් කරලා තමයි- දේශපාලන තීන්දු තීරණ ගනිමින් ආණ්ඩුව අද අත්තනෝමතික ලෙස මේ ගමන යන්නේ. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අද වන විට කොවිඩ් තුන්වෙනි රැල්ල ව්‍යාප්ත වෙලා තිබෙන්නේ. දැන් මේක සමාජගත වෙලා ඉවරයි. දැන් මේක බ්‍රැන්ඩික්ස් පොකුරත් නොවෙයි, පෑලියගොඩ පොකුරත් නොවෙයි. මේක ලංකාවේ සමාජගත වෙලා ඉවරයි. ජනතාව බරපතළ උවදුරකට ලක් වෙලා ඉන්නේ. දැන්වත් නිහතමානී වෙලා, හරියට කල්පනා කරලා තීන්දු තීරණ අරගෙන මේ රටේ ජනතාව විපතට පත් කර තිබෙන මේ තත්ත්වය සමනය කරන්න වහාම පියවර ගන්න කියා ඉල්ලා සිටිමින්, මම නතර වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු පියල් නිශාන්ත ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 1.27]

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - மகளிர் மற்றும் சிறுவர் அபிவிருத்தி, முன்பள்ளி மற்றும் ஆரம்பக்கல்வி, பாடசாலைகள் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் கல்விச் சேவைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Women and Child Development, Preschools and Primary Education, School Infrastructure and Education Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අද මම මේ ආමන්ත්‍රණය කරන්නේ පක්ෂ, මතවාද, පුද්ගල මතවාද රැසක් තිබෙන උත්තරීතර සභාවක් තුළයි. මොන බෙදීම් තිබුණත් අපි සියලුදෙනා ජීවත් වෙන්න ආසයි; මැරෙන්න අකැමැතියි. හැබැයි, මේ සියල්ල අවබෝධ කර ගත් අප, විශේෂයෙන්ම වග කිව යුතු සභාවක් වන මේ ගරු සභාව නියෝජනය කරන අප අද හැසිරෙන ආකාරය, කථා කරන ආකාරය පිළිබඳ නැවත නැවත සිහිපත් කරන්න ඕනෑ. එසේ සිහිපත් කරමින් අපි බෙහෙවින් කනගාටු වෙන්න ඕනෑ කියලායි මා හිතන්නේ. එහෙම කියන්න ප්‍රධාන හේතුවක් තිබෙනවා. විශේෂයෙන්ම ගෝලීය වශයෙන් දැවැන්ත වසංගතයක් තිබෙන අවස්ථාවක දී වග කිව යුතු විපක්ෂයක් හැටියට විපක්ෂයේ කාර්ය භාරය නිවැරදිව ඉටු වෙනවා ද, ඒ වාගේම මහජන නියෝජිතයන් හැටියට මේ උත්තරීතර සභාවට අප තෝරා පත් කර එවපු ඒ ආදරණීය, අහිංසක ජනතාවගේ ජීවිතවලට පක්ෂ, පාට දේශපාලනයෙන් තොරව අප වග කියනවා ද කියන එක පිළිබඳ දැන් නම් පැහැදිලි සැකයක් තිබෙනවා.

මම සතුටු වෙනවා විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා, ඒ වාගේම ගරු විජිත හේරත් මැතිතුමා ඇතුළුව දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කරපු ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළාට පසුව කථා කරන්න ලැබීම ගැන. විපක්ෂ නායකතුමා කථා කළේ කැනඩාව පිළිබඳයි. කැනඩාවේ එන්නත් එකතු කිරීම සම්බන්ධව කිව්වා; එහේ මාත්‍රා මෙච්චර සංඛ්‍යාවක් ලබා දෙනවා කිව්වා. අපේ රටේ ඖෂධවල තිබෙන හිඟයක් ගැන එතුමා කථා කළා. හැබැයි, එතුමාට අමතක වෙලා තිබෙනවා, මහ බැංකුව කොල්ල කනකොට පැවැති ආණ්ඩුව තුළ එතුමා සිටියා, එතුමා ඒ ආණ්ඩුව නියෝජනය කළ කෙනෙක් කියන එක. ගරු විපක්ෂ නායකතුමාට අමතක වෙලා තිබෙනවා, බාල ඖෂධ ගෙනැල්ලා අහිංසක ජනතාවගේ ජීවිත විනාශ කරපු ආණ්ඩුවක හිටපු කෙනෙක් කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක බෙහෙවින්ම කනගාටුවට කරුණක්.

දෙවැනි කාරණය හැටියට මා ඉදිරිපත් කරන්න සූදානම් වන්නේ මෙයයි. අපේ රටේ ව්‍යසනයක් ඇති වන, ජනතාව දැඩි පීඩනයකට ලක් වන හැම අවස්ථාවකම වාගේ අපි පාර්ලිමේන්තුවේ දෙපැත්තේ ඉඳගෙන අපේ මතවාද ඉදිරිපත් කරනවා; මහා උජාරුවට සාකච්ඡා කරනවා. එය සුබවාදී ද නැද්ද කියන එක පිළිබඳ නැවත නැවත මෙනෙහි කරන්න සිදු වෙලා තිබෙනවා කියලායි මා හිතන්නේ.

ඉතිහාසය අරගෙන බැලුවොත් අපේ රටේ අවුරුදු 30ක් තිස්සේ යුද්ධයක් පැවතුණු බව අපි දන්නවා. විපක්ෂය හැම මොහොතකම කළේ යුද්ධය අවසන් කරන්න සහයෝගය දෙන එක නොවෙයි. ඔවුන් කළේ ඒ යුද්ධයෙන් මියැදෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සෑම අහිංසක ජීවිතයක් තුළින්, එහෙම නැත්තම් ඒ මළකඳන් උඩින් දේශපාලනය කරන්න හදපු එකයි. අපේ රටට සුනාමියක් ආවා. සුනාමියේදීත් විපක්ෂය මේ කාර්යයම කළා. ගංවතුර, නායයෑම් ආවා. ඒ අවස්ථාවේදීත් ඔවුන් මේ ටිකම කළා. පාස්කු ප්‍රහාරය ආවා. අහිංසක ජීවිත 300කට ආසන්න සංඛ්‍යාවක් නැති වුණා. පාස්කු ප්‍රහාරයේ දීත් මේ දෙපැත්තේ අය විවිධ මත ඉදිරිපත් කරමින් තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කළා. ඊට පසු මෑත කාලයක සිට මගේ ආදරණීය රටේ ජනතාව -මේ මාතෘ භූමියේ ජනතාව- මෙම ගෝලීය ව්‍යසනයට මුහුණ දෙමින් සිටිනවා.

අපේ රටට කොවිඩ් - 19 පළමුවන රැල්ල ආවා. ආණ්ඩුවක් හැටියට අතිගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු සියලුදෙනා ඒ පළමුවන රැල්ලට බොහොම සාර්ථකව මුහුණ දුන්නා; මර්දනය කරන්න නායකත්වය දුන්නා. ඒ වාගේම සෞඛ්‍ය ක්ෂේත්‍රයත්, ආරක්ෂක සේවයත් ඇතුළු රාජ්‍ය සේවයේ සිටින සියලුදෙනා එකතුවෙලා ඒ සඳහා දැවැන්ත හයියක් ලබා දීලා ඒ රැල්ල මර්දනය කර ගත්තා.

ඉන් පසු දෙවැනි රැල්ල ආවා. එම අවස්ථාවේ දීත් විපක්ෂය කටයුතු කළේ ඒ විධියටයි. විපක්ෂය තමන්ගේ සාම්ප්‍රදායික කාර්ය භාරය ඉටු කළා මිසක් රට සහ ජනතාව ගැන හිතුවේ නැහැ. අපේ ආණ්ඩුවට දෙවැනි රැල්ලත් සාර්ථකව මැඩ පවත්වන්නට හැකියාව ලැබුණා. ඉන් පසු තුන්වන රැල්ල ආවා. ඉතාම අවාසනාවන්තයි! එන්න එන්නම උග්‍ර වන මේ තත්ත්වය තේරුම් නොගත් විපක්ෂය ක්‍රියා කළේ කොහොමද? මේ රටේ ජනතාවගේ මළ කඳන් උඩින්, කොරෝනා රෝගීන්ගේ මළකඳන් උඩින් තම බලය, තනතුරු, වරදාන, වරප්‍රසාද වෙනුවෙන් පෙනී සිටිමින් ජනතාව වෙනත් අතකට යොමු කරන්නට විපක්ෂය උත්සාහ ගත්තා. එම නිසා මම පැහැදිලිවම විපක්ෂයට කියනවා, විපක්ෂය මොන විධියට කොයි කොයි දේවල් ක්‍රියාත්මක කරන්න හැදුවත්, කශේරුවක් තිබෙන නායකයකු මේ රටේ නිර්මාණය වී තිබෙන බව. එම නායකයා පිළිබඳව මේ රටේ ජනතාව තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අවුරුදු 30කට ආසන්න කාලයක් මිනී කනත්තක් බවට පත්වෙලා තිබුණු මේ රටේ, මිනිසුන්ට අභය දානය දීමට කටයුතු කරපු නායකයකු හැටියට එතුමා මේ තුන්වන රැල්ලේ අභියෝගයටත් මුහුණ දෙමින් එයත් සාර්ථකව අවසන් කරයි කියලා අපට ලොකු විශ්වාසයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වසංගතය ලංකාවට ආපු වෙලාවේ ඉඳලා විපක්ෂය හැසිරුණු ආකාරය ඉතාම කනගාටුදායකයි. වර්තමානයේ මේ ගෝලීය වසංගතයට මුහුණ දුන් බොහොම ප්‍රබල රටක් වන නවසීලන්තයේ අගමැතිතුමිය වන ජසින්ඩා මැතිනිය බොහොම ආඩම්බරයෙන් කථා කළා, "මගේ රට මේ විධියට ආරක්ෂා වුණේ මගේ රටේ ජනතාව තුළ විනයක් තිබුණු නිසා" කියලා. ඔව්, ඒක අපි පිළිගන්නවා. හැබැයි, කනගාටුවට කරුණ අපේ රටේ සිටින සමහර ජනතාව තුළ විනයක් නොතිබීමයි. විළිලජ්ජාවෙන් වුණත් කියන්නට ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ සිටින විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඇතුළු දෙපාර්ශ්වයේම සියලු මන්ත්‍රීවරුන් පක්ෂ, පාට භේදයකින් තොරව විනයක් ඇතිව කටයුතු කළා නම්, අපට මේ අභියෝගයට මුහුණ දෙන්න හැකියාව තිබුණ බව. එදා නවසීලන්තය ඒ ජයග්‍රහණය ලබා ගත්තේ, විශේෂයෙන්ම කොරෝනා මර්දනය සම්බන්ධයෙන් ඉතාම හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ එවැනි වැඩ පිළිවෙළක් අද වෙනකොට මේ රට තුළත් ක්‍රියාත්මක වනවා. ඒක නිසා හැම ක්ෂේත්‍රයක්ම නියෝජනය කරමින්, අපේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කර දෙන්න අද වන විට ඒ සියලුදෙනා දැවැන්ත කැපවීමක් කරන බව විශේෂයෙන් මේ උත්තරීතර සභාව තුළදී මම කියන්න කැමැතියි.

ඒ වාගේම තමයි, අපි හැමදෙනාම කථා කරන්නේ, අවධානය යොමු කරන්නේ මරණ පිළිබඳව, ආර්ථික කඩා වැටීම් පිළිබඳව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
හැබැයි, වැඩි අවධානයක් යොමු කරන්න තිබෙන අපේ දරුවන්ගේ අධ්‍යාපනය වාගේම ළමා පරපුර, කාන්තා පරපුර පිළිබඳවත් ඒ අවධානය යොමු නොකිරීම ඉතා කනගාටුදායක තත්ත්වයක් කියා මා හිතනවා. හැම වෙලාවේම සාම්ප්‍රදායික විපක්ෂය හැටියට ඒ අයට පාසල ඇරියත් වැරදියි; පාසල වැහුවත් වැරදියි. ප්‍රදේශයක් lock down කළත් වැරදියි; නොකළත් වැරදියි. ඖෂධවල යම්කිසි ප්‍රමාදයක් සිදු වුණා නම් ඒකත් වැරදියි. ඒ නිසා මේ සියල්ල පැත්තකට දාලා අපි එකා වාගේ පක්ෂ, පාට භේදයකින් තොරව එකට එකතු වෙලා, මේ අහිංසක ජනතාවගේ ජීවිත බේරා ගැනීමට කැප වෙමු කියන පණිවුඩය ලබා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව එක විනාඩියක් දෙන්න. මගේ අමාත්‍යාංශය කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය. අපි මේ වන විට අපේ අමාත්‍යාංශය තුළින් විශාල වැඩ කොටසක් ඉටු කරමින් සිටිනවා. අපි, අතිගරු ජනාධිපතිතුමාත් එක්ක පසුගිය මාසයේ 29වැනි දා මොනරාගල කාන්තා රැඳවුම් මධ්‍යස්ථානය විවෘත කරන්න හිටියා. එය රෝගීන් සඳහා වෙන් කරන රෝහලක් හැටියට පත් කරන්නට අපේ සහයෝගය ලබා දුන්නා. අපේ දිස්ත්‍රික් ලේකම්තුමා ඇතුළු සියලුදෙනාගේ ඉල්ලීම පරිදි, කළුතර දිස්ත්‍රික්කයේ පානදුර ළමා රැඳවුම් මධ්‍යස්ථානයට ඇඳන් 100ක් යොදලා, එයත් ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම, අහිංසක දරුවන් පාසල් අධ්‍යාපනය ලැබීමට නොහැකිව ගෙදර ඉන්නවා. මේ වන විට අපි ඒ දරුවන්ගේ පෝෂණය වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා එකිනෙකාට තිබෙන වගකීම සහ යුතුකම පිළිබඳව වටහාගෙන මේ ව්‍යසනයෙන් රටත්, මගේ ආදරණීය ජනතාවත් බේරාගෙන ඒ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් අපි කැප වෙමු කියන පණිවුඩයත් ලබා දෙමින්, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදෑසන අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා මතු කළා, පාර්ලිමේන්තු මන්ත්‍රී රිසාඩ් බදියුදීන් මහතා පාර්ලිමේන්තුවට ගෙන ඒම සම්බන්ධ කාරණය. ඒ පිළිබඳව එම පවුලේ උදවියට නැවත වතාවක් දැනුම් දීලා තිබෙනවා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරියෙකුට කොරෝනා වයිරසය හැදුණා කියලා එතුමා පාර්ලිමේන්තුවට සහභාගි කරවන්න බැහැ කියලා. අපට මෙය තේරෙන්නේ නැහැ. මොකද, උදේ වරුවේ එවැනි පණිවුඩයක් නොවෙයි ආවේ. උදෑසන කිව්වේ කථානායකතුමාගේ අවසරය තවම ලැබී නොමැති නිසා එතුමාව පාර්ලිමේන්තුවට ගෙනෙන්න බැහැ කියලායි. මම හිතන හැටියට දැන් කථානායකතුමා මැදිහත් වුණා ද දන්නේ නැහැ. එහෙම මැදිහත් වුණාට පස්සේ වෙන පණිවුඩයක් දෙනවා. මෙය හිතාමතා ම මන්ත්‍රීවරයකුගේ වරප්‍රසාද කඩ කිරීමක් හැටියට තමයි අපට පෙනෙන්නේ. ඒ නිසා ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව කථානායකතුමා දැනුවත් කරන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.39]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වසර එකහමාරක කාලයක් තුළ කොවිඩ් - 19 වසංගතය තුරන් කරන්නට විශාල ශක්තියක් ලබා දෙමින් කටයුතු කරන අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු නිලධාරි මහත්ම මහත්මීන්ට ප්‍රථමයෙන්ම මම මේ වෙලාවේ විශේෂ ස්තුතියක් පුද කරන්නට ඕනෑ. ඒ වාගේම, යුද හමුදාපති ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ නිලධාරි මහත්ම මහත්මීන් ද විශාල සේවයක් කරනවා. ඒ සියලුදෙනාට මේ වෙලාවේ අපේ ආචාරය සහ ගෞරවය පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මතකයි මීට වසරකට පමණ පෙර අපේ ලංකාවෙන් පළමුවෙනි කොවිඩ් ආසාදිතයා හැටියට චීන කාන්තාවක් හමුවුණා. එම කාල වකවානුවේ තමයි අපේ රටේ පළමුවැනි කොවිඩ් රැල්ල ඇති වුණේ. ඒ වෙලාවේදී අපේ රටේ ජනාධිපතිවරයාත්, මෙම ආණ්ඩුවත් එම කාරණය ඉතා සැහැල්ලුවට ගත්තා. විපක්ෂය හැටියට අපි කරුණු කාරණා ඉදිරිපත් කළාම ඒවා හාස්‍යයට ලක් කළා. විපක්ෂ නායකතුමා යම් යම් ප්‍රකාශ සිදු කළාම, ඒවා විහිළුවට ලක් කළා. නමුත් අන්තිමට සිදු වුණේ, සති ගණනක්, මාස ගණනක් මේ රට වහන්න සිදු වුණු එකයි. ඔබට මතක ඇති, ජනාධිපතිවරයා එක වෙලාවක ඇහුවා, "ආසාදිතයන් 28දෙනායි ඉන්නේ, 28දෙනෙක් ඉන්නකොට අපි රට වහන්න ඕනෑද?" කියලා. මේ රටේ තිබුණු අවදානම් තත්ත්වය පිළිබඳව පළමුවැනි රැල්ලෙන් පස්සේ අපි සඳහන් කළා. විශේෂයෙන්ම ඒ සඳහා අවශ්‍ය හදිසි ප්‍රතිකාර, වාට්ටු, ඇඳන්, උපකරණ, masks ඇතුළු ඒ අවශ්‍ය දේවල් ගැන අවධානය යොමු කරන්න කියලා අපි විටින් විට, විටින් විට ප්‍රකාශ කළා. නමුත් ඒ ගැන වුවමනාවකින්, උනන්දුවකින් කටයුතු කළේ නැතිව ඒකත් එක්කම පැමිණි මැතිවරණය ඉලක්ක කරගෙන කටයුතු කළා. විශේෂයෙන්ම මැතිවරණය ජයග්‍රහණය කරන්න, තුනෙන් දෙකක බලයක් ලබා ගන්න කාරණා පිළිබඳව තමයි අවධානය යොමු කළේ.

පාර්ලිමේන්තු මැතිවරණය අවසන් වුණාට පස්සේ කොරෝනා ගැන තිබුණු අවධානය අත්හැරලා දැම්මා. දෙවැනි රැල්ල එන කොට ඇත්තටම කොවිඩ්වලට තිබුණු අවධානය අත්හැරලා දාලායි තිබුණේ. හැදෙන කෙනෙකුට හැදෙන්න, මැරෙන කෙනෙකුට මැරෙන්න කියලා අත්හැරලා දාලායි තිබුණේ. කොවිඩ් දෙවැනි රැල්ල ආවේ කොහොමද? කොවිඩ් තුන්වැනි රැල්ල ගැන මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. කොවිඩ් තුන්වැනි රැල්ල ආවේ කොහොමද? කොවිඩ් තුන්වැනි රැල්ල ආවේ ඒ ගැන අවධානය යොමු කිරීම සම්පූර්ණයෙන්ම අඩාළ කරපු නිසායි. අපට දැනගන්න ලැබිලා තිබෙනවා, ජනවාරි මාසයේ, පෙබරවාරි මාසයේ, මාර්තු මාසයේ කරපු PCR පරීක්ෂණ සංඛ්‍යාව විශාල

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

වශයෙන් අඩු කරලා තිබුණා කියලා. එතකොට ආසාදිත සංඛ්‍යාව සියයයි, දෙසීයයි වාගේ ඉතා අඩු මට්ටමක තිබුණේ. එහෙම වුණේ කොහොමද? ඇත්තටම බලනකොට කරපු PCR පරීක්ෂණ ප්‍රමාණය අඩු කරලායි තිබෙන්නේ. එහෙම නැතුව ඇත්තටම ආසාදිත සංඛ්‍යාව අඩු වීමක් නොවෙයි සිදුවෙලා තිබෙන්නේ. PCR පරීක්ෂණ ප්‍රමාණය අඩු කරලා ආසාදිත සංඛ්‍යාව අඩුයි කියලා පෙන්වනකොට රටේ ජනතාව ඒ කාරණය ඉතා සැහැල්ලුවට ගත්තා.

ඊට පස්සේ අවුරුදු කාල සීමාව ආවා. කොවිඩ් තිබුණාය කියලා කිසි දෙයකට තහංචියක් තිබුණේ නැහැ. රට සම්පූර්ණයෙන්ම විවෘත කරලායි තිබුණේ. අපේ රටේ සංස්කෘතියත් එක්ක, අපේ රටේ පැවතගෙන එන පුරුදුත් එක්ක, විශේෂයෙන්ම පසුගිය අවුරුද්දේදීත් හරියට අවුරුදු සමරන්න බැරි වුණු නිසා මේ රටේ ජනතාව වැඩිපුරත් එක්ක අවුරුදු සැමරුවා. නමුත් රජය නිසි වෙලාවට නිසි තීන්දු තීරණ ගත්තේ නැහැ. රජය ගතයුතු ක්‍රියාමාර්ග ඒ වෙලාවේ ගත්තේ නැති නිසා තමයි තුන්වැනි රැල්ල ඇතිවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙලාවේ මම මේ කාරණයත් කියන්න ඕනෑ. ජනාධිපතිතුමාත් ප්‍රකාශ කරන ආකාරයට කොවිඩ් පාලනය සඳහා තිබෙන එකම විසඳුම තමයි එන්නත්කරණය. නමුත් vaccination ගැන අපට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. Vaccines දෙන එක අද වෙනකොට ලොකු ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, Oxford-AstraZeneca එන්නත් ලක්ෂ 12ක් විතර අපට ලැබුණු බව. මේ වෙනකොට ලක්ෂ නවයකට විතර ඒ එන්නතේ පළමුවැනි මාත්‍රාව ලබා දීලා තිබෙනවා. දෙවැනි මාත්‍රාව හැටියට තව ලක්ෂ තුනකට එම එන්නත ලබා දෙන්න දැන් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ලක්ෂ 12න් ලක්ෂ 3කට දෙවැනි මාත්‍රාව ලබා දෙනකොට නොලැබෙන ලක්ෂ නවයකට මොකක්ද වෙන්නේ? ඒ ලක්ෂ නවයට දෙවන මාත්‍රාව විධියට Oxford-AstraZeneca එන්නත ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. Oxford-AstraZeneca එන්නත ඇණවුම් කරන්න කියලා අපි දිගින් දිගටම කිව්වා. රජය මොකක්ද කළේ? රජයක් හැටියට ඒවා ඇණවුම් කළේ නැහැ. එම එන්නත් නොමිලයේ ලබා දෙන්න කියලා WHO එකෙන් ඉල්ලුවා. නොමිලයේ දෙන්න කියලා ඉන්දියාවෙන් ඉල්ලුවා. වෙනත් ආයතනවලින්, වෙනත් රටවලින් එම එන්නත හිඟා කෑවා. නමුත්, අපි මුදල් වෙන් කරලා Oxford-AstraZeneca එන්නත හරි වෙලාවට ඇණවුම් කළා නම්, අද වෙනකොට අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙන්නේ නැහැ. ඒකයි ඇත්ත.

නිසි වෙලාවට එන්නත ඇණවුම් කළේ නැහැ. මුලින්ම ඇණවුම් කළේ නැහැ, WHO එකේ අනුමැතිය ලබා දීලා නැහැ කියලා. හැබැයි, අද චීනයෙන් එන්නත් එනවා. ඒ වාගේම රුසියාවෙන් එන්නත් එනවා. නමුත් WHO එකේ අනුමැතිය ලැබිලා නැහැ. එතකොට ඒක පරස්පර විරෝධීයි. WHO එකේ අනුමැතිය ලබා දීලා නැහැ කියලා ඒ වෙලාවේ Oxford-AstraZeneca එන්නත ඇණවුම් කළේ නැහැ. දැන් WHO එකේ අනුමැතිය නැති වෙනත් එන්නත් ලංකාවට එනවා. අපි නිසි වෙලාවට නිසි පියවර ගත්තේ නැති නිසා පළමු මාත්‍රාව ගත් ලක්ෂ නවයකට මොකක්ද වෙන්නේ කියන ප්‍රශ්නයට තවමත් විසඳුමක් නැහැ. දැන් රජය කියනවා, "පළමු මාත්‍රාව වශයෙන් එක එන්නත් වර්ගයකුත් - Oxford-AstraZeneca එන්නත - දෙවන මාත්‍රාව හැටියට තවත් එන්නත් වර්ගයකුත් දෙන්න උත්සාහ කරනවා. මේ වෙනකොට ඒ සඳහා පරීක්ෂණ කරනවා" කියලා. ඒක තමයි හොඳම විහිළුව. මා හිතන විධියට මේ ලෝකයේ එක රටකවත් මේ වාගේ දෙයක් නම් වෙලා නැතුව ඇති. එතකොට පළමුවන මාත්‍රාව එක රටකින් නිෂ්පාදනය කළ එක වර්ගයක එන්නතකුත්, දෙවන මාත්‍රාව තවත් රටකින් නිෂ්පාදනය කළ තවත් වර්ගයක එන්නතකුත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ඔබතුමන්ලා මෙතැනදී කියනවා, Oxford-AstraZeneca එන්නත ලබා ගන්න නොහැකි වෙලා තිබෙන්නේ ඉන්දියාවේ අද තිබෙන ප්‍රශ්නය නිසා කියලා. ඉන්දියාවේ ප්‍රශ්නය ඇති වෙන්න කලින් අපට අවශ්‍ය එන්නත් ඇණවුම් කරලා තිබුණා නම්, අපට ඒ එන්නත් ප්‍රමාණය ලැබෙනවා. ඒ වාගේම Oxford-AstraZeneca එන්නත ඉන්දියාවේ පමණක් නිෂ්පාදනය කරන එකක් නොවෙයි. ඒ එන්නත නිෂ්පාදනය කරන වෙනත් රටවල් තිබෙනවා. නමුත් නිසි තීන්දු ගත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා, අද වන විට අපේ අල්ලපු රට -ඉන්දියාව- ඉතා බැරෑරුම් තත්ත්වයකට පත්වෙලා තිබෙන බව. නමුත් අදටත් හැම දවසකම SriLankan Airlines flights විතරක් තුනක් ඉන්දියාවෙන් ලංකාවට එනවා ගරු අමාත්‍යතුමියනි. SriLankan Airlines එකේ විතරක් flights තුනක් ඉන්දියාවෙන් එනවා. එතකොට වෙනත් airlinesවල ගුවන් යානාත් ඉන්දියාවෙන් එනවා. අද අපි මේ රටට ප්‍රමුඛත්වය ලබාදීලා, අපේ රට ගැන හිතනවා නම්, මේ වෙලාවේ තාවකාලිකව හෝ ඉන්දියාවෙන් එන සංචාරකයන් වේවා, එහෙම නැත්නම් වෙනත් අය වේවා, ඒ flights නතර කළ යුතුයි නේද? ඒ ගුවන් ගමන් නතර කළ යුතුයි නේද? එහෙම කරන්නේ නැත්තේ ඇයි කියලා මට තේරෙන්නේ නැහැ. ඒක අපි කියන්නේ ඉන්දියාව සමඟ තිබෙන විරෝධතාවක් නිසා නොවෙයි. මේ වෙනකොට ලංකාවේ පුරවැසියන්ට සිංගප්පූරුවට යන්න බැහැ, ඕස්ට්‍රේලියාවට යන්න බැහැ, නවසීලන්තයට යන්න බැහැ. ඉන්දියාවේ තරම් අපේ රටේ බැරෑරුම් තත්ත්වයක් නැහැ. නමුත්, ඒ අය අපේ රටේ තිබෙන තත්ත්වය ගැන කල්පනා කරලා, ඒ ගැන අවධානය යොමු කරලා, ඒ සඳහා අවසර ලබා දෙන්නේ නැහැ. ඉන්දියාවට සිදුවන දේ මුළු ලෝකයම බලාගෙන ඉන්නවා. නමුත්, අපි ඉන්දියාවේ අයට මේ රටට ආරාධනා කරනවා. ඊට අමතරව මෙහිදී මුදල් ඉපයීමේ කාර්යයකුත්, ඒ කියන්නේ ව්‍යාපාරික කටයුත්තකුත් සිදුවෙලා තිබෙනවා. ඉන්දියාවේ අය නිරෝධායනය කරන්න ලංකාවට ගෙන්වලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙනවා. ඒ telephone number එකකට මමත් කෙනෙකු ලවා call කෙරෙව්වා. එතකොට ඒ ගොල්ලෝ කියලා තිබෙනවා, "ඔව්, ඒ වාගේ දෙයක් වෙලා තිබෙනවා. දැන් ඒක පොඩ්ඩක් නතර කරලා තිබෙනවා. මොකද, ඒ පිළිබඳව දැන් සමහරු කථා කරනවා." කියලා. ඇත්තටම එවැනි දෙයක් සිදුවෙලා තිබෙනවා. ඒක පිළිගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මම මේ වෙලාවේ විශේෂයෙන්ම කියනවා, එසේ නිරෝධායනය කරන එක විතරක් නතර කරන නොවෙයි, ඉන්දියාවෙන් එන flights ටිකත් නතර කරන්න. අපි ඒ තීන්දු තීරණ ගත්තේ නැහැ. එදා චීනයේ කොවිඩ්-19 රෝගය පැතිරෙනකොටත් අපි චීනයෙන් එන flights නතර කළේත් නැහැ. මට තේරෙන්නේ නැහැ, ඒ ඇයි කියලා. ඒ රටවල් සම්බන්ධයෙන් එවැනි තීන්දු තීරණ ගන්න බයද? අපි චීනය එක්ක තරහත් නැහැ; ඉන්දියාව එක්ක තරහත් නැහැ. නමුත්, අපි අපේ රටට ආදරෙයි, අපි ශ්‍රී ලාංකිකයන්ට ආදරෙයි. ඉන්දියාව ගැන හිතලාවත්, චීනය ගැන හිතලාවත් නොවෙයි, ශ්‍රී ලාංකිකයන්

වෙනුවෙන් තමයි ඒ තීන්දු තීරණ ගන්න ඕනෑ. උදව් කරන්න පුළුවන් නම් අපි ඉන්දියාවට උදව් කරමු. ඔක්සිජන් වැඩිපුර දෙන්න පුළුවන් නම්, අපි ඉන්දියාවට දෙමු. ඒක ගැන විවාදයක් නැහැ. අපට පුළුවන් නම් වෙනත් ආකාරයකින් හෝ උදව්වක් කරන්න, වෛද්‍යවරු හෝ ලබා දෙන්න, ඒ ඕනෑ දෙයකින් අපි ඉන්දියාවට උදව් කරමු. ඒක වෙනම කථාවක්. නමුත්, ඉන්දියාවෙන් එන flights ටික නතර කරන්න ඕනෑ කියලා සාමාන්‍යයෙන් පොඩි ළමයෙකුට වුණත් තේරෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ රට ඉතාම භයානක තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරුන්, විශේෂඥයන් ඒ බව කියනවා. රට lock down කරන්න කියලා ඒ අය කියනවා. මා දන්නවා, ගරු සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය අමාත්‍යතුමියත් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. නමුත්, දේශපාලන බලපෑම් නිසා අද නිවැරදි තීන්දු තීරණ ගන්නේ නැහැ.

අද වන විට ජීවිත 700ක් නැති වෙලා තිබෙනවා. කලින් නම් දවසකට එක්කෙනා, දෙන්නා මිය ගියත්, මේ වන විට දවසකට දහයක්, දොළහක්, දහතුනක් මිය යනවා. මේ මරණ සංඛ්‍යාව තවත් වැඩි වීමට අවස්ථාව තිබෙනවා. නිසි තීන්දු, තීරණ නොගැනීම නිසා ඒ සෑම මරණයකටම මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. ඒ නිසා නොබියව නිසි තීන්දු, තීරණ ගන්න. විපක්ෂය හැටියට විපක්ෂ නායකතුමා මේ වන විට ජාත්‍යන්තරයත් සමඟ සාකච්ඡා කරලා අවශ්‍ය උදවු ලබා ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම තමුන්නාන්සේලාට ලබා දිය හැකි උපරිම සහයෝගය පාර්ලිමේන්තුවේ සිටින අපි ලබා දෙන බව ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 27ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.51]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සෞඛ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - சுகாதார அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වාගේම ආරක්ෂක අංශ කොවිඩ්-19 රෝගය මර්දනය කරන්නට සිදුකරන උතුම් කැප කිරීමට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ පළමුවෙන්ම පුද කරනවා. සෞඛ්‍ය අංශවල තාක්ෂණික උපදෙස් අනුව ඒ කටයුතු නිසියාකාරයෙන් ක්‍රියාත්මක කරන්නට අතිගරු ජනාධිපතිතුමා ලබා දෙන නායකත්වයටත් මගේ ගෞරවය පුද කරනවා.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මේ වන විට ලොව පුරා මිලියන 154කට ආසන්න සංඛ්‍යාවක් ආසාදිතයන් බවට පත් වෙලා තිබෙනවා. එයින් මිලියන 3.2කට මඳක් වැඩි ප්‍රමාණයක් මරණයට පත් වෙලා තිබෙනවා. එලෙසම මිලියන 100කට අධික ප්‍රමාණයක් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අන්ත දුප්පත්භාවයට පත්වෙලා තිබෙනවා. ඒ අනුව කොවිඩ්-19 වසංගතය ලෝ වැසියන්ගේ සෞඛ්‍යයට පමණක් නොව, ආර්ථිකයටද ප්‍රබල තර්ජනයක් එල්ල කර තිබෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානය මෙම වසංගතය මැඩ පැවැත්වීම සඳහා ප්‍රධාන කරුණු 10කින් යුත් වැඩ පිළිවෙළක් තමන්ගේ රටවලට යෝජනා කරලා තිබුණා. ඒ කරුණු දහයෙන් යෝජිත විෂයයන්ට අනුකූලව ශ්‍රී ලංකා රජය හා සෞඛ්‍ය අමාත්‍යාංශය කොවිඩ්-19 මැඩ පැවැත්වීම සඳහා ගෙන යන වැඩ පිළිවෙළ මා මීට පෙර අවස්ථා කිහිපයකදී ගරු පාර්ලිමේන්තුව හමුවේ විස්තරාත්මකව පැහැදිලි කරනු ලැබුවා. එලෙසම විපක්ෂය විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර ඇති යෝජනාවේද ලෝක සෞඛ්‍ය සංවිධානය යෝජනා කර ඇති ප්‍රධාන කුලුනුවල බොහෝ කරුණු ගැබ් කර ඇති බව පෙනෙන්න තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය කුලුනු 10කින් යුත් මෙම යෝජනාවලිය ඉදිරිපත් කර තිබෙන්නේ පූර්ණ වශයෙන් කොවිඩ්-19 පාලනය කිරීමේ ප්‍රමුඛ අරමුණ ඇතිවයි. එහෙත් කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය පද්ධතිය වාගේම රටක ආර්ථික පද්ධතියත් අස්ථාවර කරන බව අපගේ නූතන අත්දැකීමයි. ඒ නිසා මා මුලින් සඳහන් කළ පරිදි කොවිඩ්-19 පාලනය කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ යෝජිත වැඩ පිළිවෙළට අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයට බද්ධව අපි ක්‍රියා මාර්ග ගන්නා අතර, කොවිඩ්-19 හේතුවෙන් රටේ ආර්ථිකය බිඳ වැටීම වළක්වා ගැනීමට සුවිශේෂී ක්‍රියා මාර්ග ගැනීමට අපට වාගේම අනෙක් රටවලටත් සිදු වෙනවා. මක් නිසාදයත්, කොවිඩ්-19 පාලනය සඳහා අවශ්‍ය සෞඛ්‍ය වැඩ පිළිවෙළ ගෙන යෑමට නම්, අවශ්‍ය සියලු දේ මිලදී ගැනීමට නම් රටේ ආර්ථික ශක්තියකුත් පවත්වා ගෙන යා යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම සරල උදාහරණයක් පෙන්වන්නම්. අද අපි දිනකට PCR පරීක්ෂණ 25,000කට අඩු වැඩි වශයෙන් සිදු කරනවා. වර්තමානයේ PCR පරීක්ෂණයක් සඳහා රුපියල් 1,760ක් වැය වෙනවා. ඒ අනුව දිනකට PCR පරීක්ෂණ සඳහා පමණක් රුපියල් ලක්ෂ 440ක් වැය වෙනවා. ඒ විතරක් නොවෙයි, අපි මේ දරන උත්සාහයේදී හැම අංශයකටම රටේ මුදල් වැය වෙනවා.

විපක්ෂය ඉදිරිපත් කළ යෝජනාවේ සමස්ත ජනගහනයෙන් සියයට 70කට එන්නත් දීම ගැන කථා කරනවා. එහෙත් රට lockdown එකකට ගියොත් කොවිඩ්-19 වසංගතය අතරතුර දුගී බවේ අන්තිමටම වැටී සිටින අපගේ ජනතාවගෙන් යම් සංඛ්‍යාවක් ජීවත් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව කිසිම කථාවක් මේ යෝජනාවේ කිසිම තැනක ඇතුළත් කර නැහැ. ඒක විපක්ෂ නායකතුමාටත් අමතක වෙලා වාගෙයි. කනගාටුවට කරුණ නම්, දුගී-දුප්පත්භාවය ඉවත් කිරීම ගැන හැම වේලාවේම කියන විපක්ෂ නායකතුමා කොවිඩ් පාලන ක්‍රියාවලියේදී දුගී-දුප්පත්භාවය මැඩ පවත්වාගෙන මේ කටයුතු කරන්නේ කොහොමද කියලා අද කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වගකිව යුතු රජයක් ලෙස කොවිඩ් පාලන ක්‍රියාවලියට අපි අවතීර්ණ වෙලා තිබෙන්නේ, කොවිඩ් පාලනය කරන අතරතුර, එම දුගී-දුප්පත් ජනතාවගේ ජීවන තත්ත්වයද ආරක්ෂා කර ගනිමිනි. ඒ නිසා තමයි පසුගිය සිංහල අලුත් අවුරුදු උත්සව සමයේදීත්, ඊට පෙර අවස්ථා කිහිපයකදීත් අඩු ආදායම්ලාභී ජනතාවට රුපියල් 5,000 දීමනාව අපි රජයෙන් මූල්‍යාධාරයක් විධියට ලබා දුන්නේ. ඒ විතරක් නොවෙයි, කොවිඩ් පාලනය සඳහා අපි ගන්නා සෑම තීරණයකදීම සෞඛ්‍ය පැත්ත වාගේම අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවනෝපාය පවත්වාගෙන යෑම පිළිබඳවත්, රටේ ආර්ථිකය ස්ථාවරව පවත්වා ගෙන යෑම පිළිබඳවත් සැලකිලිමත් වෙනවා.

කෙසේ වෙතත්, කොවිඩ් වසංගතය පාලනය සඳහා අපගේ මූලික උපාය මාර්ගය වන්නේ එන්නත් ලබා දීමයි. එන්නත් ලබා දීම මඟින් පූර්ණ වශයෙන් කොවිඩ් පාලනය කරන තුරු සහ ඉන් මත්තටත් රට තුළ කොවිඩ් රෝගය මර්දනය සඳහා වන සෞඛ්‍ය පුරුදුවලට ජනතාව යොමු කරලා කොවිඩ් ව්‍යාප්තිය වළක්වා ගැනීමට අපි සමාන්තර උපාය මාර්ග භාවිත කරනවා. ඒ අතරවාරයේ කොවිඩ් ආසාදිතයන් සඳහා සෞඛ්‍ය පහසුකම් උපරිමයෙන් ලබා දීලා, මරණ අනුපාතය අවම කරගන්නටත් අප ක්‍රියා කරනවා.

[ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය ]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එන්නත්කරණය පැත්තෙන් බැලුවාම, මැයි මාසයේ 02වන දා වනවිට අපි Covishield එන්නතේ පළමු මාත්‍රාව නවලක්ෂ විසිපන්දහස් දෙසියහතළිහකට ලබා දීලා තිබෙනවා. එහි දෙවන මාත්‍රාව ලබා දීමේ කටයුතු අපි මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම රුසියාවේ නිෂ්පාදිත Sputnik V එන්නත ගැනත් සඳහන් කරන්න ඕනෑ. අපේ ගරු විපක්ෂ නායකතුමා පැහැදිලි කළා, ඒකට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලබා ගෙන නැහැ කියලා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශනය තිබෙන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය පිළිගන්නා stringent authorities දෙකකින් -ඒක ඇමෙරිකාවේ FDA වාගේ එකක්- අනුමැතිය ලබා දීලා තිබෙනවා නම්, ඒ වාගේම අපේ රටේ NMRA එක වාගේ එම රටේ regulatory body එක, නියාමන අධිකාරිය අනුමැතිය ලබා දෙනවා නම් ඒවා ඒ රටවලට පාවිච්චි කරන්න පුළුවන් කියලායි. ඒ අනුව තමයි NMRA එක Sputnik vaccine එක රටේ ජනතාවට ලබා දෙන්නට අවසරය දුන්නේ. අපේ රටේ regulatory body එක හිතුමතයට රටේ ජනතාවට vaccine ලබා දීමේ අනුමැතියක් ලංකා ඉතිහාසයේ කවදාවත් දීලා නැහැ. WHO එක AstraZeneca එන්නතට අනුමැතිය දෙන්න පෙර තමයි, NMRA එක අපේ රටේ අවශ්‍යතාව බලලා AstraZeneca එන්නතට අනුමැතිය ලබා දීලා, එන්නත්කරණය පටන් ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! Will an Hon. Member propose the Hon. (Mrs.) Kokila Gunawardene to the Chair?

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)

Madam, I propose that the Hon. (Mrs.) Kokila Gunawardene do now take the Chair.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA *left the Chair, and* THE HON. (MRS.) KOKILA GUNAWARDENE *took the Chair.*

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව අතරතුර ඔබතුමිය මුලසුන ගැනීම ගැන මම බොහොම සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රුසියාවේ නිෂ්පාදිත Sputnik V එන්නතේ මාත්‍රා මිලියන 13ක් අපි ඇණවුම් කර තිබෙනවා. එයින් පළමු එන්නත් මාත්‍රා 15,000 අද දිවයිනට ළඟා වුණා. එම එන්නත් මාත්‍රා මිලියන 13න් ඉතිරි මාත්‍රා සංඛ්‍යාව මේ වර්ෂය තුළදී අපට කොටස් වශයෙන් ලැබීමට නියමිතයි. ඒ වාගේම COVAX පහසුකම යටතේ තවත් AstraZeneca එන්නත් මාත්‍රා මිලියන 8.4ක් අපට ඉදිරි මාසවලදී ලැබීමට නියමිතයි. ඒ වාගේම ඇමෙරිකාවේ නිෂ්පාදිත Pfizer එන්නත මාත්‍රා මිලියන 5ක් මේ වනවිට අපි ඇණවුම් කර තිබෙනවා. එයද මේ වර්ෂය තුළම අපට ලැබීමට නියමිතයි. මෙයට අමතරව දැනට චීනයේ නිෂ්පාදිත Sinopharm එන්නත මාත්‍රා ලක්ෂ 6ක් අප සතුව -ලංකාවේ- තිබෙනවා. දැනට අපට ලැබෙන එන්නත් අනුව මේ වර්ෂය අවසන් වීමට මත්තෙන් අප රටේ ජනගහනයෙන් සියයට 63කට වඩා පූර්ණ එන්නත්කරණය කිරීමට අපට හැකියාව ලැබෙනවා. ඒ සඳහා මේ වනවිට අප එන්නත් ලබා දෙන ආයතන සමඟ ගිවිසුම්ගත වෙලා තිබෙනවා. අපගේ ඉලක්කය වුණේ ජනගහනයෙන් සියයට 60කට එන්නත් කිරීමටයි. තත්ත්වය එසේ වුණත්, අපි ඒ ඉලක්ක ඉක්මවා කටයුතු කර තිබෙන බව මේ අවස්ථාවේ මතක් කළ යුතුයි.

ඊට අමතරව අපි තවත් ක්‍රියා මාර්ග දෙකක් ගෙන තිබෙනවා. ඒ තමයි, අපි එන්නත් ලබා ගැනීම සඳහා ඉන්දියාවේ Bharat Biotech හා Johnson & Johnson ආයතන සමඟ කටයුතු කරමින් සිටිනවා. චීනයේ නිෂ්පාදිත Sinopharm එන්නතට ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුමැතිය ලැබුණු වහාම අමතර අවශ්‍ය මාත්‍රා සංඛ්‍යාව ගෙන්වා ගැනීමට අපි කටයුතු කරනවා. අපට අවශ්‍ය එම මාත්‍රා සංඛ්‍යාව ලබා දෙන බවට චීන රජය මේ වනවිටත් අපට සහතික වී තිබෙනවා. අපට අවශ්‍ය එන්නත් මාත්‍රා ඕනෑම ප්‍රමාණයක් අපට ලබා ගත හැකි බව මා මේ අවස්ථාවේදී ගරු සභාවට දැනුම් දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපගේ එන්නත්කරණ ක්‍රියාවලිය ලෝකයේ දියුණු රටවලට සමානව සිදු කරන බවත්, Sputnik V එන්නත මඟින් මෙම සතිය තුළ ආරම්භ කරන එන්නත් ක්‍රියාවලිය බාධනයකින් තොරව සිදු කරගෙන යෑමටත් අපට හැකියාව ලැබෙන බවත් මා කියනවා.

මේ ඇති වී තිබෙන කොවිඩ් 3වන රැල්ල පාලනය කිරීමට හා ආසාදිතයන්ට ප්‍රතිකාර කිරීමට ගෙන යන කඩිනම් වැඩ පිළිවෙළ පිළිබඳව දැන් මා කෙටියෙන් පැහැදිලි කරන්න කැමැතියි. කොවිඩ් රෝගීන් සඳහා අද වනවිට දළ වශයෙන් රෝහල්වල ඇඳන් 13,800ක් අප වෙන් කර තිබෙනවා. ඉදිරි සති දෙක තුළ රෝගීන් සඳහා තවත් ඇඳන් 10,000ක් වෙන් කිරීමට අපි කටයුතු කරනු ලබනවා. දැනට අපේ රටේ රෝහල්වලට අවශ්‍ය ඔක්සිජන් ධාරිතාව ටොන් 25යි.

එහෙත්, ඔක්සිජන් ටොන් 80ක් පමණ වන තෙක් ධාරිතාව වැඩි කිරීමේ හැකියාව අප සතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔක්සිජන් තිබුණාට අපට මදි. මොකද, ඒවා භාවිත කිරීමට සිලින්ඩර අවශ්‍ය වනවා. ඉන්දියාවේ අප දුටුවේ ඔක්සිජන්වල හිඟයටත් වඩා සිලින්ඩරවල ඇති හිඟයයි. ලංකාවේ රෝහල් සතුව අද වන විට සාමාන්‍ය ඔක්සිජන් සිලින්ඩර් 24,000ක් සහ ජම්බෝ සිලින්ඩර 4,000ක් තිබෙනවා. අප

කඩිනමින් තවත් අමතර ජම්බෝ සිලින්ඩර 7,000ක් ඇණවුම් කළා. මේ සතියේ එයින් 400ක් ලැබීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම තව සති දෙකකින් පමණ high-flow oxygen machines ලැබීමට නියමිතයි.

ඒ වාගේම, අපි කොවිඩ්-19 රෝගීන් සඳහා ICU ඇඳන් 104ක් වෙන් කරනු ලැබුවා. පසුගිය කාලයේ දවසකට 200කට අඩු සංඛ්‍යාවක් කොවිඩ් රෝගීන් එන වෙලාවේ ඒ ICU ඇඳන් සාමාන්‍ය රෝගීන් සඳහාත් අපි පාවිච්චි කළා. හැබැයි, මේ වන විට ICU ඇඳන් 104ක් කොවිඩ් රෝගීන් සඳහා අපි වෙන් කර තිබෙනවා. ඒ වාගේම HDU - High Dependency Unit - ඇඳන් 64ක් වෙන් කරලා තිබෙනවා. අද ICU ඇඳන් 58ක අසාධ්‍ය තත්ත්වයේ ලෙඩුන් සිටිනවා. ඒ වාගේම අවශ්‍ය වුණොත්, තවත් අමතර ICU ඇඳන් 138ක් සහ HDU ඇඳන් 56ක් වෙන් කිරීම සඳහා අපි කටයුතු සූදානම් කර තිබෙනවා.

මීට අමතරව, high-flow oxygen machines 315ක්, ventilators 875ක්, transportable ventilators 400ක්, portable ventilators 200ක්, CPAP machines සහ BiPAP machines 310ක් අප සතුව තිබෙනවා. අවශ්‍යතාවකදී කොවිඩ් රෝගීන් සඳහා අපි ඒවා පාවිච්චි කරනවා. විශේෂයෙන් තවත් සති දෙකකින් high-flow oxygen machines 25ක්, BiPAP machines සහ CPAP machines 80ක් ලැබීමට නියමිතව තිබෙනවා. අලුතින් high-flow oxygen machines 175ක්, BiPAP machines සහ CPAP machines 350ක් ද අපි ඇණවුම් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ අනෙක් රටවල් මෙවැනි තත්ත්වයකට මුහුණ දෙනකොට ඔවුන්ට ඇති වූ ගැටලු පිළිබඳවත් අප තවදුරටත් සොයා බැලුවා. එහිදී අපට දැක ගන්න හැකි වුණේ, උපකරණ පමණක් නොව එම උපකරණ සමඟ යොදවන සෞඛ්‍ය කාර්ය මණ්ඩලවලද ප්‍රමාණය වැඩි කළ යුතු බවයි. එසේ හදිසියේ යොදන කාර්ය මණ්ඩලවලට පූර්ව පුහුණුවක් ලබාදීම ද අත්‍යවශ්‍යයි. ඒ අනුව අප මේ වන විට සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාත්මකව කොවිඩ් පාලන කටයුතු සඳහා වැඩි කර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. උදාහරණයක් විධියට postgraduate diploma and MSc කරන doctorsලාගේ ඒ කටයුතු තාවකාලිකව නවතා එම වෛද්‍යවරු කොවිඩ් මර්දන කටයුතුවලට නිදහස් කර තිබෙනවා. ඒ වාගේම Post-Basic Nursing Courses කරන හෙදියන් කොවිඩ් මර්දන කටයුතුවලට නිදහස් කර තිබෙනවා. ඒ වාගේම අවශ්‍ය වුවහොත් අවසාන අදියරේ ඉගෙනුම ලබන හෙදියන් කොවිඩ් ප්‍රතිකාර කටයුතුවලට යෙදවීමට අප බලාපොරොත්තු වනවා. ඊට අමතරව, ICU පුහුණුව හෙදියන්ට ලබා දීමටත්, සීමාවාසික වෛද්‍යවරු සඳහා කොවිඩ් හදිසි ප්‍රතිකාර පුහුණුව ලබාදීමටත් අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර තිබෙනවා.

ඒ අනුව වග කිව යුතු රජයක් විධියට අපි කොවිඩ් වසංගතය පාලනය කර ගනිමින් රට ස්ථාවරව පවත්වාගෙන යෑමට බහුවිධ සැලැස්මක් සහිතව කටයුතු කරමින් සිටිනවා. එකී සැලැස්ම තුළින්, කොවිඩ් නිසා රටේ ඇති වන සෞඛ්‍ය ප්‍රශ්නයට පමණක් නොව සමාජ, ආර්ථික ප්‍රශ්න සඳහා ද විසඳුම් ලබා දෙමින් කටයුතු කරනවා. කිසිම රටක් කොවිඩ් හමුවේ ජයග්‍රහණය කර නැහැ. ඒ වාගේම කොවිඩ් හේතුවෙන් කිසිම රටක් දේශපාලන ජයග්‍රහණ ද ලබාගෙන නැහැ. එම නිසා ම ශිෂ්ටසම්පන්න රටවල ශිෂ්ටසම්පන්න විපක්ෂ කිසි විටෙකත් කොවිඩ් සමඟ සිදු කරන සටන දේශපාලනීකරණය කර ගැනීමට උත්සාහ කරන්නේ නැහැ. කොවිඩ් සමඟ කරන සටනින් කළ හැක්කේ කොවිඩ් පාලනය කිරීම පමණයි. එලෙසම කොවිඩ් වයිරසයේ වෙනස් වීම් මත එය පාලනය කිරීමේ අඩු වැඩි හැකියාව ද රඳා පවතිනවා.

විශේෂයෙන්ම කොවිඩ්-19 වයිරසය ආසාදිතව අතිශය අසාමාන්‍ය තත්ත්වයකට පත්ව විශාල පීඩාවක් විඳි කෙනෙකු හැටියට, අතිශය අසාධ්‍ය තත්ත්වයට පත්ව දින ගණනක් තිස්සේ මරණ මංචකයේ දඟලපු කෙනකු හැටියට මා මෙම රෝගයෙන් පීඩා විඳින රෝගීන්ගේ වේදනාව පිළිබඳව පාර්ලිමේන්තුවේ සිටින අන් කවරකුටත් වඩා හොඳින්, අත් දැකීමෙන් දන්නවා. ඔබතුමන්ලා කවුරුවත් මා තරමට මේ රෝගය නිසා පීඩා විඳිමින් දැඩි සත්කාර ඒකකයක, එහෙම නැත්නම් ICU එකක machines ආධාරයෙන් ඉඳලා නැහැ. මම එතැනත් සිටියා.

අද රටට අවශ්‍ය වන්නේ කාලය කා දමන විවාද නොව, මෙම විසල් උවදුරින් ජාතිය ගලවා ගැනීමේ දේශපාලන එකඟතාවක් හා මැදිහත් වීමක් පමණයි. ඒ බව මෙම ගරු සභාවට සඳහන් කරමින් ඔබ සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.13]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කොවිඩ් - 19 වසංගතය සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන ලද යෝජනාව ගැන වචන ස්වල්පයක් එක් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳ මම බෙහෙවින්ම සතුටු වෙනවා. ඒ වාගේම අපි කනගාටු වෙනවා, මේ වන කොට අද රටේ තිබෙන වාතාවරණය ගැන. මොකද, අද අපි සියලුදෙනා මේ මුහුණ දෙන්නේ ඉතාම භයානක අවස්ථාවකට. පාට, පක්ෂ, දේශපාලන, ජාති, ආගම් භේදයෙන් තොරව අපි කාටත් අද මේ අනතුර බලපා තිබෙනවා. විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ, පසු ගිය දින 7 තුළ අපේ රට තුළින් ආසාදිත රෝගීන් 11,000ක් හඳුනාගෙන තිබෙන බව; මරණ 54ක් වාර්තා වෙලා තිබෙන බව. මා හිතන විධියට දැන් අපි ඉන්නේ, ඉතාම භයානක තැනක.

මා විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපේ අල්ලපු රට වන ඉන්දියාව ගැන. ඒ රටේ අද ඉතාම භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව අපි මාධ්‍ය තුළින් දකිනවා. ප්‍රමාණාත්මකව වෙනස් වුණාට, ජනගහන අනුපාතය අතින් බැලුවාම අපේ රටත් අද ඉන්දියාවට කිට්ටු තත්ත්වයකින් මේ රෝගය නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා, ඉතාම අමාරු තැනකට වැටී තිබෙනවා.

අපේ රටට මේ රෝගය ඇවිල්ලා අද වන විට අවුරුද්දකුත් මාස ගණනක් ගත වෙලා තිබෙනවා. එම නිසා අපට මේ රෝගය පිළිබඳ අංශ ගණනාවක් යටතේ හොඳින් අවබෝධ වී තිබෙනවා. අපේ රටට මේ රෝගය එන්න මාස ගණනාවකට කලින් ලෝකයේ වෙනත් රටවල්, එනම් දියුණු රටක් වන ඇමෙරිකා එක්සත් ජනපදය, ඒ වාගේම යුරෝපා රටවල් අද අපි විඳින තත්ත්වය අත් වින්දා. එම නිසා අපට ඕනෑ තරම් කල් තිබුණා, අවස්ථාව තිබුණා, මේ රෝගය පැවැති ඒ රටවල තත්ත්වයත්, රෝගය මර්දනය සඳහා ඒ රටවල් ගත් ක්‍රියා මාර්ගත් දිහා බලා සූදානම් වෙන්න. අපේ රටේ මේ රෝගය ආරම්භයේදීම, එනම් 2020 පෙබරවාරි මාසයේදීම -මාර්තු මාසයේදී ශ්‍රී ලාංකික පළමුවෙනි කොවිඩ් රෝගියා හමු වන්න කලින්- විශේෂයෙන්ම අපේ විපක්ෂ නායකතුමා පැහැදිලි කළා, ලෝකය තුළ මේ රෝගය මෙන්න මේ ආකාරයට ව්‍යාප්ත වෙනවා, අපි ඒ සඳහා සූදානම් වෙන්න ඕනෑ කියලා.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

විපක්ෂයක් හැටියට අපි පැහැදිලිවම කියනවා, මේ කොවිඩ් වසංගතය තුළින් දේශපාලනය කරන්න අප බලාපොරොත්තු වන්නේ නැති බව. නමුත් අපේ රටේ පවතින මේ තත්ත්වය මැඩ පවත්වන්න අවශ්‍ය සහයෝගය ලබා දීමේ වගකීමක් හා යුතුකමක් අපට තිබෙනවා. ඒ නිසා තමයි ගරු විපක්ෂ නායකතුමා මේ කාරණා පිළිබඳ දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී මතක් කළේ. විපක්ෂය හැටියට අපි දීර්ඝ වශයෙන් මේ කාරණය සම්බන්ධයෙන් කථා කළා. ඒ පිළිබඳ යෝජනා ආ හැම අවස්ථාවකදීම අනෙකුත් සියලු භේද අමතක කරලා රටක් හැටියට එකතු වෙලා වැඩ කරන්න ඕනෑය කියන හැඟීමෙන් අපි කථා කළා. නමුත්, පාර්ලිමේන්තුව තුළ කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් කරන මේ වාද විවාදවලට අමතරව, 'විපක්ෂ නායකතුමාට ආරාධනා කරලා, විපක්ෂයත් එක්ක එකතු වෙලා සාකච්ඡාවක් පවත්වලා, අඩුම ගණනේ, අපි එකට එකතු වෙලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමු' කියන යෝජනාව වත් මේ වනතෙක් කර තිබෙනවාද කියලා අපි රජයෙන් අහනවා. රටක් හැටියට හිතලා, මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග ගැන ආණ්ඩුව විපක්ෂය සමඟ සාකච්ඡා කරලා තිබෙනවාද? අපි පැහැදිලිව කියනවා, රජය හැටියට ඒ කටයුත්ත කර නැති බව.

"අපි තමයි මේක හොඳටම පාලනය කරලා තිබෙන්නේ, ඇයි අපි කරපු විධිය ගැන කථා කරන්නේ නැත්තේ?" කියලා ජනාධිපතිවරයා එක්තරා අවස්ථාවකදී අහනවා අපි දැක්කා. කොවිඩ්-19 වයිරසය පැතිරී ගිය පළමුවන වටයේදී මේ රෝගය කොයි විධියටද ව්‍යාප්ත වන්නේ කියලාවත් හරියට සොයා බැලුවේ නැහැ. ඇමෙරිකාව, යුරෝපීය රටවල් ඉතාම අමාරු තැනකට වැටිලා තිබුණු ඒ වෙලාවේ අපි උදන් ඇනුවා. එදා විපක්ෂය විධියට අප කථා කරපු දේවල් විහිළුවට ලක් කළා. අද අපට මොකක්ද වෙලා තිබෙන්නේ?

ජාතික ආරක්ෂාව ගැන කථා කරලා බලයට ආපු තමුන්නාන්සේලා -මේ ආණ්ඩුව- මේ රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්න ගත යුතු ක්‍රියා මාර්ග අවශ්‍ය වෙලාවට ගත්තා ද, සුදුසු වැඩ පිළිවෙළ අවශ්‍ය වෙලාවට යෙදුවා ද කියන ප්‍රශ්නය අද මේ රටේ සියලු ජනතාව තුළ තිබෙනවා. ලෝකයේ අනෙකුත් රටවල් මේ ප්‍රශ්නයට මුහුණ දුන්නේ කොහොමද? රටවල් ගණනාවක ප්‍රශ්න ගණනාවක් තිබෙන බව අපි දන්නවා. නමුත් අපේ රට වාගේ කුඩා රටකට උදාහරණයට ගන්න ඕනෑ තරම් රටවල් තිබෙනවා. එම රටවල් මේ ප්‍රශ්නයට මුහුණ දීලා තම රටවල ජනතාව ආරක්ෂා කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ කොයි විධියට ද කියා අපි සොයා බලන්න ඕනෑ.

එන්නත්කරණය ආරම්භ කළාම අපි නිරන්තරයෙන් මතක් කළා, මෙහිදී ලොකු තරගයක් ඇති වන බව. මෙහිදී ලොකු තරගයක් ඇති වන බව අප කාටත් තේරෙනවා. මුළු ලෝකයේම තිබෙන වසංගත තත්ත්වයක් තුළ සීමාසහිත ප්‍රමාණයකින් තමයි එන්නත් බෙදා දෙන්න වෙන්නේ. මොකද, එන්නත් නිෂ්පාදනය කරන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. අපි ඉදිරියට ගියේ නැත්නම් අවශ්‍ය එන්නත් ප්‍රමාණය අපට ලැබෙන්නේ නැහැ. එසේ නොවීමට නොයෙකුත් හේතු තිබෙන්න පුළුවන්. නමුත් ප්‍රමුඛතාව ඒ වෙනුවෙන් ලබා දුන්නාද කියන එක අප කාටත් තිබෙන ප්‍රශ්නයක්.

කොවිඩ් පළමුවැනි රැල්ල ඇති වුණු අවස්ථාවේ කොවිඩ් පාලනය කිරීම පිළිබඳව සහතික; awards ලබා දුන් ආකාරය අපි දැක්කා. මේ කාරණය කියන මේ අවස්ථාවේ ගරු සෞඛ්‍ය ඇමතිතුමිය මේ ගරු සභාවේ හිටියා නම් හොඳයි. පළමුවැනි ස්ථානය දුන්නා, ජනාධිපතිතුමාට. දෙවැනි ස්ථානය දුන්නා, අගමැතිතුමාට. මා හිතන විධියට තුන්වැනි ස්ථානය ලබා දුන්නේ සෞඛ්‍ය ඇමතිතුමියට වෙන්න ඇති. කොවිඩ් වසංගතය පිළිබඳ අද පවතින තත්ත්වය සම්බන්ධයෙන් award එක දෙන්නේ කාටද? අද තිබෙන මේ අවාසනාවන්ත තත්ත්වය තුළ මේ award එක ගන්නේ කවුද? අද පළමුවැනියා, දෙවැනියා, තුන්වැනියා කවුද කියලා හොයනවාද?

සෞඛ්‍ය සේවයේ විශේෂඥ වෛද්‍යතුමන්ලා දුන් උපදෙස් අනුව ද අපේ රටේ ආණ්ඩුව ක්‍රියා කරලා තිබෙන්නේ කියා අපි අහනවා. අඩු ගණනේ මේ වන කොටවත් ඒ උපදෙස් අනුව ක්‍රියා කරනවාද? කොවිඩ් රෝග පාලන කටයුතු භාර අපේ රාජ්‍ය ඇමතිතුමිය දැන් මේ ගරු සභාවේ ඉන්නවා. වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව, විශේෂඥයන්ගේ උපදෙස් අනුව, ඒ වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදෙස් අනුව කටයුතු කරන්න එතුමිය ගොඩක් උත්සාහ ගන්නවා. අද කොවිඩ් රෝග පාලන කටයුතු භාර රාජ්‍ය ඇමතිතුමිය හැටියට එම කටයුතු කරන්න එතුමියට භාර දීලා තිබුණාට හරි විධියට වැඩ කටයුතු කරන්න එතුමියටවත් අද අවස්ථාවක් ලැබෙන්නේ නැහැ කියා මම හිතනවා. බෝ වන රෝග පිළිබඳ විශේෂඥයන්ගේ උපදෙස් අනුව ද අද මේ රටේ වැඩ කරන්නේ කියන ප්‍රශ්නයට පිළිතුර දැනගන්න අපි කැමැතියි. අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ තත්ත්වය තුළ අද අවාසනාවන්ත තත්ත්වයකට පත් වෙලා ඉන්නේ මේ රටේ ජනතාවයි.

මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම, මල්ලවපිටිය වාගේම කුලියාපිටියේ ප්‍රදේශ ගණනාවක මේ වන කොට රෝගීන් විශාල ප්‍රමාණයක් ගෙවල්වල ඉන්නවා. විශේෂයෙන්ම MOH සමඟ, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සමඟ වාගේම කුරුණෑගල රෝහලේ අධ්‍යක්ෂවරයා සමඟ ද අපි මේ ගැන කථා කළා. කොරෝනා රෝගීන් දින ගණනාවක් තිස්සේ ගෙවල්වල ඉන්නවා. මේ වනතෙක් රෝහල්ගත කරන්න බැරි වෙච්ච රෝගීන් විශාල ප්‍රමාණයක් ගෙවල්වල ඉන්නවා. නමුත් අද සෞඛ්‍ය ඇමතිතුමිය කිව්වා, ඇඳන් ප්‍රමාණය වැඩි කරනවා, අඩුවක් නැතිව වෛද්‍යතුමන්ලා සහ හෙදියන් යොදවනවා කියලා. මේ වනකොට අපේ ප්‍රදේශයේ ගම්මානවලත් රෝගීන් ගෙවල් තුළට වෙලා අසරණ වෙලා ඉන්නේ. අද ඒ අය ගැන බලන්න කවුරුත් නැහැ. අද MOHsවල සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ලාත් අසරණ වෙලා සිටිනවා. ඔවුන්ටත් කර කියාගන්න දෙයක් නැහැ. ඒ වාගේම වෛද්‍යතුමන්ලාත් අද අසරණ වෙලා සිටිනවා. අද මේ රෝගීන් ගෙවල් ඇතුළට වෙලා තමන්ට කර කියා ගන්න දෙයක් නැතිව ඉන්නවා. මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයක්. අපි ඒ ගැන කල්පනා කරන්න ඕනෑ.

අද ගොඩක් ඇමතිවරු කථා කරමින් කිව්වා, රට වැහුවාම ආර්ථිකය කඩා වැටෙනවාය කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට විනාඩි දහයක කාලයක් තිබුණා නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ඒ කාලයෙන් තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හොඳයි.

මේ රෝගය පාලනය කිරීම සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය ලබා දී තිබෙන උපදෙස් අනුව සහ අපේ රටේ සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ උපදෙස් අනුව දැන්වත් කටයුතු කරන්න. එහෙම නොවුණොත් මේ රට ඉතාම අවාසනාවන්ත තැනකට යනවා. මේ රජය රටේ ජනතාවගේ ජීවිත සමඟයි මේ සෙල්ලම් කරන්නේ.

බලන්න, මේ වෙනකොට ඉන්දියාවේ ඉඳලා ගෙන්වපු අය නිරෝධායන මධ්‍යස්ථාන ගණනාවක ඉන්නවා. ඉන්දියාවේ ඉඳලා ඇවිල්ලා මැද පෙරදිග රැකියාවලට යන අය දින 14ක් ලංකාව තුළ නිරෝධායනය කරනවා. අද වෙනකොට එවැනි 11,000ක පිරිසක් ඉන්නවා. ඉන්දියාව තුළ අද තිබෙන තත්ත්වය අනුව, විශාල ප්‍රමාණයක් එනකොට ඔවුන්ගෙන් කිහිප දෙනෙකුට හෝ මේ රෝගය ආසාදනය වෙලා තිබෙන්න පුළුවන් බව අපි දන්නවා. ඒ තුළ තිබෙන අනතුර ගැන මේ රජය හිතනවාද? ඩොලර් 690කට ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට අද මේ කටයුත්ත කරන්න අවසර දීලා තිබෙනවා. අපි පැහැදිලිව රජයට මතක් කරනවා, දැන් සති දෙක, තුනක සිට ඉන්දියාවේ ඉඳලා නිරෝධායනය සඳහා එන මේ පිරිස ගැන. විශේෂයෙන් මේ අය මැද පෙරදිග රැකියාවලට යාමේදී දින 14ක් නිරෝධායනය වුණේ නැත්නම් එම රටවලට ගන්නේ නැති නිසා, අද ඒ අය ලංකාව නිරෝධායන මධ්‍යස්ථානයක් කරගෙන තිබෙනවා. මේ නිසා ඉදිරියේදී අපේ රට තුළ භයානක තත්ත්වයක් ඇති වෙන්න පුළුවන් කියන කාරණය මම රාජ්‍ය ඇමතිතුමියට මතක් කරන්න කැමැතියි.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යතුමන්ලා විශාල පිරිසක් මේ සම්බන්ධයෙන් විරෝධතාව දක්වද්දී තමයි මේ කටයුත්ත අද ක්‍රියාත්මක කරගෙන යන්නේ. මේ රජය අනෙකුත් වැඩ කටයුතුවලදී වාගේම මේ කොරෝනා වසංගතය වැනි භයානක තත්ත්වයක් තුළත් මේ රටේ ජනතාවගේ ජීවිත ගැන හිතන්නේ නැතිව ගන්නා දේශපාලන තීන්දු නිසා අද රටේ ජනතාවගේ ජීවිත අනතුරට ලක්වෙලා තිබෙනවා. අපේ රටේ එන්නත්කරණය ක්‍රියාත්මක කරන්න ගෙනාපු Oxford-AstraZeneca එන්නත් දොළොස් ලක්ෂයට මොකද වුණේ? යම් කොටසකට ඒ එන්නත ලබා දුන්නා. නමුත්, ඉතිරි කොටසට ඒක දෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ. වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂවරයා කියනවා අපි දැක්කා, ඒ ඉතිරි කොටසට වෙනත් එන්නතක් දෙන්න බලනවා කියලා. මේවා සාධාරණද? මේ රටේ ජනතාවගේ ජීවිත එක්ක නේද මේ සෙල්ලම් කරන්නේ? මේ කොරෝනා තත්ත්වයත් එක්ක, වගකීමෙන් වැඩ කරන්න කියලා අපි රජයට කියනවා. විශේෂයෙන්ම විපක්ෂය සමඟ සාකච්ඡා කරලා රටේ අනාගතය, ජනතාවගේ ජීවිත ආරක්ෂා කර ගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. දේශපාලනයෙන් තොරව මේ සම්බන්ධයෙන් සත්‍යය ප්‍රකාශ කරන්න. අද තොරතුරු ගොඩක් වසන් කරනවා. එයත් මේ රෝගය ව්‍යාප්ත වීමට හේතුවක් වෙනවා. ඒ නිසා, සත්‍යය කථා කරලා මේ රටේ ජනතාවත් එක්ක එකතු වෙලා මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න අපි සැම දෙනාම කැප වෙනා වැඩකටයුතු කරන්න ඕනෑ. මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.24]

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය (ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷனி பர்னாந்துபுள்ளே - ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் நோய்க் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle - State Minister of Primary Health Care, Epidemics and Covid Disease Control)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් ලෙස මා සතුටු වනවා, ඔබතුමිය මූලාසනයේ සිටින වේලාවේ මට කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව. මොකද, ඔබතුමියත් නියෝජනය කරන්නේ එම දිස්ත්‍රික්කයම නිසා. කොරෝනා යනු ගෝලීය වසංගතයක් බව අපි නැවත නැවතත් මතක් කරන්න ඕනෑ. කොරෝනා වසංගතය ආපු කාලයේ සිටම විශේෂඥවරුන් පැවසූ කාරණාවක් තමයි, මේ වයිරස් ප්‍රභේදය විටින් විට වෙනස් වෙන්න පුළුවන්; විටින් විට වෙනස් වෙනකොට එම වසංගත තත්ත්වයන් වරින් වර මතුවෙන්න පුළුවන් කියන කාරණය. ඒ වාගේම රෝගය පැතිරීමේ වෙනස්කම් ඇති වෙන්න පුළුවන්, මාරාන්තික බවේ වෙනස්කම් ඇති වෙන්න පුළුවන් කියලාත් කිව්වා. ඒ අනුව මම නැවතත් මතක් කරන්න කැමැතියි, මේ කොරෝනා වයිරස් එකේ ස්වභාවය අනුව මේ වසංගත තත්ත්වය වරින් වර රට තුළ විතරක් නොවෙයි, ගෝලීයවත් ඇති වන බව.

අද විපක්ෂය පෙන්නුම් කරන්න උත්සාහ කරන්නේ, ආණ්ඩුවේ වරදක් නිසා මේ කොරෝනා වසංගතය ලංකාවේ විතරක් වැඩි වුණා කියලායි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනුව මම මතක් කරන්න ඕනෑ, පසුගිය සති 10ක කාලය පුරාම ගෝලීයව මේ තත්ත්වය වැඩි වෙලා තිබෙන බව. ලංකාවේ විතරක් නොවෙයි, මේ වන විට බිලියන 1.2කට මේ එන්නත් ලබා දී තිබුණත්, අප්‍රේල් 23වන දා වනකොට ලෝකයේ වැඩිම ආසාදිතයන් ප්‍රමාණයක්, එනම් දවසකට ලක්ෂ 9ක් වාර්තා වුණා. ඒ වාගේම පසුගිය සති 7 තුළ එක දිගට ලෝකයේ කොවිඩ් මරණ සංඛ්‍යාවත් වැඩි වෙලා තිබෙනවා. දවසකට කොවිඩ් මරණ 11,000ක් පමණ සංඛ්‍යාවක් වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම පසුගිය සති පහ පුරාවටම අග්නිදිග ආසියානු රටවල මේ රෝගය වැඩියෙන් පැතිරිලා තිබෙනවා. මම හිතන විධියට, මේ වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේම ආසාදිතයන් මිලියන 31.9ක් ඉන්නවා. අපේ රටට අල්ලපු රට වන ඉන්දියාවේ ආසාදිතයන් මිලියන 19.2ක් ඉන්නවා. බ්‍රසීලයේ ආසාදිතයන් මිලියන 14.6ක් ඉන්නවා. මේ වන විට ලංකාවේ කොවිඩ් රෝගීන් 113,676ක් හමුවෙලා තිබෙනවා. කලාප වශයෙන් ගත්තාම, රෝගීන් වාර්තා වීම අතින් අග්නිදිග ආසියා කලාපය ලෝකයේ තුන්වෙනි තැනට පත් වෙලා තිබෙනවා. පසුගිය කාල සීමාව තුළ රෝගීන් වාර්තාවීමෙන් පළමුවැනි තැනට පත් වෙලා සිටින්නේ ඇමෙරිකානු කලාපයයි. දෙවැනි තැනට සිටින්නේ යුරෝපීය කලාපය සහ තුන්වැනි තැනට සිටින්නේ අග්නිදිග ආසියාව. විශේෂයෙන්ම පසුගිය සතිය තුළ පමණක් මේ අග්නිදිග ආසියානු කලාපය තුළ රෝගීන් මිලියන දෙකක ප්‍රමාණයකින් වැඩිවෙලා තිබෙනවා. ඒ කියන්නේ රෝගීන් ප්‍රමාණය සියයට 49.4කින් වැඩි වෙලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, මේක ගෝලීයව, කලාපීය වශයෙන් අපි දකින ප්‍රශ්නයක්.

මේ රෝගය වැඩිවීමට ප්‍රධාන වශයෙන් අල්ලපු රට වන ඉන්දියාව බලපානවා. මොකද, පසුගිය සති 10 තුළ ඉන්දියාවේ මෙම රෝගය වැඩි වෙලා තිබෙනවා. පසුගිය සති හය තුළ නේපාලයේ සියයට 233කින් මෙම රෝගය වැඩි වෙලා තිබෙනවා. මාලදිවයිනේ සියයට 109කින් වැඩි වෙලා තිබෙනවා. භූතානයේත්

[ගරු (වෛද්‍යා) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ]

මෙම රෝගය වැඩි වෙලා තිබෙනවා. පසුගිය කාලයේ දී ලංකාවේ මෙම රෝගීන්ගේ අඩුවීමක් අපි දැක්කා. PCR tests කරන සංඛ්‍යාවට අනුව රෝගීන් අඩුවෙලා තිබෙනවා අපි දැක්කා. දැන් අපට තිබෙන චෝදනාවක් තමයි, PCR tests සිදුකිරීම කෘත්‍රිමව අඩු කළා කියන එක. PCR positive සංඛ්‍යාව අඩු වෙනකොට ප්‍රාථමික ආශ්‍රිතයින් සංඛ්‍යාවත් අඩු වෙනවා. නමුත්, අපි අහඹු ලෙස රෝහල්වල කරන PCR පරීක්ෂණ, ප්‍රජාව සඳහා කරන PCR පරීක්ෂණ අඛණ්ඩව කරගෙන ගියා. PCR positive වෙන සංඛ්‍යාව අඩු වෙනකොට ඔවුන්ගේ ආශ්‍රිතයන් test කිරීමේ අඩුවීමක් අපි දකිනවා. මම ඒක රෝහල්වලිනුත් හොයා බැලුවා. රෝහල්වලට සාමාන්‍ය ශල්‍යකර්ම සඳහා පැමිණෙන අයගේත්, සාමාන්‍ය රෝගී තත්ත්වයන් යටතේ රෝහල්වලට ඇතුළත් වෙන අයගෙත් PCR සිදු කරනවා. එහෙම කරපු පරීක්ෂණවලිනුත් PCR positive ප්‍රතිශතය අඩු වෙලා තිබුණා. ඒ නිසා අපේ රෝගීන්ගේ සැඟෙන අඩුවීමක් අපි දැක්කා. හැබැයි, නැවත අප්‍රේල් 12 - 18 පමණ වන විට එම සතියේ රෝගීන් 1,665ක් වාර්තා වුණු බව අපි දැක්කා. එම ප්‍රමාණය අප්‍රේල් 19වන දා සිට 25වන දා පමණ වෙනකොට 4,406ක් වුණා; දෙගුණයකට වඩා වැඩි වුණා. මැයි දෙවැනිදා ඉඳලා එන සතිය වෙනකොට රෝගීන් සංඛ්‍යාව 10,304යි. ඒ නිසා වේගයෙන් මේ රෝගයේ පැතිරීමක් සිද්ධ වෙන බව පෙනෙනවා. විශේෂයෙන්ම මේ B.1.1.7 ප්‍රභේදය අප්‍රේල් 8 වෙනිදා තමයි හඳුනා ගත්තේ. ඒ සම්බන්ධයෙන් රජය කටයුතු කළේ නැහැ කියලා චෝදනාවක් ආවා. B.1.1.7 කියන අලුත් ප්‍රභේදයට සමාන වයිසරයක් ජනවාරි මාසයේදීත් හඳුනා ගත්තා. ඔවුන් බහුතරයක් පිටරටවල ඉඳලා ඇවිල්ලා නිරෝධායන මධ්‍යස්ථානවල හිටපු අය. රජය විමසිල්ලෙන් හිටපු නිසාත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව මේ සම්බන්ධව පර්යේෂණ සිදු කළ නිසාත් තමයි මේ අලුත් strain එක හඳුනා ගත්තේ. මේ අලුත් strain එක හඳුනා ගැනීමට දවස් දෙකකට කලින් ස්ථිර වශයෙන්ම කිව්වා, බස්නාහිර පළාතෙන්, වයඹ පළාතෙන් හඳුනා ගත්ත strain එක එංගලන්ත B.1.1.7 කියන එක බව. එය තහවුරු වුණා.

මේ රෝගය වේගයෙන් ව්‍යාප්ත වෙනවා. ඒ වාගේම තමයි අද වන විට රෝගීන්ගේ සීඝ්‍ර වැඩිවීමක් අපි දකිනවා. ඒ නිසා අපි රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. මේක තවමත් අපට වළක්වා ගන්න පුළුවන්. ඒ නිසා සංචරණය සීමා කරන්න, ස්වයංවාරණයක් යොදා ගන්න. අනවශ්‍ය විධියට සෙනඟ ඒක රාශි වන තැන්වලට යන්න එපා. ගෙදරින් එළියට යන්න ඕනෑ නම් මුව ආවරණයක් පළඳින්න. එක්කෙනෙක් පමණක් ගෙදරින් එළියට යන්න. ජනතාවගේ සහයෝගය තිබෙනවා නම් අපට රටක් හැටියට මේ රෝගයෙන් ආරක්ෂා වෙන්න තවමත් පුළුවන්කම තිබෙනවා. අප රට තුළ මේ රෝගය අවම කර ගන්න පුළුවන්.

අද බොහෝ අය ICUs ගැන කථා කරනවා; HDUs ගැන කථා කරනවා; ඔක්සිජන් පහසුකම් ගැන කථා කරනවා. රෝහල් තුළ මේවා වැඩි කිරීම අවශ්‍යයි. හැබැයි, ඒ එක්කම මේ රෝගය පාලනය කර ගැනීමට, වළක්වා ගැනීමට ජනතාවගේ සහයෝගය ලබා දීමත් ඉතා වැදගත් වනවා. විශේෂයෙන්ම ගරු සෞඛ්‍ය අමාත්‍යතුමියට, ඒ වාගේම සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ වනකොට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු දෙනා බොහෝ කැපවීමකින් මේ කාර්යයේ යුහුසුළුව නියැලී සිටින ආකාරය අපි දකිනවා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාව, පොලීසිය වාගේම අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරින්, විශේෂයෙන්ම ග්‍රාම නිලධාරිවරුන් ඇතුළු ඒ සියලු අයගේ විශේෂ සහයෝගය අපට ලැබිලා තිබෙනවා.

මේ සඳහා ජනතා සහයෝගය අත්‍යවශ්‍යයි. තාවකාලික රෝහල් ස්ථාපිත කරන්න අපට පුළුවන්. දැනටමත් ඒ කටයුතු කරගෙන යනවා. ICU, HDU facilities වැඩි කරන්න, ඔක්සිජන් ධාරිතාව වැඩි කරන්න අවශ්‍ය සියලු කටයුතු අපි කරනවා. නමුත්, මේ සියලු දේම උපරිම අසීරු මට්ටමකට එන්න නොදී වළක්වා ගන්න අපි කටයුතු කරනවා. මොකද, රෝගීන් වැඩි වුණාට සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වැඩි වෙන්නේ නැහැ. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය අපට ක්ෂණිකව වැඩි කර ගන්නත් බැහැ. මේ තත්ත්වය පාලනය කරගන්න අපට තවමත් පුළුවන්. එම නිසා මම රටේ ජනතාවගෙන් ඉතා කරුණාවෙන් ඉල්ලන්නේ, සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් පුළුවන් තරම් සංචරණය සීමා කරන්න කියලායි. ඒක තමයි ඔබතුමන්ලාට දෙන්න පුළුවන් ලොකුම සහයෝගය.

ඒ වාගේම, රටක් හැටියට අපි එන්නත්කරණය සඳහා සැලසුම් කර තිබුණා. මාර්තු මාසයේදී තමයි අපි එන්නත්කරණය ආරම්භ කරන්න හිටියේ. නමුත්, අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ මැදිහත්වීම මත අපි එම කටයුත්ත ඉක්මනින් ආරම්භ කළා. ඒ සම්බන්ධයෙන් අපි ඉන්දියානු ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. අපට Oxford-AstraZeneca එන්නතේ පළමුවැනි මාත්‍රාව විධියට එන්නත් ලක්ෂ පහක් ඉන්දියාවෙන් ලබා දුන්නා. එම Oxford-AstraZeneca එන්නත් තොගය ලංකාවට ගෙනැල්ලා සතියක කාලයක් ඇතුළත ජාතික ඖෂධ නියාමන අධිකාරිය එය අනුමත කරලා දුන්නා. එතකොට ලෝක සෞඛ්‍ය සංවිධානයවත් ඒක අනුමත කරලා තිබුණේ නැහැ. රටේ ජනතාවට ආරක්ෂිත, ගුණාත්මක, ඒ වාගේම side effects බොහොම අඩු එන්නත් ලබා දීම අනුමත කිරීමේ පූර්ණ වගකීම තිබෙන්නේ රටක ජාතික ඖෂධ නියාමන අධිකාරියටයි. ඒ අනුව, ජනවාරි 28වන දා එන්නත් ලක්ෂ පහක් ලැබෙනකොට, ජනවාරි 29වන දා එන්නත්කරණය ආරම්භ කරන්න අපට හැකියාව ලැබුණා. ඒ කටයුත්ත ආරම්භ කිරීමේදී ප්‍රමුඛතාව දුන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට, ත්‍රිවිධ හමුදාවට සහ කොරෝනා මර්දනයේදී ඉදිරි පෙළ වැඩ කරන කාර්ය මණ්ඩලයටයි. ඒ වෙනකොට නිර්දේශය තිබුණේ සති හතරකින් දෙවැනි මාත්‍රාව දෙන්න කියලායි. එම නිසා දෙවැනි මාත්‍රාව දෙන්න එන්නත් ලක්ෂ දෙකහමාරක් වෙන්කර ගත්තා. ඒ අතර, ගෝලීය වශයෙන් කළ පර්යේෂණවලින් ඔප්පු වුණා, දෙවැනි මාත්‍රාව සති 12කට පසුව දෙනවා නම් එය වඩාත්ම ප්‍රතිඵලදායකයි කියලා. ඒ අනුව තමයි අපි දෙවැනි මාත්‍රාව සති 12කින් දෙන්න තීරණය කළේ.

ඊළඟට, අපේ වසංගතවේද අංශයේ තොරතුරු එක්ක සොයා බලනකොට දැක්කා, බහුතරයක් රෝගීන් සිටියේ වයස අවුරුදු 30යි, 60යි අතර බව. වයස අවුරුදු 60ට වැඩි රෝගීන් සිටියේ සියයට 10යි. එම නිසා අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීමකදී තීන්දු කළා, අවුරුදු 30ට වැඩි අයටත් එන්නත ලබා දීම සඳහා එන්නත් මිලදී ගන්නවා කියලා. අපි වයස අවුරුදු 30 සිට 60 දක්වා ජනතාව ආරක්ෂා කර ගැනීම වැදගත්. මොකද, රටේ ආර්ථිකයට දායකත්වය දෙන මානව සම්පත ඉන්නේ වයස අවුරුදු 30 සහ 60 අතර. ඒ අනුව තමයි අපි SPC ආයතනය හරහා සීරම් ආයතනයෙන් මේ එන්නත මිලදී ගැනීම සඳහා ඇණවුමක් දීලා එන්නත් මාත්‍රා ලක්ෂ පහක පළමු තොගය අපට ලැබුණේ. ඊළඟ ලක්ෂ පහක තොගය අප්‍රේල්, මැයි වෙනකොට අදියර දෙකකින් ලබා දෙන්න එකඟතාව ලැබුණා.

ඒ අතර COVAX පහසුකම හරහා අපට එන්නත් මාත්‍රා මිලියන 1.6ක් පළමුවැනි තොගය හැටියට ලබා දෙන්නත් තීරණය කර තිබෙනවා. එම තොගයේ පළමුවැනි කොටස වශයෙන් එන්නත් මාත්‍රා 264,000ක් ලංකාවට ගෙනාවා. හැබැයි, අනපේක්ෂිත විධියට ඉන්දියාවේ ව්‍යාප්ත වන මේ දරුණු වසංගතයත් එක්ක පොරොන්දු වුණු එන්නත් ටික deliver කරන්න සීරම් ආයතනයට නොහැකි වෙනවා. අපි දැක්කා, සල්ලි තිබෙන, ලෝකයේ බලවත් රටවල් තමන්ගේ රටේ සිටින ජනගහනයටත් වඩා එන්නත් තොග අරගෙන stock කර ගන්න බව. තවම එකම එන්නත් මාත්‍රාවක්වත් දීමට නොහැකි වූ සමහර

රටවල් පවා තිබෙනවා. එහෙම stock කළත් ලෝක ජනගහනයෙන් සියයට 7යි අද එන්නත්වලින් ආරක්ෂාව ලබාගෙන තිබෙන්නේ. මේක ගෝලීය වසංගතයක්. පුළුවන් අය විතරක් එන්නත් කර ගත්තාට මේ ගෝලීය වසංගතය පාලනය කරන්න බැහැ.

අද එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල තමයි COVAX පහසුකමේ එන්නත් මිලදී ගැනීමේ කටයුත්ත කරන්නේ. අපි ඔවුන් එක්ක කථා කළාම COVAX පහසුකම යටතේත් එම එන්නත් ලබා ගැනීමේ ගැටලුවක් තිබෙන බව දැනගන්න ලැබුණා. ලෝකයේම රටවල් ඔවුන් සතුව තිබෙන අතිරික්ත තොග අද ඉන්දියානු රජයට donate කරන්න කටයුතු කරනවා. ඒක සාධාරණයි. මොකද, අද වෙනකොට ඉන්දියාවේ ලොකු ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම ඇෆ්ඝනිස්ථානයේ තිබෙන stocks හඳුනා ගත්තා. හැබැයි ඒවා භාර ගන්න බැහැ, cold chainsවල ප්‍රශ්නයක් තිබෙන නිසා. එම නිසා අපට එන්නත් මාත්‍රා ලක්ෂ හයක ගැටලුවක් තිබෙනවා. අපට ඒක හංගන්න දෙයක් නැහැ. මේක සිදු වුණේ රජයේ වරදක් නිසා නොවෙයි. මේ වසංගතයේ තත්ත්වය මත එන්නත් නිෂ්පාදකයන්ට අවශ්‍ය සැපයුම ලබා දීමට නොහැකි වූ නිසායි මේ තත්ත්වය ඇති වුණේ. ඒක අපි රටට කියන්න අවශ්‍යයි. ඒක මේ ආණ්ඩුවේ වරදක් නොවෙයි. ඒ වාගේම අපි ස්පුට්නික් එන්නත ගේන්න, ෆයිසර් එන්නත ගේන්න අවශ්‍ය සියලු කටයුතු කර තිබෙනවා.

පළමුවැනි මාත්‍රාව දීලා දෙවැනි මාත්‍රාව වෙනත් vaccine එකකින් දෙන්න පුළුවන්ද කියලා දැන් පර්යේෂණ කරගෙන යන බව මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ඒක අපට තීරණය කරන්න බැහැ. ඒ පර්යේෂණවල ප්‍රතිඵල අනුව සමහර විට ඉදිරියේදී cocktail එකක් දෙන්න පුළුවන් වෙයි. එම නිසා අපි සියලුදෙනාම එකතු වෙලා මේ වසංගතයට මුහුණ දෙමුයි කියලා මම තමුන්නාන්සේලාට මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සංජීව එදිරිමාන්න මහතා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම හිතුවේ විපක්ෂයට අවස්ථාව ලබාදීලා මට අවස්ථාව ලබාදෙයි කියලා. සමාවෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාව කරගෙන යෑමේදී කාලය මදි වුණොත් ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ අවසරය ඇතිව ගරු ජයන්ත කැටගොඩ මන්ත්‍රීතුමාගේ කාලයෙන් ස්වල්ප වේලාවක් මම ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක් විධියට මේ මොහොතේ අපි මුහුණ දී තිබෙන තත්ත්වය පිළිබඳ ඉතාම විවෘත මනසකින්, අවංකව සාකච්ඡා කරන්න මේ විවාදය අවස්ථාවක් කර ගන්නට මා කැමැතියි. කොවිඩ්-19 වසංගතය පිළිබඳ ප්‍රශ්නය මතු වුණු තැනටම මම ඔබතුමාගේ අවධානය රැගෙන යන්න සූදානම්. 2019 අවුරුද්දේ අවසාන දවසේ - දෙසැම්බර් මාසයේ 31වැනි දා - නිශ්චිත ලෙස හඳුනා නොගත් නියුමෝනියා රෝගී තත්ත්වයක් පිළිබඳ තොරතුරක් චීනයේ වූහාන් නගරය ආශ්‍රිතව වාර්තා වුණා. ඊට පසුව 2020 ජනවාරි 07වැනි දා පළමු වතාවට මෙම විශේෂිත රෝගී තත්ත්වයට හේතුව කොරෝනා වයිරසය වග ලෝකය විසින් හඳුනා ගන්නවා. ඉන් අනතුරුව 2020 ජනවාරි 30වැනි දා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මුළු ලෝකයටම අදාළව හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබුවා. මගේ මතකය නිවැරැදි නම්, 2020 ජනවාරි 11වැනි දා හෝ ඊට ආසන්න දිනයකදී "කොවිඩ්-19" නමැති යෙදුම මේ රෝගය හඳුන්වාදීම සඳහා ලෝකයා පාවිච්චි කරන්න පටන් ගන්නවා. මම ඔබතුමාට කථා කරන මේ මොහොත වන විට කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව ලෝකයේ පවතින සංඛ්‍යාත්මක තත්ත්වය මෙසේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොහොත වන විට ලෝකයේ 154,195,608දෙනෙක් කොවිඩ් ආසාදිතයන් බව නිල සංඛ්‍යාලේඛන තුළින් දක්නට ලැබෙනවා. ලෝකයේ එම ආසාදිතයන් අතරින් මේ වන විට 3,227,188දෙනෙක් ජීවිතක්ෂයට පත්ව තිබෙනවා. අප ජීවත්වන ආසියානු කලාපයේ සංඛ්‍යාත්මක තත්ත්වය විග්‍රහ කර බැලුවොත්, 40,912,015දෙනෙක් මේ වන විට ආසාදිතයන් බවට පත්වෙලා, ඒ අතරින් 535,123දෙනෙක් මරණයට පත්වෙලා තිබෙනවා. ඊරලෝසු වේලාවෙන් අද පෙරවරු 10 වන විට අපේ රටේ තත්ත්වය බැලුවොත්, සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව 111,753යි. ඒ අතරින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව මේ තත්ත්වය විධිමත්ව කළමනාකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, මේ වන විට 98,209දෙනෙක් සුවපත් වෙලා සුරක්ෂිතව ගෙදර ගිහින් තිබෙනවා. මේ වන විට කොවිඩ් මරණ 696ක් වාර්තා වෙනවා. සාපේක්ෂව සංඛ්‍යාවක් -ඉලක්කමක්- විධියට පුංචි ගණනක් වාගේ මෙය පෙනෙන්නට පුළුවන්. නමුත්, මේ හැම මරණයක් ගැනම බරපතළ වේදනාවක් ඒ පවුල්වල සාමාජිකයන්ට විතරක් නොවෙයි, අපි හැමෝගේම පපුවට දැනෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොහොත වන විට ලෝකයේ සෑම රටක්ම මානව ශිෂ්ටාචාරයේ අතිශය බිහිසුණුම සැඟවුණු සතුරා සමඟ සටනක නිරතවෙලා ඉන්නවා. ලෝකයේ සමහර රටවල් දේශපාලන බෙදීමකින් තොරව, ඉතාම සහජීවනයෙන් මේ ප්‍රශ්නයට, එහෙම නැත්නම් මේ ගෝලීය අභියෝගයට ස්වදේශික විසඳුමක් සොයන්න ජාතික කළමනාකරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. ඒ අතර ලෝකයේ සමහර රටවල ආණ්ඩු, විපක්ෂයේ විපරීත කෙනෙහිලිකම් හමුවේ කොවිඩ්-19 රෝගය මර්දනය කිරීම වෙනුවෙන් අමතර වෙහෙසක් දරමින් ඉන්නවා. විපක්ෂයේ ආදරණීය ගරු මන්ත්‍රීවරුනි, මා එහෙම කිව්වාට අමනාප වෙන්න එපා. ආණ්ඩුවක් විධියට අපි ඉන්නේ, ජාතික ප්‍රශ්න මත දේශපාලන සිතියම් ඇඳීම පිළිබඳ බරපතළ පෙර පුහුණුවක් සහිත විපක්ෂයක් මේ ජාතික ව්‍යසනය මත දේශපාලන සිතියමක් අඳින මොහොතකයි. ඒ අමතර අභියෝගයටත් මුහුණ දෙමින් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව වසංගත තත්ත්වය කළමනාකරණය කරමින් ඉන්නවා.

COVID-19 ව්‍යසනය කළමනාකරණය වෙනුවෙන් ආණ්ඩුවක් විධියට ගත් ක්‍රියාමාර්ග සහ මේ වන විටත් ගනිමින් සිටින ක්‍රියාමාර්ග පිළිබඳ කෙටි පැහැදිලි කිරීමකට මම කාලය ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි COVID-19 ව්‍යසනය කළමනාකරණය වෙනුවෙන් ඊට සුවිශේෂී පහසුකම් ලබා දිය හැකිවන පරිදි රටේ සෞඛ්‍ය සේවාව ප්‍රතිව්‍යුහගතකරණය කළා. කොරෝනා රෝගීන් සඳහා වන විශේෂිත රෝහල් පද්ධතියක් අපි ස්ථාපිත කළා. මේ වන විටත් මගේ කළුතර දිස්ත්‍රික්කයේත් එවැනි රෝහල් කිහිපයක්ම ක්‍රියාත්මකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආසාදිතයන් හඳුනා ගැනීම වෙනුවෙන් ලෝකය මේ මොහොත වන විට අනුගමනය කරන පිළිගත්තු විද්‍යාත්මක ක්‍රමවේදය අප විසින් ඉතා මැනවින් මෙහෙයුමක් විධියට රට පුරා ක්‍රියාත්මක කරනු ලැබුවා. ආසාදිතයන් හඳුනා ගැනීමෙන් පසුව දෙවන අභියෝගය තමයි, ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් හඳුනා ගැනීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

සාමාන්‍යයෙන් අපි දන්නා දේ මෙයයි. මනුස්සයෙක් ලෙඩ වුණාම ඒ ලෙඩා ඉස්පිරිතාලෙට යනවා. හැබැයි, යම් කෙනෙකුට මේ රෝගය හැදුණාම සෞඛ්‍ය අංශවලට සිදු වුණා ලෙඩාව හොයාගෙන ගමක් ගමක් ගණනේ ඇවිදින්න. අපි ඒක කළා. පහසුකම් සහිත නිරෝධායන මධ්‍යස්ථාන පද්ධතියක් අපි රට පුරා හැදුවා. විටෙක සමස්ත දිවයිනම ආවරණය වන පරිදි, විටෙක විශේෂිත භූ කලාප සහ විශේෂිත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රට අගුළු ලා තැබීමට අපි අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කළා. ඒ වාගේම විදේශගත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. ප්‍රශ්නයේ හැඩය හරියටම තේරුම්ගෙන නොතිබුණු අවස්ථාවකදී පවා චීනයේ වූහාන් නුවරට ගිහිල්ලා ශ්‍රී ලාංකික දරුවන් මෙරටට රැගෙන ඒම වෙනුවෙන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මැදිහත් වුණා. මේ මොහොත වෙන කොට ඕස්ට්‍රේලියානු අග්‍රාමාත්‍ය ස්කොට්මොරිසන් මහතා අරගෙන තිබෙන තීන්දුව සමඟ ගළපලා බලද්දී එදා ඒ ගත්තු තීන්දුවේ බර දැනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඕස්ට්‍රේලියානු රජය තීන්දුවක් ගන්නවා, ඉන්දියාවේ ඉඳලා කිසියම් ඕස්ට්‍රේලියානු ජාතිකයෙක් මව් බිමට ආවොත් ඩොලර් 66,000ක දඩ නැත්නම් අවුරුදු පහක් හිරේ කියලා. ඒ, අපේ සමාජයේ ඇතැමුන්ගේ සිහින දේශය බවට පත් වෙලා තිබෙන ඕස්ට්‍රේලියානු රජයේ තීරණය.

මම දැන් එනවා, එන්නත්කරණ වැඩ පිළිවෙළ ගැන කියන්න. අපි ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා එන්නත ලබා දීම ආරම්භ කළා. මහාචාර්ය ගරු චන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවටත් කරුණු පැහැදිලි කළා. ඒ වාගේම රුසියාවේ නිෂ්පාදිත ස්පුට්නික් එන්නතේ එක තොගයක් ඊයේ රෑ ආවා. එහි ඊළඟ තොගය ලංකාවට ගෙන්වා ගන්න ලැහැස්තියි. පළමුවැනි වටයේ එන්නත් 15,000ක් ආවා. කවුරු හෝ අහයි, එන්නත් 15,000කින් මොකක් කරන්නද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එන්නත් 15,000 තීන්දුව එන්නේ මේ ආකාරයටයි. ඒ එන්නත් තොගය සෙල්සියස් අංශක සෘණ 20ක උෂ්ණත්වයකයි ගබඩා කරන්නේ. ඒවා නිවැරැදිව අපේ රට අනුගමනය කරනවාද කියලා ඖෂධ නිෂ්පාදක මව් ආයතනය, මව් රට ඒ ගැන අධ්‍යයනයක් කරනවා. එහෙම නොවුණොත් ඖෂධයේ ප්‍රමිතිය පිළිබඳව වැරදි චිත්‍රයක් ලෝකයට යනවා. මැයි මාසයේ ලක්ෂ හයක්, ජුනි මාසයේ ලක්ෂ අටක්, ජූලි මාසයේ ලක්ෂ 12ක් වශයෙන් ඒ ස්පුට්නික් එන්නත අපි ලබා ගැනීමට සූදානම්. චීනයේ නිෂ්පාදිත සයිනෝෆාම් එන්නත් ලක්ෂ හයක තොගයක් මේ රටට ගෙන්වා තිබෙනවා. මෙරට සිටින චීන ජාතිකයන්ට ඒ එන්නත ලබා දීලා තිබෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ Emergency Use Listing කියන ක්‍රියාවලියේ සයිනෝෆාම් එන්නත මේ වන විට අවසන් අදියරේයි තිබෙන්නේ. අපට ඒ එන්නත සමඟ ඒ වැඩ පිළිවෙළ තවදුරටත් වේගවත් කරන්න හැකියාව තිබෙනවා. ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේත්, රූපවාහිනියේත්, සමහර විට ගමේත් කියනවා, "මේ එන්නත සල්ලි තිබුණා නම් ඕනෑම වෙලාවක ගන්න පුළුවන්" කියලා. නමුත් මේ එන්නත කියන්නේ, පැරසිටමෝල් පෙත්තක් වාගේ එකක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ ඒ එන්නත් නිෂ්පාදනය වීමත් එක්ක එන්නත් මිලදී ගැනීමට පෝලිමක් නිර්මාණය වුණා. ඒ වෙනුවෙන් ලෝකයේ අලුත් මාතෘකාවක් හැදුණා. ඒකට කිව්වේ, "vaccine nationalism" කියලා; එන්නත් ජාතිකවාදයක් නිර්මාණය වුණා. ඒකේ සරල අදහස, තමන්ගේ රටට එන්නත මිලදී ගැනීම වෙනුවෙන් ලෝකයේ රටවල් තනි තනිව සටන් කරන්න පටන් ගත්තා කියන එකයි. ඒ වාගේම එන්නත් ඉල්ලුම සහ සැපයුම අතර බරපතළ අසමතුලිතතාවක් පවතින බව මා ඔබට කථා කරන මේ මොහොත වන විටත් ඇති බව රහසක් නොවෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධානියා ගිය සුමානයේ කිව්වා, වේගයෙන් එන්නත් කරන්න, මුළු ලෝකයම එන්නත් කරන්න තව අවුරුදු තුනක කාලයක්වත් ගතවෙනවා කියලා. හැබැයි, අපේ ආණ්ඩුව ඉතාම ඉක්මනින් මේ වැඩ පිළිවෙළ අතිසාර්ථකව අවසන් කරන්න සූදානම්. ඒ වාගේම යුක්තිය, සාධාරණත්වය පිළිබඳව කථා කරන නූතන ලෝකයේ ඇතැම් රටවල් අවශ්‍යතාවට වඩා වැඩි ප්‍රමාණයක් එන්නත් අරගෙන තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. උදාහරණයක් කියනවා නම්, මේ වන විට කැනඩාව ජනගහනය වාගේ පස් ගුණයක් එන්නත් මිලදී ගෙන තිබෙනවා.

එන්නතට අදාළව තවත් මාතෘකාවක් -එන්නත විදගැනීමේ දෙගිඩියාව- පිළිබඳව ලෝකය කථා කළා. ඒ කියන්නේ එන්නත තිබුණත්, එන්නත විදගැනීම සම්බන්ධව ජනතාව තුළ ඇතැම් සැකසංකා පවතිනවා. ඒ පිළිබඳව ලෝකයේ දියුණුම රටවල් - ජපානය, ප්‍රංශය- අධ්‍යයනය කළා. එන්නත පිළිබඳ දෙගිඩියාවේ ප්‍රශ්නය සියයට පනහක් වාර්තා වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නය හමුවේ මේ රටේ ජනතාවගේ ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීම වෙනුවෙන් මිනිසුන්ට ජීවත් වෙන්න වටපිටාවක් හදන්න අපට සිදු වුණා. මිලියන 1.9ක දැවැන්ත ජන සමූහයක් දෛනික වැටුප් මත යැපෙන, දෛනික රස්සා කරන ජනතාව විධියටයි අපි හඳුනා ගන්නේ. ඒ අය වෙනුවෙන් අපි අවස්ථා කිහිපයකදී රුපියල් පන්දහසේ දීමනාව ලබා දුන්නා. රාජ්‍ය සේවක වැටුප්, විශ්‍රාම වැටුප්, වැඩිහිටි දීමනා, වකුගඩු දීමනා, ආබාධිත දීමනා පමණක් නොව ක්ෂය රෝග දීමනාවට එනතුරු සියලු මහජන දීමනා අපි ලබා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොහොත වන විටත් රට පුරා නිරෝධායනය වන සෑම නිවසකටම රුපියල් දසදහසක වියළි සලාක මල්ලක් ආණ්ඩුවේ මැදිහත්වීමෙන් ලබා දෙනවා. අද උදේත් මා අපේ දිසාපතිතුමා එක්ක කථා කළා. කළුතර දිස්ත්‍රික්කය තුළත් අපි ඒ වැඩ පිළිවෙළ සාර්ථකව ක්‍රියාත්මක කරනවා. ඒ විතරක් නොවෙයි, පළමු රැල්ලේදී රට වහපු වෙලාවේ ගොවියාගේ එළවලු ටික, ධීවරයාගේ මාළු ටික මිලදී ගැනීමට පවා මැදිහත් වුණු ආණ්ඩුවක් ලංකාවේ තිබුණා නම්, ඒ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමන්ගේ ආණ්ඩුවයි. අපි ඒ පිළිබඳව කථා කරන්න ඕනෑ.

දෛනික සෞඛ්‍ය සේවා පවත්වාගෙන යෑම ගැනත් කියන්න ඕනෑ. මම පෙරේදා උදේ ජාතික රෝහලේ හදිසි අනතුරු ඒකකයට ගියා, හදිසි අනතුරකට ලක්වෙලා හිටපු බදුරලිය පැත්තේ තරුණයෙකුගේ සුවදුක් බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දෛනික සෞඛ්‍ය සේවා ඉතාම විධිමත්ව, පෙර පරිදිම, මේ අභියෝගය මැද්දේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් තිබෙනවා මා දුටුවා. ඒ වාගේම මා මේ සභාවට කිව යුතුයි, අපි හැමෝටම මේ තුළ යම් වගකීමක් තිබෙන බව. අපි ඒ සඳහා තනි තනිවත් උත්සහ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ආඩම්බරෙන් තමයි මේ කාරණාව කියන්නේ. ඊයේ රෑ ඉඳලා මා මේ කථා කරන මොහොත වන විටත් මගේ දිස්ත්‍රික්කයේ රෝගී ජනතාව වෙනුවෙන් පහසුකම් සපයන්න අපේ ගෙදර මිදුලේ ඇඳන් වගයක් හදනවා. මගේ ඉංගිරිය කලාපයේ සංවිධායක කණ්ඩායම මේ මොහොත වන විට ඉංගිරිය රෝහලේ ඒ සඳහා වන විශේෂිත ශාලාවක් ප්‍රතිසංස්කරණය කරමින් ඉන්නවා. මම

හෙට උදේ දහය වන විට ඇඳන් විස්සක් සහිත අලුත් රෝහල් වාට්ටුවක් ඉංගිරිය රෝහලේ ස්ථාපිත කරනවා. අපි හැමෝටම මේ තුළ තිබෙන වගකීම සිහිපත් කරන්නයි ඒ ගැන කිව්වේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අපේ වයසට දැකපු දේශපාලන ඉතිහාසය තුළ, ජාතික ව්‍යසනයකදී විපක්ෂය කවදාවත් ආණ්ඩුවට උදව් කරලා නැහැ. මට හැමදාම කිරිඇල්ල මැතිතුමා කියපු කථාවමයි මතක් වෙන්නේ. ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්. හැබැයි, ගොනෙකුට යුද්ධයක් අවසන් කරන්න බැහැ. යුද්ධයක් අවසන් කරන්න පුළුවන් වන්නේ, දැවැන්ත පෞරුෂයක් සහිත අභිමානවත් නායකයෙකුට පමණයි. එදා යුද්ධය වෙලාවේ, -ගරු සරත් වීරසේකර ඇමතිතුමාත් සභාවේ ඉන්නවා- ඒ කාලයේ ඒ සිද්ධිය පිළිබඳව මාධ්‍යයෙන් කථා කළ සම්පත් දායකයෙක් එතුමා. එදා පුතුකුඩියිරුප්පු සටන හිර වුණු වෙලාවේත් අපට මතකයි, විපක්ෂය අපට හිනා වුණා. හැබැයි, දින කිහිපයක් හිර වුණාට අපි පුතුකුඩියිරුප්පු සටන පැරදුණේ නැහැ. අපි අවසන් සටන ජයග්‍රහණය කළා. හැබැයි, ඒ කිසි මොහොතකදී විපක්ෂය කිසිදු සහයෝගයක් ලබා දුන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මා කියනවා. මේ මොහොත වන විට සමාජ මාධ්‍ය තුළ රට ගොඩනැඟීම පිළිබඳව දැවැන්ත සංවාදයක් නිර්මාණය වෙන බව. ඇතමුන් කියනවා, පාර්ලිමේන්තුවේ 225දෙනා හැදුණා නම් මේක හරි යයි කියලා. ඒකේ එක කොටසක් හරි තමයි. හැබැයි, පාර්ලිමේන්තුවේ 225දෙනා විතරක් හැදිලා රට හදන්න බැහැ. මේ රට හදන්නට නම්, වැරැදි කරන, අවංක නැති මහජන නියෝජිතයන් නිවැරදි විය යුතුයි. ඒකට මම එකඟයි. ඒ වාගේම මේ රට හදන්නට නම්, අනුමත කිරීම්, නිර්දේශ කිරීම් වැනි විෂයයන් අමතර ආදායම් මාර්ග බවට පත් කර ගත් ඇතැම් නිලධාරින් නිවැරදි විය යුතුයි. ඒ වාගේම මේ රට හදන්නට නම්, බටහිර බල කඳවුරට එරෙහිව අපි වෙනුවෙන් හිටගත්ත, ජීනිවා නුවරදී අපට ඡන්දය දුන් චීනයේ ආරක්ෂක ඇමති ඊ දොළහට බොරැල්ල කනත්තේ traffic light එකේ හිරවෙලා ඉන්න ඕනෑ කියලා හිතන අමුතු අලුත් පරම්පරාව නිවැරදි විය යුතුයි. ඒ වාගේම මේ රට නිවැරදි කරන්නට නම්, ATM යන්ත්‍රය ළඟ තිබෙන sanitizer බෝතලය බෑග් එකේ දාගෙන යන ජාතියේ සමහර පුරවැසියන් නිවැරදි විය යුතුයි කියන එක අවධාරණය කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මට පෙර කථා කළ අපේ ගරු සහෝදර මන්ත්‍රීතුමා කළ කථාවෙන්ම පටන් ගත්තොත්, "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියන කථාව වාගේම මතක තබාගත යුතු කාරණාවක් තමයි, "ඕනෑ ගොනෙකුට බෙහෙත් කරන්න බැහැ" කියන එක. බෙහෙත් කරන්න දොස්තර මහත්වරුන්ට ඉඩ දිය යුතුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සජිත්ට පුළුවන්. සජිත් කරයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
බෙහෙත් කරන්න දොස්තර මහත්වරුන්ට ඉඩ දෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැන පටලවාගෙන තිබෙන්නේ. තීන්දු ගන්න ඕනෑ සෞඛ්‍ය අමාත්‍යාංශය සහ දොස්තරවරුයි. හැබැයි, සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, දොස්තරවරුන්ටත් තීන්දු ගන්න ඉඩ නොදී, පණ්ඩිතයෝ ටිකක් වට වෙලා ජනාධිපතිතුමා මුළා කරමින්, ජනාධිපතිතුමාට අසත්‍ය තොරතුරු දෙමින් කරගෙන යන වැඩසටහනේ එක ප්‍රතිඵලයක් හැටියට මේ තත්ත්වය ඇති වී තිබෙන බව මම පළමුවෙන්ම මතක් කරනවා.

සිංහල අවුරුද්දට මේ රටේ ජනතාව හැසිරෙව්වේ කොහොමද කියලා අපි දන්නවා. එතැනදී අවශ්‍ය තීන්දු, තීරණ ගන්න තිබුණා. දැන් ඒ ගැන කථා පවත්වන එක නොවෙයි කළ යුත්තේ. එදා ඒ තීන්දු, තීරණ ගන්න තිබුණා. විපක්ෂයේ අපි තමයි කොරෝනා වසංගතයේ පළමු රැල්ල එද්දී ඒ ගැන කථා කරපු කණ්ඩායම. අපේ විපක්ෂ නායකතුමා පළමුවෙන්ම ඒ ගැන කිව්වා. එතකොට එතුමාට හිනා වුණා. ඊට පසුව දෙවැනි රැල්ල ගැන කථා කළා. හැබැයි, දෙවැනි රැල්ලෙන් පසුව සිංහල අවුරුද්ද දක්වා වන කාල සීමාව ඇතුළත මේ රටේ ජනතාව ආරක්ෂා කිරීමට අවශ්‍ය සෞඛ්‍ය වැඩ පිළිවෙළ හදන්න හොඳටම ඉඩප්‍රස්ථාව තිබුණා. හැබැයි, මේ රටේ ඒ සෞඛ්‍ය වැඩ පිළිවෙළ නිවැරදිව හැදුවේ නැහැ. ඒ සෞඛ්‍ය වැඩ පිළිවෙළ හදපු නැති එකේ ප්‍රතිඵලයක් තමයි අපි අද භුක්ති විඳින්නේ. ඒ නිසා ආණ්ඩුව පණ්ඩිත කථා දොඩවන්නේ නැතිව රටේ ජනතාවට සැබෑ සේවය සැලසීමට මතක තබා ගන්න ඕනෑ.

අද රටේ ජනතාව ඉතාම අමාරුවෙන් ජීවත් වෙන්නේ. එක පැත්තකින් ඒ අය ආර්ථික ප්‍රශ්න ගොඩක හිරවෙලා ඉන්නේ. ඊළඟට, සෞඛ්‍ය අංශයේ ප්‍රශ්න ගොඩක හිර වෙලා ඉන්නේ. එක පැත්තකින් ගෙදරින් එළියට බහින්න බැහැ. අල්ලපු ගෙදර කෙනාට කොරෝනා වයිරසය තිබෙනවාද කියලා විශ්වාසයක් නැහැ. ජනතාව මෙවැනි ප්‍රශ්න ගොඩක ඉන්නේ.

අද PCR පරීක්ෂණ නිවැරදිව කරන්නේ නැහැ. TV එකෙන් අද වාර්තා බලනකොට ඒ වාර්තා දින හතරකට කලින් වාර්තා කියලායි කියන්නේ. මොකද, PCR පරීක්ෂණවල වාර්තා ලැබෙන්න සමහර වේලාවට දවස් හතක් ගත වෙනවා. අද පරීක්ෂා කරන කණ්ඩායමේ වාර්තා ලැබෙන්න තව දවස් හතක් ගත වෙනවා. එහෙම නැත්නම් දවස් හතරක්, පහක් ගත වෙනවා. එතකොට අද තිබෙන තත්ත්වය අපට දැන ගන්න බැහැ. අපට දැන ගන්න ලැබෙන්නේ පසුගිය කාරණායි. එතකොට අද මේ රටේ තිබෙන තත්ත්වය මොකක්ද? මේ සියලු දෙයට වගකියන්න ඕනෑ ආණ්ඩුවයි. ආණ්ඩුව වගකීමක් ඇතිව මේ වැඩ කටයුත්ත හරියට කළා නම්, තමුන්නාන්සේලාට මේ ප්‍රශ්නය ගැන අද මෙතැන කථා පවත්වන්න වෙන්නේ නැහැ.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

සිංහල අවුරුදු සමයේ සංචරණ පිළිබඳ යම් කිසි විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න තිබුණා. හමුදාව, සෞඛ්‍ය අංශ කැප වෙලා සිටින වේලාවක, හැම ගමකම නිලධාරි කණ්ඩායමක් ඉන්න වේලාවක හොඳ වැඩ පිළිවෙළක් හදන්න තිබුණා. අපට තිබෙන්නේ සිංහල අවුරුද්දේ අපේ චාරිත්‍ර-වාරිත්‍ර ටික ඉටු කිරීමට අවස්ථාව ලබා දෙන එකයි. ඊට වඩා දෙයක් නොවෙයි කරන්න තිබෙන්නේ. ඒ චාරිත්‍ර-වාරිත්‍ර ටික හරියට ඉටු කරලා රටේ ජනතාව ජීවත් කරවීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා දෙන්න තිබුණා. නමුත්, ඒක සකස් කර දුන්නේ නැහැ. ඒක ඉබාගාතේ ඇරියා. එහි ප්‍රතිඵලයක් හැටියට අද හැම ගෙදරකටම තමන්ගේ අල්ලපු ගෙදර ගැන විශ්වාසයක් නැති වෙලා තිබෙනවා. මෙහෙම ගියොත් ඉදිරි කාලය තුළ දිනකට ආසාදිතයන් 6,000ක්, 7,000ක් වාර්තා වෙයි කියලා සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමිය කියනවා මම දැක්කා. එතකොට අපි යන්නේ කොහේද? කොහේ රෝහල්වලටද ගෙනියන්නේ? කොහේද අපි ප්‍රතිකාර කරන්නේ? අපි ජීවත් වෙන්නේ කොහේද? තමන්ගේ ගෙදර ජීවත් වෙන්නත් විශ්වාසයක් නැති වෙනවා.

මෙවැනි තත්ත්වයක් රටේ ඇති වෙලා තිබියදී, අද ඉන්දියාවේ සංඛ්‍යාලේඛන අරගෙන බැලුවොත්, ප්‍රතිශත අරගෙන බැලුවොත් අපි ඉන්දියාවටත් වඩා ඉදිරියට ගිහින් තිබෙන බව පෙනෙනවා. අද PCR පරීක්ෂණ හරියට කරලා ප්‍රතිඵල ටික ගත්තොත් අපි ඉන්දියාවටත් එහා ගිහින්. එතකොට අපිට පුළුවන්ද, හැකියාවක් තිබෙනවාද මේ ලෙඩුන් බේරා ගන්න? හෙට වනවිට මේ රටේ ආසාදිත කණ්ඩායමෙන් සියයට 40කට, 50කට හුස්ම ගන්න බැරුව නියුමෝනියාව හැදුණොත් ඔවුන් බේරා ගන්න තමුන්නාන්සේලාට පුළුවන්ද? බේරා ගන්න බැහැ. එහෙම නම් අපි ගමේ සැබෑ තත්ත්වය හඳුනා ගෙන මහ පොළොවේ ඉඳිමින් වැඩ කටයුතු කරන්න ඕනෑ. විපක්ෂයක් හැටියට අපි සූදානම්, තමුන්නාන්සේලාට උදවු කරන්න. අපි මේ අවස්ථාවේ උදවු කරන්න සූදානම්. හැම දිස්ත්‍රික්කයකම අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා, හිටපු පළාත් සභා මන්ත්‍රීතුමන්ලා ඉන්නවා; හැම කොට්ඨාසයකම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් ඉන්නවා. අපට පුළුවන් ඒ සියලුදෙනා හා නිලධාරින් සමඟ වාඩි වෙලා මේ රට තුළ එක වැඩ පිළිවෙළකට යන්න. කොරෝනා ආසාදිතයන් සිටින තැනක් බවට රට පත් වෙනකොට ඒකෙන් ප්‍රයෝජන ගන්න අපට අවශ්‍ය නැහැ. අද ජනතාව කියන දේ තමයි අපි මෙතැනට ඇවිල්ලා කියන්නේ. එහෙම නැතුව මේවා අපි හදලා කියන ඒවා නොවෙයි.

අපි සමහර තැන්වලට ගියා. ඔවුන් එදා වේලා හම්බ කරගෙන කන දුප්පත් අහිංසක කම්කරුවන්. ඒ ගොල්ලන් ආසාදිතයන් නොවෙයි, හැබැයි, ඒ ගොල්ලන් නිරෝධායනය කර තිබෙනවා. නමුත්, ඒ අයට කන්න කිසිම දෙයක් ගෙවල්වල නැහැ. මේ කියන රුපියල් 10,000ත් තවම දීලා නැහැ. එක්කෝ රුපියල් 10,000 දෙන වැඩසටහනක් හදන්න වෙනවා. නිරෝධායනය කළ ගමන් දවස් දෙක-තුනකින් ඒක දෙන්න ඕනෑ. මොකද, එදිනෙදා කීයක් හරි හම්බ කරගෙන තමයි ඒ අය එදා වේල කන්නේ. ඒ නිසා පස්-හය දෙනෙකු ඉන්න එවැනි ගෙදරක දවස් තුන-හතරක් ගියාට පසුව කන්න බොන්න දෙයක් නැති වෙනවා. සමහර වේලාවට ඒ ගමේ අනෙක් අයත් දුප්පත් නම්, ඒ අයට බෙදා හදා ගන්න බැහැ. ඒ ගමේ නිරෝධායනය වෙන පවුල් ගණන වැඩි නම්, බෙදා හදා ගන්න බැහැ. මෙවැනි ප්‍රශ්න ගොඩක් තිබෙනවා, එක පැත්තකින්.

මම එක ගෙදරකට ගියා. ඒ ගෙදර කොරෝනා ආසාදනය වුණු කෙනෙක් දවස් දහයක්ම ගෙදර තමයි ඉඳලා තිබෙන්නේ. ඔහුට කියා තිබෙන්නේ ඔහුට හොඳටම අමාරු වුණොත් ගෙනියන්න එන්නම්, නැත්නම් ගෙනයන්න තැනක් නැහැ කියන එකයි. ඇඳන් සූදානම්, පහසුකම් සියල්ල සූදානම් කියලා කියනවා නම්, ඒ අය ගෙවල්වල තබාගෙන ඉන්නේ මොනවාටද? පුත්තලම දිස්ත්‍රික්කයේත් කොවිඩ් හැදුණු හතළිස්දෙනෙකු ඉන්නවා කිව්වා, ගෙනයන්න තැනක් නැතුව. එහෙම නම් මේ අඩු පාඩු හරියාකාරව හඳුනා ගන්න.

ආණ්ඩුව අසමත් වුණේ කොතැනද දන්නවාද? දෙවැනි රැල්ල ආවාට පසුව මේ වෙනකම් පසු කළ කාල සීමාව තුළ ආණ්ඩුවට හම්බ වුණු සල්ලිවලින් හැම ශතයක්ම මේ රටේ මිනිසුන් ආරක්ෂා කරන්න වියදම් කරන්න තිබුණා. අද PHI මහත්වරු කියන්නේ මොකක්ද? PHI මහත්වරුන් කියනවා, ඒ අය කියන කිසිම දෙයක් ගණන් ගන්නේ නැහැ කියලා. ඒ අය අද රැකියාව අත හැර ඉන්නේ. ඒ අයට කිසිම පහසුකමක් දීලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ 1990 ambulances ටික තිබුණේ නැත්නම් අද මේ රටේ මිනිසුන් මහ පාරේ මැරෙනවා. මතක තබා ගන්න. ඒ ambulancesවල සේවය කරන රියැදුරන් ඇතුළු අනෙක් අයට පහසුකම් විතරක් නොවෙයි, සමහර අයට දීමනා ටික ගෙවලාත් නැහැ. මෙවැනි තත්ත්වයක් අද රටේ තිබෙන්නේ. ඒ නිසා කරුණාකර, මහ පොළොවට බැහැලා මහ පොළොවේ ඉඳිමින් මේ රටට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා බලන්න.

දැන් මේ වේලාවේ තව ජනප්‍රිය දේවල් ගෙනෙනවා. පොහොර ටික දෙන්නේ නැහැ. රසායනික පොහොර ගෙනෙන්නේ නැහැ කියලා තව ජනප්‍රිය වෙන්න හදනවා. හැබැයි, ඒක ජනප්‍රිය වෙන වැඩක් නොවෙයි. කොවිඩ්වලින් මිනිසුන් මැරෙන කොට, මේ රටේ මිනිසුන් තුළ රට ගැන විශ්වාසයක් නැති වෙනකොට, අනෙක් පැත්තෙන් ජනප්‍රිය වෙන්න උත්සාහ කරන එක නොවෙයි කළ යුත්තේ. මේ වේලාවේ සැලසුමක් හදලා, යම් කිසි වැඩ පිළිවෙළක් හදලා ඒක ඉස්සරහට ගෙනයන්න හිතන්න ඕනෑ. ඒ වෙනුවට ජනප්‍රිය වැඩ කරන එක නොවෙයි කළ යුත්තේ. කොවිඩ් වසංගතය පැතිරිලා මිනිසුන් මැරෙන්න යනකොට, රටේ අපි ඔක්කෝම එකතු වෙලා ඒ ගැන සැලකිලිමත් විය යුතු මොහොතේ, මෙන්න Colombo Port City Economic Commission එකට අදාළ පනත් කෙටුම්පත සම්මත කරගන්න පාර්ලිමේන්තුවට ගෙනෙනවා. ඒවා සම්මත කරන දවස්ද මේ? අපි මේ දවස්වල කථා කළ යුත්තේ මේ කොවිඩ් වසංගතය නැති කරගන්නේ කොහොමද, අපි එන්නත ගෙනෙන්නේ කොහොමද, ආර්ථික වශයෙන් දුප්පත් මිනිසුන් ටික ආරක්ෂා කරගන්නේ කොහොමද, ඒ අය ශක්තිමත් කරන වැඩ පිළිවෙළ සකස් කරන්නේ කොහොමද, සුබ සාධන කටයුතු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධව අවධානය යොමු කිරීම සහ ශ්‍රමයෙන් දෙන්න පුළුවන් මොනවාද, මුදල්වලින් දෙන්න පුළුවන් මොනවාද, උපකරණවලින් දෙන්න පුළුවන් මොනවාද කියන දේවල් පිළිබඳවයි.

හැම ගමකම පවතින ක්‍රමවේදයක් තිබෙනවා. සංස්කෘතිකමය වශයෙන්, සමාජයීය වශයෙන් හා ආගමික වශයෙන් හැම ගමක්ම ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙළක් අපට හදන්න පුළුවන්. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා, කරුණාකර පුහු මාන්නය අත හැර, එක එකාට මඩ ගහනවා වෙනුවට, එක එකාට ඇඟිල්ල

දිගු කරනවා වෙනුවට, බෙල්ල මිරිකනවා වෙනුවට රටේ ජනතාව ගැන හිතලා, ඔළුවේ ඇතුළේ තිබෙන මොළය හරියට පාවිච්චි කරලා රටට සැලසුමක් හදලා, "අපි ඔක්කෝම එකට වාඩිවෙලා එම සැලසුම ක්‍රියාත්මක කරලා මේ මිනිසුන් ටික බේරා ගනිමු." කියලා කියන්න කියලා. අපේ වගකීම එයයි. මේ අපි 225 දෙනාටම බණින්නේ තමුන්නාන්සේලා- [බාධා කිරීමක්] වැඩ නිසායි. ඒ නිසා තමයි 225 දෙනාම බැණුම් අහන්නේ. ඒ නිසා කරුණාකර මේ සම්බන්ධව විධිමත් ක්‍රියාවලියක් සකස් කරන්න කියා තමුන්නාන්සේලාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා. ජනප්‍රිය දේවල් නොවෙයි, රටේ මිනිසුන් ජීවත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වෙනුවෙන් තමුන්නාන්සේලාට ඕනෑම සහයෝගයක් දෙන්න විපක්ෂයක් හැටියට අපි සූදානම් බවත් ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසාන කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වයිරස් පිළිබඳ විශේෂඥයකු හැටියට මට කරුණු ටිකක් ඉදිරිපත් කරන්න තිබෙනවා. පවතින තත්ත්වය පිළිබඳ වාද විවාද කරන්න පෙර අප ඒ කරුණු හිතට අරගෙන ක්‍රියා කරන්න ඕනෑ. මේ කොවිඩ්-19 වයිරසය ලෝකයට අලුත් වයිරසයක්. සතුන්ගෙන් ආ ජීව වෙනස් වීමක් හේතුකොටගෙන මිනිසුන් අතර පැතිර යන්න පටන් ගෙන තිබෙන වයිරසයක්. මේ වයිරසය ඇති වෙන්න කලින් එයට ඔරොත්තු දිය හැකි කිසිම ප්‍රතිශක්තියක් සමාජය තුළ තිබුණේ නැහැ. හැබැයි, අනෙකුත් වයිරස් රෝග නම් විටින් විට හැදිලා තිබෙන නිසා ඒවාට මුහුණ දීම සඳහා යම් සමාජ ප්‍රතිශක්තියක් පවතිනවා. ඒ වයිරස් රෝගවලට මුහුණ දුන් මතකයක් තිබෙන නිසා ආයෙත් ඒ වයිරසයක් බෝ වුණත් ආරක්ෂාවට අදාළ කරුණු මතු වෙමින් එනවා. නමුත්, මේ අවස්ථාවේදී නම් එය එහෙම සිද්ධ වන්නේ නැහැ.

අපි අතීත සිදුවීමක් වෙත හිත යොමු කරමු. වර්ෂ 1917දී පළමු ලෝක යුද්ධය අවසන් වනවාත් එක්කම පැතිර ගිය influenza වර්ගයේ අලුත් වයිරසය නිසා ලෝකයේ මිලියන 30ත් 50ත් අතර ජනතාවක් මිය ගිය බව වාර්තා වෙනවා. ඒ වාගේ තත්ත්වයක ලකුණු පෙන්වමින් මේ කොවිඩ්-19 වයිරසය දැන් ලෝකය පුරා පැතිර යමින් තිබෙනවා. කොවිඩ් හේතුවෙන් දැනට මිලියන 3ක විතර ජනතාවක් මිය ගිහින් තිබෙනවා. ඒ අතරින් වැඩිපුර මිය ගිහින් තිබෙන්නේ සංවර්ධිත -පොහොසත්- රටවල ජනතාවයි. ඇමෙරිකාව ප්‍රධාන රටවල තිබෙන නව ලිබරල් ආර්ථික ක්‍රමය හා ඒ ආකල්ප පදනම් කරගෙන මහජන සෞඛ්‍ය ක්‍රම හරියට ක්‍රියාත්මක නොවීම හේතුකොටගෙන තමයි ඒ රටවල රෝගීන් වැඩි වෙලා තිබෙන්නේත්, විශාල පිරිසක් මිය ගිහින් තිබෙන්නේත්. මේ ආකාරයට ලෝකය පුරා දැන් කොරෝනා වයිරසය පැතිර ගිහින් තිබෙනවා.

අප රටටත් එම වයිරසය ඇවිත් තිබෙනවා. අනෙකුත් රටවල් එක්ක සසඳා බලන විට ලංකාව ගැන අපට සතුටු වෙන්න පුළුවන්. ලංකාවේ සිටින කොවිඩ්-19 රෝගීන් ගණන ලක්ෂයකට ටිකක් වැඩියි. 1,000ක්වත් මිය ගිහින් නැහැ; 700 ගණනක් පමණයි මිය ගිහින් තිබෙන්නේ. මේ තත්ත්වය පාලනය කරගෙන මේ වසංගතයෙන් ආරක්ෂා වෙන්න අපි දැනට වඩා හොඳින් ක්‍රියා කරන්න ඕනෑ.

මේ වාගේ අලුත් වසංගතයක් පැතිර යන කොට, එහි හැසිරීම පිළිබඳව විශ්වාස කරන්න බැහැ. එහි අලුත් ප්‍රභේද මතු වනවා. බ්‍රිතාන්‍යයේ ප්‍රභේදය දැන් ලංකාවට ඇවිත් තිබෙනවා. ඒ ප්‍රභේදය ඉතා පහසුවෙන් -සියයට 50ක ප්‍රවණතාවකින්- බෝ වනවා. එමඟින් මිනිසුන් මිය යෑමේ ප්‍රතිශතය ද සියයට 52ක් පමණ වනවා. ඒ නිසා දැන් පවතින මේ තත්ත්වය පවා කොහොම වෙනස් වෙයිද කියන්න දන්නේ නැහැ. ඒ ප්‍රභේදයත් දැන් ලංකාවේ පැතිර යෑමේ ඉඩ කඩ තිබෙනවා.

මම එන්නත් ගැන දෙවනුව කථා කරන්නම්. එන්නත් කෙරේ ඕනෑවට වඩා විශ්වාසයක් තබන්න ඕනෑ නැහැ. හේතුව, මේකයි. මේ වාගේ තත්ත්වයක් හමුවේ මුළු රටේම එන්නත් කළ යුතු ජනතාවගෙන් සියයට 80ක් විතර එන්නත් කළොත් තමයි මේ වයිරසය පැතිර යෑම වළක්වන්න පුළුවන් වන්නේ. ඉතින් අපි ඒ මට්ටමට එන්න කොච්චර කල් යයිද කියන්න බැහැ. මේ කාරණය ගැන සලකා අප හොඳ සෞඛ්‍ය පුරුදු තුනක් ඇති කර ගත්තොත් මේ තත්ත්වයට හුඟක් සාර්ථකව මුහුණ දෙන්න පුළුවන්. එකක් තමයි එකිනෙකා අතර දුරස්ථභාවය පවත්වා ගැනීම. මම කියන්නේ විශේෂයෙන්ම පුද්ගලයන් රැස් වන තැන්වල පුද්ගලයන් අතරේ මීටර එකක නොවෙයි, මීටර දෙකක පරතරයක් තියා ගන්න කියලායි. ගෙයින් පිටතදී අප එය පුරුද්දක් හැටියට ම කළ යුතුයි. ඒ එක්කම ගෙදරින් පිට යන කොට නිතරම මුහුණු ආවරණ පාවිච්චි කරන්න ඕනෑ. තුන්වනුව, අපි යම් දෙයක් ඇල්ලුවොත්, විශේෂයෙන් පිට කවුරුන් හෝ අල්ලා තිබෙන දෙයක් ඇල්ලුවොත් එතැන වයිරස තිබෙනවා නම් ඒවා අපේ අතට එන්න පුළුවන්. ඒ නිසා සබන් ගාලා දෑත් සෝදන්න අවශ්‍යයි. සබන්වලට එම වයිරස් මැරෙනවා. ඒක ලොකු වියදමක් යන වැඩක් නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු 2ක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මට දුන්නේ විනාඩි 8ක් නේද ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 9 යි. දැන් විනාඩි 7ක් අවසානයි. ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මා ඉහත කී ආකාරයට අපි දැන් ක්‍රියා කළ යුතුයි. මේ සෞඛ්‍ය පුරුදු තුන අප හරියට අනුගමනය කළොත් මේ ප්‍රශ්නයෙන් මිදෙන්න පුළුවන්. අපි හැමෝම ඒ ගැන හිතන්න ඕනෑ.

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

ජනතාවට හොඳ සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබා දෙන්නත් අවශ්‍යයි. එය කිරීමට අවශ්‍ය තාක්ෂණයත් අපේ රටේ තිබෙනවා; රට පුරා සෞඛ්‍ය සේවකයනුත් ඉන්නවා. සතියකින් ඒ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීලා, ජනතාවගේ හිත් හැදිය යුතුයි, වෙනත් ඕනෑම පුද්ගලයෙකුගෙන් මේ රෝගය බෝ වෙන්න පුළුවන්, මෙය සමාජගත වෙලායි තිබෙන්නේ කියලා සිතන මට්ටමට. අපි හරියාකාරව ඒ මතය මේ සමාජය තුළ ඇති කළොත්, වැඩි වියදමකින් තොරව මේ තත්ත්වය වළක්වාගන්න අපට පුළුවන්. එවිට අපට එන්නත් ලබා දෙන තෙක් බලාගෙන ඉන්න, පොර කන්න ඕනෑ නැහැ. එන්නත් ලබා දීම අතැන පොඩ්ඩක් වැඩි කළා, මෙතැන පොඩ්ඩක් වැඩි කළා කිව්වාට වැඩක් වෙන්නේ නැහැ. මා කියපු විධියට මේ රට තුළ එන්නත් කළ යුතු ජනතාවගෙන් අඩු වශයෙන් සියයට 80කට වත් එන්නත් ලබා දුන්නොත් තමයි මේ වයිරසය පැතිර යෑම නියම විධියට නවත්වන්න අපට පුළුවන් වන්නේ. නමුත් අප ගම් මට්ටමේ ඉඳලා සියලුදෙනාට සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීලා මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන්න ඕනෑ. එහෙම කරලා ඒ අය ඕනෑකමින්ම තමන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන තැනට ගෙන එන්න ඕනෑ. අපි television බලන පෙනෙනවා, සෙනඟ ඉන්න තැන්වල ගොඩක් අය තම mask එක පහළට දමාගෙන ඉන්න ආකාරය; එහෙම නැත්නම් mask එකක් දමන්නේ නැතිව කටයුතු කරන ආකාරය. එහි භයානකකම ජනතාවට පැහැදිලිව කියා දෙන්න අවශ්‍යයි. මොකද, ජනතාව ඒ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා තිබෙනවා නම්, ඒ ගොල්ලන්ගේ හිත්වලට ඒ පණිවිඩය කිඳා බැහැලා තිබෙනවා නම් නිකම් පෙනුමට නොවෙයි මුව ආවරණ දැමීම ඇතුළු පුරුදු ක්‍රියාත්මක කරන්නේ. ජනතාව එසේ දැනුවත් වුණොත් නියත වශයෙන් අපට මේ තත්ත්වය පාලනය කරන්න පුළුවන් වෙයි කියන කාරණය මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම විවාදයට මා පිවිසෙන්නේ මෙය රටේ පවතින වර්තමාන තත්ත්වය පිළිබඳව පවත්වන විවාදයක් නිසායි. බොහෝ දෙනෙකු කොවිඩ් වසංගතය ගැන පමණක් කථා කළාට අද වන විට අපට බලපා තිබෙන ඊට ඔබ්බට ගිය කරුණු කාරණාත් තිබෙනවා. ඒ වාගේම විවිධ අවස්ථාවලදී විවිධ අය විවිධ කථා කිව්වත්, මේ පිළිබඳව හොඳ අවබෝධයක් ලබා ගැනීමටත්, ඒ පිළිබඳව සියලුදෙනාම දැනුවත් කිරීමටත් අපට වගකීමක් තිබෙනවා. ඒ නිසා තමයි මම මේ අවස්ථාවේදී කොවිඩ් වසංගතයත් එක්ක රටේ ආර්ථිකය පාලනය කරන විට අපට තිබෙන අභියෝග ගැන කථා කරන්නත්, ඒත් එක්කම කොවිඩ් සහ ආර්ථික පාලනය තුලනය කර ගැනීම පිළිබඳ පොඩි විග්‍රහයක් කරන්නත් අදහස් කළේ. බොහෝ අවස්ථාවලදී බොහෝ දෙනෙක් කල්පනා කරන්නේ කොවිඩ් හෝ වෙනත් කුමන හෝ වසංගතයක් ආවාම අපේ වගකීම වෙන්නේ එතැනින් එහාට සියලු දේවල් නවත්වලා, ඒ කටයුතු නොකර සිටීම කියලායි.

මම මහ බැංකුවේ අධිපතිවරයා හැටියට සිටි කාලයේ යුද්ධය උත්සන්නම වුණු අවස්ථාවක් මට මතකයි. කොටි ත්‍රස්තවාදීන් නැවත වරක් පහර දෙන්නට මහ බැංකුව target කරලා තිබෙන බව අපි දැනගත්තා. ඒ, 2007, 2008 වාගේ කාලයේදී. ඒ වෙලාවේ අපි මහ බැංකුවේ Director, Securityට කිව්වා, ඒ පිළිබඳව plan එකක් හදන්න කියලා. ඒ වෙලාවේ මුලින්ම හදපු plan එක තමයි සියලු දේවල් වැසීම. කාටවත් එන්න දෙන්නේ නැහැ, බඩු භාණ්ඩ බැංකුවට ගෙනෙන්න දෙන්නේ නැහැ, පරිහරණයට අවශ්‍ය වන මුදල් ගෙන එන වෑන්වලට එන්න දෙන්නේ නැහැ, ඒ විධියට කිසිම දෙයක් නොකර සම්පූර්ණ lockdown එකක් කිරීමට තමයි ඒ අය මුලින්ම යෝජනා කළේ. ඒ වෙලාවේ අපට තේරුණා එහෙම කළොත් මහ බැංකුව මඟින් අපේ රටට සිදු විය යුතු රාජකාරිය සිදු වෙන්නේ නැහැයි කියන එක. ඉන් පසුව අපි ඒ අයට නැවත කිව්වා, සියලු වැඩ කටයුතු කරන්න පුළුවන් වෙන විධියට අපේ ආරක්ෂාව සපයන්න කියලා. මම හිතන විධියට අන්න එතැන තමයි රහස තිබුණේ. මේ අවස්ථාවේදී වුණත් අපි ඒ ගැන කල්පනා කරන්නට ඕනෑ. ඒ අවස්ථාවේදී අපේ Security Services Departmentහි Directorට ඒක කිව්වාම, එතුමා අලුත් plan එකක් අරගෙන ආවා. ඒ plan එක තමයි, සියලු වැඩ කටයුතු කරන ගමන්ම ආරක්ෂාව තහවුරු කිරීම. අන්න ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී කිසිම විටෙක කිසිම අංශයක් වැහුවේ නැහැ, අපි කිසිම දෙයක් නතර කළේ නැහැ. සාමාන්‍යයෙන් සිදු විය යුතු කටයුතු අපි කරගෙන ගියා. මට හිතෙන හැටියට ඒ අත්දැකීම තුළින් අපට මේ අවස්ථාවේදී ගත හැකි හොඳ පාඩමක් තිබෙනවා. අපට දැන් තර්ජනයක් තිබෙනවා; අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝග ඉදිරියේ අපි කටයුතු කරන්නේ කොහොමද කියන එක ඉතාම වැදගත්.

පසු ගිය වසර තුළදී අපේ ආර්ථික වර්ධන වේගය සියයට 3.6ක් දක්වා අඩු වෙනවා අපි දැක්කා. ඒකේ කම්පාව දැනෙන්නේ ඒකෙන් යම්කිසි පීඩනයක් විඳපු අයට සහ රැකියා අහිමි වුණු අයට. තමන්ගේ ණය ගෙවා ගන්න බැරිව ගෙදර සිත්නවෙනකොට තමයි තේරෙන්නේ. ඒ වේදනාව නොවිඳින්නට නම් රටේ ජන ජීවිතය, රටේ ව්‍යාපාරික කටයුතු මේ කොවිඩ් උවදුරත් සමඟ ඉදිරියට ගෙන යෑමට අපට සිදු වෙනවා. ඒ නිසා තමයි අපි ඒ වෙලාවේ තීරණය කළේ, සියලු සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරන ගමන් රටේ එදිනෙදා කටයුතු, ආර්ථිකමය කටයුතු නොනවත්වා ඉදිරියට ගෙන යෑමේ වගකීමක් රජයට තිබෙන බව. දැන් ඒක ක්‍රියාත්මක වෙනවා. සමහර අවස්ථාවල ඒ සඳහා යම් කිසි අභියෝග මතුවෙන බව අපි දන්නවා. අපි ඒ අභියෝග ජය ගන්නට අවශ්‍යයි, ඒ අභියෝග තුලනය කර ගැනීමට අවශ්‍යයි. ඒක තමයි මෙතැන තිබෙන රහස. We have to balance these competing interests. එක පැත්තකින් අපි සෞඛ්‍ය ගැන බලන්නට ඕනෑ; අනෙක් අතට ආර්ථිකමය පැත්ත ගැන බලන්නට ඕනෑ. අපි ඒ දෙපැත්තම තුලනය කරගෙන යන්නට අවශ්‍යයි.

මේ රටේ තත්ත්වය ගැන කථා කිරීමේදී මම තවත් කාරණයක් දැක්කා. මහ බැංකුවේ Annual Report එක ළඟදී එළිදැක්වූවා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් ඒකේ යම්කිසි වෙනසක් තිබෙනවා කියලා කෑ ගසමින් කියා සිටියා. මම කියන්නට අවශ්‍යයි, 2019 වර්ෂයේ දී සමහර ඉලක්කම්වල නැවත ප්‍රකාශ කිරීමක් සිදුවෙලා තිබෙන බව. එහෙම කරන්න හේතු කිහිපයක් තිබෙනවා. පළමුවැනි හේතුව තමයි, අය වැය හිඟය රුපියල් බිලියන 1,016ක් හැටියටයි මුලින්ම සඳහන් කරලා තිබුණේ. නමුත් 2019 වර්ෂය

වෙනුවෙන් එම අය වැය හිඟයට වඩා තවදුරටත් විවිධ වියදම් රජය විසින් කරලා තිබෙන බව අපි දැක්කා. මම ඒ වියදම් ගැන පොඩ්ඩක් කියන්නම්. 2020 වර්ෂයේදී රජය 2019 වර්ෂය වෙනුවෙන් නව වියදම් වශයෙන් රුපියල් බිලියන 422ක් වැය කරලා තිබෙනවා. පොහොර සඳහා රුපියල් බිලියන 23.9ක්, ඖෂධ සඳහා රුපියල් බිලියන 25.7ක්, වැඩිහිටි ජනතාව වෙනුවෙන් ලබා දුන් වැඩිපුර පොලිය සඳහා රුපියල් බිලියන 45.8ක්, කොන්ත්‍රාත්කරුවන් සඳහා රුපියල් බිලියන 18.4ක්, "ගම් පෙරළිය" වැඩසටහන සඳහා රුපියල් බිලියන 7.1ක්, නාගරික සංවර්ධනය සඳහා රුපියල් බිලියන 6.9ක්, පාසල් සඳහා රුපියල් බිලියන 2.8ක් වැය කරලා තිබෙනවා. ඊට අමතරව 2020 වර්ෂයේ මුල් භාගයේදී පිටරටින් ගෙනාපු රුපියල් බිලියන 212ක මුදලක් 2019 වර්ෂය වෙනුවෙන් වැය කරලා තිබෙනවා. ගිණුම් හදද්දී ඒ කොටස ඒ වසරට තමයි වෙන් වන්නට අවශ්‍ය වන්නේ. ඒ කටයුත්ත හරියට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි එම වෙනස ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා මම ගරු මන්ත්‍රීවරුන්ට ඒ පැහැදිලි කිරීම කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, ඒ කාරණය නොකිව්වොත් සමහර විට එය සත්‍යය වසන් කිරීමක් වෙන්න පුළුවන් නිසා.

විශේෂයෙන්ම Port City ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි කාරණා දැනුවත් කරන කොට සමහර අයට රිදෙනවා අපි දැක්කා. සමහර අයට ඒ Port City ව්‍යාපෘතිය ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ අය අපට පෞද්ගලිකවත් ඒ සම්බන්ධයෙන් චෝදනා එල්ල කරන්න පටන් ගෙන තිබෙනවා. සමහර වෙලාවට නීතිමය රාමුව පාවිච්චි කරලා, සමහර අය අපට විරුද්ධව නඩු දාලා තිබෙනවා අපි දැක්කා. ඒ නඩු අවුරුදු හතකටත් කලින් ඒවා. මම හිතන හැටියට ඒ කටයුතු කරලා තිබුණේ අපි යම් අපහසුතාවකට ලක් කරන්න වාගේම, අපේ නම කැත කරන්නයි. ඒ ගැන අපි කනගාටු වනවා. නීතිය ඉදිරියේ කිසි දවසක ඒ වාගේ දෙයක් කිසි කෙනෙකුට කරගෙන යන්න බැරි බව අපි දන්නවා. එහෙම කිරීමෙන් අපි තවදුරටත් ධෛර්යවත් වනවා මිසක් ඒවායින් අපි අධෛර්යවත් වෙන්නේ නැති බවත් මා මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට මතක් කර දෙන්න කැමැතියි. සමහර වෙලාවට සමහර මන්ත්‍රීවරු මේ ගරු සභාවේදී ඒ කාරණා කියන්නේ තවදුරටත් අපි අධෛර්යවත් කරන්න වෙන්න ඇති. මොකද, දැන් නැවත වරක් මේ රටේ ආර්ථිකය යහ මඟට පිවිසෙමින් තිබෙන බව ඒ අය දන්නවා. මාස තුනකට වතාවක් අපට කිව්වා, ණය ගෙවා ගන්න බැරි වෙයි කියලා. ඩොලරය රුපියල් 250ක් වනවාය කියමින් උදන් අනපු අය දැන් නැවත වරක් රුපියල ස්ථාවර වනවා දකිනකොට මේවා බලාගෙන ඉන්න අමාරුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේවා දකින කොට ඒ අයට වේදනාවක් දැනෙනවා ඇති. රටේ යහපතට දෙයක් සිදු වනකොට ඒ අය වේදනාවක් අත් විඳින්න අවශ්‍ය නැහැ. ඒ අයට වෙන චේතනාවක් තිබුණොත් තමයි වේදනාවක් අත් විඳින්න සිදු වෙන්නේ.

කොවිඩ් වසංගතය හමුවේ අපි බොහොම ඉදිරියෙන් සිටිමින් හොඳින් කටයුතු කරගෙන යනවා. කොවිඩ් වසංගතය ව්‍යාප්ත වීම හේතුවෙන් සමහර අවස්ථාවලදී අපට තර්ජනයක් එල්ල වෙන්න පුළුවන්. අපි එවැනි තර්ජනවලට මුහුණ දීලා තිබෙනවා. රජය එම තර්ජනවලට හරියාකාරව මුහුණ දෙමින්, ශක්තිමත්ව කටයුතු කරන ආකාරය අපි දැකලා තිබෙනවා. අපේ රටට එන්නත් ගෙනැල්ලා තිබෙනවා. ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග මැතිතුමා අද අපට කිව්වා, තවම එක එන්නතක්වත් ලබා දෙන්න බැරි වෙලා තිබෙන රටවල් පණහක් තිබෙන බව. අපේ රටට අවශ්‍ය සියලු එන්නත් ගෙන ඒමට දැනටමත් අපට හොඳ වැඩ සැලැස්මක් තිබෙනවා. ඒ තුළින් සියලුදෙනාටම එන්නත් ලබා දෙන්නට අවශ්‍ය වැඩ පිළිවෙළක් අපි දැනටමත් දියත් කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සියලු ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. අවශ්‍ය වන හැම විටකම ඒ වෙනුවෙන් මුදල් ගෙවන්න අපි සූදානම් වෙලා ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා, ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
හොඳයි. මම නියමිත වෙලාවට මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අපේ රටේ ජනතාවට මේ ගැන කිසිම භයක් සැකක් ඇති කර ගන්නට එපා කියලා අපි මේ අවස්ථාවේදී කියනවා. වෙනත් රටවල ඔක්සිජන් නැති වුණාට කිසි විටෙක මේ රටේ ඔක්සිජන් අඩුපාඩුවක් සිදු වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. සමහර අය අපේ රටේත් ඔක්සිජන් හිඟ වෙයි කියන බලාපොරොත්තුවෙන් ඉන්නවා ඇති. නමුත් මම කියන්න කැමතියි, එහෙම කිසිම දෙයක් අපේ රටේ සිදු නොවන බව. අපි කොවිඩ් පළමුවැනි රැල්ලට, දෙවැනි රැල්ලට මුහුණ දුන්නා වාගේම තුන්වැනි රැල්ලටත් මුහුණ දීලා, ඒ සියලු අංග තුලනය කර ගැනීමෙන් මේ කටයුතු කරන්න බලාපොරොත්තු වන බව මතක් කරන්න කැමැතියි.

එම නිසා මා අවසාන වශයෙන් කියා සිටිනවා, අපි මේ රට පාලනය කරද්දී හැම පැත්තක්ම තුලනය කර ගනිමින් තමයි එය කරන්නේ කියලා. අපි හැම පැත්තක්ම සමථයකට පත් කරගන්න අවශ්‍යයි. රටේ ආර්ථිකය, රටේ ජන ජීවිතය, රටේ ශුභසාධනය ආදී සියලු අංග හරියාකාරව තුලනය කර ගනිමින්, පාලනය කර ගනිමින්, අපි ජනතාවට අවශ්‍ය ශක්තියත් ලබාදෙන බව කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමා. ඔබතුමාට මිනිත්තු නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් රජයේ මාතෘකාව වෙලා තිබෙන්නේ, "මේ කොරෝනා වසංගතයට අවශ්‍ය එන්නත අද නොවෙයි හෙට" කියන එකයි. හැම කෙනෙක්ම මේ ගරු සභාවට ඇවිල්ලා පොරොන්දු වෙනවා, කොරෝනා එන්නත හෙට දෙනවා, නැත්නම් තව මාසයකින්, දෙකකින්, එහෙමත් නැත්නම් අවුරුද්ද අන්තිමට දෙනවා කියලා. මීට ඉස්සෙල්ලාත් මේ වාගේ පොරොන්දු දුන් බව අපි දැක්කා. නමුත්, අද වෙනකොට මේ රටේ ජනතාව ඉතාම භීතියට පත් කරමින්, පීඩනයට පත් කරමින් ඉන්දියාවේ මෙන් ලංකාවේත් 'අලුත් අවුරුදු කොරෝනා පොකුර' පැතිර යන මොහොතක තමයි අපි මේ විවාදය පවත්වන්නේ. අලුත් අවුරුදු කොරෝනා පොකුර නිර්මාණය කිරීමේ වගකීම අපි සෘජුවම මේ රජයට භාර කරනවා. මොකද, මේ රජය කොරෝනා වසංගතය පිළිබඳව සැහැල්ලු චිත්‍රයක් තමයි ජනතාවට මැව්වේ. අපි දැක්කා, අලුත් අවුරුදු කාලයේදී රෙගුලාසි ලිහිල් කරලා නුවරඑළියේ සැණකෙළි පැවැත්වුවා; මල් ප්‍රදර්ශන පැවැත්වුවා. Highwaysවලින් කෝටි ගණනක් හම්බවුණාය කිව්වා. නමුත්, අද වෙනකොට කොරෝනා වසංගතය ඒ තැන්වලින් නැවතත් හිස ඔසවලා ඉතාම දරුණු ලෙස මේ රට තුළ ඉදිරියට යන ආකාරය අපි දකිනවා.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

මීට මාස කිහිපයකට පෙර එක් අමාත්‍යවරයෙක් කිව්වා, මේ රටේ ICU ඇඳන් නිෂ්පාදනය කරනවා කියලා. පිට රටින් ගෙනෙන්න ඕනෑ නැහැ, ඊට වඩා ඉතාම සුළු මුදලකට ඕනෑ තරම් ICU ඇඳන් නිෂ්පාදනය කරලා දෙන්න පුළුවන් කියලා කියනකොට මේ රටේ ජනතාවත් සතුටු වුණා. නමුත්, අද අපට ඒ ඇමතිවරයාවත් හොයාගන්න නැහැ. මේ පොරොන්දුත් ඒ වාගේම තමයි. විශේෂයෙන්ම ඇඳන් වැඩි කරනවා කිව්වා. නමුත්, දොස්තරලා නැතුව, ඒ වාගේම වෙනත් කාර්ය මණ්ඩල නැතුව ඒ ඇඳන්වලට මිනිස්සු දාලා නිකම් මැරෙන්න අරිනවාද කියලා මේ අවස්ථාවේදී අපි අහනවා. ඇඳන් වැඩි වුණාය කියලා මේ තත්ත්වය නවත්වන්න බැහැ. එම නිසා, ඉදිරියේදී එන කොවිඩ් සුනාමියට රටක් වශයෙන් අපි සියලුදෙනා එකතුවෙලා මුහුණ දෙන්නේ කොහොමද කියලා ඉතාම හොඳ සැලැස්මක් ඇතිව වැඩ කරන්න ඕනෑය කියන අනතුරු ඇඟවීම විපක්ෂය හැටියට අපි කරනවා. අපේ උදව් ගන්න, නොගන්න එක රජයේ වග කීමක්. අපේ උදව් අවශ්‍ය නැත්නම් රජයට තනියම ඒ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන්.

නමුත්, කොවිඩ් මර්දනය හොඳට කරගෙන යන කාලවලදී ඒක කළේ ජනාධිපතිතුමා, ඒක කළේ අගමැතිතුමා, ඒක කළේ රජය කියලා උදන් අනලා, ඊට පස්සේ අවාසනාවන්ත ලෙස මිනිස්සු මිය යන වේලාවට, මේ රෝගය පැතිරෙන වෙලාවට ජනතාව බිල්ලට දීලා, ජනතාව පිට වරද පටවලා කටයුතු කරන රජයක් හැටියට තමයි අද අපි මේ රජය දකින්නේ. මේ රට මේ අවස්ථාවේදී කොවිඩ් පාලනය කරන්න යන්නේ සෞඛ්‍ය අංශවල, සෞඛ්‍ය නිලධාරින්ගේ උපදෙස්වලට වඩා දේශපාලන තීන්දු තීරණ අරගෙනයි. අපි දැක්කා, පිළියන්දල ප්‍රදේශය එක වෙලාවකට lock down කරනවා, එක වෙලාවකට අරිනවා. එක ඇමතිවරයෙක් තමන්ගේ කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුට කොරෝනා හැදුණාම කියනවා අපි දැක්කා, "නැහැ, මම එන්නත ගහගත්තා, මම ගිහිල්ලා PCR කර ගත්තා" කියලා. ඒ වාගේ උද්ධච්ච අයුරින් තමයි අද මේ රටේ අමාත්‍යවරුන් හැසිරෙන්නේ. අමාත්‍යවරු විතරක් නොවෙයි, ඒ අයගේ පිටුපස සිටින හෙංචයියන් ටිකත් ඒ වාගේම තමයි. මෝඩ අදහස් ප්‍රකාශ කරමින්, හිනා වෙවී, මේක සැහැල්ලුවට අරගෙන, මේ වාගේ හැමදාම ජනතාව අන්දාගෙන ඉස්සරහට යන්න පුළුවන් කියන මන්ද මානසිකත්වයකින් තමයි ඒ සියලුදෙනා වැඩ කරන්නේ. නමුත්, කොරෝනා වයිරසයට ඒක වැඩක් නැහැ. විශේෂයෙන්ම කොරෝනා වයිරසයෙන් මරන්නේ, නැත්නම් ඒක පීඩා කරන්නේ වැඩියෙන්ම මෝඩයන්ටයි. එම නිසා ඒ මෝඩකම තමයි තමන්ගේ මරණයට හේතුවක් වෙන්නේ කියලා අපි මේ අවස්ථාවේ මතක් කරනවා.

මේ වන විට ලංකාවට ඇවිල්ලා තිබෙන කොරෝනා නව ප්‍රභේදය පිළිබඳව කථා බහට ලක් වෙලා තිබෙනවා අපි දැක්කා. ඉන්දියාවේත්, ඒ වාගේම එංගලන්තයේත් තිබෙනවා වාගේ ඉතා පහසුවෙන් පැතිර යෑමට හැකි ප්‍රභේදයක් තමයි දැන් ලංකාවටත් ඇවිල්ලා තිබෙන්නේ. අපි මේ අවස්ථාවේ නැවතත් රජයට මතක් කරනවා, එදා නිවැරදිව සැලසුම් කරලා මේ රටට නිසි එන්නත් ප්‍රමාණයක් ගෙන්වා ගත්තා නම් අද වෙනකොට අපට මේ රෝගී තත්ත්වයෙන් ජනතාවට යම් කිසි ආරක්ෂාවක් ලබා දෙන්නට හැකියාවක් තිබුණ බව. නමුත්, ඔබතුමන්ලා ඒක කළේ නැහැ. ඔබතුමන්ලා ඉතා උද්ධච්ච අන්දමින් පැණියක් පස්සේ දිව්වා. අපේ කථානායකතුමා පවා, සෞඛ්‍ය ඇමතිතුමිය පවා, ඒ වාගේම මෝඩ රැළත් ඒ පැණිය බිව්වා. අපි දැක්කා, ජනතාවට පෙන්වලා ඒක බිව්වා. ඊට පස්සේ ජනතාව හිතුවා, ඒ පැණිය බිව්වාම කොරෝනා පාලනය වෙනවා කියලා. ඒ නිසා ඒ වෙද මහත්තමයාගේ නිවස වටා දිගු පෝලිම් තිබෙනවා අපි දැක්කා. දැන් අපට ආරංචියි, ඒ වෙද මහත්මයාගේ යන්ත්‍ර සූත්‍ර ටිකත් දැන් විකුණන්න දාලා තිබෙනවා කියලා. ඒ වාගේ අන්ධ විශ්වාසයකින් යුක්ත ගමනක් තමයි ගියේ. ඒ නිසා තමයි අද වන විට මේ රට ආර්ථික වශයෙනුත් වැටිලා තිබෙන්නේ.

අපි මේ අවස්ථාවේ තවත් කාරණයක් අහනවා. ඩොලර් එකට සාපේක්ෂව රුපියල ස්ථාවර කරනවා කියනවා; සමනය කරනවා කියනවා; පාලනය කරනවා කියනවා; ආර්ථිකය හදනවා කියනවා. නමුත්, මේ කොයි දේ කළත් අන්තිමට පීඩා විඳින්නේ මේ රටේ ජනතාවයි. අපේ රටේ සංචාරක කර්මාන්තයට මේ පීඩාවෙන් මිදෙන්න කරලා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? නිරෝධායනය කරන ජනතාව හෝටල්වලට දානවා. ඒ වාගේම එම හෝටල් රෝහල් බවට පරිවර්තනය කරනවා. ඒ හැර, අපේ රටේ අහිංසක ජනතාව සංචාරක ව්‍යාපාරයෙන් සුළු පරිමාණයෙන් හම්බ කරපු සියලු අවස්ථා නැතිවෙලා තිබෙනවා. ඒ වාගේම අද වන විට අනෙකුත් කර්මාන්තවලත් දැවැන්ත කඩා වැටීමක් තිබෙනවා. කොරෝනා රෝගය කොපමණ දික් ගැස්සුණත් රජය ඒ සඳහා කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපි දකිනවා, වෙනත් රටවල ආර්ථික බේරාගන්න එම රටවල් මාස තුනෙන් තුනට, මාස හතරෙන් හතරට, නැත්නම් විටින් විට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව. ඒ කඩාගෙන වැටෙන ආර්ථිකය විටින් විට පණ ගන්වන්න, ශක්තිමත් කරන්න අවශ්‍ය පරිදි විශාල මුදලක් ඔවුන් ඒ ආර්ථිකවලට දානවා. ඒ වාගේම කර්මාන්ත ආරක්ෂා කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ඔවුන්ගේ පාර්ලිමේන්තු හරහා ක්‍රියාත්මක කරනවා. නමුත්, ඒ සියලු දේම තමන්ගේ ශක්තියෙන්, තමන්ගේ වැඩ පිළිවෙළකින් ආරක්ෂා කරගන්න කියලා මේ රටේ සුළු ජන කොට්ඨාසයකට රුපියල් 5,000ක් බෙදලා දෙනවා. එහෙම කරලා මේ රටේ ආර්ථිකය ඉස්සරහට අරගෙන යන්න පුළුවන් වෙයි කියලා තමයි මේ අය විශ්වාස කරන්නේ. ඒ නිසා අපි මේ අවස්ථාවේදී කියනවා, "නැවත කොරෝනා සුනාමියක් එනවා, ඒකට ලෑහැස්ති වෙන්න" කියලා. එහෙම නැතුව උද්ධච්ච වෙලා "මේක නිකම්ම ඉවර වෙයි, අපි කිසිම දෙයක් කරන්න ඕනෑ නැහැ" කියලා මෝඩ මනසකින් හිතන්නේ නැතුව කටයුතු කළ යුතුයි. ඒ සඳහා ICU ඇඳන්, ඔක්සිජන්, ඒ වාගේම එන්නත් අවශ්‍යයි. එම එන්නත අපට කොහෙන් හෝ ලබා ගන්න පුළුවන් නම් හොඳයි. වැඩිපුර එන්නත් අරගෙන තිබෙන සමහර රටවල් තිබෙනවා. ඔය telephones පාවිච්චි කරලා කථා කරලා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් රාජ්‍ය නායකයොත් එක්ක සුහද වෙලා, අවශ්‍ය එන්නත් ප්‍රමාණය මේ රටට ගෙනැල්ලා, අඩුම තරමින් මේ රටේ ජනතාවගෙන් සියයට 60කට, 70කට එන්නත ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ මතක් කරනවා. ඒ වාගේම, එන්නත්කරණයේදී එකම වර්ගයේ එන්නත් ලබා දීම සඳහා අපි උනන්දු විය යුතුයි. ඒක තමයි කළ යුතු වන්නේ. එහෙම නැතුව වෙන වෙන වර්ග මිශ්‍ර නොකළ යුතුයි. එවැනි අවස්ථා අත්හදා බලන්න පහසුකම් අපට තිබෙනවාද කියන එක ගැන අපට ලොකු සැකයක් තිබෙනවා. ඒවා වෙනත් රටවල් කරලා තිබෙනවාද කියන එක ගැනත් අපට ලොකු සැකයක් තිබෙනවා. එම නිසා අපේ රටේ ජනතාවගේ ජීවිත එක්ක සෙල්ලම් කරන්නේ නැතුව නියම සැලැස්මක් ඇතිව එම එන්නත් මේ රටට ගෙනැල්ලා වැඩ කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේදී මතක් කරනවා.

කොරෝනා වසංගතයත් සමඟ අපි තවත් කාරණයක් දැක්කා. පසුගිය ආණ්ඩුව සමයේ රටට ගෙන්වූ "සුව සැරිය" ගිලන් රථ සේවාවට එදා සමහරු හිනා වුණා. "Indian RAW හා සම්බන්ධ ඔත්තුකරුවන් එහි ඉන්නවා. ඒකේ ගියොත් ලෙඩ්ඩු මැරෙයි, කඩා වැටෙයි, ඒවා අබලන් වාහන" කිව්වා. නමුත් අද අපට පෙනෙනවා, අපේ ප්‍රදේශවලට සුව සැරිය ඇම්බියුලන්ස් සේවයෙන් විශාල සේවාවක් සිදුවන බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

අපි දැක්කා, ඉන්දියාවේ මෝටර් බයිසිකල්වල, ත්‍රීවීලර් ඇතුළේ මිනිසුන් මැරෙන ආකාරය. ඒ පිළිබඳවත් අපි මේ අවස්ථාවේදී මතක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පැණිය වෙනුවට එන්නත ලබා දීලා ජනතාව සුරක්ෂා කරන්න කියලා කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්.එම්. හරීස් මැතිතුමා. එතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා. - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු මධුර විතානගේ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා (මහජන ආරක්ෂක අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர - பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Weerasekera - Minister of Public Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු අජිත් රාජපක්ෂ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) KOKILA GUNAWARDENE left the Chair, and THE HON. AJITH RAJAPAKSE took the Chair.*

[අ.භා. 3.31]

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොඳ වෙලාවට තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණේ. මොකද, ප්‍රහාරයක් එල්ල කරන බව සහරාන් කිව්වා. ඊට පස්සේ ඇමතිවරු විතරක් නොවෙයි, තාත්තලාත් කිව්වා, "පුතේ, හෙට ගහනවා, යන්න එපා පල්ලි" කියලා. එහෙම තමයි ඒ ආණ්ඩුව ඒ වෙලාවේ ජනතාව ආරක්ෂා කර ගත්තේ. හොඳටම තිබුණු ජාතික ආරක්ෂාව නැති කරලා රට නන්නත්තාර කරලා තමයි අපට රට ලබා දුන්නේ. එහෙම කරපු අය අද කියනවා, එන්නත පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, රටේ ලොකු අර්බුදයක් තිබෙනවා කියලා. හැබැයි, සියලු අර්බුද අපි ඉතා හොඳින්, විනිවිදභාවයෙන් හා ඉතා හොඳ වෘත්තීය තත්ත්වයකින් කළමනාකරණය කරන බව මුළු ලෝකයම දන්නවා. ඒක නිසා තමයි ලෝක බැංකුව වාගේම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වාගේ ආයතන අපේ රටට අවශ්‍ය සහයෝගය හා ආධාර දෙනවා කියලා නිරන්තරයෙන් කියන්නේ. අදත් ඒ තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබෙනවා.

විශේෂයෙන්ම ලෝක වසංගතය ගැන අද මුළු ලෝකයම බොහොම අවධානයෙන් තමයි ඉන්නේ. අද මුළු ලෝකයම කඩා වැටිලා. එවැනි තත්ත්වයක් තුළ වසංගතයට අයිතිකාරයකු නැති වුණාට අද මුළු ලෝකයම වසංගතය ඉදිරියේ දණ ගහලායි තිබෙන්නේ. හැබැයි, 2020 මැයි මාසයේ 13වන දා ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂ හදිසි අවශ්‍යතා පිළිබඳ අංශයේ අධ්‍යක්ෂතුමා කියනවා, "නව කොරෝනා වයිරසය මුළු ලෝකයෙන්ම තුරන් කරන්න බැරි වෙයි. ඒක නිසා අපි මේකට සූදානම් වෙන්න ඕනෑ. නව ජීවන රටාවට හුරු වෙන්න ඕනෑ" කියලා. ලෝක සෞඛ්‍ය සංවිධානය, වෙනත් ලෝක සංවිධාන වාගේම මේ සම්බන්ධයෙන් විශේෂඥයන් ලබා දුන් උපදෙස් අනුව කටයුතු කරනවා මිසක් මේ තත්ත්වය තුළ දේශපාලනය කරන්න කිසිසේත්ම අපේ බලාපොරොත්තුවක් නැහැ. විශේෂයෙන්ම ජනාධිපතිතුමා ඒ ගැන තමන්ගේ උපදෙස් සියල්ල ම ලබා දෙන්නේ ඒ විශේෂඥයන්ගේ උපදෙස් මතයි.

හැබැයි, ඊයේ-පෙරේදා විපක්ෂ නායකතුමා නැවත වතාවක් මුළු ලෝකයම ඉදිරියේ අපි සමච්චලයට ලක් කළා. අපට ආරංචි වූ විධියට විශේෂයෙන්ම එතුමා සමඟ තානාපතිතුමන්ලා කරන ලද එක්තරා සාකච්ඡාවකින් පස්සේ එතුමන්ලා හිනාවෙවී ගිහිල්ලා තිබෙනවා, "මොනවාද, මේ මනුස්සයා කියන්නේ, විකාර නේද කියන්නේ?" කියලා. මොකද, තානාපතිලාට එහෙම නැත්නම් වෙනත් රටවලට උපදෙස් දෙන්න විපක්ෂ නායකතුමාට බැහැ. ඒ වාගේම මේ වෙනකොට කොරෝනා රෝගයෙන් දැඩි පීඩාවට පත්වෙලා නන්නත්තාර වෙලා සිටින රටවලින් අපේ රටට ආධාර සහ උදව් ඉල්ලා එතුමා ප්‍රකාශයක් නිකුත් කර තිබෙන බවත් අපි දැක්කා. මම හිතන විධියට අපි මේ වෙලාවේ අපේ රටේ තිබෙන සම්පත් උපරිමයෙන්ම කළමනාකරණය කර ගෙන විනිවිදභාවයකින් යුතුව රටේ තිබෙන මේ ප්‍රශ්නය විසඳා ගෙන යනවා. ලෝකය ඉදිරියේ හැම දාම හිනාවට ලක්වන විපක්ෂ නායකතුමා ඇත්තටම කොරෝනා සම්බන්ධයෙන් එතුමාගේ අදහස් දැක්වීම ආරම්භ කළේම මැලේරියාවට දෙන බෙහෙත් කොරෝනා වයිරසයට නිර්දේශ කරලායි.

කාලයෙන් කාලයට, අවස්ථාවෙන් අවස්ථාවට විවිධ විකාර විහිළු සපයනවා. ඇත්තටම අපේ රට දැවැන්ත පීඩනයක් හමුවේ ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් මැනවින් කළමනාකරණය කරගෙන, සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරලා, කොවිඩ් කළමනාකරණය කරන ආසියාවේ හොඳම රට බවට පත් කර තිබෙනවා. ඒ වාගේම මොන ප්‍රශ්න තිබුණත් රැකියා ලක්ෂයේ ව්‍යාපෘතිය අපි කරගෙන යනවා. කොවිඩ් ප්‍රශ්නය තිබුණත්, උපාධිධාරින්ට රැකියා ලබාදී තිබෙනවා. අද තරුණයන් වෙනුවෙන් ඉහළම යුතුකම අපේ ජනාධිපතිතුමා ඉටු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වස විස, රසායනික ද්‍රව්‍ය නැතිව කාබනික පොහොර යොදාගෙන ජනතාවට ඉතා සෞඛ්‍ය සම්පන්න කෘෂි නිෂ්පාදන ලබාදීම වෙනුවෙන් කෘෂි කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ කියලා අතිගරු ජනාධිපතිතුමා පසුගිය දිනක විශිෂ්ට තීරණයක් ගත්තා. මෙවැනි දැවැන්ත ගෝලීය ව්‍යසනයක් මැද්දේ මේ වාගේ අභීත තීන්දුවක් ගැනීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමාට අපගේ විශේෂ ස්තුතිය පුද කරන්න ඕනෑ. කොරෝනා රෝගයෙන් මිය යන, පීඩාවට පත් වන අය ගැන සෞඛ්‍ය අංශ තොරතුරු විශ්ලේෂණය කළාට පසුව අපට පෙනෙන කාරණයක් තමයි, කොරෝනා වයිරසයෙන් ජනතාව මැරෙන්නේ

[ගරු මධුර විතානගේ මහතා]

යම්කිසි පීඩාවකට, එහෙම නැත්නම් රෝගයකට භාජන වුණු අය බව. පසුගිය දවස්වල ඒ සම්බන්ධයෙන් කරපු අධ්‍යයනයේදී අපි දැක්කා, වකුගඩු රෝගය එහෙම නැත්නම් විවිධ රෝගාබාධවලින් පෙළෙන, ශරීර ප්‍රතිශක්තිකරණය අඩුවීම තුළින් තමයි, මේ රෝගයට මුහුණ දෙන්න බැරිව ගොඩක් වෙලාවට ජනතාව මිය යන්නේ කියන කාරණය. මේ වෙලාවේ ජාත්‍යන්තරව මොන තරම් පීඩනයක් ආවත්, සමාගම්වල මාෆියාවට භය නොවී අතිගරු ජනාධිපතිතුමා මේ තීරණය ගැනීම සම්බන්ධයෙන් ගරු සභාවේ මන්ත්‍රීවරු 225දෙනාම -සියලු මන්ත්‍රීවරු- එකඟ වෙයි කියා මං හිතනවා. මොකද, අද වන විට ජනතාව රෝගීන් බවට පත්වන ක්‍රමවේදය නවත්වලා, ජනතාවට ඉතා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් අනාගතයේදී ලබා දෙන්න හැකියාව අපට මේ නිසා ලැබෙනවා. අද වන විට විපක්ෂය ඒ සම්බන්ධයෙනුත් ඉතාම කැත විධියට තමන්ගේ බාල දේශපාලනය කරන්න පටන් අරගෙන තිබෙනවා. වස විස දීලා හෝ මිනිස්සු මැරියන් කියන තැන තමයි විපක්ෂය ඉන්නේ. අද දවස තුළ විපක්ෂය කරපු කථා බහ අනුව රට ආරක්ෂා වෙන්න, ජනතාව ආරක්ෂා වෙන්න රජය ගන්නා සාධනීය වැඩ පිළිවෙළට සහයෝගය දක්වනවා කියන එක නොවෙයි දැක්කේ. ලේ පිපාසාවෙන් තමයි විපක්ෂය උදේ පාන්දර සිට හැම තිස්සේම කථා කරන්නේ. ලේ පිපාසාවෙන් කථා කරන විපක්ෂය ගොඩක් වෙලාවට තමන් නොදන්නා දේවල් ගැන කථා කරනවා. අද මොන තීරණ ගත්තත්, වසංගත රෝග විශේෂඥයන්ගෙන් ඒ වාගේම,- මේ වෙලාවේ සෞඛ්‍ය බලධාරියා විධියට වැඩ කරන්නේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)
එතුමාගේ උපදෙස් මත තමයි අපි වැඩ කටයුතු කරන්නේ. ඇත්තටම අද විපක්ෂය තමන්ගේ කථාවලින් ඔප්පු කරලා හමාරයි, අනාගතයේත් ජනතාවගේ විශ්වාසය දිනා ගන්න බැරි පිරිසක් බව. අද විපක්ෂය කථා කරන්නේ ජනතාව වෙනුවෙන් ජනතාවගේ පැත්තේ හිටගෙන නොවෙයි. බොහෝ වෙලාවට විපක්ෂය කථා කරන්නේ විවිධ ජාවාරම්කරුවන් වෙනුවෙන්. විපක්ෂයේ කථාවල කිසිම හරයක් නැහැ. කොවිඩ් - 19 අර්බුදය පටන් ගත් වෙලාවේ සිටම විපක්ෂයේ ප්‍රාර්ථනාව වුණේ, මිනිසුන්ගේ මළ මිනී උඩින්, එහෙම නැත්නම් මිනිසුන්ගේ දුක, වේදනාව තුළින් තමන්ගේ පහත්, බාල දේශපාලනය කිරීමයි. ඒ නිසා රටේ ජනතාව අද අපේ පාලක පක්ෂයත් එක්ක එකතු වෙලා තිබෙනවා.

අද අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව ගෙනයන සාධනීය වැඩ පිළිවෙළට ජනතාව ඉතා උද්‍යෝගයෙන්, උනන්දුවෙන් සහයෝගය දෙනවා. ඒ වාගේම, එදා බිඳ වැටුණු රාජ්‍ය සේවය අද දිවි පරදුවට තබා කොවිඩ් - 19 පාලනය සම්බන්ධයෙන් රජයත් එක්ක හිටගෙන ඉන්නවා. මේ අවස්ථාවේදී රාජ්‍ය සේවයට, ආරක්ෂක අංශවලට, සෞඛ්‍ය සේවයට, පෞද්ගලික අංශයට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා, විපක්ෂය කියන බොරු අවලාද අහන්නේ නැතිව අර්බුදය වෙලාවේ තමන්ගේ යුතුකම් මැනවින් ඉෂ්ට කිරීම සම්බන්ධයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය කරන මේ අවලාදවලට ඇහුම්කන් නොදී අපේ රජය ගෙනයන සාධනීය වැඩ පිළිවෙළට අපිත් එක්ක එකතු වෙන්න කියලා ජනතාවගෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව කථා කරද්දී අපේ පාර්ලිමේන්තුව තුළ වැඩි අවධානයක් යොමු කරලා තිබෙන්නේ කොවිඩ් වසංගත තත්ත්වය මැඩලීම සම්බන්ධ කාරණා පිළිබඳව සාකච්ඡා කරන්නයි. අපි කවුරුත් දන්නවා, ඉතාම අවසනාවන්ත විධියට ලෝකය පුරා පැතිරී ගිය කොවිඩ් වයිරසය අපේ රටටත් ඇතුළු වීම නිසා අපටත් අර්බුද ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වුණ බව. අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ගරු අග්‍රාමාත්‍යතුමා ඒ වාගේම ආරක්ෂක අංශ, සෞඛ්‍ය අංශ ඉතා හොඳින් මේ තත්ත්වය කළමනාකරණය කරපු නිසාත්, ඒ වාගේම, ජනතාවගේ සහයෝගය මේ සඳහා ඉතා හොඳින් ලැබුණු නිසාත් අපට කොවිඩ් පළමුවැනි රැල්ල, දෙවැනි රැල්ල මැඩපවත්වා ගන්නට හැකියාව ලැබුණා.

පසුගිය කාලය තුළදී ඇති වූ ආර්ථික ප්‍රපාතවලින් ගොඩ එන්න අපට ක්‍රමානුකූලව හැකියාව ලැබුණා. විශේෂයෙන්ම ගොවි ජනතාවට කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ඔවුන්ට ඉහළ ඇස්වැන්නක් ලබා ගන්න පුළුවන්කම ලැබුණා වාගේම, ඒ ගොවි ජනතාවට ඒ තුළින් විශාල ආර්ථිකමය ශක්තියක් ගොඩ නැඟුණා. අපේ රටේ පවුල් පිටින් ගෙවල්වල හිරවෙලා හිටපු මිනිසුන් විවිධ ප්‍රදේශවලට ගිහිල්ලා නිදහසේ කාලය ගත කරනවා අපි දැක්කා. ඒ වාගේම ගම්මාන පිටින් සූදානම් වෙලා අවුරුද්ද සැමරීමේ කටයුතු කළා. අපි කිසි කෙනෙකුට ඒකට විරුද්ධ වෙන්න බැහැ. හැබැයි, ආරක්ෂක අංශවලින්, සෞඛ්‍ය අංශවලින් බොහොම පැහැදිලිව කිව්වා, "ඒ සෞඛ්‍ය නීති - රීති එහෙම නැත්නම් ලබා දීලා තිබෙන ඒ නිර්දේශ අනුව කටයුතු කරන්න, ඊට එහාට ගිහිල්ලා කටයුතු කරන්න එපා" කියලා. හැබැයි, ඒ නිදහස අසීමිත විධියට අපි හැමෝම භුක්ති විඳින්න යෑමේ ප්‍රතිඵලයක් හැටියට අපට මේ තුන්වැනි රැල්ලට අද මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

අපි විපක්ෂයට මේ කාරණය කියන්න කැමැතියි. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් චෝදනා කළා, "ඕනෑ ගොනෙකුට යුද්ධ කරන්න බැහැ වාගේම ඕනෑම ගොනෙකුට වෙදකම් කරන්නත් බැහැ" කියලා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ පැවැති බෙදුම්වාදී ත්‍රස්තවාදය පරාජයට පත් කරන්න යන කොටත් විපක්ෂයක් හැටියට සම්පූර්ණයෙන්ම කකුලෙන් ඇද්දා මිසක් කිසිම සහයෝගයක් ලබා දුන්නේ නැහැ. හුඟක් අය අර වාගේ මෝඩ කථා, ගොන් කථා තමයි මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ. කාලය කෙටි නිසා මට ඒවා මතක් කරන්න වෙලාවක් නැහැ.

සෞඛ්‍ය ක්ෂේත්‍රයට නායකත්වය දෙන කැබිනට් අමාත්‍යවරිය නීතිඥවරියක්. කොවිඩ් රෝග පාලන රාජ්‍ය අමාත්‍යතුමිය විශේෂඥ වෛද්‍යවරියක්. දේශපාලනය පිළිබඳව පළපුරුද්දක් තිබෙන දේශපාලන නායකත්වයක්. ඒ වාගේම, ඖෂධ නියාමනය පිළිබඳව පත් කරලා ඉන්නේ, ඒ විෂය භාරව ඉන්නේ මහාචාර්යවරයෙක්. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාත් විශේෂඥ වෛද්‍යවරයෙක්. ඒ වාගේම සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාත් විශේෂඥ වෛද්‍යවරයෙක්. අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් සෞඛ්‍ය ක්ෂේත්‍රය අද භාර දීලා තිබෙන්නේ, අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශාල පරිණත දැනුමක් තිබෙන කණ්ඩායමකටය කියන එක ඒ කථාව කියපු මන්ත්‍රීතුමාට මේ වෙලාවේදී අපි මතක් කරලා දෙන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වගකීමෙන් රජය බැහැර වෙලා නැහැ. රජය කිසිසේත් ඒ වගකීම අත්හැරලා නැහැ. එක පැත්තකින් එන්නත් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනවා. ඒකට බාධා පැමිණ තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා, අද ඉන්දියාවේ ඇති වෙලා තිබෙන තත්ත්වය. ඉන්දියාවේ ඇති වෙලා තිබෙන තත්ත්වයත් එක්ක ඉන්දියාවෙන් බලාපොරොත්තු වුණු එන්නත ලබා ගැනීමේ ප්‍රායෝගික ගැටලු මතු වෙලා තිබෙනවා. අපට අවශ්‍ය එන්නත්වලින් සියයට 20ක් WHO එක ලබා දෙනවා කියලා ඔවුන් පැහැදිලිව සනාථ කළා. ලෝක සෞඛ්‍ය සංවිධානය අපට ලබා දීපු ඒ බලාපොරොත්තු ඉටු කිරීමට ඔවුන්ට ප්‍රායෝගික ගැටලු මතු වෙලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ යම් යම් ප්‍රමාද තිබුණත් විශේෂයෙන්ම මේ රටේ එන්නත ලබා දිය යුතු මිලියන 13ත්, 14ත් ප්‍රමාණයකට මේ වර්ෂයේ ඔක්තෝබර් මාසය වෙන්න කලින් ඒ එන්නත් ලබා දීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සම්පූර්ණ කරන්න රජය වගකීමෙන් කටයුතු කරනවාය කියන එක අපි බොහොම පැහැදිලිව මතක් කරනවා.

මේ වෙලාවේ ඉන්දුනීසියාවෙන් ලබා ගන්න පුළුවන් සහයෝගය පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්නවා. කොංගෝ රාජ්‍යයෙන් ලබා ගන්න පුළුවන් සහයෝගය පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්නවා. WHO එක හරහා ලබා ගන්න පුළුවන් සහයෝගය පිළිබඳව සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ චීනයෙන් ලබා දුන් එන්නත සම්බන්ධයෙන් වන තාක්ෂණික කමිටුව නිර්දේශය ලබා නොදීම නිසා තවමත් ඒ එන්නත දීමේ යම් ප්‍රමාදයක් තිබෙනවා. ඒකටත් අපි ප්‍රායෝගික විසඳුමක් සකසමින් ඉන්නවා. ඒ නිසා අපි ඒ එන්නත් ලබා දීමේ ක්‍රමවේදය බැහැර කරන්නේ නැහැ. සෞඛ්‍ය අංශ විසින් ක්‍රමානුකූලව සුදුසු පුද්ගලයන් සහ සුදුසු අංශ වෙනුවෙන් ඒ එන්නත ලබා දීමේ ක්‍රියාදාමය ක්‍රියාත්මක කරගෙන යනවා. එන්නත් ලබා දීම පිළිබඳව කථා කරනවා වාගේම, ICU ඇඳන් පිළිබඳව කථා කරනවා වාගේම, ventilators ගැන කථා කරනවා වාගේම, වෙනත් පහසුකම් සකසන්න කථා කරනවා වාගේම, අපි මේ පාර්ලිමේන්තුවේ සිටින මහජන නියෝජිතයන් හැටියට වැඩියෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ කාරණය තමයි මේ වයිරසය පැතිරීම නැවැත්වීම සම්බන්ධයෙන් අප ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද කියන කාරණය. ඒ පිළිබඳව තමයි අපි ඊළඟට වැඩියෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. ඒ නිසා අපි මාධ්‍යයේ උපරිම සහයෝගය අරගෙන පුළුවන් තරම් ජනතාව දැනුවත් කරනවා. අපි ස්තුතිවන්ත වෙනවා, අද අපේ රටේ රජයේ සහ පෞද්ගලික අංශයේ හැම මාධ්‍ය ආයතනයක්ම මෙය ජාතික වගකීමක් හැටියට අරගෙන COVID-19 පැරදවීම සඳහා උපරිම කාර්ය භාරයක් ඉටු කරමින්, ජනතාව දැනුවත් කිරීමේ කාර්ය භාරයේ නිරත වීම සම්බන්ධයෙන්. මේ කටයුත්ත ජනාධිපතිතුමාට විතරක් පවරලා හරි යන්නේ නැහැ. මේ කටයුත්ත අගමැතිතුමාට විතරක් පවරලා හරි යන්නේ නැහැ. මේ කටයුත්ත යුද හමුදාපතිතුමාට, නැත්නම් ආරක්ෂක අංශවලට, සෞඛ්‍ය අංශවලට විතරක් පවරලා හරි යන්නේ නැහැ. කළ යුතු වන්නේ, රටේ පුරවැසියන් හැටියට අප සියලුදෙනාම මේ වගකීම භර අරගෙන කටයුතු කිරීමයි. එහෙම කළොත් විතරයි අපට මේ කොරෝනා වයිරසයෙන් මිදුණු රටක් හැටියට ඉදිරියට ගමන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

අද ඒ ඒ ප්‍රදේශවල තිබෙනවා ප්‍රාදේශීය කොරෝනා මර්දන කමිටු. මම ඊයේ අපේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොරෝනා මර්දන කමිටුව කැඳෙව්වා. ප්‍රාදේශීය ලේකම්තුමිය, අලව්ව ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්, PHI මහත්වරු, ග්‍රාම නිලධාරින් ඇතුළු අනෙකුත් අදාළ නිලධාරින්, පොලීසිය ආදී වශයෙන් සියලුදෙනා කැඳවලා සාකච්ඡා කළා. ජාතික මට්ටමින් මේ මේ දේවල් කරන්න කියලා අපට චක්‍රලේඛ එනකල් බලාගෙන ඉන්න අවශ්‍ය නැහැ. අපේ ප්‍රදේශවලට ගැළපෙන වැඩ පිළිවෙළක් සාකච්ඡා කරලා ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයි. අපේ ප්‍රදේශයේ සතිපොළ වහනවාද, නැද්ද, වෙළෙඳසැල්වලට මොකද කරන්නේ, ජනතාව ගැවසෙන එක කොහොමද අඩු කරන්නේ, අවමඟුල් කටයුතුවලදී ඒ ජනතාවට ලබා දියයුතු උපදෙස් විධිමත් ආකාරයෙන් කොහොමද ලබා දෙන්නේ, පොදුවේ ජනතාව දැනුවත් කරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහජන නියෝජිතයන් හැටියට, ඡන්දයෙන් පත් වුණු අය හැටියට අපටත් වගකීමක් තිබෙනවා. ඒ නිසා ඒ වගකීම අපි ඉටු කරමු. විපක්ෂයට කවුරුවත් ආරාධනා කරලා මේක කරන්න කියලා පවරන්න අවශ්‍ය නැහැ. තමුන්නාන්සේලාත් මහජන ඡන්දයෙන් පත්වුණු අය හැටියට ඒ ප්‍රදේශවල ඒ ජනතාව සමඟ එකතුවෙලා, නිලධාරින් සමඟ එකතු වෙලා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ජනතාව සමඟ එකතු වෙලා, ආයතන සමඟ සම්බන්ධ වෙලා, ඕනෑම පක්ෂයක උදවියට මේ කටයුත්තට සම්බන්ධ වෙන්න පුළුවන්. ඒ නිසා විපක්ෂයට අපි කියනවා, මේ කාර්ය භාරයේදී කකුලෙන් අදලා, ආණ්ඩුව අපහසුතාවට පත් කරලා, ජනතාව අපහසුතාවට පත් කරලා, ජනතාවගේ මිනී කඳන් උඩින් දේශපාලනය කරන්න බලාපොරොත්තු වෙන්නේ නැතුව, සාධාරණ විධියට කටයුතු කරන්න, ලෝක වසංගතයක් ඇතිවෙලා තිබෙන වෙලාවක, ජාතික උවදුරක් සිදුවෙලා තිබෙන වෙලාවක, අප සියලුදෙනාම එකට අත්වැල් බැඳගෙන, රටේ ජනතාවත් එක්ක එකතු වෙලා අපේ ජනතාව මුදා ගැනීමට කටයුතු කරන්න ඕනෑ කියලා.

මා විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලනවා, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න කියලා. චීනය මේ තත්ත්වයෙන් මිදීම සඳහා ඒ ජනතාව පාවිච්චි කළ ක්‍රමවේද පිළිබඳව අවධානය යොමු කරන්න. කිහිපවතාවක් හුමාලය ඇල්ලීම, උණු වතුර පාවිච්චි කිරීම, ආයුර්වේදයේ තිබෙන විවිධ හුමාල වර්ග ඇල්ලීම තුළින් ශ්වසන පද්ධතියේ අවහිරතා මඟහරවා ගනිමින් ඔවුන් ආයුර්වේද ක්‍රමවේද ඔස්සේ ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. අපේ රටටත් ඒකට අවශ්‍ය පහසුකම් තිබෙනවා. අපේ රටට ස්වභාව ධර්මයෙන්ම ඒ දේවල් උරුම වෙලා තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ජනතාවගේ වැඩි අවධානයක් යොමු කරවීම සඳහා ආයුර්වේද ක්ෂේත්‍රයේ වෛද්‍යවරු කෙලින්ම කොවිඩ් මර්දනය සඳහා සම්බන්ධ කර ගැනීම වැදගත්. අපි දන්නා ආකාරයට ආයුර්වේද දෙපාර්තමේන්තුව, ආයුර්වේදයට සම්බන්ධ වෛද්‍යවරු කිසි කෙනෙක් දැනට ජාතික කොවිඩ් මර්දන කමිටුවට තවම සම්බන්ධ කරගෙන නැහැ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. එහෙම කෙනෙක් සම්බන්ධ කර ගෙන ඒ අයගේ අදහස් ලබා ගන්න කියලා. අපේ රටේ තිබෙන ආයුර්වේද රෝහල්වල සිටින වෛද්‍යවරුන්ගේ සහයෝගය ගන්න ඕනෑ වෙලාවක් තමයි මේ. ඒ සියලුදෙනාගේ සහයෝගය අරගෙන, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය තුළ මේ කටයුත්ත කිරීමයි වැදගත් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් එක කරුණක් කියන්න කැමතියි. විපක්ෂයේ මන්ත්‍රීවරු ඇහුවා, කොවිඩ් අරමුදලට මොකද වුණේ කියලා. කොවිඩ් අරමුදල නමින් අරමුදලක් ඇති කරගෙන ඒ අරමුදලේ මුදල් වංචා කළා, දූෂණය

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

කළා කියලා මතයක් සමාජගත කරන්නයි මේ සූදානම් වෙන්නේ. කොවිඩ් අරමුදලේ රුපියල් බිලියන 1.7ක් තිබෙන බව අපි බොහොම පැහැදිලිව කියනවා. එහි සභාපතිවරයා හැටියට පත් කරලා තිබෙන්නේ මහ බැංකුවේ අධිපතිතුමා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරි කණ්ඩායමක් තමයි ඒක පාලනය කරන්නේ. ඒ මුදල් පාවිච්චි කරන්නේ අපි අය වැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කර තිබෙන වැය ශීර්ෂවලට මුදල් වෙන් කරන්න නොවෙයි. අය වැයෙන් මුදල් වෙන් කරන්න බැරි අත්‍යවශ්‍ය සෞඛ්‍ය කාරණා වෙනුවෙන්, අවශ්‍යතා වෙනුවෙන් වියදම් කරන්න තමයි ඒ අරමුදල තිබෙන්නේ. ඒ අරමුදලේ තව මුදල් ඉතිරිව තිබෙනවා. ඒ මුදලුත් ඒ වෙනුවෙන්ම වෙන් කරනවා මිස, ජනාධිපතිතුමා ඒ අරමුදල හැදුවේ වංචා, දූෂණ කරන්න නොවෙයි. අපි සද්භාවයෙන් ඒ අරමුදල වියදම් කරනවාය කියන සහතිකය මම මේ සභාවට දෙන්න කැමතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.52]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே நாட்டின் தற்போதைய நிலைமை தொடர்பான சபை ஒத்திவைப்பு வேளை விவாதத்திலே கலந்துகொண்டு ஒருசில தகவல்களைப் பகிர்ந்துகொள்வதற்கு நேரம் வழங்கியதற்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இன்று உலகளாவிய ரீதியிலே இந்த கொவிட்-19 வைரஸ் பரவி எங்களுடைய நாட்டிலும் மூன்றாவது அலையாக விஸ்வரூபமெடுத்து மிகவும் ஒரு மோசமான நிலையை அடைந்துகொண்டிருக்கின்ற வேளையில் இந்தப் பாராளுமன்றத்திலே ஆளுந்தரப்பைச் சேர்ந்தவர்களும் எதிர்க்கட்சியைச் சேர்ந்தவர்களும் அது சம்பந்தமாக கருத்துக்களை முன்வைத்துக்கொண்டிருந்தாலும், இந்த வைரஸை வைத்துக்கொண்டு அரசியல் செய்கின்ற ஒரு நிலைப்பாட்டிலேதான் நாங்கள் இருக்கின்றோம். இந்தக் கொவிட்டினுடைய மூன்றாவது அலை நாடளாவிய ரீதியிலே மிகவும் வேகமாகப் பரவிக்கொண்டிருக்கின்ற ஒரு சூழல் இன்று காணப்படுகின்றது. குறிப்பாக, ஏப்பிரல் 29இல் 1,531 பேரும் அதனைத் தொடர்ந்து மே 3இல் 1,923 பேரும் கொவிட் தொற்றுக்குள்ளானவர்களென அடையாளம் காணப்பட்டிருக்கின்றார்கள். இந்த எண்ணிக்கை ஒவ்வொருநாளும் கூடிச் செல்வதைக் காணலாம். அதுமாத்திரமல்ல, ஒவ்வொரு நாளும் 10 -12 பேர் கொவிட் காரணமாக இறக்கின்ற ஒரு நிலை காணப்படுகின்றது. இந்த நிலை தொடருமாக இருந்தால், இந்த மாத இறுதியை அண்மிக்கின்ற சந்தர்ப்பத்திலே நாளொன்றுக்கு 50 அல்லது 60 மரணங்கள் ஏற்படக்கூடிய ஒரு நிலைக்கு எங்களுடைய நாடு தள்ளப்படும். ஆகையால், இதற்கான சரியான தீர்வை அரசாங்கம் முன்னெடுக்க வேண்டும்.

இன்று சில பிரதேசங்கள் முடக்கப்படுகின்றன. ஆனால், அடுத்தநாள் அந்தப் பிரதேசங்கள் மீண்டும் திறக்கப்படுகின்றன. முடக்கப்படுவதும் திறக்கப்படுவதுமான நிலைப்பாட்டை எதனைக் கருத்திற்கொண்டு முன்னெடுக்கின்றது என்பதனை இந்த அரசாங்கம் தெளிவுபடுத்த வேண்டும். அதுமாத்திரமல்ல, ஒவ்வொருநாளும் அதிகமான கொரோனா தொற்றாளர்கள் அடையாளம் காணப்படுவதன் காரணத்தினால் எங்களுடைய வைத்தியசாலைகளிலே இடவசதிகள், ஒட்சிசன் மற்றும் ஏனைய பராமரிப்பு விடயங்கள் என்பன திருப்திகரமானதாகக் காணப்படுகின்றனவா என்பதிலே நாங்கள் கவனம் செலுத்தவேண்டும். நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்திலே நேற்றுவரை 1,517 பேர் கொரோனாவினால் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். அவர்களில் 13 பேர் மரணமடைந்திருக்கின்றார்கள். சுகாதார வைத்திய அதிகாரி பிரிவின் ரீதியாகப் பார்க்கின்றபோது, திருகோணமலையிலே 641 பேரும் உப்புவெளியிலே 382 பேரும் கிண்ணியாவிலே 156 பேரும் குச்சவெளியிலே 49 பேரும் குறிஞ்சாங்கேணியிலே 38 பேரும் மூதூரிலே 99 பேரும் சேருவிலவிலே 18 பேரும் ஈச்சிலம்பற்றிலே ஒருவரும் கந்தளாயிலே 73 பேரும் தம்பலகாமத்திலே 25 பேரும் கோமரங்கடவலவிலே 27 பேரும் பதவிசிறிபுரவிலே 8 பேரும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இவ்வாறு தொற்றாளர்கள் இனங்காணப்படுகின்ற சந்தர்ப்பத்திலே திருகோணமலை மாவட்டத்திலிருக்கின்ற வைத்தியசாலைகள் இவர்களுக்கான சிகிச்சைகளை வழங்குகின்ற சூழலில் இருக்கின்றனவா என்பதிலும் கவனஞ்செலுத்த வேண்டிய ஒரு நிலைப்பாட்டில் நாங்கள் இருக்கின்றோம். இன்று திருகோணமலைப் பிரதேச செயலகப் பிரிவிலே 9 கிராம சேவகர் பிரிவுகள் முடக்கப்பட்டிருக்கின்றன. குறிப்பாக, பூம்புகார், உவர்மலை, அன்புவழிபுரம், கோவிலடி, மட்கோ, லிங்கநகர், காந்திநகர், காவட்டிகுடா, ஆண்டாங்குளம் ஆகிய பிரதேசங்கள் lock down செய்யப்பட்டிருக்கின்றன. இவ்வாறான பிரதேசங்கள் முடக்கப்பட்டிருப்பதால் அங்கிருக்கின்ற மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள். வாழ்வாதாரங்கள், கொடுப்பனவுகள் கிடைக்காத எத்தனையோ குடும்பங்கள் இந்தப் பகுதியிலே கஷ்டப்பட்டுக் கொண்டிருக்கின்றன. அரசாங்கம் என்ற ரீதியில் இவர்களையும் கவனிக்க வேண்டிய ஒரு நிலைப்பாடு காணப்படுகின்றது.

எங்களுடைய திருகோணமலை மாவட்டத்திலே கூடுதலானவர்கள் மீனவர்களாகக் காணப்படுகின்றார்கள். அவர்களுக்கு கொவிட்-19 இனுடைய தாக்கம் மாத்திரமல்ல, வேறு பல பிரச்சினைகளும் காணப்படுகின்றன. ஒரு வருடத்திலே 5 அல்லது 6 மாதங்கள்தான் அவர்களுக்கான மீன் பிடிக்கின்ற காலம் - season - ஆகும். அவர்களுக்கு இதுவரை அனுமதிப்பத்திரம் - licence - வழங்கப்படாத காரணத்தினால் கடற்படை, இராணுவம் போன்றவற்றால் அவர்கள் பெரும் தடைகளை எதிர்நோக்குகின்றார்கள். குறிப்பாக, கடலுக்குச் செல்கின்ற மீனவர்களுக்குத் தண்டப்பணம் விதிக்கப்படுகின்றது. அதனால், பணம் செலுத்தவேண்டிய ஒரு நிலைக்கு அவர்கள் தள்ளப்படுகின்றார்கள். அத்துடன், அவர்கள் பிடிக்கின்ற மீன்கள் முழுமையாகக் கைப்பற்றப்படுகின்றன. அவர்களுடைய மீன்பிடி உபகரணங்கள் சேதமாக்கப்படுகின்றன. இவ்வாறாக மிகவும் கஷ்டத்தின் மத்தியிலே எங்கள் பிரதேச மீனவர்கள் தங்களுடைய மீனவத் தொழிலைத் தொடர்கின்றார்கள். அத்துடன், இந்த கொவிட் தாக்கம் அவர்களுடைய நிலைமையை மேலும் பாதிப்படையச் செய்திருக்கின்றது. ஆகையால், தங்களுடைய மீனவத் தொழிலை மேற்கொள்வதற்கான உறுதிப்பத்திரத்தை வழங்குவதற்கு நடவடிக்கையை மேற்கொள்ளவேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

மேலும், நகர சபை மற்றும் பிரதேச சபைகளிலே பல வருடங்களாக தற்காலிக ஊழியர்களாக வேலை செய்கின்ற

வர்கள் இருக்கின்றார்கள். குறிப்பாக, 5-6 வருடங்களாக அவர்கள் தற்காலிகமாக அங்கு வேலை செய்து கொண்டிருக்கின்றார்கள். அவர்களுடைய பங்களிப்பும் மிகவும் முக்கியம் வாய்ந்த ஒன்றாகக் காணப்படுகின்றது. குறிப்பாக, இந்த கொரோனா காலப்பகுதிகளிலே அவர்களுடைய சேவை பாராட்டத்தக்கது. அதாவது, பிரதேசங்களை மிகவும் துப்பர வாக, தூய்மையாக வைத்துக்கொள்வதற்காக அவர்களால் எடுக்கப்படுகின்ற முயற்சி உண்மையிலே பாராட்டக்கூடிய ஒரு விடயமாக இருந்தாலும், இப்பொழுதும் அவர்கள் தற்காலிக ஊழியர்களாகவே இருந்துகொண்டிருக்கின்றார்கள். ஆகை யால், அவர்களை நிரந்தர ஊழியர்களாக்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்கவேண்டுமென்று இந்த இடத்திலே நான் கேட்டுக்கொள்கின்றேன்.

குறிப்பாக, எங்களுடைய அண்டை நாடான இந்தியாவைப் பார்க்கின்றபொழுது, எங்களுக்கு அச்சம் ஏற்படுகின்றது. நாங்கள் மிகவும் வேதனைப்படுகின்ற அளவுக்கு அங்கு நிலைமை காணப்படுகின்றது. ஏழை, பணக்காரர் அல்லது வசதியுள்ளவர், வசதியற்றவர் என்ற பாகுபாடின்றி அங்கு கொரோனாவினால் மக்கள் காவுகொள்ளப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். ஆகையால், எங்களுக்குள்ளே எத்தனை கருத்து வேறுபாடுகள் இருந்தாலும், நாங்கள் ஒன்றுபட்டு இந்த 3ஆவது அலையைக் கட்டுப்படுத்துவற்குச் சரியான நடைமுறைகளைக் கையாளவேண்டுமென்று அரசாங் கத்திடம் கேட்டு எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු ලෝකයම බරපතළ අර්බුදයකින්, විනාශයකින්, මහත් වූ වසංගත තත්ත්වයකින් පීඩා විඳින වේලාවේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විධියට මෙම විවාදයට සම්බන්ධ වෙන්න ලැබීම ගැන විශේෂයෙන්ම මා සතුටු වෙනවා. අපේ රටත් එම උවදුරට ලක් වෙමින් පවතින බව අප සියලුදෙනාම දන්නවා. ඒ වාගේම අපේ දේශීය වෛද්‍ය ක්‍රමය තුළ මෙවැනි බෝ වන රෝග සම්බන්ධයෙන් සහ බෝ නොවන රෝග සම්බන්ධයෙන් ප්‍රතිකාර කිරීම පිළිබඳව දීර්ඝ ඉතිහාසයක් තිබෙන බවත් අප කියන්නට ඕනෑ.

විශේෂයෙන්ම වසංගත රෝග සම්බන්ධයෙන් අපේ පාරම්පරික වෙදකමේ ප්‍රතිකර්ම තිබුණා. අප එය කිසිසේත්ම නොසලකා හැරිය යුතු නැහැ. අපි දන්නවා, වසංගත කියන නම හැදිලා තිබෙන්නේ 'ගත වසං' කියන සිංහල භාෂාමය පද එකට එකතු කර බව. ඈත කාලයේ දෙයියන්ගේ ලෙඩ හැදුණා කියලා කිව්වා. හැබැයි, ලෝකයට නිරෝධායන නීතිය හඳුන්වා දුන්නේ නැති කාලයක තමයි අපේ ඉතිහාසය තුළ මුතුන්-මිත්තන් නිරෝධායන ක්‍රම අනුගමනය කළේ. යම් වසංගත රෝගයකට ගොදුරු වෙච්ච, බෝ වන රෝගයකට ගොදුරු වෙච්ච, දෙයියන්ගේ ලෙඩක් හැදිච්ච ගෙදරක අය දින 14ක ස්වයං නිරෝධායනයකට යොමු වුණා. ගසක අතු ටිකක් එම නිවස ඉදිරිපිට එල්ලා එම නිවස ආරක්ෂා කරමින්, නිවැසියන් ආරක්ෂා වෙමින් රෝග නිවාරණය කිරීමේ ක්‍රමවේද අනුගමනය කළා. සියවස් ගණනාවකට පෙර, බටහිර වෛද්‍ය විද්‍යාවෙන් රෝග පිළිබඳව හඳුනා නොගත් කාලයේ තමයි පෙරදිග රටවල, අපේ රටේ මේ රෝග නිවාරණ ක්‍රම අනුගමනය කළේ. සමහර වේලාවට ඒ අනුගමනය කළ ක්‍රියාදාමයට වෙනත් නිර්වචන සපයන්න ඉඩකඩ තිබුණා.

මළ ගෙදරකට ගිහිල්ලා ආවාම කහ දියරෙන් එහෙම නැත්නම් දෙහි යුෂවලින්, දෙහි කොළවලින් පිරිසිදු වෙන්න කියලා අපේ මුතුන්-මිත්තන් කිව්වා. විෂබීජ කියන එක ලෝකය හඳුනා ගත්තේ නැති කාලයේ අපේ පැරැන්නෝ එයට "කිලි" කියන වචනය භාවිත කළා. ඒ නිසා කිලි අහු වෙනවාය කිව්වේ විෂබීජවලට හසු වෙනවාය කියන එකටයි. එහෙම තමයි එය අර්ථ නිරූපණය කළේ. ඒ ආකාරයට අපේ මුතුන් මිත්තන් ඒ වචන විද්‍යාත්මක ගැඹුරු අර්ථයකින් භාවිත කළා.

අපි දන්නවා, බටහිර යටත් විජිත අපේ රට පාලනය කළ කාල පරිච්ඡේදයේ අපේ ජීවන චක්‍රය, අපේ ආහාර පුරුදු සියල්ලම වෙනස් කරනු ලැබූ බව. සුද්දෝ වෙල්ලස්ස කැරැල්ලේදී මිනිසුන් දහස් ගණනක් මැරුවා. ඊට වඩා අපේ පාරම්පරික වෙදකම්, අපේ සිරිත්-විරිත්, අපේ ගුණධර්ම, අපේ ආහාර රටා සියල්ල විනාශයට පත් කළා; අභාවයට යැව්වා. ඒ නිසා අද ලෝකයම බෝ වන රෝගවලින් විතරක් නොවෙයි, බෝ නොවන රෝගවලින් පවා පීඩා විඳින බව අපි දන්නවා. පිළිකා රෝග වෙන්න පුළුවන්, හෘදයාබාධ වෙන්න පුළුවන්, දියවැඩියාව වෙන්න පුළුවන්, අධික රුධිර පීඩනය වෙන්න පුළුවන්, මේ කියන විවිධ ආකාරයේ රෝගාබාධවලින් දසදහස් ගණන් මිය යන තත්ත්වයට අද ලෝකය පරිවර්තනය වෙලා තිබෙනවා. ඒ නිසා අපේ පාරම්පරික මුතුන්-මිත්තන් අනුගමනය කළ ජීවන ක්‍රියාවලිය නැවත අනුගමනය කරන්න කියන එක තමයි අද ස්වභාව ධර්මය විසින් අපට කියා දෙන්නේ.

අපේ ආහාර පාන සංස්කෘතිය දිහා බලන්න. අද වනවිට කෑමට ගන්නා හැම ආහාරයකටම වස විස කලවම් කරනවා. අද වනවිට වස විස සියලු පලතුරු ආක්‍රමණය කර තිබෙනවා. මඤ්ඤොක්කා වාගේ අල වර්ගවලට වස විස දමන්නේ නැහැ කියලා අපි හිතුවා. ඒත් අද අල ගලවන්න ලෙහෙසි වෙන්න ඒවාට වස විස භාවිත කරනවා. සියලු පලතුරුවලට වස විස කලවම් කරනවා. ඔබ-අප දන්නා කොමඩු ගෙඩියට පවා විස එන්නත් කරනවා, රතු පැහැය ගන්න. ඉඳියප්ප, ආප්පවල ඉඳලා සියලු ආහාරවලට වස විස කලවම් කරනවා. අපට මේ ව්‍යාධියෙන් ගොඩ එන්න අවශ්‍යයි. බෝ වන රෝග වාගේම බෝ නොවන රෝගවලින් ගොඩ එන්න අවශ්‍යයි. ඒ නිසා පළිබෝධ නාශක, කෘමි නාශක, වස විස සහිත පොහොර භාවිතය සීමා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විශිෂ්ට තීරණයක් ගත්තා. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විධියට ඒ සම්බන්ධයෙන් අපේ ගෞරවය එතුමාට පිරිනමනවා.

මේ රටේ පාරම්පරික වෛද්‍ය ක්‍රමය, දේශීය වෛද්‍ය ක්‍රමය, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, ස්වභාව ධර්මය සහ බුදු දහමත් එක්ක මිශ්‍ර වෙලා ගොඩ නැඟුණු වෛද්‍ය ක්‍රම. පළිබෝධ නාශකවලින්, වස විසවලින් තොර රටක් නිර්මාණය කරමු කියලා අපි දීර්ඝ කාලයක් තිස්සේ කියා සිටියා. අපි දන්නවා, අපේ ජීවන රටාව හුරුවෙලා තිබුණේ කොහොමද කියලා. ආයුර්වේදයට අනුව, දේශීය වෙදකමට අනුව ජීවත් වෙන අයට ස්වයං ප්‍රතිශක්තිකරණ ශක්තිය තිබෙනවා.

[ගරු සිසිර ජයකොඩි මහතා ]

උදේ පාන්දර 4.30ට, 5.00ට බ්‍රහ්ම මුහුර්තයෙන් අවදි වෙන්නැයි කියා තිබෙනවා. ශ්වසන පද්ධතිය ඉතා හොඳින් ක්‍රියාත්මක වෙන්නේ එවිටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා රෝගය පෙණහලු ආශ්‍රිත රෝගී තත්ත්වයක්. ශ්වසන පද්ධතිය හරහායි ඒ වයිරසය පෙණහලුවලට යන්නේ. එයට විසඳුමක් ලෝකයේ පවතින හැම ආගමකම උතුම් ඉගැන්වීම් ක්‍රමවල තිබෙනවා. ඒ උතුම් ආගමික ඉගැන්වීම්වල තිබෙන නමස්කාර ක්‍රමවලින් ශ්වසන පද්ධතියට අවශ්‍ය ව්‍යායාම ලැබෙන අතර, ආධ්‍යාත්මික ඉගැන්වීම් ද ගැඹුරින් කියා දෙනවා. අපේ බෞද්ධ ඉගැන්වීම් ක්‍රමයක් තමයි ආනාපාන සති භාවනාව. ඒ වාගේම ඔබ සැම දන්නවා ඉන්දියාවේ භාවිත වන යෝග ව්‍යායාම ක්‍රම මූලාශ්‍ර කර ගත්ත යෝග සහ සූර්ය නමස්කාර ක්‍රම ශ්වසන පද්ධතිය ආශ්‍රිත ප්‍රතිකර්ම ක්‍රමයක් මෙන්ම ව්‍යායාම ක්‍රමයක් බව. ඒ වාගේම, මුස්ලිම් භක්තිකයන් විසින් අනුගමනය කරන නමස්කාර ක්‍රමයත් ශ්වසන පද්ධතියේ ක්‍රියාදාමයට ඉතා ඉවහල් වනවා. ඒ අනුව පෙනෙනවා, ඒ ආගමික නායකයෝ කියා දුන්නේ උදක්ම ආධ්‍යාත්මික ඉගැන්වීම් පමණක් නොවන බව. උදේ පාන්දර නැඟිට ශ්වසන පද්ධතිය පිරිසිදු කිරීමේ ව්‍යායාම ක්‍රමය තමයි ඔවුන් එක පැත්තකින් කියා දුන්නේ. මේ රෝගයට ප්‍රතිකර්මය එම ධර්ම මාර්ගවල පවතිනවා. 'උදේ පාන්දරම නැඟිටින්න; නැඟිට හිස් බඩ වතුර උගුරු 21ක් බොන්න; දිනකට අවම වශයෙන් වතුර ලීටරයක් බොන්න.' එයයි, කියා දුන්නේ. දැන් සමහර බටහිර වෛද්‍යවරු කලබල වෙලා තිබෙනවා, දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රම කොවිඩ් රෝගය සඳහා විසඳුම් ලබා දෙනවාට. වතුරවලින් සිරුර සෝදා ගන්න කියන කතන්දරයේ ඇති වැරැද්ද මොකක්ද, දෙයියනේ? ඒ විසඳුම දෙන්නේ, පෙරදිග වෛද්‍ය ක්‍රමයෙන්ද, බටහිර වෛද්‍ය ක්‍රමයෙන්ද, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන්ද, පාරම්පරික වෛද්‍ය ක්‍රමයෙන්ද කියන එක නොවෙයි වැදගත්. ඒ තමයි පුද්ගලයාගේ ජීවන චක්‍රය. ඒ නිසා, එම උපදෙස් ගන්න අපි සූදානම් වෙන්න ඕනෑ. අපේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ඒ උපදෙස් ටික දෙනවා.

ඊළඟට, කැඳ වර්ග පානය කිරීමත් ඉතාම හොඳ දෙයක්. ධාන්‍ය කැඳ වෙන්න පුළුවන්; කොළ කැඳ වෙන්න පුළුවන්; ඔසු පැන් වර්ග වෙන්න පුළුවන්, එම කැඳ වර්ග පානය කරන්න, ශාරීරික ව්‍යායාම කරන්න. ආධ්‍යාත්මික වශයෙන් ආගම ධර්මයට නැඹුරු වෙන්න. තරගකාරී ලෝකයෙන් යම්තාක් ඈත් වෙලා, සරල ජීවන චක්‍රයකට එන්න. ස්වාභාවික ආහාරවලට පුරුදු වෙන්න. මේ කථාව තමයි දේශීය වෛද්‍ය ක්‍රමයේ සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ තිබෙන්නේ. මේවාට විරුද්ධ වෙන්න පුළුවන් කාටද? කිසිවෙකුට හෝ මේවාට විරුද්ධ වෙන්න පුළුවන්ද? ඒ ක්‍රියාවලිය අනුගමනය කරන අපේ ආයුර්වේද ක්ෂේත්‍රයට මෙයට මැදිහත් වෙන්න අවශ්‍ය ඉඩකඩ, ආයුර්වේද වෛද්‍යවරු අද ඉල්ලා සිටිනවා. කොවිඩ් රෝගීන්ට ප්‍රතිකර්ම කිරීම සඳහා, ප්‍රජා වෛද්‍ය සේවය දැනටමත් ක්‍රියාත්මක කරන මහ පෙන්වීම -මාර්ගෝපදේශ- සඳහා අවශ්‍ය නිල බලය ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට, දේශීය වෛද්‍ය ක්‍රමයට ලබා දෙන්න කියන ඉල්ලීම අපි මේ ගරු සභාවේදී කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට උපාධිධාරි වෛද්‍යවරු ඉන්නවා. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතියේ අවුරුදු පහක් අධ්‍යාපනය ලබපු ආයුර්වේද වෛද්‍යවරු විශාල ප්‍රමාණයක් ඉන්නවා. අපට මධ්‍යම රජයේ ආයුර්වේද රෝහල් -පර්යේෂණ රෝහල්- 7ක් තිබෙනවා. ශික්ෂණ රෝහල් 4ක් තිබෙනවා. පළාත් රෝහල් 107ක් තිබෙනවා. අපට තිබෙන සමස්ත රෝහල් සංඛ්‍යාව 117යි. අද ඒ රෝහල් 117 ප්‍රයෝජනයට ගන්න පුළුවන්. එම රෝහල්වල තිබෙන ඇඳන් ප්‍රමාණය බැලුවොත්, මධ්‍යම රජයේ ආයුර්වේද රෝහල්වල ඇඳන් 763ක් තිබෙනවා. පළාත් ආයුර්වේද රෝහල්වල ඇඳන් 4,309ක් තිබෙනවා. එම රෝහල්වල තිබෙන සමස්ත ඇඳන් සංඛ්‍යාව 5,072යි. එහෙම නම්, අපේ ආයුර්වේද රෝහල්වල ඇඳන් තිබෙනවා. අපට උපාධිධාරි වෛද්‍යවරු ඉන්නවා. ඒ පාරම්පරික වෛද්‍යවරු නොවෙයි, උපාධිධාරි වෛද්‍යවරු. ලක්ෂ 40ක් වියදම් කරලා අවුරුදු 5ක් වැනි දීර්ඝ කාලයක් අධ්‍යාපනය ලබපු, පාරම්පරික දැනුම සහ ආයුර්වේද දැනුම මිශ්‍ර වෙච්ච උපාධිධාරි වෛද්‍යවරු. එවැනි වෛද්‍යවරු 1,022ක් රජයේ රෝහල්වල සේවය කරනවා. අපට ප්‍රජා වෛද්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරු 1,274ක් ඉන්නවා. ඒ අය අදත් නිවසෙන් නිවසට ගිහින් ඖෂධ ලබා දෙනවා. ඒ අනුව අපේ දේශීය වෛද්‍යවරු 2,296ක් රාජ්‍ය සේවයේ ඉන්නවා. මේ බරපතළ බෙදනීය තත්ත්වය හමුවේ අපේ ආයුර්වේද රෝහල් රෝගීන් හුවමාරු කරන -කොවිඩ් රෝගීන් එහා මෙහා කරන- මධ්‍යස්ථාන බවට නොවෙයි පත් විය යුත්තේ. මේ පිරිසිදු දැනුම් සම්භාරයක් සහිත අපේ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දැනුම අපේ රටෙන් කොවිඩ් රෝගය මර්දනය කර ගැනීම සඳහා උපයෝගී කර ගන්න කියා අපි ඉතා ඕනෑකමින් ඉල්ලනවා. එය ජාතික අවශ්‍යතාවක්. එම රෝහල් කොවිඩ් රෝගීන් එක්රැස් කරන මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යනවාට වඩා, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයත්, දේශීය වෛද්‍ය ක්‍රමයත් පළල් සේවාවක් ඉටු කරනවා.

මේ රටේ අවුරුදු දහස් ගණනක ඉතිහාසයේ සිට ගෙනීගෙන එන ඒ සංස්කෘතික සම්බන්ධතාත් එක්ක පරිණත වෙච්ච, පරිචයක් ලබපු උපාධිධාරි වෛද්‍යවරුන් සිටිනවා. ඒ අයගෙන් මා ඉල්ලනවා, ඔවුන්ගේ ඖෂධ මේ රෝගීන් වෙනුවෙන් ලබා දෙන්න කියලා.

මේ රටේ විවිධ තැන්වල ඇති වුණු විවිධ අර්බුදවලදී අපේ දේශීය ඖෂධ පානය කළා. අපි පානයන් ලබා දුන්නා. අපි 'සුවධරණි ඔසු පානය' හඳුන්වා දුන්නා. එහි අන්තර්ගත වුණේ ඉඟුරු, කොත්තමල්ලි, වෙනිවැල්ගැට, හීන් අරත්ත කියන ඒවා. ආයුර්වේද දෙපාර්තමේන්තුව මේ ද්‍රව්‍ය උපයෝගී කරගෙන සුවධරණි ඔසු පානය සකස් කරලා විවිධ කොවිඩ් පොකුරු මර්දනය කිරීමට උපයෝගී කර ගත්තා. ඒ, බන්ධනාගාර කොවිඩ් පොකුර වෙන්න පුළුවන්; සපුගස්කන්ද තෙල් සංස්ථා කොවිඩ් පොකුර වෙන්න පුළුවන්. අදත් රටපුරා නිරෝධායනය වන ජනතාවට අපේ ප්‍රජා වෛද්‍ය සේවයේ නිලධාරින් හරහා අපි ඒ ඖෂධ වර්ග ලබා දෙනවා. මේ ඖෂධ වර්ගවලට අමතරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටුව අනුමත කළ - ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ- ඖෂධ වර්ග - ගුලි, පෙති, චූර්ණ- අපි භාවිත කරනවා. අද ඒවා බල සම්පන්න වෙලා තිබෙනවා. අද සමහර බටහිර රෝහල්වල බෙහෙත් දෙනවාද? බටහිර වෛද්‍යවරු ලබා දෙන බෙහෙත් වර්ග මොනවාද? සමහරු හිනා වුණාට, අද රත කල්කය ලබා දෙනවා. සුදර්ශනය බටහිර රෝහල්වල කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කිරීමට පාවිච්චි කරනවා.

අද සමහර අය පැණි වර්ගයක් ගැන කියාගෙන මේ ගරු සභාවේ බරපතළ ලෙස හිනා වුණා. අපේ විපක්ෂ නායකතුමාත් මිථ්‍යාවේ උපත. උන්නැහේ අලින්ට මතුරන මන්තරේ ගැන කිය කියා හිටියේ. දැන් පැණි ගැන තමයි කථාව. මේ පැණිය කැගල්ලේ තැනැත්තෙකුගේ. ඒක මුල්වරට ඉදිරිපත් කළේ අපිද? නැහැ, බටහිර වෛද්‍යවරු තමයි ඉදිරිපත් කළේ. මේ පාර්ලිමේන්තුවේ පළමුවැනි දවසේ අපි ඒ පිළිබඳව කථා කරනකොට කිව්වා, චතුපිටිවල රෝහලේ වෛද්‍යවරු තිදෙනෙක් PCR වාර්තා අපේ අතට දීලා සියයට සියයක් කොවිඩ් රෝගය නැති අය; negative තත්ත්වයට පත් වුණු අය කියලා එතුමන්ලාට පෙන්නුවා කියලා. එය තමයි අපි ප්‍රකාශයට පත් කළේ. ඒ නිසා පැණිය ගැන අපි නොවෙයි මුලින්ම කිව්වේ. ඒක කිව්වේ බටහිර වෛද්‍යවරු.

බටහිර වෛද්‍යවරු විතරක් නොවෙයි, ඔය විරුද්ධ පාර්ශ්වය පැත්තේ සිටින නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා ඒ පැණිය පිළිබඳව සඳහන් කරමින්, ඒවා මිථ්‍යා මත කියලා බැන්නා. එතුමාට එහා පැත්තේ ඉඳගෙන සිටියේ දේව බලයෙන් ලෙඩ සුව කරන පාදිලි උන්නාන්සේ කෙනෙක්; දේව බලයෙන් ලෙඩ සුව කරන උන්නාන්සේ කෙනෙක් ළඟ හිටියේ. ඉතින්, ලෙඩ සුව කර ගන්න පුළුවන් නේ. හැබැයි, අපි මේ රටේ කිසිම සාම්ප්‍රදායික ධර්මයකට, ආගමකට, මතයකට, අදහසකට පහර දිය යුතු නැහැ.

අපේ සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය තුළ ගතයුතු ආදර්ශ රාශියක් තිබෙනවා. අපි ඉතාම ඕනෑකමින් ඒවා වටහා ගන්නවා. එම නිසා අපේ රටේ පාරම්පරික වෛද්‍යවරුන්ගේ අත් බෙහෙත් අදත් දසදහස් ගණනින් භාවිත වෙනවා. මේ රෝගය පොකුරු පිටින් නිර්මාණය වෙද්දී, ඉන් වැළකී ඉන්න සාම්ප්‍රදායික පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම් පද්ධතිය උපයෝගි කරගත් විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා. ඒවා අවතක්සේරු කරන්න කිසිසේත්ම අපි ලැහැස්ති නැහැ. විශේෂයෙන් අපි කියන්න ඕනෑ, එම පැණිය හඳුන්වා දී එය භාවිත කිරීමෙන් පසුව, රෝගී වූ අය සියයට සියයක් negative තත්ත්වයට -රෝගය නැති තැනැත්තන් බවට- පත් වුණාය කියන වතුපිටිවල රෝහලේ වෛද්‍යවරුන් තිදෙනෙකුගේ ප්‍රකාශයත් එක්කයි අපි කටයුතු කළේ. ඔබ සියලුදෙනා දන්නවා, පාරම්පරික හෝ දේශීය කියලා යම් බෙහෙතක් හඳුන්වා දුන්නොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට වගකීමක් තිබෙන බව. එක්කෝ අපි එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන්න ඕනෑ, "එපා, අපි මේක පිළිගන්නේ නැහැ" කියලා. එහෙම නැත්නම් අපි කරන්න ඕනෑ කුමක් ද? ඒ පිළිබඳව විද්‍යාත්මක පරීක්ෂණයක් කරන්න ඕනෑ කියලා සටන් කරන එකයි. ඉතින්, අපි තෝරා ගත්තේ දෙවැනි මාර්ගය. දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විධියට ඒ මාර්ගය තමයි මට තෝරා ගන්න තිබෙන්නේ. යම් පරීක්ෂණ සහ සාධක මත යමෙක් කියනවා නම්, "මේ ඖෂධය හොඳයි" කියලා, එහෙම නම් අපි ඊළඟට තෝරා ගන්න ඕනෑ ඒ ගැන පරීක්ෂණ කරන්න ඕනෑය කියන සාධකය මිසක්, එය ඉවත් කරන්න ඕනෑය කියන සාධකය නොවෙයි. ඉතින්, අපි පරීක්ෂණ කරන්න පටන් ගත්තා. ඒ නිසා ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි ජයග්‍රහණයක් ලැබුවා. ඒ ජයග්‍රහණය තමයි, දේශීය ඖෂධ බටහිර වෛද්‍ය විද්‍යාත්මක කරුණු මත, ඊට අදාළ සායනික ක්‍රම මත තහවුරු කර ගැනීමේ ජයග්‍රහණය. දේශීය ඖෂධ බටහිර සායනික ක්‍රමවලට ලක් කරන්නට ඉතිහාසයේ මෙතෙක් කලක් ඉඩ ලැබුණේ නැහැ. ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි ඒ අවසරය, ඒ අනුමැතිය ලබා ගත්තා. ඒ අනුව අපි මාර්ගෝපදේශ මාලාවක් සකස් කළා. මීට පස්සේ ඕනෑම දේශීය ඖෂධයක් එනවා නම්, විද්‍යාත්මක ලෙස සායනිකව අත්හදා බැලීමේ ඉඩ කඩ සහ අවසරය ලබා ගැනීමේ ක්‍රමවේදයක් අපි සකස් කළා. ඒ වාගේම කොවිඩ් රෝගීන්ට සහනයක් වෙනවා නම්, දේශීය ඖෂධ, ආයුර්වේද ඖෂධ, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද ඖෂධ, ආයුර්වේදයේ සූත්‍ර කමිටුව විසින් අනුමත කරන ලද ඖෂධ, අපේ ආයුර්වේද ඉගැන්වීම් මාලාව තුළ පොත්පත්වල අන්තර්ගත ඖෂධ ලබාදීමට අවශ්‍ය නිල අවසරය අපට ඕනෑය කියා අපි ඉල්ලීමක් කරනවා. අදත් ඒවා භාවිත වෙනවා.

අපි අහනවා, ඔය කියන එන්නත් අරගෙන සංකූලතා ඇතිවෙලා නැද්ද කියලා? මම බටහිර වෛද්‍ය විද්‍යාවට අපහාස කරන්නේ නැහැ. අපේ රටේ විතරක් නොවෙයි, ලෝකයේම ජනතාවට වැලඳුණු සමහර රෝග වැළැක්වීමට එන්නත් සමත්වෙලා තිබෙනවා කියන එක අපි එකහෙළා පිළිගන්නවා. හැබැයි, එන්නත් ලබාගෙන ඒ තුළින් සංකූලතා හටගත් සහ මිය ගිය අය පිළිබඳ වාර්තාවනුත් අපේ රටේත් තිබෙනවා, ලෝකයේත් තිබෙනවා. හැබැයි, අපේ දේශීය බෙහෙතක් පානය කරලා මිය ගිය අයෙක් ගැන සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන්ද? කාටහරි පුළුවන්ද, එවැනි සාක්ෂියක් ඉදිරිපත් කරන්න? ඇති වූ සංකූලතාවක් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන්ද? ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්ද. නමුත්, එහෙම නැහැ. එම නිසා බටහිර ගැති, අනුකාරකවාදී බුද්ධිමතුන් විසින් එක එක කථා කියනවා. මම දැක්කා, එක වෛද්‍යවරයෙක් කියනවා, "තෙල් බෙහෙත් ගාන්න, තෙල් බෙහෙත් පොවන්න ඉඩ දෙන්න බැහැ" කියලා. "ආයුර්වේදය" කියලා කියන්නේ තෙල් බෙහෙත් පොවන එකද? එය මහා දැනුම් සම්භාරයක්.

අපි උපන් දවසේ ඉඳලා අපේ අම්මලා තාත්තලා විෂබීජ නාශකයක් විධියට අපිව වෙනිවැල්ගැට වතුරින් නෑව්වා. නමුත්, සමහර වෛද්‍යවරුන් එහෙම නාවලා නැහැ. ඒකයි ලෙඩ හොඳවෙලා නැත්තේ. අපට කොත්තමල්ලි ටික පෙව්වා. ඒ ඉතිහාසය ගැන අපි දන්නවා. අපි ඉඟුරු කොත්තමල්ලි බිව්වේ. අපේ සමහර පාරම්පරික වෛද්‍යවරුන් දෙන උපදෙස ඒකයි; ආයුර්වේද වෛද්‍යවරුන් දෙන උපදේශය ඒකයි. එම නිසා, අපේ දේශීය වෛද්‍ය ක්‍රමය අලුත් පුනරුදයක් කරා ගමන් කරනවා කියා අපි විශ්වාස කරනවා. අපේ රටට අවශ්‍ය වන ඖෂධ වර්ග අපේ රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා වූ ක්‍රියාදාමයට අපි මැදිහත්වෙලා තිබෙනවා.

අපේ දේශීය වෙදකමට බලපාන බරපතළම ප්‍රශ්නයක් තමයි ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය කරන, ගුණාත්මකභාවයෙන් යුත් පිරිසිදු අමුද්‍රව්‍ය පිට රටින් ගෙන්වන එක. අපි රුපියල් මිලියන 1,000ක් වැය කරලා, ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය පිට රටින් ගෙන්වනවා. ඒක බරපතළ අපරාධයක්. එම නිසා අපි මේ වෙනකොට "සුව ධරණී" ඔසු වගා වැඩසටහන ආරම්භ කරලා තිබෙනවා. ඊයේ අපි දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයත් සමඟ ඒකාබද්ධව ලංකාවේ පිරිවෙන් පද්ධතිය කේන්ද්‍ර කරගෙන ඔසු උයන් නිර්මාණය කිරීමේ ජාතික වැඩසටහනක් ආරම්භ කළා. ඒ අනුව අපේ වෛද්‍ය ක්‍රමය සඳහා අවශ්‍ය ඖෂධ වර්ග දේශීයව වගා කිරීමේ වැඩසටහන අපි ආරම්භ කරලා තිබෙනවා. එසේ වගා කරන ඖෂධ වර්ග මිලදී ගන්න, බෙදා හරින සහ විකුණන ක්‍රමවේදයක් නොමැති බවත් අපි හඳුනාගෙන තිබෙනවා. එම නිසා ආයුර්වේද ඖෂධ සංස්ථාවට අයත් නාවින්න ආයුර්වේද පර්යේෂණායතන සංකීර්ණයම ආර්ථික ඖෂධ කලාපයක් බවට පරිවර්තනය කරලා මිලදී ගැනීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ වැඩ පිළිවෙළකට අත ගහන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපේ ප්‍රජා වෛද්‍ය සේවයේ නිලධාරින් හරහා, "සුව ධරණී ගුඩුච්චාදී චූර්ණය" ඇතුළු දේශීය ඖෂධ ගෙයින් ගෙට බෙදා දීමේ වැඩ පිළිවෙළ දැන් අපි ආරම්භ කරලා තිබෙනවා. නිරෝධායන මධ්‍යස්ථානවලට ඒ බෙහෙත් බෙදා හරින ආයුර්වේද ක්ෂේත්‍රයේ සියලු වෛද්‍යවරුන්ට අපේ ගෞරවය පිරිනමන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අපේ රෝහල් පද්ධතිය තුළ වාගේම, විශේෂයෙන් අපේ පාරම්පරික වෛද්‍යවරුන් ඖෂධ වර්ග රාශියක් නිර්මාණය කරමින් ඉන්නවා. අපේ රටේ සාම්ප්‍රදායිකව පැවත එන දැනුම් පද්ධතිය ඉදිරියට ගෙන යමින්, මේ වසංගත රෝග තත්ත්වයෙන් අපේ රට මුදා ගැනීමේ අධ්‍යාත්මික මහා ප්‍රාර්ථනයත් කැටි කරගෙන, රුපියලක් අතට ගන්නේ නැතිව, නිස්සරණාධ්‍යාශයෙන් ලෝක සත්වයන් සුවපත් කිරීමේ අරමුණින් කටයුතු කරන, උසස් අධ්‍යාත්මයන් සහිත දේශීය වෛද්‍යවරුන්, පාරම්පරික වෛද්‍යවරුන් අපට ඉන්නවා. ඒ අය මුදලට විකිණෙන දොස්තරලා නොවෙයි. මේවා ශාප කරමින් කියන කතන්දර නොවෙයි. ඒ පාරම්පරික දැනුම් පද්ධතිය සහ ඒ අධ්‍යාත්මික ගුණධර්ම පද්ධතිය මත පදනම් වුණු ඒ වෛද්‍යවරුන් -අපේ වෙදදුරන්- විසින් මේ රට සුවපත් කරමින් යනවා. අපි අදත්,

[ගරු සිසිර ජයකොඩි මහතා]

හෙටත් විශ්වාස කරනවා, ඒ පාරම්පරික වෛද්‍ය ක්‍රමයට, ඒ දේශීය දැනුම් පද්ධතියට මේ රෝගය සුවපත් කරන්නට දායකත්වයක් සපයන්න පුළුවන් කියලා. ඒ දායකත්වය ආයුර්වේද දෙපාර්තමේන්තුව විධියටත්, දේශීය වෙදකම් ප්‍රවර්ධන විෂය භාර රාජ්‍ය අමාත්‍යාංශය විධියටත් අපි ඉටු කරනවා කියන කාරණය මතක් කරමින්, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.21]

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන හිටපු අමාත්‍ය, දන්ත වෛද්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් එකතු කිරීමට ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා.

චීනයේ වූහාන් නගරයෙන් ආරම්භවෙලා අද ලෝකය පුරාම ව්‍යාප්ත වුණු කොවිඩ්-19 වසංගතය අපේ රටට පමණක් බලපා තිබෙන වසංගතයක් නොවෙයි. එම වසංගතය ගෝලීය වශයෙන් ලෝකය පුරාම ව්‍යාප්තවෙලා තිබෙන එකක්. විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටක් විධියට අපි එම වසංගතයට මුහුණ දීමේදී අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ රජය විසින් මේ වන විට විශාල වැඩ කොටසක් ඉෂ්ට සිද්ධ කරමින් සිටිනවා. අපේ ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා පැවසූ පරිදි, අපි මේ අවස්ථාවේදී පාරම්පරික හා දේශීය වෛද්‍ය ක්‍රම භාවිතයට ගත යුතුයි කියන ස්ථාවරයේ ඉඳලා තමයි මමත් කථා කරන්නේ.

අපි දන්නවා, අපට හැදෙන හැම රෝගයකටම මුල් වෙන්නේ අපේ ශරීරයේ ප්‍රතිශක්තිකරණය බව. ප්‍රතිශක්තිකරණය නැති වුණාම අපේ ශරීරය තුළට ඕනෑම රෝගයකට ඇතුළු වෙන්නට පුළුවන්. අද අපි ප්‍රතිශක්තිකරණයක් නැති ජාතියක් බවට පත්වෙලා තිබෙනවා. අපි දන්නවා, ඉස්සර අපේ කිරිඅම්මා තමයි ගෙදර හොඳම වෛද්‍යවරිය වුණේ. ඒ වාගේම ඉස්සර උණක්, කැස්සක්, හෙම්බිරිස්සාවක් හැදුණාම අපි දොස්තර මහත්මයා හමුවෙන්න දුවගෙන ගියේ නැහැ. ඒ වෙලාවේ කිරිඅම්මා තමයි දරුවාගේ රෝග නිශ්චය කරන වෛද්‍යවරිය වුණේ. දරුවාට අහවල් ගහේ පොතු ටික තම්බලා දීලා, රෝගයට වෙදකම් කරන්න කියලා එදා ගෙදර හිටපු කිරිඅම්මා තමයි උපදෙස් දුන්නේ. අපිට පාරම්පරිකව උරුම වුණු දේශීය වෛද්‍ය ඥානය අද වනකොට නැති වීම මෙන්න මේ වසංගතයට බලපා තිබෙනවාය කියන එකත් අපි සිහිපත් කරනවා.

අද විපක්ෂය දෙකොන පටලවාගෙන ඉන්නවාය කියලා මම හිතනවා. මේ ගරු සභාවේදී කියපු විවිධ කරුණු කාරණා සම්බන්ධයෙන් බැලුවාම අපිට පෙනෙනවා, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යවරිය විධියට කටයුතු කරන අපේ ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය -එතුමිය වෘත්තීයෙන් නීතිඥවරියක්.- රෝගයට ප්‍රායෝගිකව මුහුණ දුන්නු එකම අමාත්‍යවරිය බව. කොරෝනා වසංගතයේ භයානකකම එතුමිය දන්නවා. එතුමිය වසංගත තත්ත්වය තුරන් කිරීමට විශාල කැප කිරීමක් කරනවා, ඒ සඳහා විශාල වෙහෙස මහන්සියක් දරනවා. විපක්ෂය බොහෝ වෙලාවට අපේ දේශීයත්වයට නිගරු කරන බව අපි දන්නවා. එතුමන්ලා දේශීයත්වය සමච්චලයට ලක් කරනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා "ඕනෑම ගොනෙකුට යුද්ධ කරන්න පුළුවන්" කියලා එදා ප්‍රකාශ කළ බව අපි දන්නවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මෙම ගරු සභාවේ හිටියා නම් හොඳයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා එදා කළ ප්‍රකාශය අනුව මෙතුමාත් අද "ඕනෑ ගොනෙකුට බෙහෙත් දෙන්නත් බැහැ" කියලා කිව්වා. ඒක බරපතළ ප්‍රකාශයක්. ඒ වාගේම විපක්ෂ නායකතුමා කිව්ව කාරණයක් සම්බන්ධයෙනුත් අපි මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. කොරෝනා රෝගය ලංකාවේ ව්‍යාප්ත වේගෙන යනකොට එතුමා රෝගයට බෙහෙත් නියම කළා. Plaquenil කියන ඖෂධයක් සම්බන්ධයෙන් එතුමා කථා කළා.

මේ අවස්ථාවේ ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා ගරු සභාවේ හිටියා නම් හොඳයි. එතුමා ඒ වෙලාවේ රෝගයට Rapid Antigen Test එක හොඳයි කියලා කිව්වා. ඒ වාගේ විහිළු සපයන විපක්ෂයක් තමයි මේ ඉන්නේ. දෙගොල්ලන්ටම මඩ ගහ ගැනීම, අවලාද නඟන එක නොවෙයි අද සිදු වෙන්න ඕනෑ කාර්ය භාරය වන්නේ. ජාතික කර්තව්‍යයට අවශ්‍ය සහයෝගය විපක්ෂයක් විධියට ලබා දීම තමයි මේ මොහොතේ විය යුත්තේ කියන කාරණය සිහිපත් කරනවා. රෝගය වැළඳුණොත් බොහෝ වෙලාවට නිරෝධායන මධ්‍යස්ථානවලට ඒ රෝගීන් යොමු කරනවා. නමුත් ලෝකයේ කොහේවත් නැති සංස්කෘතියක් අපි නිර්මාණය කළා. ත්‍රිවිධ හමුදාව එකතුවෙලා, රෝගයට ගොදුරු වෙච්ච පිරිස් නිරෝධායන මධ්‍යස්ථානවලට අරගෙන යනවා. එලෙස නිරෝධායන කටයුතු කිරීමේ සංස්කෘතියක් ලෝකයේ කොහේවත් රටක නිර්මාණය වුණේ නැහැ. රෝගය ව්‍යාප්ත වේගෙන යන කොට සෞඛ්‍ය අංශ, ත්‍රිවිධ හමුදාව අපිට විශාල සහයෝගයක් ලබා දුන්නාය කියා මම හිතනවා. මේ තත්ත්වයෙන් රෝගය පාලනය කරන්නට හැකියාව ලැබුණේ අතිගරු ජනාධිපතිතුමා ගත්ත ඒ ව්‍යායාමය නිසාය කියා මම හිතනවා. ඊට අවශ්‍ය සහයෝගය එතුමා ලබා දුන්නු නිසා තමයි පැහැදිලිවම මේ ආකාරයෙන් වසංගතය පාලනය කරන්න හැකියාව ලැබුණේ.

මම කුලියාපිටිය ආසනයේ තමයි ජීවත් වෙන්නේ. අද කුලියාපිටිය ආසනයෙන් රෝගීන් 628ක් වාර්තා වනවා. මේ වනකොට 300ක වාගේ සංඛ්‍යාවක් නිරෝධායන මධ්‍යස්ථාන සඳහා යොමු කරලා තිබෙනවා. හත් දෙනෙකු මිය ගිහිල්ලා තිබෙනවා. ආණ්ඩුවට මොන තරම් බාධක තිබුණත් වසංගතය පාලනය කරන ආකාරය බලන්න. අද ලෝකයේම ආර්ථිකය සුන්නද්දූලි වෙලා තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබියදී නිරෝධායනය කරන පවුල්වලට රුපියල් 10,000ක බඩු මල්ලක් ගෙදරටම ගිහිල්ලා දෙනවා. මේවා කරන්න පුළුවන් වැඩ නොවෙයි. විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමායි, විපක්ෂ නඩයයි බලයේ හිටියා නම් මේ කටයුතු කරන්න පුළුවන්ද? කරන්න බැහැ. එතුමන්ලා බලයේ හිටියා නම් මැරිච්ච මිනිස්සුන්ගේ සොහොන්වල ගසුත් පැළ වෙලා තිබෙන්න පුළුවන්. නමුත් අද අපි රජයක් විධියට වසංගතයට මුහුණ දෙමින් සිටිනවා. විශේෂයෙන්ම 98,000ක් වාගේ සංඛ්‍යාවක් සුවවෙලා ගෙදර ගිහිල්ලා තිබෙන බව අපි දන්නවා. 112,000ක වාගේ සංඛ්‍යාවක් රෝගයට ගොදුරු වෙලා ඉන්නවා. රෝගය මර්දනය කරන්න ශක්තිය ලැබුණේ රජයක් විධියට ගත් ක්‍රියාමාර්ග නිසායි.

චීනය දිහා බලන්න. චීනය තමයි කොරෝනා වසංගතය පටන් ගත්ත රට වන්නේ. චීනය වසංගතය පාලනය කරලා තිබෙන ආකාරය සම්බන්ධයෙන් පසු විපරමක් කරන්න ඕනෑ. සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ වීඩියෝවක් සංසරණය වෙනවා මම දැක්කා. ඒ රටේ ජීවත් වන ලංකාවේ පුරවැසියෙක් තමයි එම වීඩියෝව සමාජ මාධ්‍යවලට නිකුත් කරලා තිබෙන්නේ. ඒ වීඩියෝව අනුව චීනයේ සෑම ගෙදරක්ම අද අනිවාර්යයෙන්ම තුන් වතාවක් දුම් අල්ලන්න හුරුවෙලා තිබෙනවා. මේවා ඉතිහාසයේ ඉඳලා අපි කරපු දේවල්. හුමාලය අල්ලන්න වාගේම දවසකට හය වතාවක් උණුසුම් පානයක් ගන්නත් ඔවුන් පුරුදු වෙලා ඉන්නවා. මේවා

එච්චර අමාරු කාර්යය නොවෙයි. අද රෝහල්ගත නොවන තැනට චීන ජාතීන් අරගෙන ගිහිල්ලා තිබෙනවා. අපි චීනය උදාහරණයට ගන්න ඕනෑ. චීනය ඉතා සාර්ථකව කොරෝනා වසංගතය මැඩ පවත්වලා තිබෙනවා. රෝගය vaccine එක ලබා දීලා පාලනය කරන්න පුළුවන් දෙයක් නොවන බව අපි දන්නවා. මේ වන විට විපක්ෂය විවිධාකාරයේ දේවල් - vaccine එක ගෙනාවේ නැහැ. Vaccine එක ගැහුවේ නැහැ. පළමුවැනි එකෙන් නැවැත්වුවා - කියනවා. ඒ කාරණා සම්බන්ධව මගේ අවධානය යොමු කරන්නේ නැහැ.

ඔබතුමාට තව එක කාරණයක් කියලා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපිට මතකයි නේ, 2010 වර්ෂයේ සිඩාලේප වෙද මහත්තයා ඡන්දයට ඉදිරිපත් වුණා. සිඩාලේප හැම ගෙදරකම තිබෙනවා. සිඩාලේප හරි ප්‍රසිද්ධයි නේ. සිඩාලේප වෙද මහත්තයා හිතුවා, රටේ මිනිස්සු හැමෝම ඔහුට ඡන්දය දෙයි කියලා. 2010දී එතුමා ඡන්දයට ඉදිරිපත් වෙලා අන්තිමට ඔහු තබපු ඇපයත් රාජ සන්තක වුණා. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් එහෙම හිතාගෙන ඉන්නවා නම්, ඒ එතුමාට වැරදිලා.

ඉස්සර රජ වාසලේ සට්ටම්බි රාළ කියලා කෙනෙක් සිටි බව අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සට්ටම්බි රාළගේ කාර්ය භාරය තමයි, වැසිකිළියට ගිහින් ආවාම රජ්ජුරුවන්ගේ සට්ටම් දෙක ලෙව කාලා බලනවා ඒ වැඩේ හරියට කරලා තිබෙනවාද කියලා. විපක්ෂය විධියට පෙනී සිටිමින් අද මේ සමහර අය කරන්නේත් එම කාර්ය භාරය තමයි. අද කරන මේ හැම කටයුත්තකම වගකීම රජය සහ විපක්ෂය යන අපි දෙකොටසටම තිබෙනවා. ජනාධිපතිතුමාට බැණ-බැණ, මේ ආණ්ඩුවට දොස් කිය -කියා ඉන්නේ නැතිව මේ වැඩ පිළිවෙළ ජනතාව අතරට ගෙන ගොස් ජනතාව දැනුවත් කරන්න. සෞඛ්‍ය ඇමතිතුමියට දොස් කිව්වාට වැඩක් නැහැ. වෙන කාටවත් දොස් කිව්වාට වැඩකුත් නැහැ. මේ ගැන ජනතාව දැනුවත් කරන්න ඕනෑ. විනයගරුක ජාතියක් බිහි කිරීමේ වගකීම ගෞරවනීය පාර්ලිමේන්තුවට තිබෙනවා. ඒ වෙනුවෙන් ඒක රාශි වෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා.4.29]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් ව්‍යසනය ගැන පාර්ලිමේන්තුවේ කථා කරන මේ අවස්ථාවේ අපි මෙතැන ජනෙල් දොරවල් ඇරගෙන කථා කරනවා. හැබැයි, කොළඹ AC කාමර අස්සේ හිරවෙලා වැඩ කරන දරුවෝ සිටින office කීයක් තිබෙනවාද දන්නේ නැහැ. අපිට මෙතැන දොරවල් ඇරගෙන කථා කරන්න අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ දරුවන්ට මේ අවස්ථාව තිබෙනවාද දන්නේ නැහැ. එක එක අය එක් එක් රැලි ගැන අනම් මනම් කියනවා. මම දැන් අහගෙන සිටියා; කොවිඩ් පළමුවැනි රැල්ල, දෙවැනි රැල්ල ගැන කිව්වා. මම දන්නා විධියට ලංකාවේ කොවිඩ් රැලි 3ක් තිබිලා තිබෙනවා. ඊට කලින් මම කියනවා, මේ මැරුණු හත්සිය ගණන ගැන වගකීම මේ ආණ්ඩුව භාරගන්න ඕනෑ බව. ජනාධිපති කොමිසමක් පත් කරලා, පාස්කු ප්‍රහාරය - Easter Sunday attack එක - ගැන සොයා බලනවා වාගේ, මේ හත්සිය ගණන මැරෙන්න කවුද හේතු වුණේ කියා සොයා බලා දඬුවම් දෙන්න ඕනෑ කියන එකත් මම මුලින්ම කියන්න ඕනෑ. මොකද, 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය පවත්වන්න තිබුණු හදිසිය නිසා තමයි පළමුවැනි කොවිඩ් රැල්ල ඇති වුණේ. ජනවාරි මාසයේදී අපේ රටේ පළමුවැනි කොවිඩ් රෝගියා හමුවුණු වේලාවේ සිට මාර්තු මාසයේ 19 වැනිදා පාර්ලිමේන්තු මහ මැතිවරණයේ nomination lists භාර ගන්නා අන්තිම දවස වනතුරු රට lock down කරන්නේ නැතිව ඇරගෙන තියාගෙන සිටියා. මොකද, ඒ දවස්වල රට lock down කරලා ඒ nomination දෙන දවස පරක්කු වුණා නම්, සමහරවිට පොහොට්ටුවත් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සන්ධානය කැඩෙන්නත් ඉඩ තිබුණා කියා අපට ඒ දවස්වල ආරංචි ලැබුණා. ඇත්තටම කොවිඩ් පළමුවැනි රැල්ල ඇති වෙන්න හේතුවත් මේ ආණ්ඩුවම තමයි. මොකද, ඒ දවස්වල රට lock down කරලා තිබුණා නම්, රෝගය පැතිරෙන්න ඉඩක් නැතිවෙන්න තිබුණා. මොකද, ඒ පළමුවැනි රැල්ලෙන් තමයි ලංකාවේ ආර්ථිකයත් කඩා වැටුණේ. ආර්ථිකය කඩා වැටෙන්නේ නැති තත්ත්වයකට කොවිඩ් පළමුවැනි රැල්ල එන්න දෙන්නේ නැතිව ඒ දවස්වල රට lock down කරන්න තිබුණා.

කොවිඩ් වසංගතය නිසා නවසීලන්තයේ නම් මිනිස්සු 26 දෙනායි මැරිලා තිබෙන්නේ. ඔවුන් ඊයේ, පෙරේදා 50,000ක පමණ ජනතාවක් එක්ක ලොකු සාදයකුත් පවත්වා තිබුණා. ඔබතුමා හිනා වෙවී ඉන්න ගරු මන්ත්‍රීතුමා. හිනා වෙනවාට ඔබතුමන්ලාටත් ඔය ජනාධිපති කොමිෂන් සභාවලට යන්න වෙයි. ඒ වාගේම තමයි කොවිඩ් දෙවැනි රැල්ලත්. ඒ දෙවැනි රැල්ල ඇති වුණේ ඔක්තෝබර් මාසයේ. මාර්තු සිට ඔක්තෝබර් වනතුරු කොවිඩ් නිසා මිනිස්සු 20ක්, 30ක් වාගේ සංඛ්‍යාවක් තමයි මැරිලා තිබුණේ. කොවිඩ් දෙවැනි රැල්ල ඇති වුණේ ඔක්තෝබර් මාසයේ. ඒ දෙවැනි රැල්ලට මම කියන නම තමයි, "විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ රැල්ල" කියන එක. විසිවන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න, ඒ දවස්වල ආණ්ඩුව අස්සේ තිබුණු කචල් වහගන්න, මිනුවන්ගොඩ කොවිඩ් පොකුරක් තිබෙනවා කියලා දැන දැන රට lock down කරන්න කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ නැතිව මිනිස්සු ලෙඩ කෙරෙව්වා. ඒ වෙද්දී මිනිස්සු 500ක් විතර මැරිලා ඉවරයි.

ඊට පස්සේ තුන්වැනි එක තමයි Port City රැල්ල. [බාධා කිරීමක්] කෑ ගහන්නේ නැතිව ඉන්න මන්ත්‍රීතුමා. ඔබතුමාට වෙලාව ඕනෑ නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාගෙන් ඉල්ලාගන්න. [බාධා කිරීමක්] ඒක තමයි, ඔබතුමාට තේරෙන්නේ නැහැ. තුන්වැනි රැල්ල තමයි Port City රැල්ල කියන්නේ. මම දකින විධියට අද දවසේ පාර්ලිමේන්තුව රැස්වෙලා තිබෙන්නේ විපක්ෂයේ අය කැමති නිසාවත්, ආණ්ඩු පක්ෂයේ අයට කොවිඩ් ගැන discussion එකක් කරන්නවත් නොවෙයි. හෙට දවසේදී Colombo Port City Economic Commission Bill එකේ Second Reading එක ගන්න ඕනෑ නිසා තමයි, අද දවසේ කොවිඩ් ගැන කල් තැබීමේ විවාදය දාලා, හෙට දවසේ ඒක දැම්මේ. මම හිතන විධියට අද ජනාධිපතිතුමාගෙන් හොඳ බැණුමක් අහගන්නවා. මොකද, හෙට Colombo Port City Economic Commission Bill එක ගන්න බැහැ කියලා දන්නවා නම්, මේ සතියේ පාර්ලිමේන්තුව පැයක් විතර රැස් කරලා සති දෙකකට කල් තියලා, Colombo Port City Economic Commission Bill සම්මත කරන්න පුළුවන් වෙලාවේ නැවත පාර්ලිමේන්තුව රැස් කරන්න පුළුවන් වාතාවරණයක් හදාගන්න තිබුණා. අද ජනාධිපතිතුමාගෙන් කවුරුන් හෝ හොඳ බැණුමක් අහගන්නවා. Supreme Court එකේ නඩුව ඉවරද, නැද්ද කියලා හොයලා බලන්නේ නැතිව හෙට Colombo Port City Economic Commission Bill එක ගන්නවා කිව්වා. නමුත්, අද කොවිඩ් ගැන කල් තැබීමේ විවාදය පවත්වලා,

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

ආපසු හෙටත් කොවිඩ් ගැන කථා කරන්න, extend කරලා තිබෙනවා. [බාධා කිරීමක්] අනේ සෞඛ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියගේ වෙලාවෙන් හෝ මෙතුමාට වෙලාව දෙන්න. නිතරම බාධා කරනවා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාගේ නම සඳහන් කරලා මෙතුමා පොඩ්ඩක් එළියටවත් දමන්න.

අපි ආණ්ඩුවේ කරන සංවර්ධන වැඩ පිළිවෙළ ගැන කථා කරන්න ඕනෑ. මට ඊයේ-පෙරේදා UDA එකෙන් කථා කළා. කථා කරලා කිව්වා, "ඔබතුමන්ලාගේ නගරය ලස්සනට සංවර්ධනය කරන්න පුළුවන් project proposals මොනවා හෝ තිබෙනවා නම් අපිට කියන්න" කියලා. මේ රටේ ණය ගෙවා ගන්න බැරිව ජුනි හෝ ජුලි මාසයේ ගත්ත පළමුවෙනි ණය වාරිකය default වෙන්න යනවා. රටේ beautification කරන්න යනවා. මේවා අසත්‍යය. රටේ ICU beds නැහැ. රටේ ඔක්සිජන් නැති ප්‍රශ්න තිබෙනවා. ඔබතුමන්ලාගේ ජනප්‍රියත්වය හදා ගන්න එක එක සංවර්ධන වැඩ පිළිවෙළවල් කරලා ගමේ මනුස්සයා රවටන්න යන්නේ නැතිව, ඇත්තටම ලංකාවට අවශ්‍ය දේ කරන්න. [බාධා කිරීමක්] අපේ ප්‍රදේශයේ ප්‍රශ්න තිබෙනවා. මම දැන් පොඩ්ඩක් දෙමළ භාෂාවෙන් කථා කරන්නම්. [බාධා කිරීමක්] එතකොටවත් බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමා.

அரசாங்கத்துடன் இணைந்திருக்கும் கிழக்கு மாகாணத் தைச் சேர்ந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இன்னமும் தன்னுடைய உரையை ஆற்றாமல் இச்சபைக்கு வெளியே காத்திருக்கிறார். நான் உரையற்றி முடியும்வரையா அப்படி அவர் காத்திருக்கிறார் என்ற ஒரு சந்தோகம் எனக்கு இருக்கின்றது. எனக்குப் பிறகு அவர் உரையாற்றுவாரென நான் நம்புகிறேன்.

மாகாண சபைக்கான தேர்தல் நடக்குமா? நடக்காதா? என்று தெரியாத ஒரு நிலைமை காணப்படுகின்றபோதும் அரசாங்கத்துடன் ஒட்டியிருக்கும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த தமிழ், முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் - 20ஆவது திருத்தத்துக்கு ஆதரவு வழங்கியவர்கள், அரசாங்கத்தின் கைக்கூலிகள் - பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த ஒரு முதலமைச்சர்தான் அம்மாகாண முதலமைச்சராக வரவேண்டும் என்பதற்காக இப்பொழுதே திட்டமிட்டுச் செயற்பட ஆரம்பித்திருக்கிறார்கள். கிழக்கு மாகாணத்தில் 2008-2012 வரை ஒரு தமிழ் முதலமைச்சரும் 2012-2017 வரை இரு முஸ்லிம் முதலமைச்சர்களும் இருந்திருக்கிறார்கள். இதற்கு நல்லதோர் உதாரணம்தான் கல்முனை வடக்குப் பிரதேச செயலகம்! இலங்கையிலே மாவட்டத்துக்கு ஒன்று வீதம் 25 RDHS இருக்க வேண்டும். ஆனால், 26 RDHSs இருக்கின்றன. அதாவது, கல்முனைக்கு என்று ஒரு RDHSஉம் அம்பாறைக்கு என்று இன்னொரு RDHSஉம் என அம்பாறை மாவட்டத்தில் மட்டும் இரண்டு RDHS இருக்கின்றன. நாங்கள் அதை எதிர்க்கவில்லை. அதேநேரத்தில், கல்முனையில் Ashraff Memorial Hospital என்று ஒரு வைத்தியசாலை இருக்கிறது. அதிலிருந்து கிட்டத்தட்ட 05 கிலோமீற்றர் தூரத்தில் Kalmunai North Hospital என்று இன்னொரு வைத்தியசாலை இருக்கிறது. அதையும் நாங்கள் எதிர்க்கவில்லை. மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துப் பார்த்தீர்கள் என்று சொன்னால், -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. මොකද, ඔබතුමන්ලාගේ මන්ත්‍රීතුමා disturb කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් වැඩිපුර ලබාදෙන්න. අනෙක් මන්ත්‍රීවරුන්ටත් එහෙම දුන්නා නේ?

மட்டக்களப்பு மாவட்டத்தில் நிலத்தொடர்பு இல்லாத ஒரு கல்வி வலயம் இருக்கிறது. அதையும் நாங்கள் எதிர்க்கவில்லை. ஏனென்றால், அவை அந்தச் சமூகத்துக்குத் தேவையான விடயங்களாகும். ஏன், நாங்கள் அவற்றை எதிர்க்க வேண்டும்? ஆனால், இன்று கல்முனை வடக்குப் பிரதேச செயலகத்தை உப பிரதேச செயலகமாகத் தரம் குறைத்திருக்கிறார்கள். இதற்குப் பின்னணியில் கல்முனையைச் சேர்ந்த ஒரு பாராளுமன்ற உறுப்பினர் இருக்கிறாரா? என்றதொரு சந்தேகம் எனக்கிருக்கிறது. அங்கு தமிழ், முஸ்லிம் மக்களுக் கிடையே நிலவும் நல்லுறவைச் சீர்குலைப்பதற்காகத்தான் இப்படிச் செய்கிறார்கள். அவ்வாறு நடந்தால்தான் எதிர்காலத்தில் கிழக்கு மாகாணத்தில் ஒரு சிங்கள முதலமைச்சர் வர முடியும்.

இலங்கையிலே முஸ்லிம் மக்களுக்கு இன்று எவ்வளவோ பிரச்சினைகள் இருக்கின்றன. உங்களுடைய சமூகத்தைச் சேர்ந்த ஒரு கட்சியின் தலைவரான பாராளுமன்ற உறுப்பினர் றிஸாட் பதியுதீன் அவர்களைப் பயங்கரவாதத் தடைச் சட்டத்தின் கீழ் கைது செய்திருக்கின்றார்கள். நீங்கள் குரல் கொடுத்தீர்களா? அசாத் சாலி அவர்களைக் கைது செய்து தடுப்புக்காவலில் வைத்திருக்கின்றார்கள். குரல் கொடுத் தீர்களா? புர்காவைத் தடைசெய்திருக்கின்றார்கள். குரல் கொடுத்தீர்களா? மத்ரஸாக்களை மூடுவதற்கு முடிவெடுத்திருக் கின்றார்கள். குரல் கொடுக்கின்றீர்களா? ஆனால், அரசாங்கத்தின் கைக்கூலிகளாக இருந்துகொண்டு, கல்முனை வடக்குப் பிரதேச செயலகத்தைப் பற்றி தமிழ், முஸ்லிம் மக்களுக்குப் பொய் கூறி இரண்டு இனங்களுக்கும் இடையே பிரச்சினையை உருவாக்குவதற்கு நீங்கள் முயல்கின்றீர்கள்.

அரசாங்கத்துடன் ஒட்டியிருக்கும் கிழக்கு மாகாணத்தைச் சேர்ந்த தமிழ் அரசியல் வாதிகளின் செயற்பாடுகளும் அதேபோன்றுதான் காணப்படுகின்றன. 'கல்முனை வடக்கு உப பிரதேச செயலகம் தரமுயர்த்தப்படாவிட்டால் கிழக்கு மாகாண நிர்வாகத்தை முடக்குவேன்' என்று வியாழேந்திரன் அவர்கள் அன்று சொல்லியிருந்தார். இன்று அவருடைய சப்தத்தைக் காணவில்லை. ஒரு கடிதத்தை எடுத்துக் கொண்டுபோய் அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்களை நேற்று அவர் சந்தித்திருக்கிறார். பிள்ளையான் அவர்கள் சிறையிலிருந்து வெளியேறிய நிலையில், தற்போது அவர் பாராளுமன்ற உறுப்பினர்களிடத்திலே 223ஆவது இடத்திலே இருக்கின்றார்; எங்களுடைய சம்பந்தன் ஐயா அவர்கள் கிட்டத்தட்ட 90 வயதிலே அவரைவிட 5 இடங்கள் முன்னேறி 218ஆவது இடத்தில் இருக்கின்றார். "கிழக்கை மீட்கப் போகின்றோம்" என்று பிள்ளையான் அவர்கள் சொன்னதை

நம்பி மக்கள் அவருக்கு வாக்களித்தார்கள். ஆனால், அந்தப் பிரதேச செயலகம் சம்பந்தமாக அவரால் இன்றுவரை எதுவுமே செய்யமுடியவில்லை. கருணா அவர்கள் எங்கே என்றே தெரியாது வந்தார்; அம்பாறை மாவட்டத்தில் தமிழர்களுடைய வாக்குகளைப் பிரித்தார்; அம்பாறை மாவட்டத்துக்கு ஒரு தமிழ்ப் பாராளுமன்றப் பிரதிநிதித்துவத்தை இழக்க வைத்துவிட்டு எங்கோயோ போய்விட்டார்.

இவ்வாறான சூழ்நிலையில், கிழக்கு மாகாணத்திலே தமிழ், முஸ்லிம் மக்களுக்கிடையிலான எங்களுடைய உறவை நாங்கள் பலப்படுத்தவேண்டும். ஏனென்றால், இன்று கிழக்கு மாகாணத்திலே சிங்கள ஆதிக்கம் அதிகரித்துக்கொண்டு போகின்றது. பூட்டுமான் ஓடையிலே புதிதாக விகாரை ஒன்று கட்டுவதற்கான ஏற்பாடு நடைபெறுகின்றது. மயிலத்த மடுவிலே 10,000 ஏக்கர் பறிபோகின்றது. கெவிலியாமடுவிலே 5,000 ஏக்கர் பறிபோகின்றது. இதைப்பற்றியெல்லாம் கதைக்க முடியாத கிழக்கு மாகாணத்தைச் சேர்ந்தவர்கள் தமிழ், முஸ்லிம்களுக்கிடையே இருக்கின்ற உறவைக் குலைக்கப் பார்க்கின்றார்கள்.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කොටියා!

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කොටියා නම් ඔයා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. [බාධා කිරීමක්]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කොටියා නම් මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව සුළු වෙලාවක් ලබා දෙන්න. මොකද, මට මගේ කථාව අවසන් කරන්න මෙතුමන්ලා ඉඩ දෙන්නේ නැහැ.[බාධා කිරීමක්]

මේක ජාතිවාදී ආණ්ඩුවක්. අපේ සෞඛ්‍ය ඇමතිතුමිය කළුතර දිස්ත්‍රික්කයට cath lab එක දුන්නා. ඇයි ඒ? සියයට 80ක් පමණ මුස්ලිම්, දෙමළ අය ජීවත් වෙන නැගෙනහිර පළාතට ඒ cath lab එක දෙන්න තිබුණා නේද? කොළඹ cath labs තිබෙනවා. ඒවාට කළුතර ඉඳන් පැයකින් එන්න පුළුවන්. ගාල්ලේත් cath labs තිබෙනවා. ඉතින් බලන්න, කවුද ජාතිවාදී කියලා? මේ ආණ්ඩුව තමයි ජාතිවාදී. මොකද, සියයට 80ක් මුස්ලිම්, දෙමළ ජනයා ජීවත් වෙන පළාතකට ඒ cath lab එක දුන්නේ නැහැ. ඒ ගැන කථා කරන්න බැහැ, කල්මුනේ ඉඳලා ඇවිත් ඉන්න මේ මන්ත්‍රීවරුන්ට. [බාධා කිරීමක්] මම දෙමළ තමයි. කොටියා ඉන්නෙත් ඔබතුමාගේ පැත්තේ. පිල්ලෙයාන් කොටියා. [බාධා කිරීමක්] මේ ගරු පාර්ලිමේන්තුවට ඇවිල්ලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දෙන්න එපා මේ ගොල්ලන්ට. ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනි යම් කාරණා සඳහන් වුණා නම් ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම මේ වෙලාවේ දන්වා සිටිනවා.

මීළඟට, ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු ජගත් කුමාර මහතා**
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා අද දිනයේ මාතෘකාවට අදාළව කථා කරන්නේ නැතිව, ඉතාම ද්වේශ සහගත ලෙස, ජාතිවාදය වපුරවමින් තමන්ගේ දේශපාලන ඕනෑ එපාකම් වෙනුවෙන්, පටු අවස්ථාවාදය වෙනුවෙන් කථා කළා. ඒ ගැන මම කනගාටු වෙනවා. [බාධා කිරීමක්]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කළා.

**ගරු ජගත් කුමාර මහතා**
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
පාර්ලිමේන්තුවේ කථා කරනකොට කලින් කථා කරපු අයගේ නම් සඳහන් කරන්න වෙනවා නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කළ නිසා එතුමාට උත්තරයක් දීමට විනාඩියක් දෙන්න.

ගරු මන්ත්‍රීතුමනි, ජාතිවාදී මම නොවෙයි. නැඟෙනහිර පළාතට cath lab එකක්වත් දෙන්නේ නැති ආණ්ඩුව තමයි ජාතිවාදී. ඒ subject එකට සම්බන්ධ-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ ගැන ඔබතුමා සඳහන් කළානේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු ජගත් කුමාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ජගත් කුමාර මහතා**
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම එතුමන්ලා කියන පට්ටපල් අසත්‍යය අපි ඉවසීමෙන් අහගෙන හිටියා. පසුගිය කාලයේ එතුමන්ලා උන්න ද මළා ද කියලා දැන ගන්න තිබුණේ නැහැ. එතුමන්ලා දැන් කියනවා, "කොරෝනා රෝගයෙන් 700ක් දෙනා මැරුණා. ඒකේ වගකීම ආණ්ඩුව ගන්න" කියලා. මේ ආණ්ඩුවද ඒ අය මැරුවේ? මේ කොවිඩ් ව්‍යසනය ඇතුළේ පසුගිය කාලයේ එතුමා සෙනඟ විශාල සංඛ්‍යාවක් අරගෙන පෙළපාළි ගියා, රථ පෙළපාළි ගියා; ජනතාව උසි ගැන්නුවා; ජාතිවාදය ඇවිස්සුවා. එතකොට කොවිඩ් හැදෙන්නේ නැද්ද? ඒ ප්‍රදේශවල මිනිසුන්ට කොවිඩ් හැදුණා නම් ඒ වග කීම එතුමා භාර ගන්නේ නැද්ද? එතුමා තමන්ට ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා කර ගන්නා න්‍යායේ ඉන්න කෙනෙක්. ඒ නිසා අපි ඉතා කනගාටු වෙනවා, එවැනි අය පාර්ලිමේන්තුවට ඇවිල්ලා තව තවත් මේ රටේ ජාතිවාදය අවුස්සලා රට විනාශ කිරීමට උත්සාහ කිරීම ගැන.

මොන ජාතියකට, ආගමකට සම්බන්ධ වුණත් අපි හැමෝම මිනිස්සු. උතුරේ මැරුණත්, දකුණේ මැරුණත්, කොතැනක මැරුණත් අපි හැමෝම මිනිස්සු. ඒ මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපට කථා කරන්න පුළුවන්. හැබැයි, මේ විධියට ජතිවාදය වපුරමින් කථා කිරීම ම්ලේච්ඡ ත්‍රස්තවාදයකට උඩගෙඩි දීමක් කියන කාරණාව පැහැදිලියි. අනෙක, එතුමන්ලා උපදෙස් ගන්න, ආදර්ශයට ගන්න ඇමෙරිකාව, අපේ රට ආසන්නයේ තිබෙන ඉන්දියාව වැනි රටවල කොරෝනා රෝගයෙන් මැරුණු ගණන 700 ද? ඒ රටවල ලක්ෂ ගණනින් මිනිස්සු මැරුණේ. කෝටි ගණනින් රෝගාතුර වෙලා තිබෙන්නේ. ඒවාට ඒ ආණ්ඩු වග කියනවාද? එහෙම නම් ඒවාට විරුද්ධවත් මෙතුමන්ලා කථා කරන්න එපා යැ. කවදාවත් ඉන්දියාවට විරුද්ධව මෙතුමන්ලා කටක් ඇරලා කියනවාද? ඇමෙරිකාවට විරුද්ධව කථා කරනවාද? මෙහේ ඉඳගෙන ජාතිවාදය වපුරනවා. නමුත්, ඒ රටවලට ගිහිල්ලා ඒ ගොල්ලන්ගේ ආධාර උපකාර අරගෙන NGOs හදාගෙන තමන්ට ඕනෑ දේවල් කරන්න හදනවා.

මම මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න ඕනෑ, මේ කොවිඩ් උවදුර වෙලාවේ අපේ ආණ්ඩුව ක්‍රියා කළ ආකාරය පිළිබඳව. කොවිඩ් රැළි තුනක් අපේ රටට ආවා නම්, අපි ඉන් රැළි දෙකක් ඉතා විශිෂ්ට විධියට පාලනය කර ගත්තා; මර්දනය කර ගත්තා. ඉතා අවදානම් සහගත තත්ත්වයක් පැවැතියත් අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමිය ජනතාව වෙනුවෙන් කැප වෙලා කටයුතු කළා. එතුමිය දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් බරපතළ අවදානමකට මුහුණ දුන්නා. එතුමියට ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණේ මිනිසුන් අතරට ගිහිල්ලා මිනිසුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කැප වෙලා වැඩ කිරීම නිසායි. එවැනිම කාර්ය භාරයක් අපේ සෞඛ්‍ය අංශයේ සේවකයෝත් කරනවා, ආරක්ෂක අංශයේ අයත් කරනවා.

මම මේ අවස්ථාවේදී ම ගරු ඇමතිතුමියට තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. ආරක්ෂක අංශය සහ සෞඛ්‍ය අංශය මේ කටයුතු වෙනුවෙන් කැප වනවා වාගේම, අද වන කොට lock down කරපු ප්‍රදේශවලට බඩු මලු ගෙන ගොස් දෙන, පසුගිය කාලයේ බඩු මලු ගෙන ගොස් දුන්, පසුගිය කාලයේ රුපියල් 5,000ක මුදල, රුපියල් 10,000ක මුදල ගෙවන්න කටයුතු කළ නිලධාරින් පිරිසක් ද ඉන්නවා. ඒ වෙන කවුරුවත් නොවෙයි, ඒ ඒ ප්‍රදේශවල සිටින සමෘද්ධි නිලධාරින්, ග්‍රාම නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්, සංවර්ධන නිලධාරින් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරින් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්. ඒ අය තමයි ඒ කටයුතුවලට මැදිහත් වුණේ. ඒ නිලධාරින්ගේ ආරක්ෂාව සැලසුවොත් තමයි නැවත lock down කළ ප්‍රදේශයකට හෝ වෙනත් ගැටලුවක් තිබෙන තැනකට එම නිලධාරින් යොමු කරන්න හැකි වන්නේ. එම නිසා මීළඟට අපට ලැබෙන පළමුවෙනි එන්නත් ප්‍රමාණයෙන් ඒ නිලධාරින් එන්නත් කළ යුතුයි.

විපක්ෂය කියන විධියට රට වහලා අපට ඉදිරියට යන්න බැහැ. අපි සංවරණය සීමා කර ගන්න ඕනෑ. කොවිඩ් රැල්ල වැඩි වීම සම්බන්ධයෙන් මේ කවුරුත් අඩු වැඩි වශයෙන් වග කියන්න ඕනෑ. ඔය කවුරුත් අවුරුදු සමයේ විවිධ පාර්ශ්ව එක්ක අඩු වැඩි වශයෙන් තමන්ගේ සතුට සැමරුවා. ඒ නිසා තමයි මේ තත්ත්වය වර්ධනය වුණේ. දැන් මේ තත්ත්වය පාලනය කර ගන්න පක්ෂ, පාට භේදයෙන් තොරව, ආණ්ඩුව ද, විරුද්ධ පක්ෂය ද කියා හිතන්නේ නැතිව හැමෝම ඒක රාශි වන්න ඕනෑ; හැමෝම උදව් කරන්න ඕනෑ. දැනුවත් බවින් යුත්, ලෝකයේ අනෙක් රටවල් කටයුතු කරන්නේ එහෙමයි. විශේෂයෙන් තමුන්නාන්සේලා ආදර්ශයට ගන්නා රටවල් කටයුතු කරන්නේත් එහෙමයි. හැබැයි, ඒ රටවල් ගැන පුරසාරම් දොඩන ගමන් තමුන්නාන්සේලා අපේ රටේ වැඩ කරන්නේ රෙදි ඇඳගෙන නොවෙයි -නිර්වස්ත්‍රවයි- කියා මම කියනවා. එක්සත් ජාතික පක්ෂයට හෝ යහ පාලන ආණ්ඩුවේ සිටි අයට හෝ සමගි ජන බලවේගයට හෝ මේකෙන් කර අරින්න බැහැ, කොවිඩ් රෝගීන් 700 දෙනකු මැරුණේ පවතින ආණ්ඩුවේ අඩු පාඩු නිසාය කියා. තමුන්නාන්සේලාගේ ආණ්ඩු තිබුණා නම්, තමුන්නාන්සේලා උදව් කරපු ආණ්ඩු තිබුණා නම් අද වන කොට මැරෙන ප්‍රමාණය සමහර විට ලක්ෂ ගණනක් වෙන්න පුළුවන්; රෝගාබාධවලට ලක් වූ ප්‍රමාණය කෝටි ගණනක් වෙන්න පුළුවන්. අපට ඒ තත්ත්වය පාලනය කර ගන්න පුළුවන් වුණේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු ආණ්ඩුව ගත් යම් යම් තීන්දු නිසායි. අපි මැතිවරණ කරන්න ගිහිල්ලා කොවිඩ් රැල්ලක් හදලා රට විනාශ කළා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරපු කාලයේ තවත් කොවිඩ් රැල්ලක් ආවා, ඒ අතරේ කොවිඩ් ව්‍යාප්ත වෙලා ගියා කිව්වාට, ඒ හැම එකක්ම මහා මුසාවන් විතරයි. ඒ කාලයේ එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ නේ.

අද ඉන්දියාවේ තත්ත්වය දිහා බලන්න. ඉන්දියාවේ කෝටි ගණනින් කොවිඩ් රෝගීන් වාර්තා වෙද්දීත්, ජනතාව ලක්ෂ ගණනින් මිය යද්දීත් මැතිවරණ පවත්වනවා. ඒවාත් එක්ක බලන කොට අපේ රටේ ඒ වාගේ දේවල් වුණේ නැහැ. ඊට වඩා ඉතාම සුළු කොවිඩ් ව්‍යාප්ත තත්ත්වයක් යටතේ තමයි අපේ රටේ මහ මැතිවරණය පැවැත්වුයේ. අපි ඒ මැතිවරණය පැවැත්වූයේ ඉන්දියාවට සාපේක්ෂව ඉතාම අඩු අවදානමක් යටතේයි. හැබැයි, මෙහිදී ඒ කාරණය පමණක් ලඝු කරලා මේ රටේ අවදානම ගැන විපක්ෂය කියනවා.

පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව ඔබතුමන්ලා හඬ නැඟුවාද? මේ ආණ්ඩුවට විරුද්ධව මත ප්‍රකාශ කරන විපක්ෂයේ අය දැන් කියන්නේ මොකක්ද? "යහ පාලන ආණ්ඩුව දැනුවත් වෙලා තිබියදීත් එදා පාස්කු ප්‍රහාරය වළක්වා ගත්තේ නැහැ කියන චෝදනාව අපි භාර ගන්නවා. හැබැයි, අද කොවිඩ් ව්‍යසනය ගැන දැනුවත් වෙලාත් ආණ්ඩුව එය පාලනය කරලා නැහැ" කියලායි විපක්ෂය කියන්නේ. අපි පැහැදිලිවම කියන්න ඕනෑ, පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල කළ සතුරායි, කොවිඩ් සතුරායි කියන්නේ දෙදෙනෙකු බව. පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල කළ සතුරා ඇහැට දැක්කා. ඒ වාගේම වසර ගණනාවක් තිස්සේ ඒ අවදානම ගැන කියලාත් තිබුණා. එම නිසා ඒ සතුරා මර්දනය කරන්න පුළුවන්කම තිබුණා. එසේ මර්දනය කරන්න පුළුවන්කම තිබියදීත් එදා පැවැති යහ පාලන ආණ්ඩුව පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල කළ සතුරා

මර්දනය කරන්නේ නැතිව අහිංසක මිනිසුන් සිය ගණනක් මරණයට පත් වන තැනට කටයුතු කළා. ෂාණක්කියන් මන්ත්‍රීතුමා හෝ අද විපක්ෂය නියෝජනය කරන වෙනත් මන්ත්‍රීතුමන්ලා හෝ ඒ පිළිබඳ හඬක් නඟන්නේ නැහැ; 'මීක්' කියන්නේ නැහැ. එතුමන්ලා සද්ද නැතිව ඉන්නවා. අද මේ කොවිඩ් සතුරා කාටවත් හඳුනා ගන්න බැහැ. අපට විතරක් නොවෙයි, ධනවත්, බලවත් ඇමෙරිකාවට වත්, අපේ රටට ආසන්න බලසම්පන්න ඉන්දියාවට වත් මේ රෝග ව්‍යාප්තිය වළක්වා ගන්න බැරිව සිටින තත්ත්වයක් තුළ තමයි අපි අද මේ කටයුතු කරන්නේ.

මම පැහැදිලිව කියනවා, මේ රටේ මිනිසුන් ගලවාගන්න මේ වෙලාවේ අපි හැමෝටම ජාතික වගකීමක් තිබෙන බව. වාද කර කර බෝලය දෙපැත්තට පාස් කර කර බැණ ගන්න එක නොවෙයි අපේ වගකීම වෙලා තිබෙන්නේ. අපේ අඩු පාඩු කොතැනද වෙලා තිබෙන්නේ; ඒ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ද, ඇමතිතුමියගේ ද, ආණ්ඩුවේ ද, විපක්ෂයේ ද කියලා නිවැරදි විධියට හඳුනා ගෙන ඒවා පිළිබඳ කථා කර ගන්නා ක්‍රමවේදයක් තිබෙනවා. ඒවා ගැන වෙනම කථා කරලා පොදු එකඟතාවක් හදාගෙන අපි මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න ඕනෑ. ඒ සඳහා සමහර විට බටහිර වෛද්‍ය විද්‍යාවේ ක්‍රමවේද වාගේම අපේ ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දේශීය වෛද්‍ය ක්‍රමය, එහෙම නැත්නම් ආයුර්වේදය කෙරේ ද අපි විශ්වාසය තබන්න ඕනෑ.

බටහිර වෛද්‍ය ක්‍රමය එන්න ඉස්සෙල්ලා ඉතිහාසයේ මෙවැනි ව්‍යසන, වසංගත ආ විට රටේ මිනිසුන් බේරුණේ දේශීය වෙදකම ගැන විශ්වාසය තබලායි. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින රෝහල්වල ඇඳන් 3,000කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒවායේ අවශ්‍ය සම්පත් තිබෙනවා, වෛද්‍යවරු ඉන්නවා. ඒ අයගේත් ශක්තිය ගන්න අපේ ආණ්ඩුව කටයුතු කරන්න ඕනෑ කියා මා හිතනවා.

මම ඊයේ පාදුක්ක, කඩුවෙල, බත්තරමුල්ල ප්‍රදේශවල MOHsලාට කථා කළා. එම ප්‍රදේශවල ප්‍රශ්න ටිකක් තිබෙනවා. අපි මේ තත්ත්වය සියයට සියයක් පාලනය කළා කියන්න ඕනෑ නැහැ. එහෙම කරන්න බැරි වෙලා තිබෙනවා. මොකද, ආණ්ඩුවකට විතරක් මේ තත්ත්වය මර්දනය කරන්න පුළුවන්කමකුත් නැහැ නේ. මේ සඳහා ආණ්ඩුවේත්, විපක්ෂයේත් සියලුදෙනා එකතු වෙන්න ඕනෑ, ජනතාවගේත් සහයෝගය ඕනෑ. මෙහිදී අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. යුද්ධය දිනුවේත් එහෙමයි. යුද්ධය කරපු වෙලාවේත් ආණ්ඩුවට විරුද්ධව රාජ්‍ය සේවයේ යම් යම් අංශවල සේවකයන්, පෞද්ගලික අංශයේ සේවකයන්, මිනිසුන් එළියට බැහැලා අරගළ කළා නම් යුද්ධය දිනන්න බැහැ. අපි එකට සිටි නිසා තමයි එය ජයග්‍රහණය කරන්න පුළුවන් වුණේ. අපි මේ නොපෙනෙන සතුරාට ඊට වඩා ශක්තිමත්ව මුහුණ දෙන්න ඕනෑ. අපි ඒ සඳහා සියලුදෙනාගේ සහාය, ශක්තිය ලබා ගන්න ඕනෑ. එහිදී තිබෙන අඩු පාඩු ටික අපි පැහැදිලිවම හඳුනා ගන්න ඕනෑ. ගරු සෞඛ්‍ය ඇමතිතුමියනි, අපේ සමහර MOH මහත්වරු මට කිව්වේ, ඒ ප්‍රදේශවල රෝගීන් ඉස්පිරිතාලවලට ගෙන යන්න විධියක් නැහැ කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු ජගත් කුමාර මහතා**
(மாண்புமிகு ஜகத் குமார)
(The Hon. Jagath Kumara)

ඒ රෝගීන් ඉස්පිරිතාලවලට ගෙන යන්න සමහර වෙලාවට දවසක් දෙකක් යනවා. ඒ වාගේම, PCR පරීක්ෂණයේ ප්‍රතිඵල එන්න දවස් දෙක තුනක් යනවා. එතකොට ලෙඩා ගෙදර නතර වෙනවා. ලෙඩා ගෙදර සිටින කොට ගෙදර සියලුදෙනාට, අසල්වාසීන්ට වයිරසය බෝ වෙනවා; එමඟින් වයිරසය පැතිරීම වර්ධනය වෙනවා. ඒ නිසා ඉක්මනින් රෝගීන් හඳුනා ගන්නවා වාගේම, රෝහල්වල අඩු පාඩු හදාගන්නා තෙක් අතරමැදි මධ්‍යස්ථානවලට හෝ ඒ රෝගීන් ගෙන යන්න ඕනෑ.

අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු ඇමතිතුමිය ඇතුළු රජය ඒ පහසුකම් හදන්න කටයුතු කරන බව අපි දන්නවා. එය ක්ෂණිකව දවසෙන් දෙකෙන් කරන්න බැහැ. හැබැයි, අපි දැන් ඒ කටයුතු ඉක්මන් කරන්න ඕනෑ. 'මේ තත්ත්වය අපට සම්පූර්ණයෙන්ම පාලනය කරන්න බැහැ' කියලා අපට මේ වගකීම අත් හරින්න බැහැ. අපි මේ තත්ත්වය කෙසේ හෝ පාලනය කළ යුතුයි. සියලු බලවේග සහ සියලු අයගේ සහාය, ශක්තිය අරගෙන එය පාලනය කරන ක්‍රමවේද ගොඩනඟා ගන්න අපි උත්සාහ කරන්න ඕනෑ. මේ වෙලාවේ ආණ්ඩුව විධියට අපි කරන කාර්ය භාරය යම් ප්‍රශස්තභාවයක තිබුණා වුණත් දැනට වඩා මැදිහත් වීමක්, වගකීමක් ඇතිව මේ කාර්ය භාරයට අපි නායකත්වය දෙන්න ඕනෑ. මන්ද, මේ මිනිස් ජීවිත නේ. මේ සතුන් නොවෙයි, බල්ලන් බළලුන් නොවෙයි. මිනිසුන් 100ක් මැරුණා ද, 1,000ක් මැරුණා ද කියලා අහන්නේ නැතිව සියලු මිනිස් ජීවිතවල වගකීම අරගෙන, මේ රෝග ව්‍යාප්තිය මේ තිබෙන මට්ටමෙන් ඔබ්බට යන්න ඉඩ තබන්නේ නැතිව කටයුතු කරන්න ඕනෑ.

එක් පැත්තකින්, අපට තිබෙන ප්‍රධාන වගකීම තමයි ජනතාව රෝගීන් වීම වළක්වා ගන්නා එක; රෝගීන් අඩු කර ගන්නා එක. දෙවැනි එක තමයි, රෝගී වුණාම ඒ අය මරණයට පත් වීමට ඉඩ නොදී බේරා ගන්නා එක. ඒ කාර්යයන් දෙකම කරන්න නම්, අපේ පහළ මට්ටමේ සෞඛ්‍ය අංශවල අයගේ සහායත් ශක්තියත් අරගෙන අවශ්‍ය විධියට තීන්දු-තීරණ නිවැරදිව අරගෙන කටයුතු කරන්න ඕනෑ. ඒ කාර්ය භාරය සිදු කරනවා වාගේම වඩාත් ශක්තිමත්ව තවදුරටත් ඒ කටයුතු සිදු කරන්න ආණ්ඩුවට පුළුවන්කම තිබෙනවා.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු සෞඛ්‍ය ඇමතිතුමිය ඇතුළු ආණ්ඩුව සිදු කරන මේ කාර්ය භාරය අපි පසසනවා. තවත් අඩු පාඩු තිබෙනවා. ඒවා ගැන සොයා බලා, ඒ ඒ අංශවල පවතින අඩු පාඩු සපුරාගන්න කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම මා කලින් කියූ විධියට මේ කටයුතු කරන ප්‍රාදේශීය ලේකම්, සමෘද්ධි නිලධාරින්, ග්‍රාම නිලධාරින් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරින්ට ක්ෂණිකව -ඉක්මනින්- ඒ එන්නත ලබා දෙන්න. ඒ වාගේම, ඔවුන්ටත් වැඩ කරන්න අවශ්‍ය නීරෝගීභාවය ලබා දෙන්න මැදිහත් වෙන්න කියමින්, මේ සියලු කාරණාවලදී සහාය, ශක්තිය දෙන සියලු අංශවල සේවකයන්ටත්, ජනතාවටත් අපගේ ගෞරවය පළ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් ලැබෙනවා.

[4.50 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

Hon. Presiding Member, when we talk about the COVID-19 pandemic, an issue that we cannot run away from is the grave economic situation the people are

forced to face, not only in this country, but globally. The Hon. Ajith Nivard Cabraal, in his speech, endeavoured to put the economic situation into context and to explain how the Government is trying to address those issues.

In that light, Sir, if the economic situation during the COVID-19 pandemic has deteriorated to such an extent and if the average citizen in Sri Lanka is facing a grave crisis, can you just imagine what the situation would be for the people of the North-East, who had been facing an economic blockade for almost 32 years during the war? Not only did they have that economic blockade to face up to, which they have still not recovered from, but on top of that, they have this pandemic which has almost pauperized them completely. So, in that backdrop, I want to bring to the notice of this House something quite astounding that is taking place even in this grave situation without any consideration of those downtrodden, suffering people in the North-East.

Sir, in 1984, the Tamil people in Kokulai, Kokkuthoduwai and Karunaddukerny were asked to evacuate by the military because they were going to carry out military operations. Those people were displaced right until around 2012. Till then, they were not even allowed to come and resettle. Despite the military chasing out the Tamil people who had been there for generations, Sinhalese people who had been there in the 80s had begun to be settled in those areas. After the war, when the people who rightfully owned those areas, the rightful owners, tried to come back, they found that Kokulai West, Kokulai East, Kokkuthoduwai South, Kokkuthoduwai North, Kokkuthoduvwai Centre and Karunaddukerny had been gazetted under the Mahaweli Development Authority in 2007. Those areas had been gazetted without their knowledge and when they tried to go back, resettle and do their farming in those areas, areas they had rightful papers and deeds for, they were not allowed and that became a huge issue. Subsequently, the Grama Niladhari Divisions of Chemmalai East and Chemmalai were also included in that Gazette. Under those circumstances, Sir, despite those areas being gazetted to fall under the Mahaweli Authority, the land administration was kept under the Karaithuraipattu Divisional Secretary. In some way, that Divisional Secretary was helping those war-displaced people coming back and trying to get back to their normal life. All of a sudden, what we found was, towards the end of last year, the Mahaweli Authority had written to the Divisional Secretariat saying that they were going to take over all of the land administration and that they wanted all the documents to be transferred. So, in this backdrop, during the Budget Debate, when we heard this, we, not only ourselves, but even the Members of the TNA and all the Tamil political parties representing those areas, immediately called for a meeting with the Hon. Chamal Rajapaksa, who is the relevant Minister concerned and who, in turn, called the Mahaweli Authority, the Department of Forest Conservation and all the relevant departments for a meeting. So, we had a meeting and the Hon. Minister agreed to suspend that action, that is, the transfer of all the land administration to the Mahaweli Authority, pending the appointment of a committee consisting of all the stakeholders to go into the matter and come to some sort of agreement because he did not want unnecessary tensions, considering the grave economic situation also faced by the people. So, in fairness to the Hon. Minister, even though he agreed to appoint the committee, the committee could not eventually be appointed and did not even meet once because of the COVID-19 situation in the country, but the land administration being shifted from the Divisional Secretary to the Mahaweli Authority was suspended, to which we are thankful.

Sir, on the 03rd of April this year, this month, His Excellency the President visited the Bogaswewa area in Nedunkerni in Vavuniya North, which ironically has another Tamil area that had been colonized as Kokkachchankulam. That Grama Niladhari Division has two Tamil villages and a Sinhala village and Bogaswewa is the Sinhala village. Even though His Excellency the President went to that GN Division, he did not inform the people in those two Tamil villages to come and meet him; only the Sinhala villagers were met. To that meeting, someone who did not belong to that village came from Mullaitivu, from an area that the Mahaweli Authority is trying to usurp, and told the President that the Mahaweli Authority has not taken over the lands and as a result, Sinhala people in that area are being colonized by the Mahaweli Authority, against whom the Divisional Secretary has actually filed legal action, and that they are losing the opportunity to get their lands. Then, the President, without even consulting the administration or the relevant officials of that area, announced that the Maheweli Authority should go ahead and take over those lands. This is completely unacceptable, Sir. I hope that the Hon. Minister responsible would bring that matter to the President's notice. Obviously, the President was not informed of his elder brother's decision to suspend that action, pending that committee's decision. So, I call upon the Government to stop this most unjust action. The President must reconsider his decision and stop any attempt to transfer the land administration from the Divisional Secretary to the Mahaweli Authority until this matter is fully gone into and justice to the people, who have been long suffering especially during this COVID-19 pandemic, is finally meted out.

I would like to conclude, Hon. Presiding Member, by raising this one matter. We are discussing the COVID-19 pandemic; we are talking about what a grave situation it is. The Government and the Hon. Minister of Health accept that it is a grave situation which must be brought under control and the Government says that they are doing their best. If that is the case, Sir, we need to focus on some of the steps that this Government has been taking in Jaffna in the North. For example, when a religious event organized by a certain Hindu temple in Jaffna, Nachchimar Kovil, was taking place, the Government took action to arrest the president and the secretary of the board of trustees of that Hindu temple saying that they should not have had that function where the public gathered because that is how serious the situation is. Well, if we are to give the benefit of the doubt, that, in fact, the situation has been that bad and

therefore, those sorts of events should not have taken place, then certainly, the National Vesak Festival also cannot take place. That too has been earmarked to take place in Nainativu - Nagadeepa. So, I call upon the Government to stop those events forthwith, considering the grave situation.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
I am winding up, Sir.

None of the Tamil Members of Parliament protested when it was announced that Nainativu will be the place where the National Vesak Festival would take place. But, certainly, considering the grave situation, which the Government itself accepts, faced by the country, it is only fair that the Government reconsider its decision and takes steps to stop that festival forthwith. Certainly, under these circumstances, for the Government to go ahead with that festival would mean that unnecessary ethnic tensions will only widen and I hope the Government acts responsibly in that matter as well.

Thank you, Sir.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Sir, I did not want to disturb the Hon. Member, to whom I have utmost respect. But, I need to put the record correct. As the Governor of the Northern Province, I tried to resolve the same problem regarding land administration. There are 28 Gazette Notifications issued on lands, but it was the TNA leaders who, due to their disunity, could not solve that problem. My dear Hon. Member, we could have solved that in 2019. I had invited -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுரேன் ராகவன்)
(The Hon.(Dr.) Suren Raghavan)
Sir, there is one more point and allow me to raise it.

I was at that meeting which you mentioned where the Hon. Minister of Irrigation was present. I spoke to the Secretary to that Ministry, Mr. Anura Dissanayake, and that decision still stands - there will be a committee appointed, there will also be a discussion and after that discussion only such takeover will take place.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Sir, give me just a few seconds, please.

Well, if he says that, I would like to believe him, but that is not correct. I ask him to recheck his facts. In fact, tomorrow, the letter is to be sent and the documents are to be transferred forthwith. Those are the instructions that have been given. So, I kindly ask him to meet His Excellency the President and tell him that the orders of his own brother, who is the subject Minister and who called that meeting, are being violated by himself. Therefore, if you could use your good offices, then that would be welcome.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එච්.එම්.එම්. හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.01]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கொரோனா தொற்று காரணமாக இந்த நாட்டில் நாங்கள் ஓர் அபாயகரமான சூழ்நிலையில் வாழ்ந்துகொண்டிருக்கின்றோம். கொரோனாவைக் கட்டுப்படுத்தி மக்களைப் பாதுகாக்கின்ற நடவடிக்கைகளை எங்களுடைய சுகாதார அமைச்சர் மற்றும் இராணுவத்தினர் எடுத்துவருகின்றார்கள். எமது அம்பாறை மாவட்டத்தில் கொரோனா தொற்றாளர்கள் அதிகரிக்கின்றபொழுது, அதற்கான முன் ஆயத்தங்களாக அங்கு சில தற்காலிக ஆஸ்பத்திரிகளையும், அதிதீவிர சிகிச்சைப் பிரிவுகளையும் உருவாக்குவதற்கு கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் முன்வரவேண்டுமென்று கேட்டுக்கொள்வதோடு, இந்தச் சபையில் எனது மாவட்டம் சம்பந்தப்பட்ட சில விடயங்களைப் பேசலாமென்று நினைக்கின்றேன்.

உண்மையில், எனக்கு மிகவும் கவலையாக இருக்கின்ற விடயம் என்னவென்றால், இந்த நாட்டில் சிறுபான்மை மக்கள் என்ற ரீதியில் தமிழ், முஸ்லிம் மக்கள் மிகவும் ஐக்கியமாகவும் ஒற்றுமையாகவும் செயற்படவேண்டிய ஒரு காலகட்டத்தில், இன்று துரதிருஷ்டவசமாக சில சம்பவங்கள் இடம்பெற்றுக்கொண்டிருப்பதாகும். குறிப்பாக, கல்முனைத்

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

தொகுதியின் வரலாறு சம்பந்தமாகத் தெரிந்துகொள்ள வேண்டும். 1895ஆம் ஆண்டு ஆங்கிலேய ஆட்சியாளர்களினால் முதன்முதலாக கல்முனைத் தொகுதியில் 4 உள்ளூராட்சிச் சபைகள் உருவாக்கப்பட்டன. அவை கல்முனை நகரத்தில் முஸ்லிம்கள் பெரும்பான்மையாக வாழ்கின்ற பட்டின சபை, அதேபோன்று தமிழ் மக்களுக்கென்று கரவாகு மேற்கு சபை, சாய்ந்தமருது மக்களுக்கென்று கரவாகு தெற்கு சபை, மருதமுனை மக்களை மையப்படுத்தி கரவாகு வடக்கு சபை என்ற அடிப்படையில் உள்ளூராட்சிக் கட்டமைப்பின் நிர்வாகம் செம்மையாக நடைபெற்று வந்தது. கல்முனைத் தொகுதியானது முஸ்லிம்களைப் பெரும்பான்மையாகக் கொண்ட ஒரு தொகுதியாகும். 1948இன் பின்பு அங்கிருந்த பாராளுமன்ற உறுப்பினர்களான எம்.எஸ் காரியப்பர், எம்.சீ அஹமட், ஏ.ஆர்.எம்.மன்சூர் மற்றும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் ஸ்தாபகத் தலைவர் அஷ்ரப் போன்றோர் தமிழ், முஸ்லிம் என்ற எந்தவித பேதமும் பாராமல் அத்தொகுதியில் தங்களுடைய அபிவிருத்திப் பணிகளைத் தமிழ்க் கிராமங்களிலும் முஸ்லிம் கிராமங்களிலும் சமனாகச் செய்தார்கள். அங்கு அவர்களினால் பாடசாலைக் கட்டிடங்கள், வைத்தியசாலைகள், வீதிகள் போன்ற பல்வேறு பொதுநல விடயங்கள் அமைக்கப்பட்டிருக்கின்றன. அதேபோன்று முஸ்லிம் மக்களுக்கும் தமிழ் மக்களுக்கும் அரச வேலைவாய்ப்புகளைக் கணிசமாக வழங்கியிருக்கின்றார்கள். இது வரலாறாகும்.

இந்த நாட்டில் ஏற்பட்ட யுத்தம் அல்லது ஆயுதப் போராட்டம் காரணமாக, இனங்களுக்கிடையிலான திட்டமிடப்பட்ட பிரித்தாளும் தந்திரம் காரணமாக 1985ஆம் ஆண்டுக்குப் பின்பு கிழக்கு மாகாணத்தில் தமிழ், முஸ்லிம் மக்களுக்கு மத்தியில் வேற்றுமைகளும் பேதங்களும் அதிகரித்த ஒரு சூழ்நிலையில், அதை சரிவரப் பேசித் தீர்க்க முற்படாமல் நிருவாகங்களில் இனரீதியான கட்டமைப்புக்கள் உருவாக்கப்பட்டது மிகவும் துரதிருஷ்டவசமாகும். கல்முனை மாநகரத்தில் ஒரு தாய் பிள்ளைகள் போலிருந்த தமிழ், முஸ்லிம் மக்கள் மத்தியில் முதன்முதலில் நிருவாக ரீதியாக ஒரு பிரதேச செயலகம் வேண்டுமென்று அக்காலத்தில் இருந்த தமிழீழ விடுதலைப் புலிகள் அமைப்பினர் அன்றிருந்த ஜனாதிபதி ஆர்.பிரேமதாஸ அவர்களுடன் நடத்திய பேச்சுவார்த்தையில் முன்வைத்ததன் காரணமாக 1989 மே, 12ஆம் திகதி ஓர் உப பிரதேச செயலகம் தமிழ் மக்களுக்கென்றே உருவாக்கப்பட்டது. அது எல்லையுடனான ஓர் உப பிரதேச செயலகமாகவோ அல்லது பிரதேச செயலகமாகவோ உருவாக்கப்பட்டிருந்தால் இன்று இந்தப் பிரச்சினையை இந்த இடத்தில் பேசவேண்டி வந்திருக்காது. ஆனால், அது நிலத்தொடர்பற்ற ரீதியில் உருவாக்கப்பட்டிருக்கின்றது. கல்முனையின் கேந்திர நிலையமாக இருக்கின்ற நகரங்கள், முஸ்லிம் கிராமங்கள், நிலப்பரப்புக்கள், வயல் நிலங்கள், அதேபோன்று முஸ்லிம்களின் பொருளாதார நாடியாக இருக்கின்ற சந்தைகள், பள்ளிவாசல்கள், பொதுக் கட்டிடங்கள், பாரியளவிலான அரச நிருவாக அலகுக் கட்டிடங்கள், கட்டமைப்புக்கள் போன்றன கல்முனை பிரதேச செயலகப் பிரிவில் உள்ளடக்கப்படாமல், பலாத்காரமாக அந்த உப பிரதேச செயலகப் பிரிவில் உள்ளடக்கப்பட்டதனால் முஸ்லிம் சமூகம் அநீதிக்குள்ளாக்கப்பட்டது.

தங்களுக்கு நியாயம் கிடைக்க வேண்டுமென்பதற்காக அஷ்ரஃப் அவர்கள் 1994இல் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அரசாங்கத்தை தன்னுடைய பலத்தினால் ஆட்சிக்குக் கொண்டுவந்தார். அந்த அரசாங்கத்தில் பலம் வாய்ந்த ஓர் அமைச்சராக அவர் இருந்தார். அந்தப் பிரதேச செயலகப் பிரச்சினையை தன்னுடைய அதிகாரத்தைக்கொண்டு ஒருதலைப்பட்சமாக அவரால் தீர்த்திருக்க முடியும். ஆனால், அவர் அவ்வாறு செய்யவில்லை. தமிழ், முஸ்லிம் மக்களின் ஐக்கியத்திற்காக தமிழ்த் தலைமைகளுடன் பேசி அதனைச் சுமுகமாகத் தீர்க்க முற்பட்டார். தமிழ் மக்களுக்கென்று ஒரு பிரதேச செயலகம், அதேபோன்று சாய்ந்தமருது மக்களுக்கென்று ஒரு பிரதேச செயலகம், மருதமுனை மக்களுக்கென்று ஒரு பிரதேச செயலகம், கல்முனை நகர மக்களுக்கென்று ஒரு பிரதேச செயலகம் என 4 பிரதேச செயலகங்களை உருவாக்க வேண்டுமென்று தலைவர் அஷ்ரஃப் அவர்கள் விரும்பியிருந்தார். ஆனால், துரதிருஷ்டவசமாக அது நடைபெறவில்லை. கௌரவ வஜிர அபேவர்தன அவர்கள் அமைச்சராக இருந்தபொழுது தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த கௌரவ மாவை. சேனாதிராஜா, கௌரவ சுமந்திரன் ஐயா, முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ கோடீஸ்வரன் ஆகியோருடன் நாங்கள் இந்த விடயங்களை சுமுகமான முறையில் பேசித் தீர்க்க வேண்டுமென்பதற்காக பல நாட்களாக இரவு 12.00 - 1.00 மணிவரையும் கடந்த ஆட்சியில்கூட முயற்சிகளைச் செய்திருந்தோம். ஆட்சி மாற்றம் ஏற்பட்ட பின்பு அங்கு தமிழ், முஸ்லிம் மக்கள் அமைதியான முறையில் வாழ்ந்துகொண்டிருக்கின்றபொழுது, தங்களுடைய அரசியல் ஆதாயத்திற்காக, எதிர்கால மாகாணசபைத் தேர்தலைக் கருத்திற்கொண்டு தங்களுடைய வாக்கு வங்கிகளை நிரப்பிக் கொள்வதற்காக இப்பொழுது மீண்டும் இந்தப் பிரச்சினையை சிலர் கையில் எடுத்திருக்கிறார்கள். இதற்கு நிரந்தரமான ஒரு தீர்வைத் தாருங்கள் என்று நாங்கள் அரசாங்கத்திடம் சொல்லியிருக்கின்றோம். இதுசம்பந்தமாக எல்லை நிர்ணய ஆணைக்குழுவொன்றை அரசாங்கம் நியமித்திருக்கின்றது. எதிர்வரும் 6 மாத காலத்தில் நிரந்தரத் தீர்வைப் பெறமுடியும். இதுதொடர்பாக தமிழ், முஸ்லிம் தலைவர்கள் பேசி ஒரு தீர்மானத்திற்கு வரவேண்டும். அதைவிடுத்து, வரலாறு தெரியாமல், முஸ்லிம்களுக்கு நடந்திருக்கின்ற அநீதிகள்பற்றித் தெரியாமல், இங்குவந்து வெறுமனே கல்முனை வடக்கு பிரதேச செயலகத்தைத் தரமுயர்த்துங்கள், முஸ்லிம் அரசியல்வாதிகள் இனவாதமாகச் செயற்படுகிறார்கள் என்று எங்களை யாரும் குற்றஞ்சாட்டக்கூடாது. தமிழ், முஸ்லிம் மக்களுக்காக கடந்த 20 வருட காலமாக ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ், தமிழ் தேசியக் கூட்டமைப்பு எடுத்த தீர்மானத்துடன் ஒட்டியதாக சனாதிபதித் தேர்தல்களின்போது பயணித்திருக்கின்றது. இதனால், இன்று முஸ்லிம் சமூகம் பெரும்பான்மை இன சிங்கள மக்களால் குற்றவாளிக்கூண்டில் நிறுத்தப்பட்டிருக்கின்றது. இதற்கான விலையை முஸ்லிம் சமூகம் கொடுத்துக்கொண்டிருக்கிறது. இன்று சகோதர பாராளுமன்ற உறுப்பினர் சாணக்கியன் அவர்கள் வெட்கமில்லாமல் பொய் கூறியிருக்கின்றார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

அதாவது, கிழக்கு மாகாண சபையில் பெரும்பான்மை இனத்தவர் ஒருவரை முதலமைச்சராகக் கொண்டுவருவதற்கு நாங்கள் முற்படுகின்றோம் என்று. இந்த நோன்பு காலத்தில்

அல்லாஹ்வின்மீது சத்தியமாகச் சொல்கின்றேன். அவ்வாறான காட்டிக்கொடுக்கின்ற குடும்பத்திலோ அல்லது சமூகத்திலோ நாங்கள் பிறக்கவில்லை. நீங்கள் தமிழீழ விடுதலைப் புலிகள் இயக்கத்திலிருந்து பிரிந்துவந்த பிள்ளையானுடைய கட்சியின் அமைப்பாளராக இருந்திருக்கின்றீர்கள்; தமிழ் மக்களை நசுக்கிய கட்சி என்று சொல்கின்ற சுதந்திரக் கட்சியின் அமைப்பாளராக நீங்கள் இருந்திருக்கின்றீர்கள். இன்று வெட்கமில்லாமல் இங்கு வந்து சிறுபான்மை மக்களுடைய உரிமைகள் பற்றி நீங்கள் பேசுகின்றீர்கள். உங்களுக்கு நான் சவால்விடுகின்றேன். அம்பாறை மாவட்டத்தில் 70 சதவீதமான தமிழ் பேசும் மக்கள் வாழுகின்றார்கள். அந்த மாவட்டத்தைப் பிரித்து, தமிழ் பேசும் மக்களுக்கான ஒரு மாவட்டத்தைப் பெற்றுத்தருமாறு கோரி உங்களால் ஏன் போராட முடியாது? கேவலம்! அம்பாறைக்கு தமிழ் பேசும் ஓர் அரசாங்க அதிபரை நியமிக்க வக்கில்லாதவர்களாக இருந்துகொண்டிருக்கின்றீர்கள். இதற்குக் காரணம், முஸ்லிம் இன எதிர்ப்பு அரசியல்மூலமாக தமிழ் மக்களையும் முஸ்லிம் மக்களையும் மூட்டிவிட்டு, அரசியல் இலாபம் தேடுகின்ற மிகக் கேவலமான, இழிவான செயற்பாட்டை சாணக்கியன் அவர்கள் செய்துகொண்டிருப்பதாகும்.

ஒரு வாரத்துக்கு முன்பு இதே சாணக்கியன் MPயை முஸ்லிம் சமூகம் தலையில் வைத்துப் புகழ்ந்தது; அவருக்குப் பெரும் மதிப்பைக் கொடுத்தது. இன்று அவர் தொடர்பில் இருந்த நம்பிக்கை சுக்குநூறாகியிருக்கின்றது. இந்த நாட்டிலே எத்தனையோ தமிழ் தலைவர்கள் கண்ணியமான முறையில் இன்றும் இருந்துகொண்டிருக்கின்ற நிலையில், இன்று இனவாதமாக இவர் எங்களைக் "கைக்கூலி" என்று சொல்லுகின்றார். யார் கைக்கூலி என்பதை வரலாறு கூறியிருக்கின்றது. அவர் பிள்ளையானுடைய ஒரு கைக்கூலியாக, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் ஒரு கைக்கூலியாக, இந்த நாட்டில் தமிழ் மக்களுடைய போராட்டத்தைக் காட்டிக்கொடுத்த ஒரு கைக்கூலியாக இருந்திருக்கிறார் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அரசியலமைப்பின் 20ஆவது திருத்தத்துக்கு நாங்கள் ஆதரவாக வாக்களித்த விடயம் என்பது, எங்களுடைய அரசியல் வியூகமாகும். சகோதரர் சாணக்கியன் அவர்களே, அதன் காரணமாகத்தான் இன்று நாங்கள் எங்களுடைய ஆள்புலப் பிரதேசங்களை உங்களிடமிருந்து பாதுகாத்துக்கொண்டிருக்கின்றோம் என்று குறிப்பிட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. එතුමා සභා ගර්භය තුළ නැති බවයි පෙනෙන්නේ.

ඊළඟට, ගරු වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා. කථා කිරීමට නියමිත අනෙක් මන්ත්‍රීවරයා සභාවේ නැති නිසා ඔබතුමාට තව පොඩි වේලාවක් ගන්න පුළුවන් වෙයි.

[பி.ப. 5.12]

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan )

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய கொவிட் - 19 தொடர்பான இந்த விவாதத்திலே எங்களுடைய பகுதிகளிலே இருக்கின்ற பிரச்சினை மற்றும் இந்த நாட்டிலுள்ள பிரச்சினைகள் பற்றிப் பேசுவதற்கான சந்தர்ப்பம் எனக்குக் கிடைத்திருக்கின்றது. இந்த கொவிட்-19 யாரையும் விட்டுவைக்கவில்லை. இன, மத, சாதி, சமயம், நிறம் என்று பேதம் பார்க்காமல் அது உலகத்தையே ஆட்டங்காணச் செய்துகொண்டிருக்கின்றது. இந்த கொவிட் தொற்று இப்பொழுது உலகம் முழுதும் வியாபித்திருப்பதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. அரசாங்கம் என்ற முறையிலே உரிய நடவடிக்கைகளை எடுப்பதுடன், வெளிநாட்டு உதவிகளைப் பெற்றுக்கொண்டு கொவிட் தொற்றிலிருந்து மக்கள் மீண்டு வருவதற்குத் தேவையான நடவடிக்கைகளைச் செய்யவேண்டிய முக்கியமான காலகட்டத்திலே நாங்கள் இருக்கின்றோம். இந்த நிலையில், ஆளும் கட்சி, எதிர்க் கட்சி என்ற பேதம் இல்லாமல் நாங்கள் எல்லோரும் ஒன்றுசேர்ந்து இந்த கொவிட் தொற்றை இல்லாமற் செய்வதற்கான நடவடிக்கையை எடுக்கவேண்டும் என்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற நுவரெலியா மாவட்டத்திலே பல பகுதிகள் இப்பொழுது தனிமைப்படுத்தப்பட்டிருக்கின்றன. வலப்பனையில் நில்தண்டாஹின்ன அதேபோல ஹங்குராங்கத்தையில் ரத்மெதிய, பொஹவந்தலாவை பகுதியிலே 'இஞ்ஜஸ்ரி', 'ஹென்பீல்ட்', 'போடேய்ஸ்' போன்ற பகுதிகள் தனிமைப்படுத்தப்பட்டிருக்கின்றன. இவ்வாறு தனிமைப்படுத்தப்பட்ட - isolated - சில இடங்களுக்கு யாரும் போக முடியாது, அங்கிருந்து வெளியேறவும் முடியாது என்ற சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. இவ்வாறான சூழ்நிலையிலே மக்களைப் பாதுகாக்கவேண்டிய பொறுப்பு எங்களுக்கு இருக்கின்றது என்பதை நாங்கள் மறந்துவிடக்கூடாது.

விசேடமாக, பதுளை, நுவரெலியா, இரத்தினபுரி போன்ற மலையகப் பகுதிகளிலே இருக்கின்ற, பெருந்தோட்டத் தொழிலிலே ஈடுபடுகின்ற மக்கள் கொவிட் தொற்று ஆரம்பித்த நாள்முதல் இன்றுவரைக்கும் தங்களுடைய வேலைகளைச் செய்து வருகின்றார்கள். அவர்களுடைய வேலைத் தளங்களிலே கொவிட் தொடர்பான அறிவுறுத்தல்களை அல்லது தெளிவூட்டல்களை வழங்குவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்கவேண்டுமென நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன். கைகளைக் கழுவாமல், mask பாவிக்காமல் தோட்டங்களிலே வேலை செய்கின்ற தொழிலாளர்களைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, அங்கேயுள்ள சுகாதார அதிகாரிகள் இந்த விடயத்தில் மிகவும் கவனஞ்செலுத்த வேண்டும். தோட்டங்களிலே மக்கள் அடுத்தடுத்து லயன் அறைகளிலே வாழ்கின்ற காரணத்தினால் இந்தச் சுகாதார முறைகளைப் பேணுவது மிகமிகக் கஷ்டமான ஒரு செயலாக இருக்கின்றது. இவைகளை முறைப்படுத்திச் செய்வதற்கான சந்தர்ப்பத்தை உருவாக்கித் தருவதற்கான நடவடிக்கையை அங்கிருக்கின்ற சுகாதார அதிகாரிகள் எடுக்கவேண்டும் எனவும் நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அண்மையிலே நுவரெலியா Municipal Council area இலுள்ள 54 பேருக்குக் கொவிட் தொற்று உண்டாகியிருக்கின்றது. இந்த கொவிட் தொற்றுத் தொடர்பில் கடந்த 28ஆம் திகதி PCR பரிசோதனைகள் செய்யப்பட்டன. ஆனால், நேற்றுத்தான் அதன் results வந்தது. இந்த 8 நாட்களாக அந்த மக்கள் அங்கும் இங்கும் திரிந்து ஏனைய மக்களோடு பழகுகின்றபோது இன்னும் பலருக்கு இது பரவியிருக்கலாம். ஆகவே, அந்த resultsஐ ஓரிரு நாட்களிலே கொடுப்பதற்குரிய ஏற்பாடு செய்யப்பட வேண்டும். இல்லாவிட்டால், இந்தத் தொற்றுப் பரவுவதற்கு இதுவும் ஒரு காரணமாக இருக்கும். நுவரெலியா மாவட்டத்திலே கிட்டத்தட்ட 810,000 மக்கள் வாழ்கின்றார்கள். ஆனால், அந்த 810,000 மக்களுக்கும் PCR பரிசோதனை செய்வதென்பது

[ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා ]

கஷ்டமான செயல் என்பது எல்லோருக்கும் தெரிந்த விடயமாகும். இருந்தாலும், நுவரெலியாப் பகுதியிலே PCR பரிசோதனை செய்வது மிகமிகக் குறைவாக இருக்கின்றது. நான் காலையிலே RDHS உடன் பேசினேன். Nuwara Eliya Hospitalஇல் மட்டும்தான் PCR machine இருப்பதாக அப்போது சொல்லப்பட்டது. அதாவது, நுவரெலியா மாவட்டத்துக்கு ஒரேயொரு PCR machine தான் இருக்கின்றது. அதில் ஒருநாளைக்கு 300 பேருக்கு மட்டும்தான் PCR test இனைச் செய்ய முடியும். இவ்வாறு நாளொன்றுக்கு 300 பேருக்கு மட்டும் PCR test செய்கின்றபோது எத்தனை நாட்கள் - எவ்வளவு காலம் போகுமென்று நாங்கள் சற்றுச் சிந்தித்துப் பார்க்கவேண்டும். கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் இங்கு இருந்தார். இப்போது அவர் சபையில் இல்லை. எனவே, நுவரெலியா மாவட்டத்துக்கு இன்னுமொரு PCR machineஐ வழங்கி அதனைக் ஹற்றன் பகுதிக்குக் கொடுக்கவேண்டும் என்பதனை நான் இந்த நேரத்திலே இந்தச் சபைக்கு என்னுடைய கோரிக்கையாக முன்வைக்கின்றேன்.

நுவரெலியாவிலே இப்பொழுது positive ஆனவர்களைத் தனிமைப்படுத்துவதற்கு 3 இடங்கள் எடுக்கப்பட்டிருக்கின்றன. Kande Ela Youth Centre, Maskeliya District Hospital, Lindula District Hospital ஆகிய 3 இடங்களை இன்று தெரிவு செய்திருக்கின்றார்கள். அதற்காக எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். எதிர்காலத்திலே positive ஆனவர்களை அவற்றில் தங்கவைத்துப் பரீட்சிப்பதற்கான நடவடிக்கையை எடுக்கவேண்டும். கொழும்பிலிருந்து அதிகமான மக்கள் நுவரெலியாவுக்கு வருவதன் காரணமாக நுவரெலியாவுக்கு வரும் வழியிலே, கினிகத்தனையிலே இருக்கின்ற களுகெல என்ற இடத்திலே அதிகமான PCR பரிசோதனைகள் செய்யப்பட்டன. அவ்வாறு PCR பரிசோதனைகள் செய்யப்பட்டவர்களில் 50 வீதமானவர்களுக்குக் கொவிட் தொற்று ஏற்பட்டிருப்பதாக அறிவுறுத்தியிருக்கின்றார்கள். ஆகவே, அதிகமான பரிசோதனைகளை அந்த இடங்களிலே செய்யவேண்டும் எனவும் நான் இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
මට වැඩිපුර කාලය ගන්න පුළුවන් නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
நுவரெலியா மாவட்டத்திலே கொவிட் பரவுவதற்கு முக்கியமான காரணம் நுவரெலியாவிலே நடைபெற்ற வசந்தகால உற்சவம் என்பது எல்லோருக்கும் தெரியும். கிட்டத்தட்ட 5 இலட்சம் பேர் நுவரெலியாவுக்கு வந்து போனதன் காரணமாகத்தான் நுவரெலியா மாவட்டத்தில் அதிகமானோருக்குக் கொவிட் தொற்று உண்டாகியிருக்கின்றது; நாட்டிலும் அதிகமானோருக்குக் கொவிட் தொற்று உண்டாகியிருக்கின்றது. இவ்வாறான சூழ்நிலையில், களியாட்டங்கள் தேவையா? என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும். ஆகவே, இவற்றைக் கருத்திற்கொண்டு அரசாங்கம் இவ்வாறானவர்களுக்கெதிராக நடவடிக்கை எடுக்கவேண்டும் எனவும் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன். அவர் எல்லா நடவடிக்கைகளையும் Governor of the Central Provinceஇன் அனுமதியுடன்தான் செய்திருக்கின்றார். Governor of the Central Province எல்லா நிகழ்வுகளிலும் கலந்துகொண்டிருந்தார். ஆனால், இப்பொழுது Mayorக்கு எதிராக நடவடிக்கை எடுக்கின்றார். நுவரெலியா மாநகர சபையின் Mayor பாவம்! இது எந்த விதத்தில் நியாயமென்று எனக்குத் தெரியவில்லை. ஆகவே, எங்கோவொரு தவறு நடந்ததற்காக அந்த Mayorஐ இப்படிப் பழிவாங்குவது என்பது பொருத்தமில்லாத ஒரு செயல் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று இந்தியாவிலே இலட்சக்கணக்கான மக்கள் இறந்துகொண்டிருப்பதை நாங்கள் TV மூலமாகப் பார்த்துக்கொண்டிருக்கின்றோம். இன்று உலகத்திலே கொவிட்-19 மூலமாக மிகவும் பாதிக்கப்பட்ட நாடாக இந்தியா இருப்பதையும் எங்களால் அறியக்கூடியதாக இருக்கின்றது. இந்தியா எங்களுடைய அயல் நாடு; எங்களுக்கு உதவி செய்கின்ற நாடு. இவ்வாறிருக்கும்போது அந்த நாட்டிலே இவ்வாறு ஒரு சூழ்நிலை ஏற்படும்பொழுது எங்கள் நாட்டின் சார்பாகவும் எங்களுடைய அனுதாபங்களைத் தெரிவிக்க வேண்டிய கட்டாயம் இருக்கின்றது. அந்த வகையில், அங்கு கொவிட்-19 உடன் போராடிக்கொண்டிருக்கின்ற மக்களுக்கும் இந்திய பிரதம மந்திரி நரேந்திர மோடி அவர்களுக்கும் முதலமைச்சர்களுக்கும் எங்களுடைய ஆழ்ந்த அனுதாபங்களை இந்த நேரத்திலே நாங்கள் தெரிவித்துக்கொள்கின்றோம்.

இந்த நாட்டிலே இன்று பேசப்படுகின்ற இன்னுமொரு விடயம் என்னவென்றால், இரசாயன உரம் மற்றும் கிருமிநாசினிகள் சம்பந்தமானதாகும். இவற்றைப் பாவிக்கக்கூடாதென்று மேதகு ஜனாதிபதி அவர்கள் அறிவித்திருக்கின்றார். அது நல்ல ஒரு திட்டம்; நாங்கள் அதை வரவேற்கின்றோம். இதனை உடனடியாகச் செய்வதற்கு முயற்சிப்பார்களேயானால் விவசாயத்துறை மிகவும் அதலபாதலத்திற்குத் தள்ளப்படுகின்ற ஒரு சூழ்நிலை ஏற்படும். இதனை ක්‍රමයෙන්, ක්‍රමයෙන් - படிப்படியாகச் செய்யவேண்டுமே தவிர, ஒரேயடியாகச் செய்ய முற்பட்டால் விவசாயிகளுக்கு பல்வேறு சிக்கல்கள் ஏற்படும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) වී. රාධාකෘෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
Sir, give me one more minute, please.

அதேபோல, தேயிலைத் தோட்டத் தொழிலாளர்களுக்கு தேயிலைத் தோட்டங்களிலே உரம் போடாமல் கொழுந்து பறிப்பது என்பது சாதாரண விஷயம் அல்ல. கிருமிநாசினிகள் பாவிக்காததன் காரணமாக கொழுந்துகள் நாசமாகிப் போவதை இப்பொழுது எங்களால் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இரசாயன உரம் பாவிப்பதையோ, கிருமிநாசினிகள் பாவிப்பதையோ நாங்கள் வரவேற்காவிட்டாலும், இவ்வாறு சட்டம் கொண்டுவரும் போது எல்லாவற்றையும் கருத்திற்கொண்டு நியாயமான முறையில் சட்டங்கள் கொண்டுவரப்பட வேண்டுமென்பதை நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කේ.පී.එස්. කුමාරසිරි මන්ත්‍රීතුමා *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ගුණතිලක රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට කථා කරන්න සිදුවී තිබෙන්නේ කොවිඩ් වසංගතය අපේ රට පමණක් නොව, මුළු ලෝකයම වෙළා ගත් මොහොතකයි.

කොවිඩ්-19 වසංගතයේ පළමු රැල්ල අපේ රටේ පටන් ගත්ත වේලාවේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනතාව කොවිඩ්-19 ව්‍යසනයෙන් බේරා ගැනීමට රට lock down කරලා ක්‍රමවත්ව, විධිමත්ව, මැනවින් රට පාලනය කළා. ලෝකයේ බලවත් යැයි, ධනවත් යැයි කියා ගන්නා ඇමෙරිකාව, එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය වැනි රටවල මිනිසුන් මහ පාරේ මැරී වැටෙද්දී, කොච්චර ධනය, බලය තිබුණත්, කොච්චර ශක්තිමත් වුණත් ඒ තත්ත්වය පාලනය කර ගැනීමට ඒ අයට නොහැකි වූ මොහොතක, ඉතාම සුළු මරණ සංඛ්‍යාවක් සහ සුළු ආසාදිතයන් සංඛ්‍යාවකට සීමා වෙමින් කොවිඩ් පළමු රැල්ලෙන් අපේ ජනතාව බේරා ගන්න අපේ රාජ්‍ය නායකයාට පුළුවන් වුණේ ඒ නිසායි.

ලෝකයේ රටවල් 238කින් කොවිඩ් වසංගතය පාලනය කළ රටවල් අතර 10වැනි තැනට අපේ රට පත් කර ගැනීමට අපේ ජනාධිපතිතුමා සමත් වුණා. ජනාධිපතිතුමා වාගේම රටේ ජනතාවත් ඒ කාරණය හොඳින් තේරුම් බේරුම් කරගෙන ආරක්ෂක අංශ මෙන්ම වෛද්‍ය අංශ සමඟ එකට එකතු වෙලා කටයුතු කළ නිසා එය මැඬ පැවැත්වීමට අපට පුළුවන් වුණා. නමුත්, ඊට එහා ගිය, ඊට වඩා වෙනස් ආකාරයෙන් **තෙවන** රැල්ල රට පුරා පැතිරෙමින් පවත්නා මේ මොහොතේ රටට ආදරය කරන පිරිසක් හැටියට, ජාතියට ආදරය කරන පිරිසක් හැටියට අපි සියලුදෙනා පක්ෂ භේදයකින් තොරව එක්විය යුතුයි. මොකද, මේ කොවිඩ් වසංගතයට ජේවීපීද, යූඑන්පීද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද, පොදු පෙරමුණද කියලා එකක් නැහැ. සිංහලද, දෙමළද, මුස්ලිම්ද, බර්ගර්ද කියලා එකකුත් නැහැ. එහෙම නම් මේ සියල්ලටම මුහුණ දෙන්න ඕනෑ අපිමයි. ඒ නිසා අපි පෙරට ආවොත් මේ දේ මැනවින් පාලනය කර ගන්න පුළුවන්. මම දන්නා විධියට රජයේ සංවර්ධන කටයුතු සඳහා වෙන් කර තිබුණු මුදල්වලින් රුපියල් බිලියන 80කට එහා ගිය මුදලක් අපේ රටේ අහිංසක ජනතාව බේරා ගැනීම සඳහා වියදම් කළා.

මේ අවස්ථාවේ අපේ රට වෙන රටවල් සමඟ සංසන්දනය කර බැලුවාම, අපේ රටේ තවමත් 115,000කට වඩා අඩු සංඛ්‍යාවක් තමයි ආසාදිතයන් හමු වුණේ. අද වන විට එයින් ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් සුව වී නිවෙස්වලට ගිහින් තිබෙනවා. ප්‍රතිකාර ලබමින් සිටින්නේ ආසාදිතයන් 12,000ක් විතර පිරිසක්. අපි ඒ ආකාරයෙන් කටයුතු කරනකොට අපේ වැඩිමහල් සහෝදරයා වාගේ ඉන්න ඉන්දියාවේ තත්ත්වය පිළිබඳව අමුතුවෙන් කථා කරන්න අවශ්‍ය නැහැ. අද මාධ්‍ය තුළින් උදේ හවස ඉන්දියාවේ තත්ත්වය දැක බලා ගන්න අපට පුළුවන්. එදා බුදුන් වහන්සේ උත්පත්තිය ලබපු භාරත දේශයේ විශාලා මහනුවර තුන්බිය ඇති වී මිනිස්සු මැරී වැටෙද්දී උන්වහන්සේ රතන සූත්‍රය දේශනා කර ඒ භාරතීය ජනතාව බේරා ගත්තා. මේ වාගේ වසංගත තත්ත්ව කොයි මොහොතේ, කොයි වෙලාවේ එනවාද කියන එක කාටවත් හිතා ගන්න බැහැ. ඒවා කාටවත් පාලනය කර ගන්නත් බැහැ. අපි පුංචි කාලයේ අහලා තිබෙනවා, පොත් පත්වල කියවා තිබෙනවා අතීතයේ මුහුද ගොඩ ගැලුවා කියලා. අපි කවදාවත් හිතුවේ නැහැ, මුහුද ගොඩ ගලයි කියලා. නමුත්, මුහුද ගොඩ ගැලුවා. ඒකෙන් තමයි අපි ඉගෙන ගත්තේ, ඉතිහාසයේ කියලා තිබෙන දේ සත්‍යයක් කියලා. අපි 2004දී ඇස් දෙකෙන්ම දැක්කා; අත්වින්දා, මුහුදු රළ මඟින් අපේ ජනතාවගේ ජීවිත බිලිගත් ආකාරය.

අපේ ආණ්ඩු පක්ෂයට, රටේ ජනතාවට වාගේම විපක්ෂයටත් අද වගකීමක් තිබෙනවා. ආණ්ඩුව පිළිබඳ විවේචන තිබෙන්න පුළුවන්. ඒවා ඕනෑ වෙලාවක කරගන්න පුළුවන්. නමුත්, අද ඊට වඩා රටක් හැටියට සිතා අපි හැම දෙනාම කටයුතු කළ යුතුයි. ඉන්දියාවේ ජාතීන් සිය ගණනක් හිටියත්, දේශපාලන පක්ෂ අනුව කොච්චර බෙදී සිටියත් ඔවුන් ඉන්දියානු ජාතිකයන් හැටියට තමයි ව්‍යසනයකදී මෙන්ම හැම අවස්ථාවකදීම කටයුතු කරන්නේ. නමුත්, අවාසනාවකට අපේ රටේ විපක්ෂය මේ අවස්ථාවේත් බොර දියේ මාළු බානවා. රෝගීන් වැඩි වෙනවා නම් හොඳයි. මිනිස්සු මැරෙනවා නම් හොඳයි. ආසාදිතයෝ වැඩි වෙනවා නම් හොඳයි. එහෙම හිතන කාලකණ්ණි විපක්ෂයක් බවට අද ඔවුන් පත් වෙලා තිබෙනවා. අපේ ජනාධිපතිතුමා ඉන්දියාවෙන් එන්නත් ටික ගෙන්වන්න වැඩ කටයුතු කරලායි තිබුණේ. අද උදේත් අපි ඒ ගැන කථා කළා.

ඉන්දියාවට මේ ප්‍රශ්නය වුණේ නැත්නම් මේ වෙන කොට අපේ රටේ ජනතාවට එන්නත ලබා දීලා ගොඩක් දුරට රෝගය පාලනය කරගන්න තිබුණා. අපි විපක්ෂයට කියනවා, වගකිව යුතු විපක්ෂයක් හැටියට මේ අවස්ථාවේදී රජය විවේචනය නොකර ජනතාව වෙනුවෙන්, ජනතාවගේ පැත්තේ හිටගෙන රටත්, ජාතියත් බේරා ගන්න ඒවාට සහාය දෙන්න කියලා. එහෙම නැති වුණොත් තමුන්නාන්සේලාට මේ රටේ ජනතාව ශාප කරයි. ඉන්දියාවේ ඒ එන්නත වාගේම තවත් රටවල් රාශියක් එන්නත් නිපදවා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්. කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගුණතිලක රාජපක්ෂ මහතා**
(மாண்புமிகு குணதிலக ராஜபக்ஷ)
(The Hon. Gunathilaka Rajapaksha)
චීනයේ එන්නත- [බාධා කිරීම්] කියලා සමහර අය කියනවා. නමුත් රටවල් 85කට ඒ එන්නත දීලා තිබෙනවා. අපි ආණ්ඩුවට කියන්නේ, චීනයෙන් හෝ ඉන්දියාවෙන් හෝ ඇමෙරිකාවෙන් හෝ රුසියාවෙන් හෝ වෙනත් කොයි රටකින් හෝ ඒ එන්නත් පුළුවන් තරම් ඉක්මනට ගෙනැල්ලා අපේ රටේ ජනතාවට ලබා දීලා ඔවුන් වෙනුවෙන් ඒ යුතුකම ඉටු කරන්න කියලායි. වැඩිකල් යන්න නොදී එය ඉෂ්ට කරන බවට අපට ලොකු විශ්වාසයක් තිබෙනවා. පළමු රැල්ල මැඬ පැවැත්වූවා වාගේ දෙවැනි රැල්ල ඉක්මනින් මැඬ පවත්වන්න අපේ අතිගරු ජනාධිපතිතුමාට, අපේ ගරු අගමැතිතුමාට, අපේ පක්ෂයේ -ශ්‍රී ලංකා පොදුජන

[ගරු ගුණතිලක රාජපක්ෂ මහතා ]

පෙරමුණේ- නිර්මාතෘ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයට ශක්තිය ධෛර්යය, දළදා හාමුදුරුවන්ගේ පිහිට, ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාවට සම්බන්ධ විවාදය තවදුරටත් පැවැත්වීම පිණිස හෙට දිනය දක්වා කල් තබන බව සභාවට දන්වනු කැමැත්තෙමි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 මැයි 05 වන බදාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே, மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2021 மே 05, புதன்கிழமை மு.ப.10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 10.00 a.m. on Wednesday, 05th May, 2021.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.